# දෙවැනි කොටස

# දෙවැනි කොටස
# ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිණුම් සහ කටයුතු

**පිටුව**


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 76 |
| 3. | බැංකු විදු පියෙස | 80 |
| 4. | සන්නිවේදන | 81 |
| 5. | ව්‍යවහාර මුදල් | 83 |
| 6. | දේශීය මෙහෙයුම් කටයුතු | 86 |
| 7 | ආර්ථික පර්යේෂණ | 90 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 94 |
| 9. | පහසුකම් කළමනාකරණ | 98 |
| 10. | මූල්‍ය කටයුතු | 99 |
| 11. | මූල්‍ය බුද්ධි ඒකකය | 101 |
| 12. | විදේශ විනිමය | 103 |
| 13. | මානව සම්පත් | 107 |
| 14. | තොරතුරු තාක්ෂණ | 111 |
| 15. | අභ්‍යන්තර විගණන | 113 |
| 16. | ජාත්‍යන්තර මෙහෙයුම් | 113 |
| 17. | නීති සහ අනුකූලතා කටයුතු | 116 |
| 18. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 117 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 119 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 122 |
| 21. | රාජ්‍ය ණය | 123 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 125 |
| 23. | ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ | 133 |
| 24. | නිරාකරණ හා බලගැන්වීම් | 134 |
| 25. | අවධානම් කළමනාකරණය | 135 |
| 26. | ලේකම් දෙපාර්තමේන්තුව | 137 |
| 27. | ආරක්ෂක සේවා | 138 |
| 28. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 139 |
| 29. | සංඛ්‍යාන | 139 |
| 30. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 144 |
| 31. | පුහුණු හා සංවර්ධන | 148 |

# 1. ගිණුම්කරණ සහ මූල්‍ය

## 2018 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව

### 1. හැඳින්වීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යනු මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද අනුකමිටුවකි. මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණ පද්ධති, අනුකූලතා, දුෂ්කෘත නිවේදන, වංචා, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලයෙන් පැවරූ වෙනත් කරුණු පිළිබඳව මුදල් මණ්ලයට උපදේශන ලබා දීම සිදුකරයි. කමිටුවෙහි නිර්දේශ සහ ක්‍රියාකාරීත්වය කාර්තුමය සහ අවශ්‍ය පරිදි මුදල් මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

### 2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපති ලෙස මුදල් මණ්ඩලයට පත්කරන ලද සාමාජිකයකු කටයුතු කරන අතර එහි සෙසු සාමාජිකයන් ලෙස බාහිර විගණන වෘත්තීයවේදීන් දෙදෙනෙකු කටයුතු කරති. 2018.12.31 දිනට කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) ඒ.එන්. ෆොන්සේකා මහතා - සභාපති

ii) එච්.එම්.ඒ. ජයසිංහ මහතා - සාමාජික

iii) ඒ.අයි. මොහොට්ටි මහත්මිය - සාමාජිකා

මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධූරය දරනු ලබන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී සහ අනුකූලතා නිලධාරී නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම්වලට සහභාගී වෙති. කමිටු සභාපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවශ්‍යතා පරිදි රැස්වීම්වලට කැඳවීම් කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේදී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සඳහා පත් කළ විගණන ආයතනයේ හවුල්කරු ද කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වතාවක් රැස්විය යුතු ය. ඊට අමතරව සභාපතිගේ තීරණය මත හෝ මුදල් මණ්ලයේ අවශ්‍යතාවයන්ට අනුව රැස්විය හැක. කමිටුවේ ලේකම් විසින් කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපති ඇතුළුව සාමාජිකයන් දෙදෙනෙකි.

### 3. 2018 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළව ක්‍රියාත්මක කළ කාර්යයන්

කමිටුව 2018 වර්ෂය තුළ දී රැස්වීම් අටක් (08) පැවැත්වූ අතර ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

(අ) මූල්‍ය වාර්තාකරණය හා බාහිර විගණනය

කමිටුව විසින්,

i) 2016 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව,

ii) 2017.09.30 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව, 2017 වර්ෂය සඳහා වූ බාහිර විගණකගේ කළමනාකරීත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සහ බාහිර විගණකගේ නිර්දේශයන්,

iii) 2018 වර්ෂය සඳහා වන KPMG හි විගණන සැලසුම,

iv) 2018.12.31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව සහ

v) 2018 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.

**(ආ) අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධති**

කමිටුව විසින්,

i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධතීන් සමලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) කමිටුව විසින් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට කරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

**(ඇ) අභ්‍යන්තර විගණනය**

කමිටුව විසින්,

i) 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

ii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත වාර්තා කළ විගණන නිර්දේශයන් සමාලෝචනය කරන ලදී.

iii) 2019 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කරන ලදී.

iv) විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලදී.

v) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතාව සමලෝචනය කරන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2018 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා කේපීඑම්ජී වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } බීඑෆ්/එච්/සීබීඑස්එල්/1/18/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 අප්‍රේල් 03 දින

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැළී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.2 මතය සඳහා පදනම**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ, තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම, වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි එළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දූස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම පිළිබඳ යෝග්‍යතාවය ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වාගෙන ගොස් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වෙමින් ලබා ගන්නා ලද සාක්ෂි මත පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සමඟ සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට, බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන්කලේ :

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2018 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 9 | **372,175,176** | 459,827,641 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 10 | **37,467,239** | 45,264,376 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති අලෙවි කළ හැකි සුරැකුම්පත් | 10 | **694,876,394** | 566,228,935 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | **750** | 4,940,455 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 12 | **147,427,452** | 126,842,946 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **961,284** | 3,665,700 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,252,908,295** | 1,206,770,053 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 13 | **45,031,157** | 9,704,962 |
| නැවත විකිණීමේ ගිවිසුම මත මිලදී ගත් සුරැකුම්පත් | 14 | **229,454,409** | 22,375,124 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 15 | **198,632,571** | 199,800,871 |
| බැංකු සඳහා දෙන ලද ණය | 16 | **95,963** | 223,702 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 17 | **1,381,879** | 41,095 |
| අනිකුත් වත්කම් | 18 | **14,783,305** | 12,882,470 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **489,379,284** | 245,028,224 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,742,287,579** | 1,451,798,277 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 19 | **149,683,439** | 126,583,727 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 20 | **6,568,935** | 6,875,533 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **1,914,087** | 1,534,848 |
| දේපල පිරියත සහ උපකරණ | 21 | **16,955,854** | 17,960,517 |
| අස්පෘශ්‍ය වත්කම් | 22 | **30,437** | 80,623 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **175,152,752** | 153,035,248 |
| **මුළු වත්කම්** | | **1,917,440,331** | 1,604,833,525 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 23 | **19,301,160** | 8,239,544 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | **14,056,460** | 4,648,449 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 24 | **79,158,977** | 90,981,712 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 25 | **416,988,246** | 318,995,269 |
| අනිකුත් | 26 | **134,730,933** | 64,095,889 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **664,235,776** | 486,960,863 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 27 | **320,106,183** | 341,712,198 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 28 | **348,718** | 324,517 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 29 | **28,311,221** | 40,655,278 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 30 | **18,333** | 4,547 |
| සංසරණයෙහි පවතින මුදල් | 31 | **640,942,510** | 598,053,901 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 32 | **12,606,431** | 8,887,156 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **1,002,333,396** | 989,637,597 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **1,666,569,172** | 1,476,598,460 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 33 | **11** | 45 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 34 | **12,016,804** | 671,061 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 35 | **85,945** | 211,720 |
| **මුළු අනිකුත් බැරකම්** | | **12,102,760** | 882,826 |
| **මුළු බැරකම්** | | **1,678,671,932** | 1,477,481,286 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 50,000,000 |
| සංචිත | 36 | **188,768,399** | 77,352,239 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | **238,768,399** | 127,352,239 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **1,917,440,331** | 1,604,833,525 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2019 මාර්තු 29 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි - අධිපති

යූ.එල්.මුතුගල - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 12 සිට 75 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදායම් ප්‍රකාශය

| | සටහන | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම:** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 38 | **25,556,932** | 22,914,716 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/ (පාඩුව) | 39 | **(18,259,956)** | 24,000,475 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/ (පාඩුව) | | **(4,092,390)** | 2,772,209 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **3,204,586** | 49,687,400 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 40 | **(5,350,155)** | (2,963,231) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 41 | **(19,121)** | - |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(5,369,276)** | (2,963,231) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව) | | **146,854,048** | (3,808,147) |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම** | | **144,689,358** | 42,916,022 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 38 | **8,956,322** | 18,501,748 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය | | **117,771** | 267,180 |
| පොළී වියදම | 40 | **(2,880,220)** | (2,676,116) |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 41 | **(10,966)** | - |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **6,182,907** | 16,092,812 |
| අනිකුත් ආදායම් | 42 | **1,692,994** | 1,602,664 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **152,565,259** | 60,611,498 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 43 | | |
| - වැටුප් සහ වේතන | | **(5,409,137)** | (4,112,349) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(1,536,049)** | (610,489) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ දායකත්වය | | **(205,147)** | (744,356) |
| | | **(7,150,333)** | (5,467,194) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(498,189)** | (518,716) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | **(3,999,000)** | (2,850,823) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 44 | **(1,850,083)** | (1,305,649) |
| වත්කම් මත හානීකරණ ගාස්තු | | **(20,650)** | (274,773) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(13,518,255)** | (10,417,155) |
| **බදු වලට පෙර ලාභය** | | **139,047,004** | 50,194,343 |
| බදු | 45 | **(1,119,286)** | (1,837,976) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | | **137,927,718** | 48,356,367 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 12 සිට 75 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය. | **137,927,718** | 48,356,367 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| **පසු කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය විය හැකි අයිතම** | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට/ වෙළඳාම සඳහා ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/ (අලාභය) | **(877,778)** | (6,843,970) |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | **5,259** | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගය මත ගණනය කරන ලද ආයෝජන සඳහා අපේක්ෂිත ණය අලාභ | **(1,939)** | - |
| **පසු කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවිය යුතු අයිතම** | | |
| විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වියදම | **(11,823,458)** | 1,741,622 |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | **122,747** | - |
| **මුළු විස්තීරණ ආදායම.** | **125,352,549** | 43,254,019 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 12 සිට 75 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය**

| | ආයක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | අනිකුත් සංචිත (සටහන 36) රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|
| **2017 ජනවාරි 1 දිනට** | 50,000,000 | 9,022,907 | 30,530,509 | (3,910,215) | 85,643,201 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 48,356,367 | 48,356,367 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | 273,918 | (273,918) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | 1,741,622 | 1,741,622 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | (3,808,147) | 3,808,147 | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | (166,388) | (166,388) |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය | - | - | (6,843,970) | - | (6,843,970) |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | - | 14,028,792 | (14,028,792) | - |
| පොදු සචිතයට මාරු කිරීම | - | - | 7,462,613 | (7,462,613) | - |
| 2016 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | - | - | - | (1,378,272) | (1,378,272) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | (321) | (321) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | - | - | 689,025 | (689,025) | - |
| **2017 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | 9,022,907 | 42,332,740 | 25,996,592 | 127,352,239 |
| ජා.මු.වා.ප්‍ර. 09 ප්‍රකාර නැවත වර්ගීකරණ බලපෑම ආරම්භක ශේෂය මත ගැලපීම | - | - | 1,287,347 | - | 1,287,347 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගය මත ගණනය කරන ලද ආයෝජන සඳහා අපේක්ෂිත ණය අලාභ ආරම්භක ශේෂය මත ගැලපීම | - | - | 65,588 | (117,160) | (51,572) |
| **2018 ජනවාරි 1 දිනට සංශෝධිත ශේෂය** | 50,000,000 | 9,022,907 | 43,685,675 | 25,879,432 | 128,588,014 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 137,927,718 | 137,927,718 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | 291,983 | (291,983) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | (11,823,458) | (11,823,458) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | - | - | 146,854,048 | (146,854,048) | - |
| තාක්ෂණික අභිවර්ධන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | - | 2,000,000 | (2,000,000) | - |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට මාරු කිරීම | - | - | - | (171,843) | (171,843) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය | - | - | (877,778) | - | (877,778) |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | - | 24,337,841 | (24,337,841) | - |
| පොදු සංචිතයට මාරු කිරීම | - | - | 5,013,869 | (5,013,869) | - |
| 2017 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | - | - | - | (15,000,000) | (15,000,000) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | (321) | (321) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | - | - | 5,372,178 | (53,72,178) | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ස්කන්ධ ආයෝජන බැහැර කිරීමේ ලාභ | - | - | (16,289) | 16,289 | - |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත් මත මිල වෙනස්වීමේ ලාභ | - | - | 5,259 | - | 5,259 |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ස්කන්ධ ආයෝජන මත වෙළෙඳපොල ප්‍රත්‍යාගණන ලාභ | - | - | 122,747 | - | 122,747 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද ආයෝජන සඳහා අපේක්ෂිත ණය අලාභ | - | - | (1,939) | - | (1,939) |
| රඳවාගත් ලාභයට අරමුදල් මාරු කිරීම | - | - | (21,154,178) | 21,154,178 | - |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | 9,022,907 | 205,633,416 | (25,887,924) | 238,768,399 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 12 සිට 75 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **25,346,571** | 24,380,250 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **821,348** | 843,143 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **(3,974,618)** | 2,772,208 |
| උපලබ්ධි වූ විනිමය අලාභය | | **(9,065,597)** | (14,514,115) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,605,833** | 1,607,790 |
| | | **14,733,537** | 15,089,276 |
| **වියදම් පැහැදම්:** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **4,855,646** | 2,740,357 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **2,368,605** | 2,679,274 |
| සේවකයින්ට ගෙවීම් | | **6,765,420** | 5,245,612 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **3,380,162** | 4,823,628 |
| ගෙවන ලද බදු | | **1,100,219** | 902,864 |
| | | **18,470,052** | 16,391,735 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 46 | **(3,736,515)** | (1,302,459) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම | | **(2,487,565)** | (1,524,155) |
| මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන බැහැර කිරීම්/ නිදහස් කිරීම් | | **19,789** | - |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **127,584** | 487,927 |
| ණයකර ආයෝජන බැහැර කිරීම්/ නිදහස් කිරීම් | | **15,178** | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **10,284** | 3,088 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම | | **(12,340,173)** | (29,394,318) |
| | | **(14,654,903)** | (30,427,458) |
| **වියදම් පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම | | **5,592,252** | 211,673,611 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(263,842)** | 355,012 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(34,064,176)** | 60,818,636 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ අඩුවීම | | **(14,311)** | (155) |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **104,362** | 265,725 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **25,484** | 7,432 |
| රන් සංචිතයේ ශුද්ධ අඩුවීම | | **(19,060,015)** | - |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් | | **-** | 369,684 |
| | | **(47,680,246)** | 273,489,945 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **33,025,343** | (303,917,403) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **796,515,572** | 628,828,164 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(753,626,964)** | (583,552,128) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **42,888,608** | 45,276,036 |
| **වියදම් පැහැදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 47 | **233,216,924** | (220,649,290) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 48 | **23,010,511** | (38,460,908) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **256,227,435** | (259,110,198) |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **(213,338,827)** | 304,386,234 |
| **වියදම් පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(39,813,671)** | (28,666,576) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **321** | 321 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **-** | 261,625 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **14,227,097** | - |
| | | **(25,586,253)** | (28,404,630) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(187,752,574)** | 332,790,864 |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **(158,463,746)** | 27,571,002 |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **70,882,845** | 8,472,902 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **459,827,641** | 423,783,737 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 9 | **372,246,740** | 459,827,641 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 12 සිට 75 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2019 මාර්තු 29 වැනි දින අනුමත කරන ලදී.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරීත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමණාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධි විධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියා කිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මු.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

ජා.මු.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" හා ජා.මු.වා.ප්‍ර. 15 "ගණුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම" යන නව වාර්තාකරණ ප්‍රමිත අදාළ කර ගැණුනු ප්‍රථම මූල්‍ය ප්‍රකාශන කට්ටලය මෙය වන අතර, එම නිසා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වූ වෙනස්කම් සටහන 4 හි විස්තර කර ඇත.

### 2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

(1) රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.

(2) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.

(3) අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.

(4) සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 2.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලු අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

**2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය**

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

**2.6 හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

**2.7 සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

## 3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

**3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය (2018 ජනවාරි 1 දින සිට අදාල වේ)**

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි.

**3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 34 හි දැක්වේ.

**3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

පහත විස්තර කර ඇති ජා.මූ.වා.ප්‍ර. 9, ජා.මූ.වා.ප්‍ර. 15 හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට යොදාගත් අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පවතින අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

**4.1** ජා.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" ප්‍රමිතයේ අවශ්‍යතාවයන්ට අනුකූලව වෙනස්කරන ලද නව ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්ව බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට ඇත. බැංකුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තෙක් වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී ජා.ගි.ප්‍ර. 39 - "මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මිණුම් කිරීම" ප්‍රමිතියට අනුකූලව කටයුතු කර ඇත.

**වර්ගීකරණය හා මිනුම් කිරීමට කරන ලද වෙනස්කම්**

ස්කන්ධ උපකරණ හා ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ හැරුණු විට ජා.මූ.වා.ප්‍ර. 9 ට අනුව, සියලුම මූල්‍ය වත්කම්, වාර්තාකරණ ඒකකයෙහි වත්කම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ව්‍යාපාර ආකෘතිය හා ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ යන දෙකෙහිම සංයෝජනයක් මගින් තක්සේරු කළ යුතුය.

ජා.ගි.ප්‍ර. 39 හි වත්කම් මිනුම්කරණ කාණ්ඩයන් වන ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරන මූල්‍ය උපකරණ (FVTPL) විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය උපකරණ (AFS), කල් පිරෙන තෙක් තබාගෙන ඇති මූල්‍ය උපකරණ හා ණය හා ලැබීම් ආදිය පහත අයිතමයන්ගෙන් ප්‍රතිස්ථාපනය වී ඇත.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ ණය සුරැකුම්පත්, ප්‍රතිහඳුනාගැනීමේදී ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළින් ප්‍රතිචක්‍රණය කෙරේ.
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ ස්කන්ධ උපකරණ, ප්‍රතිහඳුනාගැනීමේදී ලාභ අලාභ අදායම් ප්‍රකාශය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්.

මූල්‍ය වගකීම් ගිණුම්කරණය, ජා.ගි.ප්‍ර. 39 හා බොහෝ දුරට සමාන වේ. බැංකුවේ මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය හා ජා.මූ.වා.ප්‍ර. 9 අදාළ කර ගනිමින් 2018 ජනවාරි 01 දිනට වූ ප්‍රමාණාත්මක බලපෑම, මූල්‍ය ප්‍රකාශ සටහන 8 හි අනාවරණය කර ඇත.

**හානිකරණ ගණනය කිරීම් වලට කරන ලද වෙනස්කම්**

ජා.මූ.වා.ප්‍ර. 9 හි වන ඉදිරි දැක්මක් මත පදනම් වන අපේක්ෂිත ණය අලාභ (ECL) ක්‍රමය මගින් ජා.ගි.ප්‍ර. 39 හි වූ දරණ ලද අලාභ ක්‍රමය (incurred loss model) ප්‍රතිස්ථාපනය කිරීම තුළින් බැංකුවේ මූල්‍ය වත්කම් හානිකරන ගිණුම්කරණය වෙනස්වීමට ලක් කර ඇත. බැංකුව ජා.මූ.වා.ප්‍ර. 9 හි හානිකරණ අවශ්‍යතාවයන් අදාළ කර ගත් ආකාරය පිළිබඳ විස්තරාත්මක පැහැදිළි කිරීමක් සටහන 5.3.4 හි අනාවරණය කර ඇත.

**සංක්‍රාන්තිය**

පහත විස්තර කර ඇති ඒවා හැරුණුකොට ජා.මූ.වා.ප්‍ර. 9 අදාළ කර ගැනීම මගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට සිදුකළ වෙනස්කම් අතීතයට බලපාන පරිදි සිදුකර ඇත.

- බැංකුව 2017 වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු ජා.මූ.වා.ප්‍ර. 9 හි විෂය පථය තුල නැවත ප්‍රකාශ කිරීමක් කර නැත. එමනිසා 2017 හි සංසන්දනාත්මක තොරතුරු ජා.ගි.ප්‍ර. 39 හි අවශ්‍යතාවයන්ට අනුව වාර්ථා කර ඇති අතර ඒවා 2018 හි තොරතුරු සමඟ සැසඳිය නොහැක.

  ජා.මූ.වා.ප්‍ර. 9 අදාළ කර ගැනීමෙන් 2017 හි තොරතුරු වලට වන වෙනස්කම් 2018 ජනවාරි 01 දිනට වන රඳවාගත් ඉපැයීම් වලට කෙළින්ම හඳුනාගෙන ඇති අතර එය මූල්‍ය ප්‍රකාශන වල සටහන 8 හි අනාවරණය කර ඇත.

- මූලික හඳුනාගැනීම සිදුකරන ලද දිනයෙහි පැවති කරුණු හා වාතාවරණයන් මත පදනම්ව පහත ඇස්තමේන්තු සිදු කර ඇත.
  - මූල්‍ය වත්කමේ ව්‍යාපාර ආකෘතිය නිර්ණය කිරීම
  - බැංකුව විසින් මුදල් නීති පනතේ 105 A කොටස අනුව කරන ලද වෙළදාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නම් කිරීම.

**4.2 ජා.මූ.වා.ප්‍ර. 15 - ගණුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම**

ජා.මූ.වා.ප්‍ර. 15 මගින් ආදායම, කොපමණ හා කිනම් අවස්ථාවකදී හඳුනාගන්නවාද යන්න නිර්ණය කිරීම සඳහා පුළුල් රාමුවක් සකස් කර ඇත. එය ජා.ගි.ප්‍ර. 18 - අයභාරය හා ජා.ගි.ප්‍ර. 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත් හා ඒකාබද්ධ නිර්වචනයන් ප්‍රතිස්ථාපනය කරයි. කෙසේ වෙතත් ජා.මූ.වා.ප්‍ර. 15 අනුගමනය කිරීම මගින් ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් තුළින් ඇතිවන ගාස්තු, කොමිස් මුදල් හා ඒහා බැඳි බැංකුව විසින් හඳුනාගත් වත්කම් හා වගකීම් වල ප්‍රමාණය හා කාලය මත බලපෑමක් ඇති නොකරයි. එම නිසා මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම තුළින් කිසිදු බලපෑමක් ඇති වී නැත.

**5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සටහන 4හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් හැරුණුකොට පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව සෑම කාලයකම යොදාගෙන ඇත.

**5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්**

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **128.8113** | 119.3796 |
| කැනේඩියානු ඩොලර් 1 | **134.0153** | 121.8598 |
| යුරෝ 1 | **209.5593** | 183.1353 |
| ජපන් යෙන් 1 | **1.6661** | 1.3580 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **253.5111** | 217.1608 |
| ස්ටර්ලින් පවුම් 1 | **233.0792** | 206.5221 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **182.7499** | 152.8548 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **26.5988** | 23.4847 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

**5.2 සාධාරණ අගය මිනුම් කිරීම**

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 53 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරික්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

| | |
|---|---|
| පළමුවන මට්ටම | - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන් |
| දෙවන මට්ටම | - සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන් |
| තෙවන මට්ටම | - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්. |

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධුරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

### 5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

#### 5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව එක් එක් මූල්‍ය වත්කම් සඳහා වන මිනුම් කිරීමේ පදනම 2018 ජනවාරි 01 දින සිට අදාළ ප්‍රතිපත්ති වලට පසුව විස්තර කර ඇත. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

#### 5.3.2 (අ) වර්ගීකරණය

2018 ජනවාරි 01 දින සිට අදාළ වන ප්‍රතිපත්ති

**මූල්‍ය වත්කම්**

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුල රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුල රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුවයි.**

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොළිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුල ගෙවීමට ඇති මුල් මුදල හා බැඳී ණය අවධානමත් අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත් මුදලේ කාලීන වටිනාකමෙහි අගයත් "මූලික මුදල මත වන පොළිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකඟතාවයකදී පොළියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකඟතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

**ප්‍රතිවර්ගීකරණය**

මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

**5.3.2. (ආ) වර්ගීකරණය**

2018 ජනවාරි 01 දිනට පෙර අදාළ වූ ප්‍රතිපත්තිය

**මූල්‍ය වත්කම්**

බැංකුව විසින් මූල්‍ය වත්කම් ජා.ගි.ප්‍ර. 39 යටතේ පහත පරිදි වර්ගීකරණය කොට තිබුණි.

- ණය සහ ලැබීම්
- කල් පිරෙන තෙක් තබාගෙන ඇති
- විකිණීම සඳහා තබාගෙන ඇති
- ලාභ අලාභ තුළින් සාධාරණ මිලට සහ ඒ තුළ ඇතුළත්
    - වෙළඳාම් සඳහා තබාගෙන ඇති හෝ
    - ලාභ අලාභ තුළින් සාධාරණ මිලට නම් කරන ලද මූල්‍ය වත්කම්

**මූල්‍ය බැරකම්**

බැංකුව විසින් සිය මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කර තිබුණි.

**5.3.3. ඉවත් කිරීම්**

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශවයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සම්මුච්චිත ලාභය හෝ අලාභය යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

2018 ජනවාරි 01 දින සිට, විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොළිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරැකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

**5.3.4. (අ) මූල්‍ය වත්කම් හානිකරණය (2018 ජනවාරි 01 දින සිට අදාළ වන ප්‍රතිපත්තිය)**

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ අදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ.

බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/ BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ “පළමු අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය උපකරණ “දෙවන අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) “තෙවන අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

**ණය පැහැර හරීමේ සම්භාවිතාව**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශවයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලුම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශවයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලුම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මඟහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය**

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීම**

යම් කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිත දත්ත යොදා ගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම**

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශවයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැළකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

**අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

**ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් :**

අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.

**විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් :**

මූල්‍ය තත්ව ප්‍රකාශය තුල මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.

**ණය ඇපකර ගිවිසුම :** වෙන්කිරීමක් ලෙස,

**ලියා හැරීම**

ණය දීමක් හෝ ණය සුරැකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ "මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ" යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

**5.3.4 (ආ) මූල්‍ය වත්කම් හානිකරණ 2018 ජනවාරි 1 ට පෙර යොදගත් ප්‍රතිපත්ති**

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් වාර්තාකරණ දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයෙන් වට්ටම් කළ පසු ලැබෙන වර්තමාන

අගයන් අතර වෙනස මගිනි. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් තනිව හෝ සාමූහිකව හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර, එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමුහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වු සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, “ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්” යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ලාභය හෝ පාඩුව තුළ දරන ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය “උපලබ්ධි නොවු මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)” ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය “මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)” ලෙස වාර්තා කරනු ලැබේ.

**5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්**

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරිම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

**5.6 මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට**

ජා.මු.ප්‍ර. 39 යටතේ ණය හා ලැබීම් සහ කල්පිරෙන තෙක් රඳවාගත් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ ක්‍රමක්‍ෂය පිරිවැයට වූ උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති අතර ඊට කල් පිරෙන තෙක් තබා ගැනීමට ධනාත්මක අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරීමක් ඇති ආයෝජන සහ බැංකු/රජය සඳහා දෙන ලද ණය ඇතුළත් වේ. කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

**5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්‍ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි

සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශන මත ඉවත් කල විට පමණක් අදායම් ප්‍රකාශනය තුළ ගලපනු ලබයි.

### 5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මූ.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

### 5.9 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 47 සහ සටහන් 48 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

### 5.10 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනිමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

**5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්‍ෂය පිරිවැයට හඳුනාගනී.

**5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරන අතර මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**5.13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

**5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත ඍජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

**5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

**5.16 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**5.17 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මූ.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මගින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමග වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

**5.18 රන්**

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

**5.19 තොග**

**5.19.1 මුදල් තොග**

බැංකුවේ තොගය තුල, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**5.19.2 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

**5.20 දේපළ, පිරියත සහ උපකරණ**

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් සමුච්චිත ක්‍ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේ දී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

**5.21 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමගින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක එලදායී ජීව කාලයක් තුළ සෘජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**5.22 අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**5.23 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඉඟියක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ. හාණිකරණ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**5.24 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**5.25 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**5.26 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 34 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**5.27 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කර තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 34 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, සම්පූර්ණ ආයුගණන තක්සේරුවක් කල අවස්ථාවකදී පමණක් සංශෝධනය කරනු ලැබේ.

**5.28 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

**5.29 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**5.30 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ විශ්වසනීය ලෙස අගය කළ නොහැකි සිදුවීමක් හෝ වර්තමාන බැඳීමක් මගින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන පැන නැගිය හැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙළිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය**

**5.31 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්‍ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**5.31.1 පොලී ආදායම් සහ වියදම්**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන, සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත්, අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**5.31.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**5.31.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම්, බැහැර කිරීමේදී දරණ ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**5.31.4 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**5.31.5 ක්‍රියාත්මක කල්බදු**

ක්‍රියාත්මක කල්බදු මත වන සියලු කල්බදු කුලිය සරල මාර්ග ක්‍රමය අනුව කල්බදු කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**5.31.6 ආදායම් බදු වියදම**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වගන්තිය, 2006 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 7 බී (xvi) වගන්තිය සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**5.32 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ජා.මූ.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන "ඍජු ක්‍රමය" භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ඉහත නිර්වචනය කර ඇති පරිදි මුදල් හා මුදල් සමානයන් යන්නට මුදල්/ගෙවීම් නියෝග ශුද්ධ ගලායාම් ඇතුලත් වේ.

## 6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකුව බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**6.1 ජා.මූ.වා.ප්‍ර. 16 - කල්බදු**

2016 ජනවාරි මස දී, IASB විසින් කල්බදු ගිණුම් තැබීම සඳහා නව ප්‍රමිතියක් ලෙස ජා.මූ.වා.ප්‍ර. 16 නිකුත් කරන ලදී. නව ප්‍රමිතිය මඟින් කල්බදු හිමියා වෙනුවෙන් ගිණුම් තැබීමෙහි සැලකිය යුතු වෙනසක් සිදුකර නොමැත. කෙසේවෙතත්, කල්බදු ගැනුම්කරුවන් හට තම බොහොමයක් කල්බදු අනුරූප පාවිච්චි කිරීමේ අයිතියද සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්හි කල්බදු වගකීම් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ. කල්බදු ගැනුම්කරුවන් සියලුම හඳුනාගත් කල්බදු සඳහා එක් ආදර්ශකයක් යොදා ගත යුතු නමුත් කෙටිකාලීන කල්බදු සහ අඩු අගයන්ගෙන් යුත් වත්කම්වල කල්බදු හඳුනා නොගැනීමට විකල්පයක් පවතිනු ඇත. සාමාන්‍යයෙන් හඳුනාගත් කල්බදු සඳහා වන ලාභ සහ අලාභ ගිණුම්කරණ රටාව, වර්තමාන

මූල්‍ය කල්බදු ගිණුම්ගත කරන ආකාරයට සමාන වන අතර එහි දී පොලී වියදම සහ ක්ෂය වියදම යන කොටස් දෙක ද ආදායම් ප්‍රකාශය තුළ වෙනම හඳුනා ගනු ලැබේ.

ජා.මු.වා.ප්‍ර. 16, 2019 ජනවාරි 01 වන දිනට හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්වලට බලාත්මක වේ. නව ආදායම් ප්‍රමිතිය වන ජා.මු.වා.ප්‍ර. 15 ද මෙම කල්බදු ප්‍රමිතිය සමගම එකම දින ප්‍රායෝගිකව භාවිත කිරීම ආරම්භ කිරීමට යටත්ව ජා.මු.වා.ප්‍ර. 16 කලින් ක්‍රියාත්මක කිරීමට අවසර ඇත. කල්බදු ගැනුම්කරුවන් විසින් ජා.මු.වා.ප්‍ර. 16 මුළුමනින් ම හෝ වෙනස් කරන ලද අතීතානුයෝගී ගැලපුමක් වශයෙන් යොදා ගත යුතුය. බැංකුව ජා.මු.වා.ප්‍ර. 16 කලින් යොදාගැනීමක් අපේක්ෂා නොකරන අතර වර්තමානයේ එහි බලපෑම අගයමින් සිටී.

## 7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

### 7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඕස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ඝෛවරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමග පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

## 8. සංක්‍රාන්ති හෙළිදරව් කිරීම

ජා.මු.වා.ප්‍ර. 9 අදාළ කර ගැනීම මඟින් බැංකුවේ මූල්‍ය තත්ව, රඳවාගත් ඉපැයීම් සහ අනිකුත් සංචිතවලට වූ බලපෑම (අපේක්ෂිත ණය අලාභ ඇතුළත්ව) පහත අනාවරණය කිරීම තුළින් පෙන්වා ඇත.

**8.1 ජා.ගි.ප්‍ර. 39 යටතේ වූ සාධාරණ අගයන්, 2018 ජනවාරි 01 දිනට ජා.මු.වා.ප්‍ර. 9 යටතේ වාර්තාකල ශේෂයන්ට සැසඳුම**

| වත්කම්/ වගකීම් | සටහන | ජා.ගි.ප්‍ර 39 | | ප්‍රති-වර්ගීකරණය | ප්‍රති-මැනීම | ජා.මු.වා.ප්‍ර 9 | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගීකරණය | ප්‍රමාණය (රු. 000) | | | වර්ගීකරණය | ප්‍රමාණය (රු. 000) |
| මුදල් සහ මුදල් සමානයන් | | HTM | 459,827,641 | - | - | AC | 459,827,641 |
| අඩුකලා: අපේක්ෂිත ණය අලාභ | 8.1.1 | | - | - | (50,505) | | (50,505) |
| | | | | | | | 459,777,136 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | | FVTPL | 45,264,376 | - | - | FVTPL | 45,264,376 |
| වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | | | - | - | - | FVOCI | 566,228,935 |
| විකිණීම සඳහා පවතින ආයෝජන | | AFS | 566,228,935 | - | - | | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | FVTPL | 4,940,455 | - | - | FVTPL | 4,940,455 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | | HTM | 126,842,946 | - | - | AC | 126,842,946 |
| අඩුකලා: අපේක්ෂිත ණය අලාභ | 8.1.1 | | - | - | (3) | | (3) |
| | | | | | | | 126,842,943 |
| අනෙකුත් ලැබිය යුතුදෑ | | L&R | 3,665,700 | - | - | AC | 3,665,700 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හිමිකාරිත්වය) | 8.1.2 | HTM | 9,704,962 | 9,704,962 | 49,521 | FVOCI | 9,754,483 |
| නැවත විකිණීම සඳහා මිලදී ගත් සුරැකුම්පත් | | HTM | 22,375,124 | - | - | AC | 22,375,124 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | L&R | 199,800,871 | - | - | AC | 199,800,871 |
| බැංකු සඳහා දෙන ලද ණය | | L&R | 223,702 | - | - | AC | 223,702 |
| අඩුකලා : අපේක්ෂිත ණය අලාභ | 8.1.1 | | - | - | (642) | | (642) |
| | | | | | | | 223,060 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | | | - | - | 1,237,826 | FVOCI | 1,278,921 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | 8.1.3 | AFS | 41,095 | - | - | | - |
| අනෙකුත් වත්කම් | | HTM | 12,882,470 | - | - | AC | 12,882,470 |
| අඩුකලා : අපේක්ෂිත ණය අලාභ | 8.1.1 | | - | - | (8) | | (8) |
| | | | | | | | 12,882,462 |
| සංචිත | | | 77,352,239 | - | 1,235,775 | | 78,588,014 |

**8.1.1** ජා.මු.වා.ප්‍ර. 9 යොදාගැනීමත් සමඟ බැංකුවේ හානිකරණ ආකෘතිය වෙනස් වූ අතර ඒ අනුව ක්‍රමක්ෂය පිරිවැය සහ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද සියළුම වත්කම් අපේක්ෂිත ණය අලාභ ගණනයට යටත් වේ.

**8.1.2** විවිට වෙළඳපොල මෙහෙයුම් සඳහා පැවැති බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් හිමිකාරිත්වය ජා.ගි.ප්‍ර. 39 යටතේ "කල්පිරෙන තෙක් පවත්නා" යටතේ වර්ගීකරණය කෙරුණි. එය ජා.මු.වා.ප්‍ර. 9 සඳහා වූ සංක්‍රාන්තිය යටතේ භාන්ඩාගාර බිල්පත් හිමිකාරිත්වයේ ව්‍යාපාරික ආකෘතිය සැලකිල්ලට ගෙන අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ලෙස ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

**8.1.3** බැංකුව සතු මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන ජා.ගි.ප්‍ර. 39 යටතේ කල්පිරෙන තෙක් තබාගෙන ඇති ආයෝජන ලෙස පැවතුණි. ජා.මු.වා.ප්‍ර. 9 සඳහා වූ සංක්‍රාන්තිය අනුව මෙය අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ලෙස ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

**8.2 ජා.මු.වා.ප්‍ර. 9 සඳහා වූ සංක්‍රාන්තිය මගින් රඳවාගත් ඉපැයුම් හා අනෙකුත් සංචිත මත බලපෑම**

| | අනිකුත් සංචිත රු. 000 | රඳවාගත් ඉපැයුම් රු. 000 |
|---|---|---|
| ජා.ගි.ප්‍ර. 39 යටතේ 2017.12.31 දිනට අවසාන ශේෂය | 42,332,740 | 25,996,592 |
| ජා.මු.වා.ප්‍ර. 9 යටතේ ප්‍රතිවර්ගීකරණය මත සංක්‍රාන්ති ගැලපීම් (සටහන 8.2.1) | 1,287,347 | - |
| ජා.මු.වා.ප්‍ර. 9 යටතේ අපේක්ෂිත ණය අලාභ මත සංක්‍රාන්ති ගැලපීම් (සටහන 8.2.2) | 65,588 | (117,160) |
| ජා.මු.වා.ප්‍ර. 9 යටතේ 2018.01.01 දිනට ආරම්භක ශේෂය | **43,685,675** | **25,879,432** |

**8.2.1 ප්‍රතිවර්ගීකරණය හේතුවෙන් ජා.ගි.ප්‍ර. 39 සහ ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ ධාරන අගයන් සැසඳුම**

| වර්ගීකරණය | ජා.ගි.ප්‍ර. 39 යටතේ ධාරණ අගය රු. 000 | ප්‍රති මැනීම රු. 000 | ජා.මූ.වා.ප්‍ර 9 යටතේ ධාරණ අගය රු. 000 |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහබැංකු භාණ්ඩාගාර බිල්පත් හිමිකාරිත්වය | 9,704,962 | 49,521 | 9,754,483 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | 41,095 | 1,237,826 | 1,278,921 |
| | **9,746,057** | **1,287,347** | **11,033,404** |

**8.2.2. ජා.ගි.ප්‍ර. 39 යටතේ සමාහාර ආරම්භක හානිකරන වෙන්කිරීම්, ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ අපේක්ෂිත ණය වෙන්කිරීම් සමග සැසඳුම**

| | 2017.12.31 දිනට ජා.ගි.ප්‍ර. 39 යටතේ හානිකරණ රු. 000 | ප්‍රතිමැනීම රු. 000 | 2018.01.01 දිනට ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ හානිකරණ රු. 000 |
|---|---|---|---|
| මුදල් හා මුදල් සමානයන් | - | 50,505 | 50,505 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | - | 65,588 | 65,588 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | 3 | 3 |
| බැංකු සඳහා දෙන ලද ණය | - | 642 | 642 |
| අනෙකුත් වත්කම් | 151,674 | 8 | 151,682 |
| අසම්භාව්‍ය වගකීම් -ණය ඇපකරු යෝජනා ක්‍රමය | 12,600 | 414 | 13,014 |
| | **164,274** | **117,160** | **281,434** |

**9. මුදල් සහ මුදල් සමානයන්**

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | **117,035,257** | 16,518,603 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | **92,862,673** | 269,193,626 |
| එක්දින ස්ථාපනය කිරීම් | **162,300,186** | 173,979,333 |
| මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී | **48,624** | 136,079 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | **372,246,740** | 459,827,641 |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.1) | **(71,564)** | - |
| **එකතුව** | **372,175,176** | 459,827,641 |

**9.1 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය**

| | 2018 රු. 000 |
|---|---|
| අදියර 1 | |
| ජනවාරි 1 දිනට ශේෂය | **-** |
| ජා.මූ.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | **50,505** |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **50,505** |
| වර්ෂය සඳහා අය කිරීම | **21,059** |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **71,564** |

**10. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්**

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් (සටහන 10.1) | **37,467,239** | 29,988,753 |
| - රන් (බෙදා වෙන් කළ නොහැකි) | **-** | 15,275,623 |
| | **37,467,239** | 45,264,376 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති/විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **694,876,394** | 566,228,935 |
| | **694,876,394** | 566,228,935 |
| විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව | **732,343,633** | 611,493,311 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 10.2) | **63,649** | - |

**10.1** ලාභ හෝ පාඩුව තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද විදේශීය සුරැකුම්පත් ආයෝජන තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2016 වසර තුළදී ලෝක බැංකුව මගින් පාලනය කරනු ලබන සංචිත කළමනාකරණය සහ උපදේශන වැඩසටහන (RAMP)හි කරන ලද

ආයෝජන ඇතුළත් වේ. එම RAMP ආයෝජනයේ 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මි. 37,467.24 වේ (2017 - රු.මි. 29,988.75).

**10.2 වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2018<br>රු. 000 |
|---|---|
| අදියර 1 | |
| ජනවාරි 1 දිනට ශේෂය | - |
| ජා.මූ.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | **65,588** |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **65,588** |
| වර්ෂය තුළදී ආපසු හැරවුම් | **(1,939)** |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **63,649** |

## 11. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**11.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2018 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම්<br>රු. 000 | වගකීම්<br>රු. 000 | කාල්පනික අගය<br>රු. 000 | වත්කම්<br>රු. 000 | වගකීම්<br>රු. 000 | කාල්පනික අගය<br>රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | - | **13,590,145** | **203,257,715** | 4,939,919 | 3,403,868 | 228,553,847 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | **750** | - | **548,250** | 536 | - | 132,773 |
| අන්තර්ගත ව්‍යුත්පන්න - විනිමය විකල්පයන් (Embedded Derivatives - Currency Options) | - | **466,315** | **5,299,747** | - | 1,244,581 | 13,374,795 |
| එකතුව | **750** | **14,056,460** | **209,105,712** | 4,940,455 | 4,648,449 | 242,061,415 |

**11.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප, ඉදිරි විදේශ විනිමය ගිවිසුම්, සහ පොලී අනුපාත හුවමාරුවලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමග හුවමාරු ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රටතුලට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**11.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුමය.

**11.4** කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමඟ එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**11.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**11.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

## 12. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම (සටහන 12.1) | **217,126** | 677,131 |
| ජා.මූ.අ. පංගුව (සටහන 12.2) | **146,732,242** | 125,996,456 |
| ජා.මූ.අ. තැන්පතු (සටහන 12.3) | **199,965** | 164,565 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | **268,456** | - |
| ජා.මූ.අ. පංගුව මත ලැබිය යුතු පොළිය | **9,667** | 4,794 |
| අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 12.4) | **(4)** | - |
| | **147,427,452** | 126,842,946 |

### 12.1 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. විශේෂ වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

### 12.2 ජා.මූ.අ. පංගුව

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන ආයකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තිරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මු අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 25 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මඟින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

**i.)** **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

**ii.)** **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

**iii.)** **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv.)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

### 12.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

### 12.4 ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2018<br>රු. 000 |
|---|---|
| අදියර 1 | |
| ජනවාරි 1 දිනට ශේෂය | - |
| ජා.මූ.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | 3 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | 3 |
| වර්ෂය සඳහා අයකිරීම් | 1 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4** |

### 13. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

| | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 43,443,802 | 9,704,962 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,542,796 | - |
| ලැබිය යුතු පොළී | 44,559 | - |
| | 45,031,157 | 9,704,962 |

## 14. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **229,333,000** | 22,359,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී | **121,409** | 16,124 |
| | **229,454,409** | 22,375,124 |

## 15. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

## 16. බැංකුවලට දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ළෙදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **26,951** | 29,146 |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **-** | 28,254 |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **13,122** | 49,539 |
| - අනෙකුත් | **8,345** | 14,211 |
| නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **12,358** | 41,382 |
| - අනෙකුත් | **16,403** | 35,492 |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **18,830** | 24,330 |
| පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය (අදියර II) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **108** | 1,348 |
| අඩුකළා: | | |
| හානිකරණය සඳහා වෙන්කිරීම් (සටහන 16.1) | **(154)** | - |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **95,963** | 223,702 |

### 16.1 අඩමාන ණය සඳහා වෙන් කිරීමේ චලනය

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | **-** | 27,302 |
| වර්ෂය තුළ ආපසු හැරවුම් | **-** | (27,302) |
| බැංකු වලට දුන් ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 16.2) | **154** | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **154** | - |

### 16.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2018 | | |
|---|---|---|---|
| | අදියර 1 රු. 000 | අදියර 2 රු. 000 | එකතුව රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | - | - | - |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | 26 | 616 | 642 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | 26 | 616 | 642 |
| වර්ෂය තුළදී ආපසු හැරවුම් | (11) | (477) | (488) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **15** | **139** | **154** |

## 17. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

### 17.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2018 කොටස් ගණන | 2018 ධාරණ අගය රු.000 | 2017 කොටස් ගණන | 2017 ධාරණ අගය රු.000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,950,000** | 417,128 | **2,950,000** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **-** | - | **3,500,000** | 3,500 |
| ලංකා ෆයිනැන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **225,000** | 1,396 | **225,000** | 2,250 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | 963,355 | **48,244** | 5,845 |
| | | | 1,381,879 | | 41,095 |

**17.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2018 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත. එම ආයෝජිත සමාගම්වල සාධාරණ අගය, බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන දිනට ආයෝජිත සමාගම් විසින් හෙළිදරව් කරන ලද විගණනය නොකල නවතම මූල්‍ය වාර්තාවල සඳහන් කොටසකට ශුද්ධ වත්කම් අගය අනුව ගණනය කරනු ලැබේ. ඒ අනුව ආයෝජිත සමාගම්වල පහත දැක්වෙන දිනයන්ට පැවති කොටසකට ශුද්ධ වත්කම් අගය ඉහත ගණනයට භාවිතා කරන ලදී.

| | |
|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | - 2018 නොවැම්බර් 30 |
| ලංකා ෆයිනැන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | - 2018 ඔක්තෝබර් 31 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | - 2018 දෙසැම්බර් 31 |

## 18. අනිකුත් වත්කම්

| **මූල්‍ය වත්කම්** | **2018** රු. 000 | **2017** රු. 000 |
|---|---|---|
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **7,955,537** | 6,730,548 |
| අඩුකළා: වත්කම් මත හානිකරණ වෙන්කිරීම් (සටහන 18.1) | **(163,144)** | (151,674) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **7,792,393** | 6,578,874 |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | **5,780,754** | 5,036,028 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **18,785** | 54,490 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **126,086** | 143,276 |
| | 13,718,018 | 11,812,668 |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **1,065,287** | 1,069,802 |
| | **14,783,305** | 12,882,470 |

### 18.1 වත්කම් මත හානිකරණ ගාස්තුවල චලනය

| | 2018 | | | 2017 |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 3 | එකතුව | |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | - | 151,674 | 151,674 | 139,131 |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | 8 | - | 8 | - |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | 8 | 151,674 | 151,682 | 139,131 |
| වර්ෂය සඳහා අයකිරීම් | 84 | 11,378 | 11,462 | 12,543 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **92** | **163,052** | **163,144** | **151,674** |

## 19. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්ථනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 20. තොග

| | **2018** රු. 000 | **2017** රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **2,495,222** | 4,442,014 |
| සංසරණය සඳහා ඇති කාසි | **2,194,055** | 1,850,723 |
| මාර්ගස්ථ කාසි | **613,432** | - |
| මාර්ගස්ථ නෝට්ටු | **1,253,694** | 568,716 |
| | **6,556,403** | 6,861,453 |
| අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **6,511,403** | 6,816,453 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **57,318** | 58,881 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **214** | 199 |
| **පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය** | **6,568,935** | 6,875,533 |

2018 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 3,999.00 (2017 - රු.මි. 2,850.82) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස සටහන් කර ඇත.

## 21. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2018 | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 16,743,200 | 1,567,670 | 1,305,057 | 614,563 | 843,365 | 55,436 | 28,206 | **21,157,497** | 20,920,014 |
| එකතු කිරීම් | - | 10,272 | 17,537 | - | 64,328 | 1,303 | 11,074 | **104,514** | 267,129 |
| බැහැර කිරීම් | (734,278) | (1,278) | (11,672) | (13,300) | (12,143) | - | - | **(772,671)** | (29,646) |
| මාරු කිරීම්/ලියා හැරීම | 106 | - | 450 | - | - | - | (22,958) | **(22,402)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | 16,009,028 | 1,576,664 | 1,311,372 | 601,263 | 895,550 | 56,739 | 16,322 | **20,466,938** | 21,157,497 |
| **ක්ෂය** | **ඉඩම් සහ ගොඩනැගිලි** | **පිරියත සහ පිරියත උපකරණ** | **ලී බඩු සහ උපකරණ** | **මෝටර් වාහන** | **පරිගණක** | **අනිකුත්** | **නොනිමි ඉදිකිරීම්** | **එකතුව 2018** | **එකතුව 2017** |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 251,534 | 860,947 | 863,095 | 410,441 | 774,790 | 36,173 | - | **3,196,980** | 2,787,624 |
| වර්ෂය සඳහා ක්ෂය | 195,031 | 78,357 | 80,725 | 25,923 | 40,289 | 1,126 | - | **421,451** | 434,558 |
| බැහැර කිරීම් | (70,478) | (663) | (10,866) | (13,300) | (12,040) | - | - | **(107,347)** | (25,202) |
| දෙසැම්බර් 31 දිනට අගය | 376,087 | 938,641 | 932,954 | 423,064 | 803,039 | 37,299 | - | **3,511,084** | 3,196,980 |
| ශුද්ධ පොත් අගය | 15,632,941 | 638,023 | 378,418 | 178,199 | 92,511 | 19,440 | 16,322 | **16,955,854** | 17,960,517 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2016 දෙසැම්බර් 31 දිනට එෆ්.එම්. වැලුවර්ස් විසින් සිදු කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි.

2018 මැයි මස දී බැංකුවේ දේපලක් වූ නිව්යෝර්ක් සහ බ්‍රසිල් දේපල ඒවායේ පිරිවැයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට පවරන ලදී.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 104.18 (2017 - රු.මිලියන 265.73) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2018 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 1,611.38 ක් වේ (2017 රු. මිලියන 1,598.17).

නොනිමි ඉදිකිරීම් තුළ වූ රු. මිලියන 22.40 ක් මූල්‍ය වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශයට වියදමක් ලෙස අය කරන ලදී.

## බැංකුවේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හා කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලිවල තක්සේරු තොරතුරු

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් |
|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 12,500,000 | 9,000 - 15,000 | - | - | - |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,000,000 | 40% | 16.66 |
| ලොයිඩ්ස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,750,000 | 40% | 16.66 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 14,000,000 | - | 7,500,000 | 35% | 16.66 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,500,000 - 3,500,000 | 2,500 - 9,500 | - | - | - |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 7,500,000 | 3,500 - 8,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,500,000 - 3,000,000 | 4,000 - 7,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 100,000 - 500,000 | 2,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,000,000 | 2,000 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 200,000 | 4,500 - 10,000 | - | - | - |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 3,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 5,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 1,500 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 10,000 | - | - | - |

### ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය

| | ධාරණ අගය 2018 රු. 000 | ධාරණ අගය 2017 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **8,930,375** | 8,976,339 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,449,206** | 7,250,954 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **253,360** | 264,373 |
| | **15,632,941** | 16,491,666 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 7,796.82 ක් වේ (2017 - රු.මි. 8,607.88).

### 22. අස්පෘෂ්‍ය වත්කම්

| පරිගණක මෘදුකාංග : | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **957,204** | 949,772 |
| එකතු කිරීම් | **25,484** | 7,432 |
| දෙසැම්බර් 31 දිනට අගය | **982,688** | 957,204 |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට අගය | **876,581** | 793,452 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **75,670** | 83,129 |
| දෙසැම්බර් 31 දිනට අගය | **952,251** | 876,581 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **30,437** | 80,623 |

වර්ෂය තුල දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 25.48 (2017 - රු.මි. 7.43) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රම ක්ෂය කරන ලද එහෙත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 927.38 (2017 රු. මි. 636.58)ක් වේ.

## 23. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **16,864,115** | 8,237,633 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **2,437,045** | 1,911 |
| | **19,301,160** | 8,239,544 |

## 24. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, ඉරානය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය, මියන්මාරය සහ මාලදිවයින එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් 1.45% ක සිට 2.28% ක් දක්වා වූ පොළියක් ඇ.එ.ජ. ඩොලර් සඳහා (2017 දී එය 0.63% ක් සහ 1.28% ක් විය) ශුද්ධ ණය හිමියන් වෙත දෛනික පරිශේෂ ශේෂයන් මත 2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ගෙවන ලදී.

වාර්තා කරන දිනයන්හිදී ආසියානු නිශ්කාෂණ සංගමය වෙත ගෙවිය යුතු ප්‍රමාණය ශේෂයන්හි දක්වා ඇත.

## 25. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
|---|---|---|
| පොළිය දරන ණය | **181,318,765** | 116,996,460 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **100,253,563** | 86,086,013 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **67,352,253** | 57,467,696 |
| පංගු බැරකම් | **68,063,665** | 58,445,100 |
| | **235,669,481** | 201,998,809 |
| | **416,988,246** | 318,995,269 |

**25.1** පොලී දරණ ණය, ජා.මු. අරමුදලෙන් ලබාගන්නා විස්තිර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ.

**25.2** **විස්තිර්ණ ණය පහසුකම** යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යයාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මු.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මු.අ. 2016 ජුනි හිදි විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මු. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තිර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.2), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.4) සහ පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජූලි, දෙසැම්බර් සහ 2018 ජුනි යන මාස වලදී ලබාදී ඇත. පස්වන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. මිලියන 1,014 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. ඉතිරි මුදල වසරක් ඇතුළත වාරික දෙකකින් බෙදා හැරීමට නියමිතය. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොලී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොලී අනුපාතයට (වර්තමානයේ දී වාර්ෂිකව 0.05%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

| | සඵල පොලී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
|---|---|---|---|---|
| විස්තීර්ණ ණය පහසුකම (EFF) | **1.103** | **2028** | **181,318,765** | 116,996,460 |
| පොලී දරණ මුළු ණය මුදල | | | **181,318,765** | 116,996,460 |

**25.3** **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපුරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 12 වැනි

සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**25.4** ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

**25.5** පංගු බැරකම: අංක 12.2 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 26. අනෙකුත්

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (සටහන 26.1) | **1,577,068** | 2,056,009 |
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 26.2) | **5,968,519** | 7,588,467 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 26.3) | **6,242,573** | 8,094,403 |
| DST විශේෂ ඩොලර් ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (සටහන 26.4) | **-** | 109,808 |
| DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (සටහන 26.5) | **-** | 189,196 |
| DST පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම (සටහන 26.6) | **-** | 10,664 |
| DST ඩොලර් ගිණුම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය (සටහන 26.7) | **91,374,950** | 44,648,475 |
| DST විශේෂ ඩොලර් ගිණුම් 2 (සටහන 26.8) | **29,493,915** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **73,908** | 1,398,867 |
| | **134,730,933** | 64,095,889 |

### 26.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය

ඇ.එ.ජ.ඩො. මිලියන 214.20 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසුමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2018 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 4.82 ක් බෙදා හරින ලද අතර 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩොලර් මිලියන 8.63 කි.

### 26.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2018 වර්ෂය තුළදී ඇ.එ.ජ ඩොලර් මිලියන 16.99 ක් බෙදාහරින ලදී. 2018 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 32.66 කි.

### 26.3 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2018 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 18.80 ක් බෙදාහරින ලද අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 34.16 කි

### 26.4 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණය

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපීය ආයෝජන බැංකුව අතර 2013 නොවැම්බර් 13 වන දින ඇති වූ මූල්‍ය ගිවිසුමකි. මෙම පහසුකම් එකඟතාවය අනුව, ශ්‍රී ලංකා රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තෝරා ගැණිනි. ඒ අනුව, හුදෙක් ලැබෙන ණය මුදල් තැන්පත් කිරීමට සහ එම මුදල් ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ පරමාර්ථය ඇතිව පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

ඉහත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණයෙහි දෙවන වාරිකය 2015 ජූලි 09 වන දින යුරෝ වලින් ලැබුණි. ඒ අනුව හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුණු මුදල් ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි.

2018 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.71 ක් බෙදා හරින ලද අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ශේෂයක් නොතිබුණි.

### 26.5 DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය

මෙම ණය පහසුකම් ගිවිසුම Agence Francaise de Development සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2014 සැප්තැම්බර් 29 වන දින අත්සන් කර ඇත. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ

ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2015 සැප්තැම්බර් 14 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 5 ක් ලැබුණි. 2018 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.24 ක් බෙදා හරින ලද අතර 2018 දෙසැම්බර් 31 වන විට ශේෂයක් නොතිබුණි.

### 26.6 පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ඩොලර් ගිණුම

හැකියාවන් ප්‍රවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් NORAD වෙතින් ලැබෙන අරමුදල් ලබා ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම විශ්ව විද්‍යාලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා මුදල් නැවත ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇ.එ.ජ. ඩොලර් හෝ රුපියල් වශයෙන්, ගිණුමෙන් අරමුදල් ලබා ගැනීමට පේරාදෙණිය විශ්ව විද්‍යාලය අපේක්ෂා කරයි. ඉහත සඳහන් ගිණුමට 2018 වසර තුළ, ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.16ක් ලැබී ඇති අතර එකතුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.23ක් වන මාරු කිරීම් 2ක් DST ගිණුමට මාරු කරන ලදී. 2018 දෙසැම්බර් 31 වන විට ශේෂයක් නොතිබුණි.

### 26.7 DTS ඩොලර් ගිණුම - හම්බන්තොට වරාය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ China Merchant Port Holdings Co Ltd අතර හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු පැවරීම වෙනුවෙන් ලද මුදල් බැර කර ආරම්භ කල මෙම විශේෂ ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබයි. 2017 දෙසැම්බර් 22 දින මූලිකව ලත් මුදල වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 292.1ක මුදල 2017 වර්ෂ අවසානය වන විටද ශේෂය ලෙස පැවතුණි.

දෙවනුව සහ තෙවනුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 97.37ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 584.19ක මුදලක් පිළිවෙලින් 2018 ජනවාරි 24 සහ 2018 ජුනි 25 දිනයන්හි ලැබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 500 කි.

### 26.8 DST විශේෂ ඩොලර් ගිණුම 2

මෙම ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන අතර ඇ.එ.ජ. මුදලින් භාණ්ඩාගාරයට බැර කරනු ඇත. 2018 වර්ෂය තුළදී SLDB, FCBU ණය සහ දිගුකාලීන මූල්‍ය පහසුකම් බැර කර ඇත සහ රජය වෙනුවෙන් ණය ආපසු ගෙවීම සඳහා භාවිත කර ඇත. 2018 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 161.39 කි.

## 27. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශවයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **192,367,084** | 215,901,806 |
| - අනිකුත් | **127,555,665** | 125,805,585 |
| | **319,922,749** | 341,707,391 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **177** | 94 |
| - අනිකුත් | **183,257** | 4,713 |
| | **183,434** | 4,807 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **320,106,183** | 341,712,198 |

## 28. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **167,537** | 167,492 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **181,181** | 157,025 |
| | **348,718** | 324,517 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

## 29. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **-** | 6,503,884 |
| නිත්‍ය තැන්පතු පහසුකම | **28,311,221** | 34,151,394 |
| | **28,311,221** | 40,655,278 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 30. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් හි ශේෂය | **18,333** | 4,547 |
| | **18,333** | 4,547 |

### 31. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,707** | 5,707 |
| සත 5 | **23,260** | 23,258 |
| සත 10 | **39,232** | 39,229 |
| සත 25 | **121,046** | 121,039 |
| සත 50 | **185,247** | 185,590 |
| රුපියල් 1 | **929,905** | 898,148 |
| රුපියල් 2 | **1,414,466** | 1,357,849 |
| රුපියල් 5 | **4,408,327** | 4,102,486 |
| රුපියල් 10 | **6,101,195** | 5,402,312 |
| සමරු කාසි | **590,240** | 587,075 |
| | **13,822,256** | 12,726,324 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,694** | 26,696 |
| රුපියල් 5 | **37,192** | 37,193 |
| රුපියල් 10 | **1,271,474** | 1,340,240 |
| රුපියල් 20 | **5,607,149** | 5,758,265 |
| රුපියල් 50 | **5,456,882** | 5,561,352 |
| රුපියල් 100 | **22,612,502** | 21,599,562 |
| රුපියල් 200 | **128,307** | 130,040 |
| රුපියල් 500 | **40,093,478** | 38,153,548 |
| රුපියල් 1,000 | **136,787,726** | 141,832,264 |
| රුපියල් 2,000 | **5,331,902** | 10,526,029 |
| රුපියල් 5,000 | **409,761,967** | 360,357,407 |
| | **627,120,254** | 585,327,577 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **640,942,510** | 598,053,901 |

### 32. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ගෙවිය යුතු පොළී - දේශීය | **-** | 1,676 |
| වෙන්කිරීම් සහ අයකිරීම් | **1,706,541** | 396,531 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **2,082,061** | 2,306,897 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 32.1) | **6,188,502** | 5,083,171 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **2,629,327** | 1,098,881 |
| | **12,606,431** | 8,887,156 |

**32.1** අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළීය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළීය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

### 33. විලම්භිත ප්‍රදානයන්

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **45** | 80 |
| වර්ෂය තුල ක්‍රමක්ෂය | **(34)** | (35) |
| දෙසැම්බර් 31 දිනට | **11** | 45 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

### 34. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආයක මුදල්

නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත. බැංකුව මෙම වසර තුළදී ප්‍රථම වතාවට නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ අර්ථකථනය කිරීමට එම ස්වාධීන ආයුගණකයන්ගේම සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය රු.මි. 38,884.03 (2017 - රු.මි. 40,816.60) වන අතර එය ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 48,245.66 (2017 - රු.මි. 38,392.29) ඉක්මවා රු.මි. 9,361.63 (2017 - රු.මි. 2,424.31) ක අතිරික්තයක් අවසානයේ දී වාර්තා වේ.

**2018 දෙසැම්බර් 31 දිනට**

| **ප්‍රතිලාභ බැරකම/ (වත්කම)** | **සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව** | **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව** | **පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය** | **එකතුව 2018** |
|---|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 35,971,523 | 1,055,695 | 6,241,591 | 1,199,154 | 718,088 | 290,932 | 2,768,680 | 48,245,663 |
| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම | (26,120,425) | (3,519,332) | (5,337,743) | (2,177,286) | (52,204) | (243,167) | (1,433,872) | (38,884,029) |
| **ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 9,851,098 | (2,463,637) | 903,848 | (978,132) | 665,884 | 47,765 | 1,334,808 | 9,361,634 |

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

| | 2018 රු. 000 | 2017 රු. 000 |
|---|---|---|
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **9,851,097** | 892,685 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(2,463,637)** | (2,533,060) |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **903,848** | - |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **-** | - |
| වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **665,884** | - |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **290,932** | 153,167 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | **2,768,680** | 2,158,269 |
| | **12,016,804** | 671,061 |

| **ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2018 ජනවාරි 01 දිනට | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | - | (22,218) | 942,158 | (2,424,313) |
| ප්‍රතිලාභ වියදම් | 283,821 | (294,427) | (88,343) | (176,350) | 665,884 | 14,991 | 145,554 | 551,130 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | 9,059,635 | 567,448 | 1,416,796 | 477,491 | - | 54,992 | 247,096 | 11,823,458 |
| දායක ගෙවීම් | (385,044) | (203,598) | - | - | - | - | - | (588,642) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 9,851,097 | (2,463,637) | 903,848 | (978,132) | 665,884 | 47,765 | 1,334,808 | 9,361,633 |

| **පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2018 ජනවාරි 01 දිනට | 29,232,145 | 718,032 | 5,218,411 | 912,262 | - | 153,167 | 2,158,269 | 38,392,286 |
| පොළී පිරිවැය | 3,800,179 | 93,344 | 678,393 | 118,594 | - | 19,912 | 280,575 | 4,990,997 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 167,772 | 34,871 | - | - | - | 17,879 | 30,481 | 251,003 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | 718,088 | - | - | 718,088 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,365,843) | (966) | (479,098) | (30,040) | - | (5,570) | (218,416) | (3,099,933) |
| බැඳීම් මත ආයුගණන අලාභ | 5,137,270 | 210,414 | 823,885 | 198,338 | - | 105,544 | 517,771 | 6,993,222 |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 35,971,523 | 1,055,695 | 6,241,591 | 1,199,154 | 718,088 | 290,932 | 2,768,680 | 48,245,663 |

| **සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2018 ජනවාරි 01 දිනට | 28,339,459 | 3,251,092 | 5,643,016 | 2,191,535 | - | 175,385 | 1,216,111 | 40,816,598 |
| පොළී ආදායම | 3,684,130 | 422,642 | 733,592 | 284,900 | 14,346 | 22,800 | 158,094 | 5,320,504 |
| සේවායෝජක දායකත්වය | 385,044 | 203,598 | - | - | - | - | - | 588,642 |
| සේවාදායක දායකත්වය | - | - | 33,144 | 10,044 | 37,858 | - | 7,408 | 88,454 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,365,843) | (966) | (479,098) | (30,040) | - | (5,570) | (218,416) | (3,099,933) |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | (3,922,365) | (357,034) | (592,911) | (279,153) | - | 50,552 | 270,675 | (4,830,236) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 26,120,425 | 3,519,332 | 5,337,743 | 2,177,286 | 52,204 | 243,167 | 1,433,872 | 38,884,029 |

විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු, පාරිතෝෂික හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රම අරමුදල් යටතේ රු.මි. 522.23 ක වටිනාකමින් යුත් සුරැකුම් රහිතව පවත්නා ආයෝජනයන් සඳහා 100% ක වෙන් කිරීම් සිදු කර ඇති බැවින් සැලසුම් වත්කම්වල වටිනාකම්හි ඇතුලත් කර නොමැත. මෙම ආයෝජනවල වටිනාකම නොමැතිව වුවද, ආයුගණන තක්සේරුව අනුව විශ්‍රාම වැටුප් වගකීම් යටතේ බැංකුවට ශුද්ධ වත්කම් තත්ත්වයක් පවතී.

| **2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **කාලපරිච්ඡේදය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ** | | | | | | | | |
| මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් මත | 3,809,336 | 200,760 | 638,640 | 156,561 | - | 76,750 | 460,701 | 5,342,748 |
| පලපුරුද්ද මත | 1,327,934 | 9,654 | 185,245 | 41,777 | - | 28,794 | 57,070 | 1,650,474 |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | 3,922,365 | 357,034 | 592,911 | 279,153 | - | (50,552) | (270,675) | 4,830,236 |
| **කාලපරිච්ඡේදය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/ වියදම** | 9,059,635 | 567,448 | 1,416,796 | 477,491 | - | 54,992 | 247,096 | 11,823,458 |

| **2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 3,800,179 | 93,344 | 678,393 | 118,594 | - | 19,912 | 280,575 | 4,990,997 |
| සැලසුම් වත්කම් මත පොළී ආදායම | (3,684,130) | (422,642) | (733,592) | (284,900) | (14,346) | (22,800) | (158,094) | (5,320,504) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 167,772 | 34,871 | - | - | - | 17,879 | 30,481 | 251,003 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | 718,088 | - | - | 718,088 |
| සේවාදායක දායකත්වයන් | - | - | (33,144) | (10,044) | (37,858) | - | (7,408) | (88,454) |
| **ප්‍රතිලාභ වියදම** | 283,821 | (294,427) | (88,343) | (176,350) | 665,884 | 14,991 | 145,554 | 551,130 |

| **සැලසුම් වත්කම්වල සංයුතිය** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 18,951,019 | 3,138,194 | 3,665,611 | 1,682,559 | 43,131 | 214,815 | 1,150,734 | 28,846,063 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 219,425 | 21,471 | 44,950 | 26,096 | 3,883 | - | 4,013 | 319,838 |
| ණයකරවල ආයෝජන | 761,114 | 43,004 | 449,408 | 20,335 | - | 6,633 | - | 1,280,494 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 6,173,983 | 315,885 | 1,176,978 | 448,149 | 4,848 | 21,719 | 279,125 | 8,420,687 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 14,884 | 778 | 796 | 147 | 342 | - | - | 16,947 |
| **2018 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්හි එකතුව** | 26,120,425 | 3,519,332 | 5,337,743 | 2,177,286 | 52,204 | 243,167 | 1,433,872 | 38,884,029 |

2017 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 29,232,145 | 718,032 | 5,218,411 | 912,262 | 153,167 | 2,158,269 | 38,392,286 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ වටිනාකම | (28,339,460) | (3,251,092) | (5,643,016) | (2,191,535) | (175,385) | (1,216,111) | (40,816,599) |
| **ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | (22,218) | 942,158 | (2,424,313) |

| ප්‍රතිලාභ බැරකම්වල/(වත්කම) වෙනස් වීම. | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2017 ජනවාරි 01 දිනට | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,646) | 889,590 | (79,968) |
| ප්‍රතිලාභ වියදම් | 480,203 | (208,897) | (24,402) | (130,319) | 12,698 | 144,685 | 273,968 |
| අනෙකුත් විස්තීරණ ආදායම්තුල හඳුනාගත් වටිනාකම | (1,017,607) | (308,404) | (180,379) | (136,612) | (14,270) | (84,350) | (1,741,622) |
| දායක ගෙවීම් | (645,929) | (180,987) | (32,119) | (9,889) | - | (7,767) | (876,691) |
| **2017 දෙසැම්බර් 31 දිනට** | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | (22,218) | 942,158 | (2,424,313) |

| 2017 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ප්‍රතිලාභ වියදම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ශුද්ධ පොළී පිරිවැය | 269,882 | (238,520) | (24,402) | (130,319) | (2,684) | 115,647 | (10,396) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 210,321 | 29,623 | - | - | 15,382 | 29,038 | 284,364 |
| **ප්‍රතිලාභ වියදම්** | 480,203 | (208,897) | (24,402) | (130,319) | 12,698 | 144,685 | 273,968 |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2017 ජනවාරි 01 දිනට | 25,408,311 | 2,444,748 | 5,144,789 | 1,828,245 | 152,419 | 1,166,543 | 36,145,055 |
| සැලසුම් වත්කම්/ආයොජනවල සත්‍ය ප්‍රතිලාභය | 4,375,497 | 627,231 | 849,631 | 375,242 | 37,653 | 253,174 | 6,518,428 |
| දායක ලැබීම් | 645,929 | 180,987 | 32,119 | 9,889 | - | 7,767 | 876,691 |
| ප්‍රතිලාභ ගෙවීම් | (2,090,277) | (1,874) | (383,523) | (21,842) | (14,687) | (211,373) | (2,723,576) |
| **2017 දෙසැම්බර් 31 දිනට** | 28,339,460 | 3,251,092 | 5,643,016 | 2,191,534 | 175,385 | 1,216,111 | 40,816,598 |

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 12.00% | 13.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 12.00% | 13.00% |
| අනාගත වැටුප් වැඩිවීම් - වෛද්‍ය ප්‍රතිලාභ | 8.50% | 8.50% |
| අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය - පාරිතෝෂික වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම (පැරණි) | 11.50% | 8.50% |
| අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය - විශ්‍රාම (නව), වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු, (නව) | 6.50% | 6.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම අනුපාතය | 7.50% | 7.50% |
| සේවය හැරයාමේ අනුපාතය | 2.00% | 2.00% |
| වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය | 4.50% | 3.00% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 26 | අවුරුදු 27 |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව | අවුරුදු 38 | අවුරුදු 41 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 26 | අවුරුදු 27 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 26 | අවුරුදු 27 |
| වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු - නව | අවුරුදු 38 | - |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 19 | අවුරුදු 20 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 26 | අවුරුදු 32 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

| 0.5% දී සංවේදීතා විශ්ලේෂණය (2018-12-31) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පුරෝකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන බැඳීම් මත ඇති වත්මන් උපකල්පනයන්** | **35,971,523** | **1,055,695** | **6,241,591** | **1,199,154** | **718,088** | **290,932** | **2,768,680** |
| "+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | (1,508,089) | (106,827) | (298,931) | (68,243) | (79,520) | (11,697) | (105,627) |
| "-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | 1,628,425 | 121,759 | 326,649 | 74,734 | 92,308 | 12,548 | 114,320 |
| "+" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | 55,973 | 15,155 |
| "-" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | (61,945) | (16,016) |
| "+" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | 188,526 | 87,724 | 14,634 | 5,647 | 55,034 | 12,548 | - |
| "-" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | (183,845) | (80,157) | (14,279) | (5,510) | (50,354) | (11,799) | - |
| "+" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | - | 115,653 |
| "-" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | - | (106,871) |
| "+" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | 1,486,502 | - | 322,830 | 71,348 | - | - | - |
| "-" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | (1,393,434) | - | (298,617) | (65,954) | - | - | - |

**35. විවිධ බැරකම් හා උපචිතයන්**

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති අගයන්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු සහ ශ්‍රී.ලං.ම.බැ. විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් එක්රැස් කර රජයට ගෙවිය යුතු දඬ මුදල් අන්තර්ගතය.

**36. හිමිකරු ප්‍රාග්ධනය**

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**36.1** ප්‍රාග්ධන අරමුදල්

ආයක ප්‍රාග්ධනය : මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

**36.2** **ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය** - ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයන් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

**36.3** **අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;**

**i.** **ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR)** : ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**ii.** **වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය (MRR)** : ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් ඍණ අගයක් ගන්නා අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

ඒ අනුව, ප්‍රධාන වශයෙන්ම පසුගිය වසරවලදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන සැළකිය යුතු අලාභයන් එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ දැනට පවතින ඍණ රඳවාගත් ලාභයන් වැඩි දියුණු කරවීම සඳහා වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත රුපියල් බිලියන 9.43 ක් මාරු කර ඇත.

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2018 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 56.5 බැඳීම්

(අ) 2018 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 577.99 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | **2018 000** | **2017 000** |
|---|---|---|
| **ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු** | | |
| **ඉදිරි විනිමය විකුණුම්** | | |
| - ඇ.එ.ජ. ඩොලර් | 726,310 | 1,850,735 |
| - යුරෝ | - | 2 |
| **ඉදිරි විනිමය මිලදී ගැනීම්** | | |
| - ඇ.එ.ජ. ඩොලර් | 388,908 | 5,000 |
| - යුරෝ | - | 400 |

## 57. මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

### 57.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

(අ) **ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්**

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන්

හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

**(ආ) සුරකුම්පත් ණයට දීම**

සුරකුම්පත් ණය, ස්ථාපිත වෙළඳපල පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශවයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැඳේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි.

නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ආයතනයට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ මෙය සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

**(ඇ) සුරකුම්පත් ඔඩපන කිරීම්**

සුරකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 ක සුරකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට 2017 ජනවාරි 30 දින තෙක් ඇ.එ.ජ. ඩොලර් මිලියන 30 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. ඔඩපන කරන ලද සුරකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්වල ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීමෙන් හා යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගී වන පාර්ශවයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි අදාලත්වය සලකා බැලීමෙන් අනතුරුව, 2017.01.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය පහසුකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 20 දක්වා අඩුකරන ලදී.

Colleteral agreement governing secured borrowings by participants in the Euro Clear System හා ''යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගීවන පාර්ශවයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි'' යන මාර්ගෝපදේශයන් මත පදනම්ව එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුවීම හේතුවෙන්, බැංකුව විසින් එම සුරකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

සම්පූර්ණයෙන් ඉවත් නොකල, සියළුම මාරුකරන ලද මූල්‍ය වත්කම් වල ධාරණ අගයන් සහ සාධාරණ අගයන් මෙන්ම ඊට සම්බන්ධිත වගකීම් පහත වගුව මගින් ඉදිරිපත් කරයි.

| | 2018 | 2017 | |
|---|---|---|---|
| | අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් | වෙළඳාම සඳහා පවතින මූල්‍ය වත්කම් | ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් |
| | රු. 000 | රු. 000 | රු. 000 |
| **වත්කම්** | | | |
| ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් මත විකිණූ සුරකුම්පත් | - | 6,366,710 | - |
| සුරකුම්පත් ණයදීම | 3,714 | 2,466 | - |
| සුරකුම්පත් ඔඩපන | 4,841,397 | 4,583,944 | - |
| වත්කම් වල ධාරණ අගය | 4,845,111 | 10,953,120 | - |
| **සම්බන්ධිත වගකීම්** | | | |
| ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් මත විකිණූ සුරකුම්පත් | - | - | 6,503,884 |
| සම්බන්ධිත වගකීම්වල ධාරණ අගය | - | - | 6,503,884 |

## 58. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසනා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**58.1** විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

**58.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර ආයක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම,

ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

**58.3** ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්‍ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

**58.4** 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 76 කි. ගැසට් පත්‍රයේ 5.2 වගන්තියට අනුව විශේෂිත අතහැරීම් හා සියලුම ණය උපකරණ හැර සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් සහ 01.01.2012 දිනට පෙර මුදල් මණ්ඩලයේ මගපෙන්වීම අනුව 2010 සහ 2011 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ පෙර තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්‍ෂණය කෙරේ.

රු.මි. 350.20 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2018 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. බිලියන 53.3 ක් (තාවකාලික) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.මි. 0.60 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්ෂණ ඒකකය මඟින් මූල්‍ය මණ්ඩලය මඟින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂකවරයාගේ අධීක්‍ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය හාරව විගණකාධිපති කටයුතු කරයි.

**58.5** ලියාපදිංචි මූල්‍ය සමාගම් නියාමනය කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

**58.6** බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට ආයක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

2018 දෙසැම්බර් 31 දිනට එසේ එක්රැස් කළ මුදල් නැවත බැංකුවලට ගෙවා ඇති අතර මෙම යෝජනා ක්‍රමය යටතේ හිඟ හිටි ණය නොමැත (2017 - රු.මි. 6.83). මෙම ණය මඟින් 2018 වර්ෂය තුලදී රු.මි. 0.17 ක පොලියක් ලැබුණි. (2017 වර්ෂය තුලදී - රු.මි. 1.83). තවද රු.මි. 28.12 (2017 - රු.මි. 84.72) ක ආයෝජන ආදායමක් උපයා ඇත.

**58.7** බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය ආයකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ |
|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 351.06 | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | |
| අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමට ආධාර කිරීම. | 1,362.00 | කලින් නියම කරන ලද දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | |
| වයඹ පළාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ සුබ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිරසාර වර්ධනය | 249.06 | |
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පුද්ගලයන් හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ.එ.ජ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් අවම පිරිවැයක් සහිත තිරසාර ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් කලින් නියම කරන ලද දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට මාරු කළ යුතුය. |
| සුසහන අදියර II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් කලින් නියම කරන ලද දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කළ යුතුය. |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම | 1,000.00 | |
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,361.00 | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශය නගා සිටුවීමට ණය පහසුකම් සපයා දීම | 1,199.82 | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 100.00 | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රියව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | |
| පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ගොඩනංවා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම. | 3,213.20 | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 232.39 | |
| විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 881.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම සිදුකරයි. |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් කලින් නියම කරන ලද දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| වියළි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ආදායම ජනනය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.95 | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්‍ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,428.47 | |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.එ.ජ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන්ට අරමුදල් සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. | 487.66 | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 1,049.84 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම. | 1,049.84 | |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 135.69 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | 135.69 | |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 302.04 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | 302.04 | |
| පශ්චාත් ආපදා ආර්ථික ක්‍රියාකාරකම් නගා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය (PEARL) | රුපියල් | 134.58 | මෑත කාලීන ගංවතුර/නියං හේතුවෙන් ආපදාවට පත් ණය ගැතියන් (පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම්) පශ්චාත් ආපදා තත්වයෙන් මුදවා ගැනීම සඳහා අරමුදල් අවශ්‍යතා සැපයීම තුළින් ඔවුන්ගේ ව්‍යාපාරික හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් යථාතත්වයට පත් කිරීම. | 134.58 | |
| "තරුණ දිරිය" NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය | රුපියල් | 288.48 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීයමට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 288.48 | |
| වියළි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම. | 252.89 | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම. | 1,564.75 | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම. | 7,016.86 | |

## ඉදිරියට යන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම | 964.87 | | වගකීම් හා සහතිකවීම් නැත | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ගිවිසුම්වල අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදුකරනු නොලැබේ. |
| ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,000.00 | නව හා වත්මන් ව්‍යවසායකයින් මූල්‍ය සහනාධාර සපයමින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 2,522.20 | | | |
| "අත්වැල" ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නගා පිහිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) | රුපියල් | 2,000.00 | රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම. | 1,599.74 | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 1,031.00 | විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්තාපිත කිරීම. | 4,821.16 | | | |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital | ඇ.එ.ජ. ඩොලර් | 1.10 | වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරගකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී. | 67.84 | | | |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal | ඇ.එ.ජ. ඩොලර් | 2.45 | | 254.15 | | | |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P RF Income Generation | ඇ.එ.ජ. ඩොලර් | 6.00 | | 106.42 | | | |
| සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල් | 26,725.60 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා ආපදා මගින් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ණය පහසුකම් සැපයීම | 26,725.60 | සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් නැවත අය කර ගන්නා මුදල් කලින් නියම කරන ලද දිනයන්හි දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුයි. | | |
| ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය අදියර II (SEPI II) | රුපියල් | 225.00 | National Vocational Qualification (NVQ) හි සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවන් සම්පූර්ණ කරන ලද පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 352.09 | | | |

## 59. ශේෂ පත්‍ර දිනට පසු ඇතිවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

## 2. බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ හා කාලීන පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් නීති පනතේ 28 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු අධීක්ෂණය හා නියාමනය සිදු කරනු ලබයි.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් අතරට විචක්ෂණශීලී විධානයන් නිකුත් කිරීම හා ක්‍රියාත්මක කරවීම, බලපත්‍රලාභී බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ හා කාලීන පරීක්ෂණ කටයුතු සිදු කිරීම, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතා පරීක්ෂාව සහ අනුමැතිය, මුදල් මණ්ඩලයේ අනුමැතිය පරිදි විවිධ නියාමන අනුමැතීන් ලබා දීම, අවශ්‍ය අවස්ථාවන්හිදී නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ ශක්‍යතා වර්ධනය හා කාලීන දැනුවත් කිරීම් සිදු කිරීම යනාදිය ඇතුළත් වේ.

2018 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා නියාමනයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු (බ.වා.බැ.) 26 කින් සහ බලපත්‍රාභී විශේෂිත බැංකු (බ.වි.බැ.) 7 කින් සමන්විත විය. මෙයට අමතරව 2018 වසර අවසානය වන විට විදේශීය බැංකුවල නියෝජිත කාර්යාල 3 ක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර තිබූ අතර බලපත්‍රලාභී බැංකුවල හා නියෝජිත කාර්යාලවල නාම ලේඛනය ඇමුණුම 1 හි දක්වා ඇත.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ දී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් හා වැඩකටයුතුවල සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1 විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විචක්ෂණශීලී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි දක්වා ඇත. ඒ අතුරින් ප්‍රධාන විචක්ෂණශීලී නියාමනයන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

**(අ) මෝටර් රථ සඳහා ලබා දෙනු ලබන ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාත සීමා**

මෝටර් රථ මිලදී ගැනීම සඳහා ලබා දෙන ණය ඉහළ යාම නිසා බැංකු ක්ෂේත්‍රයේ ඇති වන අධික ණය වර්ධනය පහත දැමීමේ විචක්ෂණශීලී අරමුණින් යුතුව මෝටර් රථ මිලදී ගැනීම සඳහා බැංකු විසින් ණය පහසුකම් ලබා දීමේදී ඒවායේ වටිනාකම මත ණය අනුපාත සීමා පවත්වා ගන්නා ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරන ලදී. 2018 වසර තුළ කලින් කලට මෙම නියෝගය සඳහා සංශෝධනයන් කිහිපයක් ද සිදු කරන ලදී.

මේ අනුව විද්‍යුත්, දෙමුහුන් හා අනෙකුත් ලියාපදිංචි නොකළ වාහන සහ මෙරට පළමු ලියාපදිංචියේ සිට වසරකට අඩු හෝ වැඩි කාලයක් පාවිච්චි කරන ලද රථ වාහන සඳහා අදාළ වන වටිනාකම මත ණය අනුපාත සංශෝධිත සීමාවන් හඳුන්වා දෙන ලදී.

මෝටර් රථ සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය නිසා විදේශ විනිමය අනුපාතික මත වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් මෝටර් රථ වාහන සඳහා වන වටිනාකම මත ණය අනුපාත තවදුරටත් පහළ දමන ලද අතර රජය මගින් සහනදායී පදනම මත ලබා දෙනු ලබන වාහන ආනයන බලපත්‍ර හරහා ආනයනය කරනු ලබන මෝටර් රථ සඳහා ණයවර ලිපි නිකුත් කිරීමෙන් වළකින ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දන්වා සිටින ලදී. මෙයට අමතරව 2018 අයවැය යෝජනාවලට අනුකූලව මෝටර් රථ ආනයනය සඳහා භාවිතීය ණයවර ලිපි නිකුත් කිරීමෙන් වළකින ලෙසට ද දන්වා සිටින ලදී. කෙසේ නමුත් ප්‍රධාන ව්‍යාපාර කටයුතු සඳහා මෝටර් රථ ආනයනය අත්‍යාවශ්‍ය වන, හඳුනා ගත් ආර්ථික අංශයන්, රජයේ ආයතන සඳහා රථවාහන මිලට ගැනීම් සහ රජය විසින් හඳුන්වා දුන් සහනදායී ණය පහසුකම් යටතේ වාහන මිලට ගැනීම් මත ඉහත කී වටිනාකම මත ණය අනුපාතික සීමා බලපැවැත්වීම ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

**(ආ) අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනා ක්‍රම**

අක්වෙරළ ඒකකයක අනේවාසිකයෙකු විසින් පවත්වාගෙන යන ගිණුමක නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් මගින් 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අනුව අනුමත කර ඇති ගනුදෙනු සිදු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුහට අවසරය ලබා දෙමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී.

**(ඇ) නියෝජිතයන් පත් කිරීම සම්බන්ධ නියාමන රාමුව**

බලපත්‍රලාභී බැංකු සඳහා නියෝජිතයන් පත්කර ගැනීම සම්බන්ධ නියාමන රාමුවක් හඳුන්වා දුන් අතර මෙමගින් බැංකු විසින් නියෝජිතයන් හා උප නියෝජිතයන් තේරීමේදී හා අනුමත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි, බැංකුවේ වගකීම්, අවසරලත් ක්‍රියාකාරකම්, අවදානම් කළමනාකරණය සහ පාලනය, පාරිභෝගික ආරක්ෂණය, පැමිණිලි හා සහන සැලසීමේ යාන්ත්‍රණය ආදී විෂය පථයන් ආවරණය වේ. පසුකාලීනව, බැංකුවේ වත්මන් ගනුදෙනුකරුවන් නොවන අනෙකුත් ගනුදෙනුකරුවන් හට ද මෙරටට පැමිණෙන ප්‍රේෂණ මුදල් (inward remittance) ලබා ගැනීමේ සේවා සැපයීමට පහසුකම ලැබෙන පරිදි මෙම විධානය සංශෝධනය කෙරිණි.

**(ඈ) ව්‍යුත්පන්න ගනුදෙනුවල අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම**

මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සිදු කිරීමේදී අවදානම් කළමනාකරණය පිළිබඳව වඩාත් ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දුන් අතර මෙම විධානයන් මගින් ව්‍යුත්පන්න ගනුදෙනු ආරම්භ කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග, ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම, අනුමත නොකළ ක්‍රියාකාරකම් සහ වාර්තාකරණ අවශ්‍යතා වැනි අංශ ආවරණය කෙරිණි. මෙය සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති විධානයන් මෙම විධානය මගින් අවලංගු කරන ලදී.

**(ඉ) ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි මත පදනම්ව ආනයනය (Imports on Documents against Acceptance Terms) සඳහා වන ආන්තික අවශ්‍යතා**

විදේශ විනිමය අනුපාතික මත ඇති වී ඇති අයහපත්කාරී තත්ත්වයන් සමනය කරලීම සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි යටතේ ආනයන සඳහා සියයට 100 ක අත්පිට මුදල් ආන්තික අවශ්‍යතාවයක් (cash margin requirement) පවත්වා ගන්නා ලෙස බලපත්‍රලාභී බැංකුවලට නියෝග කරන ලදී.

**(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු**

2020 සහ 2019 යන වසර සඳහා ඊට පෙර වසරේ අවසානය වන විට පවතින වත්කම් ප්‍රමාණ මත පදනම්ව බලපත්‍රලාභී බැංකු සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තු ඉහළ දැමීම පිළිබඳව එම බැංකු දැනුවත් කරන ලදී.

**(උ) බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතිකය හඳුන්වා දීම.**

බලපත්‍රලාභී බැංකුවල වත්කම් සහ ශේෂ පත්‍රයෙන් පිට ක්‍රියාකාරකම් සලකා බලමින් ඒ සඳහා ස්ථායී අරමුදල් සම්පාදනය තහවුරු කිරීමේ අරමුණින් යුතුව බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ වන ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය හඳුන්වා දෙන ලදී. මේ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් 2019 ජනවාරි 01 වන විට සියයට 90 ක ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතයක් පවත්වා ගත යුතු අතර 2019 ජූලි 01 වන විට එය සියයට 100 දක්වා ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු වේ.

**(ඌ) බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ එන ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ විධාන සංශෝධනය**

බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ එන ද්‍රවශීලතා ආවරණ අනුපාතය සම්බන්ධ නියාමන වාර්තාකරණයන්ගේ ආකෘති සංශෝධන පිළිබඳව බලපත්‍රලාභී බැංකු දැනුවත් කරන ලදී.

**(එ) බලපත්‍රලාභී බැංකු විසින් ලබා ගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය**

බැංකු විසින් ලබා ගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය සම්බන්ධ අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව ඒ සම්බන්ධව 2018 නොවැම්බර් 30 වැනිදා සිට නව ප්‍රතිපත්ති රාමුවක් හා අනුගත වන ලෙසට සියලුම බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී. මේ අනුව ඒ ඒ බැංකුවල බාහිර ණය ශ්‍රේණිගත කිරීම්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත සම්බන්ධිතව ගණනය කරනු ලබන ලකුණු මට්ටමක් පදනම් කර ගනිමින් මුළු වත්කම්වලින් තීරණය කරනු ලබන යම්කිසි ප්‍රතිශතයක් ලෙස කෙටිකාලීන හා දිගුකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සීමා නිර්ණය කරනු ලබයි. තවද, බලපත්‍රලාභී බැංකුවල අක්වෙරළ බැංකු ඒකක විසින් සිදු කරන ලබන විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබා ගැනීමේ සහ දේශීය පාර්ශවයන් සම්බන්ධ විදේශ ව්‍යවහාර මුදල් ණය සම්බන්ධයෙන් 2018 අංක 11 දරන "බලපත්‍රලාභී බැංකු විසින් ලබා ගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය" පිළිබඳ විධානයේ අඩංගු කොන්දේසිවලට යටත්ව සිදු කරන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

**(ඒ) බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ එන තෝලන අනුපාත හඳුන්වා දීම.**

බලපත්‍රලාභී බැංකුවල අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට විශ්වසනීය පරිපූරකයක් ලෙස හඳුන්වාදෙන ලද බාසල් III තෝලන අනුපාත රාමුවට අනුකූලව සියයට 3 ක අවම තෝලන අනුපාතයක් 2019 ජනවාරි 01 දින සිට පවත්වාගෙන යන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

**(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS9: මූල්‍ය උපකරණ, අනුගමනය කිරීම**

බැංකු ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංගතව සහ විචක්ෂණශීලීව අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS9: මූල්‍ය උපකරණ, අනුගමනය කිරීම සඳහා උපදෙස් මාලාවක් බලපත්‍රලාභී බැංකු වෙත 2018 දෙසැම්බර් 31 වනදා නිකුත් කරන ලදී.

## 2.2 මුදල් මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතීන්

**(අ) බලපත්‍රලාභී බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකක**

2018 වසර තුළදී බැංකු ශාඛා සහ අනෙකුත් ඒකක පිළිබඳ ඉල්ලීම් 1,557 ක් සැකසීමට කටයුතු කරන ලදී. ඉන් 1,519 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර ඉල්ලීම් 38 ක් විචක්ෂණශීලී කරුණු මත පදනම්ව කල් දැමීම/ප්‍රතික්ෂේප කරන ලදී (සංඛ්‍යා සටහන II-1). මේ අනුව 2018 වසර අවසන් වන විට බැංකු ශාඛා 3,572, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,309 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4,834 ක්‍රියාත්මකව පැවතිණි.

**II-1 සංඛ්‍යා සටහන**

**ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සඳහා අනුමැතීන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | සකසන ලද | ලබා දෙන ලද |
| **විවෘත කිරීමේ සහ ස්ථාපනය කිරීම්** | **1,281** | **1,251** |
| ශාඛාවන් | 66 | 50 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 146 | 136 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 231 | 231 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 63 | 61 |
| ජංගම බැංකු ඒකක සහ ජංගම රථ | 560 | 560 |
| ජංගම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර | 8 | 8 |
| **ප්‍රතිස්ථාපන කිරීම්** | **149** | **143** |
| ශාඛාවන් | 137 | 131 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 12 | 12 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් | 25 | 23 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් දෑ සඳහා ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම සහ අත්හිටුවීම් | 102 | 102 |
| **මුළු එකතුව** | **1,557** | **1,519** |

(ආ) වෙනත් නියාමන අනුමැතීන්

2018 වසර තුළ වෙනත් නියාමන අනුමැතීන් 442 ක් ලබා දී තිබූ අතර ඒවා, බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීම්, දෙවන ස්ථරයේ ප්‍රාග්ධන සඳහා ණයකර ඇතුළත් කිරීම, බැංකුවක කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රමාණික අයිතියක් ලබා ගැනීම, ණය ලබා දීමේ උපරිම සීමා ඉක්මවීම, බැංකු සඳහා අලුතින් පත්වන හෝ ධූර කාල අලුත් කරන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ගේ යෝග්‍යතා පරීක්ෂාව, වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩුවෙන් සිදු කෙරෙන දේපල විකිණීම්, අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම, බාහිරකරණය සඳහා වන සැලසුම්, නියෝජිත ක්‍රියාකාරකම්, ප්‍රත්‍යාගණන සංචිතයන් දෙවන ස්ථරයේ ප්‍රාග්ධන සඳහා ඇතුළත් කිරීම සහ අතහැර දමා ඇති දේපළ ප්‍රතිපූර්ණය වැනි විෂය පථයන්ට අයත් විය.

(ඇ) නියාමන ක්‍රියාමාර්ග

2018 වසරේදී බැංකු පනත හා ඒ යටතේ නිකුත් කර ඇති විධානයන් හා අනුගත නොවීම් සම්බන්ධයෙන් අවස්ථා 33 ක දී නියාමන ක්‍රියාමාර්ග ගත් අතර ඒ පිළිබඳව අදාළ බැංකු දැනුවත් කරන ලදී. තවද, බැංකු ක්ෂේත්‍රයේ කාර්ය සාධනය පිළිබඳව සෑම කාර්තුවකදීම මුදල් මණ්ඩලය දැනුවත් කරන ලදී.

## 2.3 අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) අඛණ්ඩ අධීක්ෂණය යනු සමස්ත බැංකු පද්ධතියෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ දිගුකාලීන ස්ථායීතාවය නිර්ණය කිරීමෙහිලා කල් ඇතිව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් ලෙස සේවය සපයන්නා වූ එක් එක් බැංකුවල මෙහෙයුම් කටයුතු නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලියකි. මෙමගින් අවශ්‍ය විටෙක නිවැරදිකරණ ක්‍රියාමාර්ග ගැනීම සහ එමගින් තැන්පත්කරුවන්ගේ මුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සිදු කෙරේ.

(ආ) වෙබ්ගත FinNet පද්ධතිය හරහා බැංකු විසින් කාලානුරූපීව සපයනු ලබන මූල්‍ය දත්ත වාර්තා පදනම්ව අඛණ්ඩ අධීක්ෂණ ක්‍රියාවලිය සිදු කරනු ලබන අතර වාර්ෂිකව දළ වශයෙන් මූල්‍යමය හා විචක්ෂණශීලී ව්‍යවස්ථාපිත වාර්තා 70 ක් මාසිකව/කාර්තුමය/වාර්ෂිකව බැංකු විසින් මෙම පද්ධතිය වෙත යොමු කරනු ලැබේ. 2018 වසරේදී ද වඩාත් ගුණාත්මක වාර්තාකරණයන් සැපයීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු දත්ත ගබඩාව වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන ලදී.

(ඇ) බැංකු අඛණ්ඩ සුපරීක්ෂණය හා අධීක්ෂණය කිරීමෙහිලා එක් එක් ආර්ථික අංශයන් සඳහා බැංකු විසින් ලබා දී ඇති ණය සංකේන්ද්‍රණය පිළිබඳ විශේෂ වාර්තාවන් පිළියෙළ කිරීමට කටයුතු කළ අතර, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ බාහිර රාජ්‍ය ආයතනයන්හි වාර්තාවන් සඳහා අවශ්‍ය බැංකු අංශයේ සමුච්චිත දත්ත ලබා දීම ද සිදු කෙරිණි. මෙයට අමතරව, බැංකු ක්ෂේත්‍රයේ කාර්ය සාධනය පිළිබඳව මාසික ඉදිරිපත් කිරීම් ද සිදු කරන ලදී.

(ඈ) 2018 වසර තුළ දළ වශයෙන් පාරිභෝගික පැමිණිලි/ඉල්ලීම් 795 කට ආසන්න ප්‍රමාණයක් සඳහා ප්‍රතිචාර දැක්වූ අතර ඒවා ණය පොළී අනුපාත, ප්‍රතිලේඛනගත කළ ණය, ණය කාඩ්පත්, උකස් කටයුතු, බැංකුකරණ කටයුතුවල දී සිදුවන අක්‍රමිකතා සහ වංචා, අනවසර මුදල් ආපසු ගැනීම් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් අය කරනු ලබන සේවා ගාස්තු අඩු කරන ලෙස කෙරුණු ඉල්ලීම් යනාදී විෂයයන්ට අයත් විය. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ පොලී යෝජනා ක්‍රමය යටතේ අදාළ පොලී මුදල් ප්‍රතිපූරණය සඳහා අවශ්‍ය තොරතුරු එකතු කර සෑම කාර්තුවකදී ම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යැවීමට ද කටයුතු කරන ලදී.

(ඉ) බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවලදී හඳුනා ගත් අඩුලුහුඬුකම් නියමිත කාලසීමාවන් තුළදී නිවැරදි කිරීමෙහිලා ගනු ලබන ක්‍රියාමාර්ගයන්හි අත්කර ගෙන ඇති ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කරන ලදී. මීට අමතරව අඛණ්ඩ සුපරීක්ෂණ ක්‍රියාවලියේදී හඳුනාගත් නියාමන අඩුලුහුඬුකම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සමග රැස්වීම් 17 ක් ද පවත්වන ලදී.

## 2.4 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) පසුගිය වසරේ ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 5 ක් ද ඇතුළුව 2018 වසරේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කාලීන පරීක්ෂණ 32 ක් පවත්වන ලදී. 2018 වසරේදී අදාළ බැංකු කළමනාකාරිත්ව සමග විධිමත් සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව සහ මුදල් මණ්ඩලය වෙත අදාළ වාර්තා යොමු කිරීමෙන් පසු බැංකු 27 ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ සම්පූර්ණ කළ අතර පරීක්ෂණ 5 ක කටයුතු නිම කරමින් පැවතුණි. මෙම පරීක්ෂණවල දී හඳුනාගත් ප්‍රධාන කරුණු ලෙස අඩු ප්‍රාග්ධනකරණය සහ කාර්යක්ෂමතාවය, ආයතනික යහපාලනයේ සහ පරිපාලනයේ දුර්වලතා, තාක්ෂණික අවදානම් කළමනාකරණයේ සහ ද්‍රවශීලතා කළමනාකරණයේ ඇති අඩුලුහුඬුකම්, අක්‍රීය ණය අවතක්සේරු කිරීම් සහ බොල් හා අඩමාන ණය සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් නොකිරීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතුවල ඌණතා දැක්විය හැක. මෙයට අමතරව රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය, ආයතනික යහපාලනය, පාරිභෝගික පැමිණිලි, වෙළඳ මූල්‍යන ගනුදෙනු, විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සහ මෝටර් රථ මිලදී ගැනීම සඳහා ණය ලබා දීම් වැනි කරුණු ආවරණය වන පරිදි සීමිත විෂය පථයකින් යුතු පරීක්ෂණ කිහිපයක් ද පැවැත්විය.

(ආ) තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකුවල අවදානම මත පදනම් අධීක්ෂණ රාමුවක් ක්‍රියාවට නැංවීම සඳහා බැංකුවල අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක්, බැංකු තිරසාර ශ්‍රේණිගත කිරීමේ දර්ශක (Bank sustainability Rating Indicator - BSRI) නමින් දියුණු කරන ලදී. බැංකුවල උපායමාර්ගික වෙනස්කම් සහ නැගී එන ප්‍රවනතාවයන් මගින් ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම තුළින් කාලීනව මැදිහත් වී නිවැරදිකරණ පියවර

ගැනීමට හැකි ක්‍රියාවලියක් සකස් කිරීමේ අරමුණින් මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙය ක්‍රියාත්මක කරන ලදී. මේ අනුව 2019 ජනවාරි 01 දින සිට BSRI මූලික කර ගනිමින් අවදානම මත පදනම් වූ අධීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

### 2.5 බැංකු අංශයේ දැනුවත්භාවය හා ශක්‍යතා වර්ධනය

**(අ) ශක්‍යතා වර්ධනය**

බැංකු අංශයේ ශක්‍යතාවය වර්ධනය කිරීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිරන්තර දායකත්වය ඉදිරියට ගෙන යමින් මෙම වසරේ ද නියාමන අනුකූලතාවය, ආයතනික යහපාලනය, නව ගිණුම්කරණ ප්‍රමිත, අවදානම් කළමනාකරණය, බැංකුකරණය, බැංකු හා මූල්‍යකරණය සම්බන්ධ නීති හා රෙගුලාසිවල නව ප්‍රවණතාවයන් වැනි විෂය කරුණු යටතේ බැංකු විදු පියෙසේ හා ඉන් පරිබාහිර වෙනත් ආයතනයන්ගේ පැවති විවිධ පුහුණු සැසි හා සමුළු සඳහා සම්පත්දායකත්වය ලබා දෙන ලදී. තවද බැංකුවල චර්යාව වර්ධනය කිරීම සඳහා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ වැඩමුළුවක් ද සංවිධාන කරන ලදී.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2018 වසරේදී ද සිය කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වර්ධනයට කැප වී ක්‍රියා කළ අතර අවදානම මත පදනම්ව අධීක්ෂණය, බාසල් III ප්‍රමිතීන්, ආයතනික යහපාලනය, චර්යා සහ ආචාරධර්ම, මූල්‍ය තාක්ෂණ, සයිබර් ආරක්ෂණය, මූල්‍ය නවෝත්පාදනය, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ තිරසාර මූල්‍යකරණය වැනි විෂය කරුණු ඔස්සේ පැවති දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සහ අධීක්ෂණ විද්‍යාලයයන්ට සිය නිලධාරීන් සහභාගි කරවීමට කටයුතු කරන ලදී.

**(ආ) බැංකු සහ අනෙකුත් පාර්ශ්වයන් හා පැවති රැස්වීම්**

ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙන්ම බැංකු අංශයේ වර්ධනයන් සහ නියාමන හා අධීක්ෂණ රාමුවේ නව ප්‍රවණතාවයන් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමේ හමුවක් ලෙස මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ මාසික රැස්වීම්වල ලේකම් කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වසරේදීත් සිදු කරන ලදී. මෙයට අමතරව බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය, දේශීය හා විදේශීය ආර්ථික හා නියාමන රාමුවන්ගේ සිදු වන නව ප්‍රවණතාවයන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා සියලුම බැංකුවල සභාපතිවරුන් සමඟ රැස්වීමක් පවත්වන ලදී. බැංකු අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධාන කළමනාකරණ හා ප්‍රධාන විධායක නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු හා යාවත්කාලීන කිරීම සඳහා විදේශීය සම්පත්දායකයන්ගේ ද සහභාගිත්වයෙන් තාක්ෂණික සැසියක් පවත්වන ලද අතර අනාගතයේ දී බැංකු අධ්‍යක්ෂ මණ්ඩලවල චර්යාවන් හා හැසිරීම, තාක්ෂණික අවදානම් සඳහා ඔරොත්තු දීම, මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම හා අනුගත වීමේදී ඇති අභියෝග වැනි මාතෘකාවන් මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. තවද බැංකුවල ප්‍රධාන තොරතුරු නිලධාරීන් හා ප්‍රධාන අවදානම් නිලධාරීන් සමඟ තාක්ෂණික අවදානම් සඳහා ඔරොත්තු දීම පිළිබඳව සාකච්ඡාවක් ද පැවැත්විය.

බලපත්‍රලාභී බැංකුවල සැලකිය යුතු කරුණු පවතින අවස්ථාවන්හි දී ඒ සඳහා අවශ්‍ය නිවැරදිකරණ ක්‍රියාමාර්ග කඩිනමින් ලබා ගැනීම හා නිසි සුපරීක්ෂණයක් සෑම විටම පවත්වාගෙන යෑමේ අරමුණින් ඒ ඒ බැංකුවලට අදාළව විශේෂ රැස්වීම් අදාළ බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය සමඟ නිරතුරුව පවත්වාගෙන යන ලදී. එසේම බැංකුවල සහ බැංකු ක්ෂේත්‍රයේ තිරසාරභාවය සුරැකීම සඳහා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සමඟ ද රැස්වීම් පවත්වන ලදී. තවද බලපත්‍රලාභී බැංකු සඳහා නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හඳුන්වා දීමේදී ඇති වන ගැටලු නිරාකරණය සහ අවශ්‍ය තොරතුරු ආදිය පැහැදිලි කර ගැනීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ රැස්වීම් මාලාවක් පැවැත්විය.

මූල්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය, ශක්තිමත්භාවය හා සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන නියාමන ආයතනයන්ගේ සහයෝගීතා වර්ධනයට පහසුකම් සැපයීමේ අරමුණින් මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන නියාමන ආයතන ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් මූල්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණ කමිටු රැස්වීම් සංවිධානය කිරීමට ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මෙයට අමතරව ඉදිරියේ දී පැවැත්වෙන විගණනයන්හි දී අවධානය යොමු විය යුතු කරුණු සහ විගණන ආයතන මගින් බලපත්‍රලාභී බැංකු වෙත විගණන නොවන සේවා ලබා දීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල විගණන මඬුල්ල සමඟ රැස්වීමක් ද පැවැත්විය.

**ඇමුණුම II-1**

**බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

| බලපත්‍රලාභී වාණිජ බැංකු | |
|---|---|
| 1. | අමානා බෑන්ක් පී.එල්.සී. |
| 2. | ඇක්සිස් බෑන්ක් ලිමිටඩ් |
| 3. | ලංකා බැංකුව |
| 4. | බෑන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් |
| 5. | කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ් |
| 6. | සිටි බෑන්ක් එන්.ඒ. |
| 7. | කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 8. | ඩොයිෂ් බෑන්ක් ඒ.ජී. |
| 9. | ඩී.එෆ්.සී.සී. බෑන්ක් පී.එල්.සී. |
| 10. | හබීබ් බෑන්ක් ලිමිටඩ් |
| 11. | හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. |
| 12. | අයි.සී.අයි.සී.අයි බෑන්ක් ලිමිටඩ් |
| 13. | ඉන්දියන් බෑන්ක් |
| 14. | ඉන්දියන් ඕවර්සීස් බෑන්ක් |
| 15. | එම්.සී.බී. බෑන්ක් ලිමිටඩ් |
| 16. | නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. |
| 17. | නේෂන් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. |
| 18. | පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. |
| 19. | මහජන බැංකුව |
| 20. | පබ්ලික් බෑන්ක් බර්හාඩ් |

| | |
|---|---|
| 21. | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 22. | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 23. | ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් |
| 24. | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 25. | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් |
| 26. | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | |
| 27. | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 28. | ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් |
| 29. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 30. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 31. | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 32. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව |
| 33. | ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් |
| **විදේශ බැංකුවල නියෝජිත කාර්යාල** | |
| 1. | දෝහා බැන්ක් ක්‍යූ.පී.එස්.සී. |
| 2. | ජේ.පී. මෝගන් චේස් බැන්ක් එන්.ඒ. |
| 3. | එම්.යූ.එෆ්.ජේ. බැන්ක් ලිමිටඩ් |

## 3. බැංකු විදු පියෙස

ශ්‍රී ලංකා මහ බැංකුවේ හා අනෙකුත් මූල්‍ය ආයතන වල මානව සම්පත් වර්ධනය කිරීම අරමුණු කරගනිමින්, සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින මූල්‍ය ක්ෂේත්‍රයේ උද්ගත වන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ නිපුණතාවයන් හා හැකියාවන් ගොඩනැගීම බැංකු විදු පියෙස වෙත පැවරී ඇති මූලික වගකීම වේ.

ඒ අනුව, මූල්‍ය අංශයේ විවිධ ආයතනයන්ගෙන් ලද ඉල්ලීම් සපුරාලීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ඒවා පැවැත්වීම මෙන්ම එම පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා සහ ඒ හා සම්බන්ධ අනෙකුත් පහසුකම්වල ගුණාත්මක භාවය පිළිබඳව වූ ප්‍රමිතිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විවිධ ක්‍රියාමාර්ග ගැනීමට බැංකු විදු පියෙස 2018 වසරේ දී සිය මූලික අවධානය යොමු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මානව සම්පත් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික අරමුණට අනුගත වෙමින් මහ බැංකු කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීම කෙරෙහි ද බැංකු විදු පියෙසේ සුවිශේෂී අවධානය යොමු විය.

2018 වසරේ දී බැංකු විදු පියෙස මගින් වාණිජ බැංකු මෙහෙයුම් කටයුතු, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, භාණ්ඩාගාර මෙහෙයුම්, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, ණය කළමනාකරණය, මූල්‍ය නීති සහ රෙගුලාසි, සංවර්ධන බැංකුකරණය, පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇත. පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා බැංකු විදු පියෙස සිය සම්පත් දායක මණ්ඩලයේ සේවය ලබා ගත් අතර මෙම සම්පත් දායක මණ්ඩලය ඉහළ අධ්‍යාපන/වෘත්තීමය සුදුසුකම් සහ මූල්‍ය අංශයෙහි ප්‍රතිපත්ති සහ නියාමන අංශයන්හි දේශීය/ජාත්‍යන්තර අත්දැකීම් සහිත ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් මෙන්ම දේශීය හා විදේශීය විශේෂඥයින්ගෙන් ද සමන්විත වේ.

බැංකු විදු පියෙස මගින් 2018 වසර තුළ දී පුහුණු වැඩසටහන් 144 ක් සාර්ථකව පවත්වන ලද අතර එම වැඩසටහන්, පුහුණු දින දර්ශනයට අනුව පවත්වන ලද පාඨමාලා 53 කින්, මූල්‍ය අංශයේ ඉල්ලුම මත සංවිධානය කළ විශේෂ පාඨමාලා 61 කින්, අධ්‍යාපනික වැඩසටහන් 18 කින් සහ මහජනයාට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 12 කින් සමන්විත විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යය මණ්ඩලයේ නිපුණතාවන් ඉහළ නැංවීමේ අරමුණින්, කුසලතා වර්ධන පුහුණු පාඨමාලා 18 ක් පවත්වන ලද අතර ඒ සඳහා නිලධාරීන් 616 ක් සහභාගී විය. මෙම කුසලතා වර්ධන පාඨමාලා, අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය, ඉන්දියාවේ මහ බැංකුව සහ ජර්මනියේ මහ බැංකුව වන ඩොයිෂ් බුන්ඩේස් බැංකුවේ සහාය ඇතිව පවත්වන ලදී. තවද, දේශීය වාණිජ බැංකු හා විශේෂිත බැංකු, විදේශීය මහ බැංකු සහ විදේශීය වාණිජ බැංකු වල ඉල්ලීම පරිදි ඔවුන්ගේ කාර්යය මණ්ඩල සඳහා බැංකු විදු පියෙස මගින් විශේෂ පුහුණු පාඨමාලා 23 ක් පවත්වන ලදී. එසේම, ආර්ථික දැනුම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින්, විවිධ කාලීන මාතෘකා යටතේ මහජනතාවට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 6 ක් බැංකු විදු පියෙසෙහි හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙහි ද දේශන 6 ක් ප්‍රාදේශීය කාර්යාල මුල්කරගෙන ද පැවැත්වීමට කටයුතු කර තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික විද්‍යාව විෂයය හදාරනු ලබන උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් "තක්ෂිලාව" හා "අරිවූට්රූ" නමින් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් විකාශනය කරනු ලබන රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් මාලාවේ සම්බන්ධීකරන කටයුතු ද බැංකු විදු පියෙස මගින් නොකඩවා සිදු කරන ලදී.

2018 වසරේ දී බැංකු විදු පියෙසේ පුහුණු පාඨමාලා සඳහා දේශීය පුහුණුලාභීන් 7,198 ක් ද, පිලිපීනය, ඉන්දියාව, පාකිස්තානය, නේපාලය, බංග්ලාදේශය, භූතානය, චීනය, මාලදිවයින, මොන්ගෝලියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, පැපුවා නිව්ගිනියාව, කාම්බෝජය, බෘනෙ සහ තායිලන්තය යන රටවල් නියෝජනය කරමින් විදේශීය පුහුණුලාභීන් 226 ක් ද සහභාගී විය.

පුහුණු පාඨමාලාවල විෂය පරාසය, දේශන පැවැත්වීම සහ ඒ සම්බන්ධ අනෙකුත් සේවා ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාම සඳහා පශ්චාත් ඇගයුම් ක්‍රියාවලියක් ද බැංකු විදු පියෙස මගින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මූල්‍ය අංශයේ වර්තමාන සහ අනාගත පුහුණු සහ මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා නිසි ලෙස තක්සේරු කරමින් 2019 වසර සඳහා වූ බැංකු විදු පියෙසේ පුහුණු පාඨමාලා දින දර්ශනය සකස් කර ඇති අතර, සියලුම පාඨමාලා සෑම අංශයකින්ම ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාමට බැංකු විදු පියෙස නිරන්තරයෙන් කටයුතු කරනු ලැබේ.

## 4. සන්නිවේදන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙවර, එනම් ආර්ථික සහ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම සම්පූර්ණ කර ගැනීම සඳහා සහයෝගය දැක්වීම මෙන් ම මහ බැංකුවේ ආයතනික සේවා සහ නියෝජිත කාර්යයන්ට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීමේ කාර්යභාරය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ දී අඛණ්ඩ ව සිදු කරන ලදී. කථා, දේශන, රැස්වීම් සහ වැඩමුළු හරහා කෙරෙන ඍජු සන්නිවේදන කටයුතුවලට අමතර ව ඇල්මැති පාර්ශ්වයන් සමග සන්නිවේදනය සඳහා දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ නිල වෙබ් අඩවිය (www.cbsl.gov.lk), විවිධ මහ බැංකු ප්‍රකාශන, පුවත්පත්, රූපවාහිනිය මෙන් ම වීඩියෝ දර්ශන ද යොදා ගන්නා ලදී.

### 4.1 බාහිර සන්නිවේදන කටයුතු

2018 සැප්තැම්බර් 21 සහ 22 යන දෙ දින තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ දී සහ මහජන ක්‍රීඩාංගනයේ දී “මහ බැංකු විවෘත දිනය” පවත්වන ලදී. එහි දී එම ප්‍රදේශයේ වාසය කරන මූල්‍ය අංශයේ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, පොදු මහජනතාව ඇතුළු විවිධ ඉලක්කගත කණ්ඩායම් රාශියකට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම්වලට අදාළ විවිධ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් සිදු කෙරිණි. මෙම වැඩසටහනේ තවත් ඉලක්කයක් වූයේ එම කණ්ඩායම් අතර මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමයි. සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධ ගැටලු නිරාකරණය, පලුදු වූ මුදල් නෝට්ටු සඳහා නව නෝට්ටු හුවමාරු කර ගැනීම, කාසි අවශ්‍යතා සපුරා ගැනීම, වට්ටම් යටතේ මහ බැංකු ප්‍රකාශන මිලදී ගැනීම ආදී සේවාවන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූවනට හිමි විය. මෙහි දී අ.පො.ස. (උ.පෙ.) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 350ක් පමණ සහභාගී වූ විවිධ වැඩමුළු ද පැවැත්විණි.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇති ව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු නිල වෙබ් අඩවිය නව මුහුණුවරකින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම ඉදිරිපත් කිරීම 2018 මාර්තු 28 වන දා සිදු විය. විවිධ වෘත්තිකයින්, මාධ්‍යවේදීන්, සිසු සිසුවියන් ඇතුළු පොදු මහජනතාවට වෙබ් අඩවිය පහසුවෙන් පරිශීලනය කිරීමේ අවස්ථාව ලබා දීම මෙහි අරමුණ විය. ඒ තුළින් වෙබ් අඩවියේ ඇතුළත් වන තොරතුරු වෙත පහසුවෙන් හා වේගයෙන් මෙන් ම වඩාත් මිත්‍රශීලී ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාව එම පාර්ශ්වයන්ට හිමි වූ අතර ජංගම දුරකථන හරහා වෙබ් අඩවියට පිවිසීමේ අවස්ථාව ද සැලසිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙමළ වෙබ් අඩවියට BestWeb.lk 2018 තරගයේ ස්වර්ණ සම්මානය හිමි වීම ද මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

“මූල්‍ය ප්‍රතිපත්ති විවරණය” සහ මූල්‍යායතන සහ මූල්‍ය වෙළෙඳපොළට අදාළ මුදල් මණ්ඩල තීරණ ඇතුළත් පුවත්පත් නිවේදන ඇතුළු ව පුවත්පත් නිවේදන 438ක් 2018 වසරේ දී නිකුත් කෙරිණි. විවිධ ප්‍රතිපත්තිමය තීරණ පැහැදිලි කිරීම උදෙසා මාධ්‍ය හමු 16ක් ද පවත්වන ලදී. ගැසට් නිවේදන 11ක් ද නිකුත් වූ අතර පුවත්පත් දැන්වීම් 87ක් ද 2018 වසර තුළ දී මාධ්‍ය වෙත නිකුත් කෙරිණි. මීට අමතර ව විදුලි පණිවුඩ පැවරුම් (විනිමය) අනුපාතික, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පන අනුපාතික සහ ප්‍රතිපත්තිමය අනුපාතික සම්බන්ධ කෙටි පණිවුඩ සංඥා 488ක් ද යවන ලදී.

ඇල්මැති පාර්ශ්වයන් සමග සන්නිවේදනය වඩාත් පහසු කරනු පිණිස සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල සමාජ මාධ්‍ය ගිණුම් වන YouTube, Twitter සහ Facebook පරිපාලනය සහ අධීක්ෂණය කරනු ලැබී ය. 2017 සහ 2018 යන වර්ෂවල මහ බැංකු සමාජ මාධ්‍ය ගිණුම්වල ක්‍රියාකාරීත්වයේ සංසන්දනාත්මක විග්‍රහයක් සංඛ්‍යා සටහන II-2 හි දැක්වේ.

**II-2 සංඛ්‍යා සටහන**

**සමාජ මාධ්‍ය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන කටයුතු**

| සමාජ මාධ්‍ය වර්ග | 2017 | 2018 |
|---|---|---|
| යූටියුබ් (වීඩියෝ උඩුගතකිරීම්) | 63 | 37 |
| යූටියුබ් නැරඹීම් (සමස්තයක් ලෙස) | 177,454 | 64,996 |
| ෆේස්බුක් කැමැත්ත පළ කිරීම් (likes) (සමස්තයක් ලෙස) | 18,146 | 23,066 |
| ට්විටර් සාමාජිකයන් (සමස්තයක් ලෙස) | 17,990 | 23,010 |

අ.පො.ස. (උ.පෙ.) ශිෂ්‍ය ප්‍රජාවගේ ආර්ථික විද්‍යා දැනුම සහ මහ බැංකු ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය කරනු වස් සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කෙරෙන “Econ Icon - Season IV” තරගාවලියේ මූලික කටයුතු 2018 වසරේ දී ආරම්භ කරන ලදී. රූපවාහිනී තරග වටයට සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පාසල් 16ක් තෝරා ගැනීම සඳහා උසස් පෙළ ආර්ථික විද්‍යා විෂය නිර්දේශය (2017 වසරේ සිට 12 සහ 13 වසර සඳහා හඳුන්වා දුන්) පදනම් කරගත් ලිඛිත පරීක්ෂණය 2019 ජනවාරි 22 වන දින දිවයින පුරා පැවැත්විණ.

මහ බැංකුවේ පැවැත්වූ විවිධ සාකච්ඡා, සමුළු, සම්මන්ත්‍රණ, දේශන ආදිය සඳහා පහසුකම් සැපයීම ද සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් සිදු විය. ආචාර්ය ඩබ්. ඒ. විජේවර්ධන විසින් “මහ බැංකු ස්වාධීනත්වය පිළිබඳ නැවත හැරී බැලීමක්: මතුව එන ගැටලු විසඳන්නේ කෙසේද?” මැයෙන් පැවැත්වූ 68 වන සාංවත්සරික දේශනය, 2017 වාර්ෂික වාර්තාව එළිදැක්වීම, 2018 පෙර දැක්ම, ආසියානු නිෂ්කාශන සංගමයේ තාක්ෂණික කමිටු සැසිය සහ 11 වන වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු පිළිබඳ ව මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් වාර්තාමය ටෙලිනාට්‍යයක් සිංහල සහ දෙමළ භාෂාවලින් නිෂ්පාදනය කිරීමේ කටයුතු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදුව එය “රූපවාහිනී” සහ “නේත්‍රා” නාලිකා ඔස්සේ 2018 අගෝස්තු මාසයේ දී විකාශය විය.

2018 සැප්තැම්බර් 21 සිට 30 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වූ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සහභාගී වූ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු ප්‍රකාශන අලෙවිය සහ නොමිලේ බෙදාහැරීම සිදු කරන ලදී.

"ජනපතිට කියන්න" මහජන දුක්ගැනවිලි වැඩසටහන යටතේ මහ බැංකුවට ලැබුණු දුක්ගැනවිලි 325ක් සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු හා එක් වී කටයුතු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව මැදිහත් විය.

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ ව ලැබෙන මහජන ඉල්ලීම් පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු 2017 මාර්තු මස සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවට පවරා තිබුණු අතර, 2018 වසර තුළ දී මහජනතාවගෙන් ලැබුණු ඉල්ලීම් 102ක් සහ අභියාචන 13ක් සඳහා අදාළ කටයුතු අදාළ දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව සිදු කරන ලදී.

## 4.2 අභ්‍යන්තර සන්නිවේදන කටයුතු

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වන ජාතික පුවත්පත් 15ක පළ වූ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ආර්ථික කටයුතු සහ වෙනත් මූල්‍ය කාරණා සම්බන්ධ ලිපි, වාර්තා සහ මහජන මතය පෙන්වන පුවත්පත් ලිපි 6,392ක් කපා වෙන් කොට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අමතර ව වැදගත් පුවත්පත් නිවේදන මහ බැංකු කාර්ය මණ්ඩලය අතර ද බෙදා හරින ලදී.

මහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රවෘත්ති සඟරාව වන "කවුළුව" බැංකුවේ අභ්‍යන්තර වෙබ් අඩවිය වන "මංසල" වෙත උඩුගත කිරීම 2018 වසරේ දී ආරම්භ කරන ලදී.

## 4.3 මහජන දැනුම්වත්භාවය

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථිකය" යන මාතෘකා ප්‍රමුඛ පුළුල් පරාසයක පැතිරුණු විවිධ මාතෘකා ඔස්සේ දේශන මාලාවක් සම්බන්ධීකරණය කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව සමත් විය. පාසල් සිසු සිසුවියන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සහ ගුරුවරුන් ඇතුළු 15,742ක සහභාගීත්වය ඒ සඳහා ලැබිණි. ඒ පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-3 හි දැක්වේ.

**II-3 සංඛ්‍යා සටහන**

**2018 වසර තුළ පැවැත්වූ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| ආයතනය | වැඩසටහන් ගණන | සහභාගි වූ ගණන |
|---|---|---|
| පාසල් | 145 | 11,973 |
| විශ්වවිද්‍යාල | 5 | 200 |
| ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සහ ආරක්ෂක විශ්වවිද්‍යාලය | 4 | 148 |
| විදෙස් නියෝජිතයන් (ජාතික ආරක්ෂක විද්‍යාල) | 3 | 73 |
| ප්‍රධාන කාර්යාලයෙන් පිටත පැවැත්වූ ජංගම වැඩසටහන් | 16 | 3,348 |

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සංවිධානය කරන්නට යෙදුණු ජංගම වැඩසටහන් දෙකක් සඳහා සම්පත් දායකයන් සහ මහ බැංකු ප්‍රකාශන ලබා දීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය සහයෝගය දැක්වූ අතර, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇති ව මාධ්‍යවේදීන් සඳහා අධ්‍යාපනික වැඩසටහනක් ද පවත්වන ලදී.

2018 වසර තුළ දී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 3.6ක් වටිනා ප්‍රකාශන විකුණන ලදී. ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ සහ රාජගිරිය බැංකු විදු පියසේ පිහිටි විකුණුම් කවුළුවල දී, ප්‍රාදේශීය කාර්යාලවල දී සහ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ දී මෙම අලෙවි කටයුතු සිදු විය. මීට අමතර ව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පාසල් සහ විවිධ ප්‍රදේශවල මහජන පුස්තකාල සඳහා නොමිලේ බෙදා හරින ලද මහ බැංකු ප්‍රකාශන සංඛ්‍යාව 6,993කි.

## 4.4 දෙමළ පරිවර්තන සේවා

මහ බැංකුවේ දෙමළ සන්නිවේදන කටයුතු වඩාත් විධිමත් ලෙස කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව විශිෂ්ට දෙමළ පරිවර්තන සේවාවක් සපයන ලදී. මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශනවල පරිවර්තන කටයුතු ද මෙයට ඇතුළත් ය. ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුකූල වන ලෙස තොරතුරු භාෂාත්‍රයෙන් ම සැපයීමේ සිය මෙහෙවර සාර්ථක කර ගැනීමට මෙමගින් සන්නිවේදන දෙපාර්තමේන්තුවට හැකි විය.

## 4.5 ඡායාරූප සහ වීඩියෝ ආවරණ කටයුතු

2018 වසර තුළ දී අවස්ථා 390කට අධික ප්‍රමාණයක ඡායාරූප හෝ වීඩියෝ ආවරණ කටයුතු සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. ආවරණ කටයුතුවලට අමතර ව ඡායාරූප හා වීඩියෝ සංස්කරණය, ඡායාරූප මුද්‍රණය, ඇල්බම් සෑදීම, ඡායාරූප සහ වීඩියෝ සංගත තැටිවලට පිටපත් කිරීම, ඒවා මහ බැංකු නිල වෙබ් අඩවියට සහ අභ්‍යන්තර වෙබ් අඩවියට උඩුගත කිරීම ආදී සේවාවන් රැසක් ද වෘත්තීය මට්ටමෙන් ඉටු කෙරිණි.

## 4.6 මුද්‍රණාලය

මහ බැංකුවේ මුද්‍රණ අවශ්‍යතා ඉතා ඉහළ ප්‍රමිතියකින් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිර්මාණ, වර්ණයෝජන, මුද්‍රණ සහ නිමැවුම් දායකත්වය අඛණ්ඩ ව සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් සැපයිණි. 2018 වසරේ දී මුද්‍රණ ඇණවුම් 221ක් සම්පූර්ණ කිරීමට මහ බැංකු මුද්‍රණාලය සමත් විය. සටහන කලාප 10ක්, නිවිස් සර්වේ කලාප 7ක්, වයිප්පහම් කලාප 6ක්, "An Introduction to Principals of Economics - Part II", "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන" (භාෂාත්‍රයෙන්), "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත" (භාෂාත්‍රයෙන්), "A Step by Step Guide to Doing Business in Sri Lanka" (8 වන වෙළුම), "பணவீக்கத்தின் கதை (උද්ධමනයේ කතාව - දෙමළ පරිවර්තනය)" යන ප්‍රකාශන ඒවා අතර විය. ඊට අමතර ව වර්ණ පෝස්ටර්, අත්පත්‍රිකා, ලිපි ශීර්ෂ, නම්පත්, විවිධ පෝරම වර්ග සහ සුබපැතුම්පත් ද මුද්‍රණය කරන ලදී.

### 4.7 පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

ආර්ථික සංවර්ධනය ඇතුළු විෂය ක්ෂේත්‍රයන් රාශියක් සම්බන්ධයෙන් වර්ධනය කරගත් නවතම දැනුම් සම්භාරයක් සහිත ව සිය වෘත්තීය භූමිකාව මනා ලෙස ඉටු කිරීමට මහ බැංකු නිලධාරීන් හට සහාය වීමේ අරමුණින් පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය පොත් 30,829කින්, වාර්තා 19,600කින් සහ සංගත තැටි 2,079කින් සමන්විත ය. 2018 වසර තුළ දී එකතු වූ පොත් 229ක්, වාර්තා 100ක් සහ සංගත තැටි 144ක් ද එයට අයත් වේ. ඊට අමතර ව ජර්නල 48,650ක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය සතු වේ. ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරෙන සුවිසල් ප්‍රකාශන එකතුවකට පිවිසිය හැකි "Science Direct", "EconLit" සහ "Wiley Online Journals" යන මංගත දත්ත පදනම්වල දායකත්වය ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් ලබා ගෙන ඇත. මේවාට අමතර ව මහ බැංකුකරණයට අදාළ තොරතුරු ලබාගත හැකි "www.centralbanking.com", "www.risk.net" සහ "www.ft.com" යන මංගත මූලාශ්‍රවල ද දායකත්වය ලබාගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය එම මූලාශ්‍රවලට පිවිසීමේ අවස්ථාව කාර්ය මණ්ඩලයට ලබා දී ඇත. ජර්නල ලිපිවලට ප්‍රවේශවීම සඳහා "OpenAthens"හි දායකත්වය ලබාගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය දේශීය මුද්‍රිත ජර්නල 18කට සහ විදේශීය මුද්‍රිත ජර්නල 84කට ද දායක වී ඇත.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන රාශියක් අන්තර්ජාලය හරහා කාර්ය මණ්ඩලය වෙත බෙදා හැරේ. පුස්තකාලය වෙත එකතු වූ නව පොත් ගැන සඳහන් "Recent Additions", ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍යය පිළිබඳ වාර්තා සහ සටහන් ඇතුළත් "Current Contents", "International News Alert", "Local Press"යන ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන ඒවා අතර වේ. කාර්ය මණ්ඩලයේ ඉල්ලීම මත අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑල හරහා ලබා දීමේ සේවාවක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යයි.

අන්තර් පුස්තකාල ණය පහසුකම යටතේ ප්‍රයෝජනවත් තොරතුරු බැංකු කටයුතු හා ආර්ථික විද්‍යා පුස්තකාල වෙත ලබා දීමේ සේවාවක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යයි. එසේ ම ලොව පුරා මහ බැංකු සහ මූල්‍යායතන අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ඇති Global Central Bank, Financial Institutions Library සහ Information Professionals' Network (CBFA List යන සමූහයන් තුළ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ක්‍රියා කරයි. පුස්තකාලයේ අන්තර්ජාල වෙබ් අඩවිය හරහා ඩිජිටල් පුස්තකාලයට ප්‍රවේශ වීමේ අවස්ථාව ද කාර්ය මණ්ඩලය වෙත පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් සලසා දී ඇත.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ නියමයන් අනුව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි යන දෙවර්ගයේම මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මෙම කාර්යය ඉටු කිරීමේ දී ව්‍යවහාර මුදල් නෝට්ටු නිර්මාණය කිරීම, මුද්‍රණය කිරීම, කාසි ටංකනය කිරීම සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි බෙදා හැරීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මුදල් මණ්ඩලය සතු මෙම ව්‍යවස්ථාපිත වගකීම සම්බන්ධ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. සංසරණයේ ඇති මුදල්වල වටිනාකම හා නිර්ව්‍යාජබව ආරක්ෂා කරමින් මෙන්ම ව්‍යවහාර මුදල් සඳහාවන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් තොග පවත්වා ගනිමින් ආර්ථිකයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍යවන ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැංවීමේ සහ පවත්වාගෙන යාමේ කාර්යයෙහි ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව අඛණ්ඩව නිරත වී සිටී.

### 5.1 ව්‍යවහාර මුදල් මුද්‍රණය හා ටංකනය

සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ නෝට්ටු පවත්වා ගැනීමත්, ආර්ථිකය තුළ ව්‍යවහාර මුදල් සඳහාවන ඉල්ලුම සපුරාලීමත් යන කරුණු තහවුරු කිරීම සඳහා, 2018 වර්ෂයේ දී, ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 121 ක් මුද්‍රණයකර ගෙන්වා ගැනීමට හා කාසි මිලියන 311.4 ක් ටංකනයකර ගෙන්වා ගැනීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. 2016-2017 වර්ෂයන්හි නිර්මාණයකර සම්පාදනය කරන ලද මල නොබැඳෙන වානේවලින් නිෂ්පාදිත රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 යන කාසිවලින් සමන්විත නව කාසි කාණ්ඩය 2018 දෙසැම්බර් 03 දින සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සංසරණයට නිකුත් කරන ලදී. ටංකන පිරිවැය අවම කිරීම, වැඩි කල් පැවැත්ම, කාසි හැසිරවීම පහසු කිරීම හා දෘශ්‍යාබාධිත පුද්ගලයන් හට හඳුනාගැනීම පහසු කිරීම යන අරමුණු ඇතිව මෙම නව කාසි කාණ්ඩය නිර්මාණය කිරීමට කටයුතු කරන ලදී.

### 5.2 ව්‍යවහාර මුදල් බෙදා හැරීම

#### (අ) සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

තාක්ෂණය පාදක කරගත් මුදල් නොවන ගෙවීම් මාධ්‍යයන් හි අඛණ්ඩ භාවිතයක් පැවතිය ද, ශ්‍රී ලංකා ආර්ථිකයේ ආර්ථික වර්ධනය හා උද්ධමනයට අනුරූපව 2018 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සඳහා වූ ඉල්ලුම ඉහළ ගොස් ඇත. ඒ අනුව, සංඛ්‍යා සටහන II-4 හි දක්වා ඇති පරිදි පෙර වර්ෂයට සාපේක්ෂව 2018 දෙසැම්බර් 31 දිනවන විට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල්වල වටිනාකම රුපියල් බිලියන 640.3 දක්වා සියයට 7.2 කින් වර්ධනය වී ඇත.

**II-4 සංඛ්‍යා සටහන**

**සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් (වර්ෂාවසානයට)**

| නිකුතු | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස (ප්‍රතිශතයක් ලෙස) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| නෝට්ටු | 408.8 | 482.0 | 541.5 | 585.3 | 627.1 | 23.0 | 17.9 | 12.3 | 8.1 | 7.1 |
| කාසි* | 7.5 | 9.1 | 10.7 | 12.1 | 13.2 | 10.3 | 21.3 | 17.5 | 12.1 | 9.1 |
| එකතුව | 416.3 | 491.1 | 552.2 | 597.4 | 640.3 | 22.7 | 18.0 | 12.4 | 8.2 | 7.2 |

*සංසරණය නොවන සමරු කාසි ඇතුළත් නොවේ.

රූප සටහන II-1 හි දක්වා ඇති පරිදි, 2018 වර්ෂය තුළ දී සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් නොට්ටුවල වටිනාකම රුපියල් බිලියන 627.1 දක්වා සියයට 7.1 කින් වැඩි වී ඇති අතර වර්ෂාවසානයේ (2018.12.31 දිනට) සංසරණයේ පැවති රු.5000 සහ රු.1000 මුදල් නෝට්ටුවල වටිනාකම එක්ව ගත් කල එය ආසන්න වශයෙන් එදිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 87 කි.

**II-1 රූප සටහන**

**සංසරණයේ පැවති මුදල් නෝට්ටුවල වටිනාකම**




2013 වර්ෂයේ දී සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 3.54 ක් වූ අතර එය 2018 වර්ෂාවසානයේ දී සියයට 4.43 දක්වා ඉහළ යෑම, රට තුළ ප්‍රධාන ගෙවීම් මාධ්‍යයක් ලෙස ව්‍යවහාර මුදල් සඳහා පවතින ඉල්ලුම වැඩි වී ඇති බව පෙන්නුම් කරයි. (රූප සටහන II-2).

**II-2 රූප සටහන**

**සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් / දළ දේශීය නිෂ්පාදිතය**




**(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ව්‍යවහාර මුදල් නිකුත් කිරීම**

බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිති පතා සැපයීම මගින් සහ ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙ හි ස්ථාපිතකර ඇති මහජන මුදල් කවුළුව හරහා මහජනතාව වෙත කාසි නිකුත් කිරීම මගින් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සඳහා වූ මහජන ඉල්ලුම සපුරාලීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව නොකඩවා කටයුතු කරන ලදී. ඒ අනුව, 2018 වර්ෂය තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 795.4 ක වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 610.1 ක් සහ රුපියල් බිලියන 1.1 ක වටිනාකමින් යුත් කාසි මිලියන 197.8 ක් සංසරණය සඳහා නිකුත් කර ඇත. (සංඛ්‍යා සටහන II-5 හා රූප සටහන II-3). කාසිවල අඩු මිල දී ගැනීමේ හැකියාව හේතුවෙන්, 2016 වර්ෂයේ සිට කාසි සඳහා වූ ඉල්ලුම අඩු වීමේ ප්‍රවණතාවයක් පවතී.

**II-5 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| නෝට්ටු | 431.8 | 503.4 | 594.0 | 628.0 | 795.4 |
| කාසි | 0.8 | 1.6 | 1.6 | 1.4 | 1.1 |
| එකතුව | 432.6 | 505.0 | 595.6 | 629.4 | 796.5 |

ප්‍රාදේශීය මට්ටමේ කාසි අවශ්‍යතාවය සපුරාලීම සඳහා දිවයින පුරා කාසි බෙදා හැරීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හරහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රාදේශීය කාර්යාලවලට හා ප්‍රාදේශීය මට්ටමේ ශාඛා වලට කාසි බෙදා හැරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

**II-3 රූප සටහන**

**ව්‍යවහාර මුදල් නිකුතුව[1] - ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සංඛ්‍යාව**




1 නව හා සේවා නිසි යන දෙයාකාරයේම ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි ව්‍යවහාර මුදල් නෝට්ටු හා කිසි ව්‍යවහාර මුදල් නිකුතු ලෙස සලකනු ලැබේ.

### (ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම

ව්‍යවහාර මුදල් මෙහෙයුම් කාර්යයේ කොටසක් වශයෙන් මෙන්ම මූලිකවම මූල්‍ය ප්‍රතිපත්ති මෙවලමක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සඳහා ද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බාර ගනු ලැබේ. සංඛ්‍යා සටහන II-6 හි දක්වා ඇති පරිදි, 2018 වර්ෂය තුළ දී සේවා නිසි (භාවිතයට සුදුසු) සහ හානි වූ නෝට්ටු ද ඇතුලත් ව සේවා අනිසි (භාවිතයට නුසුදුසු) නෝට්ටු යන දෙයාකාරයම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බාර ගන්නා ලදී. පෙර වර්ෂය හා සසඳන විට 2018 වර්ෂයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත සිදු කළ මුදල් තැන්පතු ප්‍රමාණය සියයට 29.1 කින් වැඩි වී ඇත.

**II-6 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ ව්‍යවහාර මුදල් තැන්පතු**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 |
| නෝට්ටු | 429.6 | 534.5 | 584.0 | 753.7 | 21.1 | 24.4 | 9.2 | 29.1 |

සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කරනු ලබන කාසිවල වටිනාකම සැලකිය යුතු අගයක් නොගනී.

### (ඇ) සමරු කාසි නිකුත් කිරීම සහ සමරු අයිතම විකිණීම

ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරය සැමරීම නිමිත්තෙන් රු.1000 ක මුහුණත වටිනාකමක් සහිත සංසරණයට නිකුත් කෙරෙන සමරු මුදල් නෝට්ටුවක් 2018 පෙබරවාරි මාසයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.

මීට අමතරව, ශ්‍රී ලංකා සංඥා බලකායේ 75 වැනි සංවත්සරය සැමරීම නිමිත්තෙන්, එහි ජාතික දායකත්වය අගයමින්, රු.10 ක මුහුණත වටිනාකමක් සහිත සමරු කාසියක් 2018 නොවැම්බර් මාසයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සංසරණයට නිකුත් කරන ලදී. සමරු අයිතම අලෙවි කිරීම කොළඹ කොටුවෙ හි පිහිටි ආර්ථික කෞතුකාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරුණි.

## 5.3 පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

සේවා අනිසි/භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කරමින් රට තුළ ගුණාත්මක තත්ත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටුවල පැවැත්ම තහවුරු කිරීමේ අරමුණ ඇතිව පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, පිරිසිදු මුදල් සංසරණයේ පැවතීම මගින් රටේ ධනාත්මක ප්‍රතිරූපයක් පිළිබිඹු කරන බැවින් 2018 වර්ෂයේ දී පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලදී.

2018 වර්ෂය තුළ දී, සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටුවල අඛණ්ඩ සැපයුම තහවුරු කිරීමටත්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරනු ලැබූ මුහුණත වටිනාකම රුපියල් බිලියන 252.2[2] ක් වූ භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 343.8 ක් විනාශ කිරීම තුළින් සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීමටත්, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මීට අමතරව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරනු ලැබූ මුහුණත වටිනාකම රුපියල් බිලියන 467.0 ක් වූ සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 231.5 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නැවත සංසරණයට නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිති පතා සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු අතර වූ සිතාමතා විකෘති කරන ලද, හානි කරන ලද හෝ වෙනස් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සංඛ්‍යාවෙහි වැඩි වීම සැලකිල්ලට ගැනීමෙන්, ව්‍යවහාර මුදල් නෝට්ටු සිතාමතා විකෘති කිරීම, හානි කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධ නීති දැඩිව බලාත්මක කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

එවැනි පුරුදු වලින් වළකින ලෙසත්, තමා සන්තකයේ පවතින එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු 2018.12.31 දිනට පෙර පිරිසිදු මුදල් නෝට්ටුවලට හුවමාරු කර ගන්නා ලෙසත් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඉතා සාර්ථක දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක් පවත්වන ලදී.

## 5.4 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට සහාය ලබාදීම

මුදල් නීති පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ව්‍යවහාර මුදල් නෝට්ටු ව්‍යාජානුකරණය කිරීමට අදාළව නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට නිරන්තර සහාය ලබාදීම සම්බන්ධයෙන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2018 වර්ෂය තුළ දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නයන්ට අදාළව පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශය හා නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් සමඟ සමීපව කටයුතු කරන ලදී. 2018 වර්ෂයේ දී අනාවරණය කරගත් ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 1625 ක් වේ. සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියනයකට ඇති ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව ලෙස මනිනු ලබන ව්‍යාජ මුදල් නෝට්ටු අනුපාතය 2017 වර්ෂය සඳහා 5 ක් වූ අතර එයට සාපේක්ෂව 2018 වර්ෂය සඳහා එම අගය 1.6 ක් දක්වා අඩු වී ඇත.

(ආ) අධිකරණමය නඩු විභාගයන්වල දී, ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සඳහා වූ තීරණාත්මක සාක්ෂ්‍යය වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව අධිපතිතුමාගේ අත්සන සහිතව පිටසන් කරන ලද සහතික 108 ක් නිකුත් කරන ලදී.

2 සිතාමතා විකෘති කරන ලද, හානි කරන ලද හෝ වෙනස් කරන ලද මුදල් නෝට්ටු සම්බන්ධයෙන් වූ නීති දැඩිව බලාත්මක කිරීම හේතුකොටගෙන පසුගිය වසරවලට සාපේක්ෂව විනාශ කරන ලද මුදල් නෝට්ටු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගනී.

(ඈ) ව්‍යවහාර මුදල් ව්‍යාජානුකරණය සම්බන්ධව සාක්ෂ්‍යය ලබාදීමට අධිකරණමය නඩු විභාග 15 ක් සඳහා සහභාගිවන ලදී.

### 5.5 මහජනතාව දැනුම්වත් කිරීම

සාමාන්‍ය මහජනතාව, පොලිස් නිලධාරීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයන් හා රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ඉතිහාසය, ආරක්ෂණ සළකුණු, මුදල් භාවිතයේ හොඳ පුරුදු හා ඵලදායී කාසි භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් රැසක් පැවැත්වීමට 2018 වර්ෂය තුළදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලැබීය.

(අ) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය, විවිධ බලපත්‍රලාභී බැංකු, පොලිස් ස්ථාන සහ පාසල් යන ස්ථානයන්හී දී සම්මන්ත්‍රණ/වැඩමුළු 23 ක් පැවැත්වීම.

(ආ) රට පුරා පැවති ප්‍රදර්ශන 09 ක දී ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීම.

(ඇ) ප්‍රධාන වශයෙන් පාසල් සිසුන්, සංචාරකයින් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළුව 10,500 පමණ නරඹන්නන් පිරිසකට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කෞතුකාගාර තුන නැරඹීමේ පහසුකම් සලසාදෙමින් පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය සහ ව්‍යවහාර මුදල් ව්‍යාජානුකරණයේ ප්‍රතිවිපාක මූලික කරගත් අත් පත්‍රිකා හා තොරතුරු පත්‍රිකා බෙදා දීම.

(ඈ) ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම පිළිබඳ සාකච්ඡාමය වැඩසටහනක් ප්‍රධාන රූපවාහිනී නාලිකාවක් ඔස්සේ පැවැත්වීම.

### 5.6 ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා අවසර ලබා දීම

මුදල් මණ්ඩලය විසින් අනුමත ප්‍රත්පත්තියට අනුගතව ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදන 6 ක් සඳහා 2018 වර්ෂය තුළ දී අනුමැතිය ලබා දෙන ලදී.

### 5.7 මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමට මුද්‍රණ සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය අවසානයේ දී සෑම ව්‍යවහාර මුදල් නෝට්ටුවක්ම තනි තනිව පරීක්ෂාකර ගුණාත්මකබව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීමත් සමඟ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු නවීකරණය කිරීම මගින් ස්වයංක්‍රීයකරණයට ළඟාවීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් තවත් පියවරක් තබන ලදී.

## 6. දේශීය මෙහෙයුම් කටයුතු

### 6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනත මගින් පැවරී ඇති විධිවිධානවලට අනුව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවට වෙළඳ කටයුතු සිදු කිරීම, නිත්‍ය පහසුකම් ලබා දීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පවත්වා ගැනීම නියාමනය කිරීම, රජය, රාජ්‍ය නියෝජිත ආයතන සහ රජය වෙනුවෙන් කටයුතු කරන අනෙකුත් ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස ක්‍රියාකිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල බැංකුකරු ලෙස කටයුතු කිරීම, රජයට කෙටිකාලීන අත්තිකාරම් සැපයීම, තත්කාලීන දළ පියවුම් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල පියවීම් ගිණුම් පවත්වාගෙන යෑම සහ තත්කාලීන දළ පියවුම් පද්ධතියේ සහභාගිවන්නන්ට දිනය ඇතුළත ණය පහසුකම ලබාදීම යනාදී ප්‍රධාන කාර්යයන් ගණනාවක් සිදු කරනු ලබයි.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්තියට ගැළපෙන පරිදි කෙටිකාලීන පොලී අනුපාතික පවත්වා ගෙන යෑමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අඛණ්ඩව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය. වැඩිදියුණු කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු විචලතාවයකින් යුතුව අපේක්ෂිත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා මෙන්ම, මුදල් ප්‍රතිපත්තිය සංඥා කිරීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවට වෙළඳ කටයුතු සිදු කරන ලදී. මේ අතර, සහභාගිත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතාවය සපුරා ලීමට දෛනික පදනමින් නිත්‍ය පහසුකම ද නොකඩවා ලබාදෙන ලදී. ඒ අනුව, 2018 වසරේදී මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ කටයුතු, විවට වෙළඳ කටයුතු යොදාගත් ස්වභාවය සහ සිදුකළ වාර ගණන, ප්‍රතිපත්ති පොලී අනුපාතික, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි පරාසය, ප්‍රතිපත්ති සංඥා කිරීමේ විලාසය සහ ඉහළ විනිවිදභාවය වැනි වෙනස්වීම් මධ්‍යයේ තවදුරටත් ක්‍රියාත්මක විය.

විදේශ විනිමය වෙළෙඳපොළ මත වන පීඩනය අවම කිරීමේ අරමුණින් සැප්තැම්බර් මාසයේදී මෝටර් රථවාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයට අදාළව ණයවර ලිපි විවෘත කිරීමේදී ඊට සමාන මුදල් තැන්පතුවක් (මුදල් ආන්තිකයක්) පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් පනවන ලදී. ඒ අනුව, මෝටර් රථවාහන ආනයනයේදී සියයට දෙසීයක අවම මුදල් තැන්පතුවක් ද පාරිභෝගික නොවන භාණ්ඩ ආනයනයේදී සියයට සියයක අවම මුදල් තැන්පතුවක් ද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වා ගෙන යා යුතු බවට නියම කරන ලදී. තවද, 2018 ඔක්තෝබර් 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වාගෙන යනු ලබන එවැනි මුදල් තැන්පතු මත පවත්වාගත යුතු අවම සංචිතය සියයට සියයක් ලෙස පනවන ලදී.

මුදල් වෙළඳපොළෙහි මිල ගවේෂණ ක්‍රියාවලියේදී මුදල් වෙළඳපොළෙහි සිදුවන ගනුදෙනු පිළිබඳ නිරවද්‍ය තත්කාලීන තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව ඉතා වැදගත් වේ. ඒ අනුව, 2018 මාර්තු 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඒක්ෂණ වෙළෙඳපොළ ගනුදෙනු, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ තොරතුරු වාර්තා කිරීම සඳහා මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය (Central Integrated Market Monitor-CIMM) හඳුන්වා දෙන ලදී. තවද, බැංකු පද්ධතියෙහි දෛනික ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් විසින් සෑම වැඩ කරන දිනකදී 08.30 පැයට පෙර තම ද්‍රවශීලතා පුරෝකථන ඉහළ නිරවද්‍යතාවකින් යුතුව මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය හරහා වාර්තා කළ යුතු වේ.

### 6.2.1 විවෘත වෙළඳ කටයුතු

(අ) ද්‍රවශීලතා පුරෝකථනය

පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට යෝග්‍ය වන පරිදි අවශ්‍ය විවෘත වෙළඳ කටයුතුවල ස්වභාවය නිර්ණය කිරීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව මෙන්ම වෙළෙඳපොළ සහභාගීත්ව ආයතන අතර ද්‍රවශීලතා ව්‍යාප්තිය පිළිබඳව දෛනිකව පුරෝකථනය කරනු ලබයි. ද්‍රවශීලතා පුරෝකථනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිවලට අදාළ ක්‍රියාමාර්ග මෙන්ම සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන විදේශ විනිමය ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිත ප්‍රමාණයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය සමඟ සිදු කරන ගනුදෙනු ඇතුළු ස්වායත්ත සාධක සැලකිල්ලට ගනු ලබයි. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව පිළිබඳ ඇස්තමේන්තු මෙන්ම, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම සහ වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතා ව්‍යාප්තිය ඇතුළු අනෙකුත් සාධක ද සැලකිල්ලට ගනිමින් විවිධ ආකාරයේ විවෘත වෙළඳ උපකරණ භාවිතා කරයි.

(ආ) වෙන්දේසි

**(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

2018 වසර තුළදී, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා අවශ්‍යතාව පරිදි එක්දින, කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව දෛනිකව අවශෝෂණය කිරීම සඳහා එක්දින ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පවත්වන ලදී. සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ ක්‍රමයක් ලෙස එදිනම පියවීමේ පදනම මත, කෙටිකාලීන ප්‍රතිමිලදීගැනීමේ වෙන්දේසි පවත්වන ලදී. මේ අතර, අතිරික්ත ද්‍රවශීලතාව දිගුකාලීනව පවතින විට දින හතකට වඩා වැඩි කාලසීමාවක් සඳහා ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ අරමුණු සහිතව ඊළඟ ව්‍යාපාර දිනයේදී පියවීමේ පදනම මත, දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී.

**II-7 සංඛ්‍යා සටහන**

| ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|---|
| එක්දින | 103 | 1,724.50 | 1,218.68 |
| කෙටි කාලීන | 57 | 547.00 | 214.95 |
| දිගු කාලීන | 55 | 429.50 | 96.63 |

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

වෙළෙඳපොළට ද්‍රවශීලතාව සැපයීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් එක්දින, කෙටි කාලීන සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. විශේෂයෙන්ම, අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල අවශ්‍යතාව පරිදි වරින්වර එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලද අතර, සැප්තැම්බර් මැද භාගයේ සිට ප්‍රතිවිකුණුම් වෙන්දේසි අඛණ්ඩව පවත්වන ලදී.

**II-8 සංඛ්‍යා සටහන**

| ප්‍රතිවිකුණුම් වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|---|
| එක්දින | 107 | 2,531.00 | 2,099.10 |
| කෙටි කාලීන | 70 | 1,400.80 | 968.71 |
| දිගු කාලීන | 31 | 830.00 | 317.91 |

**(iii) ස්ථිර පදනම මත වූ වෙන්දේසි**

2018 වසර තුළදී මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සඳහා ස්ථිර පදනමින් බලපෑම් කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත්වල හිමිකාරීත්වයද වෙනස් වීමට හේතුවන ස්ථිර පදනම මත වූ භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු වෙන්දේසි පවත්වන ලදී.

**II-9 සංඛ්‍යා සටහන**

| ස්ථිර පදනම මත වූ වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි ප්‍රමාණය | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|---|
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා) | 98 | 241.50 | 63.73 |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම (ද්‍රවශීලතාව සැපයීම සඳහා) | 110 | 475.00 | 40.50 |

ප්‍රාථමික වෙළෙඳපොළ වෙතින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හේතුකොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය ඉහළ යෑමේ බලපෑම සමනය කිරීමේ අරමුණින් 2018 ප්‍රථම කාර්තුව තුළදී ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි වැඩි වශයෙන් පවත්වන ලදී. 2018 ජනවාරි මාසයේදී මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් බිලියන 60 කින් වැඩි වීමට සාපේක්ෂව, රුපියල් බිලියන 56.3 ක භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරන ලදී.

කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් මස මැද සිට දේශීය මුදල් වෙළඳපොළෙහි ඉහළ ද්‍රවශීලතා හිඟයක් ඇතිවීමත් සමඟ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ වෙන්දේසි හරහා ද්‍රවශීලතාව වෙළෙඳපොළට මුදා හැරීමට කටයුතු කරන ලදී.

#### 6.2.2 නිත්‍ය පහසුකම

මුදල් වෙළෙඳපොළ එක්දින පොලී අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වා ගැනීම සඳහා සහභාගිත්ව ආයතනවලට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම වසර පුරාම ලබා දෙන ලදී. අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ සහ විවට වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීල අවශ්‍යතා සම්පූර්ණයෙන්ම සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතනවලට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ ද්‍රවශීලතාව ලබා දුන් අතර, සහභාගිත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට නිත්‍ය තැන්පතු පහසුකම සපයන ලදී. 2018 වසරේදී නිත්‍ය තැන්පතු පහසුකම යටතේ දෛනික සාමාන්‍ය රුපියල් බිලියන 18.8 ක් ලෙස වාර්තා වූ අතර, එහි සමස්ත වටිනාකම රුපියල් බිලියන 4,502.9 ක් විය. එසේම, නිත්‍ය ණය පහසුකම යටතේ ලබාදුන් සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 3,057.5 ක් වූ අතර, එහි දෛනික සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 13.4 ක් විය.

#### 6.2.3 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධානවලට අනුකූලව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව එකී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි දෛනිකව අනිවාර්යයෙන් පවත්වා ගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මගින් තීරණය කරනු ලබයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අවශ්‍යතාව යටතේ සංචිත පවත්වාගෙන යෑම පරිපාලනය කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. සියයට 7.50 ක් ලෙස පැවති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2018 නොවැම්බර් මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 6.0 ක් දක්වා පදනම් අංක 150 කින් අඩු කරන ලදී.

#### 6.2.4 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටි කාලීන අත්තිකාකරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, 2018 වසර තුළදී කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවකට මෙම පොලී අනුපාතිකය යටතේ මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවක් ඇති නොවීය.

### 6.3 රජයේ සහ වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

#### 6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් විසින් මහ බැංකුව තුළ පවත්වාගෙන යනු ලබන පියවීම් ගිණුම් හරහා මූල්‍ය පද්ධතිය හා සම්බන්ධව පවතී. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි පවත්වා ගෙන යනු ලබන මෙම ගිණුම් මගින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගීත්ව ආයතන අතර සිදු වන නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල සහ අනෙකුත් ගනුදෙනුවලට අදාළ වන ගෙවීම් නිෂ්කාශනය හා පියවීම් කටයුතු සඳහා පහසුකම් සැලසීමත් සිදු කෙරේ. තවද බලපත්‍රලාභී වාණිජ බැංකු ඔවුන්ගේ සංචිත පවත්වා ගැනීම සඳහා ද මෙම ගිණුම් භාවිතා කරයි. වාණිජ බැංකු අතර නොයෙකුත් ගෙවීම් හා නිෂ්කාශන පද්ධති, එනම් ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (CITS), ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) හරහා සිදු වන ශුද්ධ පියවීම් තත්කාලීන දළ පියවුම් පද්ධතිය හරහා සිදු වන අතර, එම ක්‍රියාවලියට පහසුකම් සැලසීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. 2018 අවසානයේදී, බලපත්‍රලාභී වාණිජ බැංකු 26 ක් ද, ප්‍රාථමික අලෙවිකරුවන් 8 ක් ද, සේවක අර්ථසාධක අරමුදල සහ මධ්‍යම තැන්පතු ක්‍රමය සඳහා ද පියවීම් ගිණුම් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි පවත්වා ගෙන යන ලදී.

#### 6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටුකරමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, නියෝජිත ආයතන සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ගිණුම් පවත්වා ගෙන යෑම අඛණ්ඩව සිදු කරන ලද අතර, එම ගිණුම් හිමියන්ට අවශ්‍ය බැංකු පහසුකම් සැපයීමද සිදු කරන ලදී. 2018 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වාගෙන යන ලද එවැනි ගිණුම් සංඛ්‍යාව 64 ක් විය. ඒ අනුව, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් රුපියල් බිලියන 17,920.8 ක් වටිනා ගනුදෙනු 18,005 ක් සිදු කරන ලදී. එම ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට වැඩි ප්‍රතිශතයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව, යම් මුදල් වර්ෂයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව මහ බැංකුව විසින් රජයට පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබාදීමට කටයුතු කරනු ලැබේ. 2017 වසරේදී රජයට ලබාදුන් රුපියල් බිලියන 203.9 ක් වූ තාවකාලික අත්තිකාරම් මුදල සමග සැසඳීමේදී, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2018 වසර සඳහා වූ ඇස්තමේන්තු කරන ලද රාජ්‍ය ආදායම පාදක කරගනිමින් වසර ආරම්භයේදී රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 225.0 ක් දක්වා රුපියල් බිලියන 21.1 කින් වැඩි විය.

### 6.4. දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

සහභාගිත්ව ආයතනවලට ද්‍රවශීලතා පහසුකම හරහා දිනය තුළ අරමුදල් සැපයීම තුළින් තත්කාලීන දළ මෙහෙයුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යැමට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සහය දෙන ලදී. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ගාස්තුවකින් තොරව මෙම පහසුකම් සැපයීම සිදු කරන අතර, සුරැකුම්පත්වල වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් අනුව සුරැකුම්පත්වල වටිනාකම නිර්ණය කරන අතර, දිනය තුළදී එහිදී, සිදුවිය හැකි උච්චාවචනයන් සැලකිල්ලට ගනිමින් වටිනාකම ආවරණය කර ගත හැකි පරිදි ප්‍රමාණවත් ගැළපීමක් සිදු කරනු ලබයි.

වසර තුළදී දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය සහ එහි දෛනික සාමාන්‍යය, පිළිවෙළින්, රුපියල් බිලියන 13,275 ක් සහ රුපියල් බිලියන 55 ක් විය. පෙර වසරේ පැවති සමස්ත වටිනාකම වූ රුපියල් බිලියන 11,430 සහ දෛනික සාමාන්‍යය වූ රුපියල් බිලියන 47.4 හා සැසඳීමේදී දෛනික ද්‍රවශීලතා පහසුකම භාවිතය ඉහළ යැමක් පෙන්නුම් කරයි.

### 6.5. බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

මුදල් වෙළෙඳපොළ මිල ගවේෂණ ක්‍රියාවලියේදී බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වල වැදගත්කම සලකා බලමින් සහ එම සමාගම්වල මැදිහත්වීමේදී ඇති විය හැකි වෙළෙඳපොළ අවහිරතා අවම කිරීමේ අරමුණින් 2013 පෙබරවාරි මස 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් නීති පනතේ 10(සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. අනතුරුව, 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසිය සංශෝධනය කර ඉදිරිපත් කළ 2016 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි අවලංගු කොට 2018 මාර්තු මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. මෙහි අන්තර්ගත කරන ලද නව අංග ලෙස, විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් පිළිබඳ නියාමන බලතල මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පැවරීම, බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වල ප්‍රධාන නිලධාරීන්ගේ සහ එම සමාගම්වල සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් හිමි කොටස් හිමියන්ගේ යථා යෝග්‍ය බව ඇගයීම සඳහා නව නීති හඳුන්වාදීම, රෙගුලාසි උල්ලංඝනයකදී අදාළ වන නව සම්බාධක ඇතුළත් කිරීම සහ ගනුදෙනු තොරතුරු මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතියට වාර්තා කිරීමේ අවශ්‍යතාව ඇතුළත් කිරීම ආදිය දැක්විය හැකිය.

බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වල වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය සහ පරිචයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, මුදල් තැරැව්කරණ කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑතකාලීනව ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය. බලයලත් මුදල් තැරැව්කරුවන් හරහා සිදුකරනු ලබන ගනුදෙනු වාර්තා කිරීම සඳහා 2016 වසරේදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නව මංගත පද්ධතියක් හඳුන්වා දෙන ලද අතර, එය 2017 වසරේදී "මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය" නම් වූ නව මංගත පද්ධතියක් ලෙස වැඩිදියුණු කරන ලදී. වර්තමානයේදී සහභාගිත්ව ආයතන (බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන්) සහ බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි, රාජ්‍ය සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළඳපොළෙහි සිදු කරනු ලබන ගනුදෙනු 2018 මාර්තු මාසයේදී ක්‍රියාවට නැංවූ මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය ඔස්සේ වාර්තා කිරීම සිදු කෙරේ. තවද, බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ මූල්‍ය වාර්තා සහ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීම සඳහා වන මංගත වාර්තා කිරීමේ පද්ධතියක් ද 2018 වසරේදී හඳුන්වා දෙන ලදී. බලයලත් මුදල් තැරැව්කරුවන් ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුගත වෙමින් ඉහළ අවංකභාවයකින් සහ වෘත්තීයමයභාවයකින් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම තහවුරු කිරීමේ අරමුණින් 2018 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් නිකුත් කරන ලදී.

ඉහත සඳහන් කර ලද රෙගුලාසි අනුව 2018 වසර අවසාන වන විට, සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කරන ලද අතර එම සමාගම් "බලයලත් මුදල් තැරැව්කරුවන්" ලෙස නම් කර ඇත. 2018 වසර තුළ එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සමග රැස්වීම් 6 ක් සහ එතැන් පරීක්ෂණ 9 ක් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

**බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ලේඛනය**

1. බාට්ලීට් මැක්ලේයි ඇන්ඩ් රෝයි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඉස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
5. සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

# 7. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

1949 මුදල් නීති පනත යටතේ, 1950 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කිරීමට සමගාමීව ආර්ථික ප්‍රතිපත්ති උපදේශන පර්ෂදයේ සාමාජික දෙපාර්තමේන්තුවක් ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මුදල් නීති පනතේ 25 වන වගන්තියට අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයට සහ අධිපතිතුමාට ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ සිදු කිරීම සහ තොරතුරු සම්පාදනය කිරීම හා මුදල් සහ බැංකුකරණය මෙන්ම අනෙකුත් ආර්ථික ක්ෂේත්‍ර පිළිබඳ මහජනතාවට තොරතුරු ලබාදෙයි. ආර්ථික හා මිල ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා දායක වීමේ අරමුණින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සාර්ව ආර්ථික වර්ධනයන් නිරන්තරයෙන්ම ඇගයීම සහ මුදල් හා විදේශ අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීමට අමතරව දත්ත එකතු කිරීම සහ පවත්නා ක්‍රමවේදය හා ආකෘතිය වැඩිදියුණු කිරීම ප්‍රධාන කාර්යභාරයන් ලෙස සිදු කරනු ලබයි. ආර්ථික කටයුතු පිළිබඳව රජයේ උපදේශකයා ලෙස මහ බැංකුව කටයුතු සිදු කිරීමේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මූල්‍ය සහ මුදල් අංශය මනා ලෙස සම්බන්ධීකරණය කිරීම මගින් සාර්ව ආර්ථික ස්ථායීතාවට සහාය වීම සඳහා නැගී එන ආර්ථික ගැටලු පිළිබඳ උපදේශන මෙන්ම ගත යුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ ද ලබා දී ඇත. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික පර්යේෂණ කටයුතු සිදු කරන අතරතුර සාර්ව ආර්ථික වර්ධනයන් සහ මෙහෙයුම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ව්‍යවස්ථාපිත මෙන්ම අනෙකුත් ප්‍රකාශන ද ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම, විදේශ පාර්ශ්වකරුවන් සහ ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යෑම මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වැදගත් කාර්යයක් ඉටු කර ඇති අතර සංඛ්‍යාලේඛන සහ අනෙකුත් සාර්ව ආර්ථික තොරතුරු කාලීනව බෙදාහැරීම මගින් සහයෝගය සහ විනිවිදභාවය වැඩිදියුණු කර ගෙන ඇත.

## 7.1 මිල සහ ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම

ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ මුදල් නීති පනත ප්‍රකාරව මිල සහ ආර්ථික ස්ථායීතාව ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, පූර්වෝපායික මෙන්ම කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා උපකාරී වන රටේ සාර්ව ආර්ථික වර්ධනයන්ට අදාළ දත්ත සකස් කිරීම, සුපරීක්ෂණය සහ දත්ත විශ්ලේෂණය කිරීමෙහිලා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව නිරත වේ. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා මුදල් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට මුදල් ප්‍රතිපත්ති කමිටුවට හැකිවන පරිදි, එම කමිටුවේ ලේකම් වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනවල සහාය ඇතිව, ආර්ථික සහ මුදල් සංඛ්‍යාන අන්තර්ගත ඉදිරි දැක්මකින් යුතු පුළුල් විශ්ලේෂණ සහිත වාර්තා සැකසීම සහ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව සහ ශාස්ත්‍රීය හා පෞද්ගලික අංශවල නියෝජිතයන් අතර අන්‍යෝන්‍ය අදහස් හුවමාරුව වැඩිදියුණු කිරීම සඳහා 2017 වසරේදී නැවත ස්ථාපිත කළ මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුවේ විද්වතුන් විසින් ඉදිරිපත් කරන අදහස් සහ නිර්දේශ තුළින් ආර්ථික විශ්ලේෂණ තවදුරටත් වැඩිදියුණු විය. මේ අතර, මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටු රැස්වීම් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. තවද, ආර්ථිකය විභව වර්ධන මට්ටම කරා ළඟා වීමට උපකාරී වන පරිදි, මහ බැංකුව ගනු ලබන මැදිකාලීන මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති නිවේදනය කරනු ලබන '2019 සහ ඉදිරිය සඳහා වූ මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම' සම්පාදනය කරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහාය විය. සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ පැන නගින ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට නිර්දේශ සැපයූ අතර, ආර්ථිකයේ විවිධ අංශ සඳහා රජය විසින් දැනටමත් ක්‍රියාවට නංවා ඇති රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබඳව ද එලෙස දැනුම්වත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විවිධ ගැටලුවලට අදාළව ස්වාධීන අදහස් සැපයූ අතර, එම ගැටලුවලට අදාළ ආර්ථික බලපෑම් අවධාරණය කරන ලදී. 2018-2020 වසර සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා හයෙන් එකක් වන 'සඵලදායි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් හඳුන්වාදීමට' අදාළව ප්‍රමුඛතම දෙපාර්තමේන්තුව ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළේය. මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යොදා ගැනීමට අදාළව මුදල් නීති පනත සංශෝධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ සැපයීම ද ඇතුළත් පූර්ව ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව තුළ ආකෘතිකරණ හා පුරෝකථන හැකියාව වැඩිදියුණු කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව පුළුල් ආකෘති මත පදනම් වූ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් ගොඩනැගීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

ජාත්‍යන්තර වෙළඳාම සහ විදේශ මූල්‍ය හා සම්බන්ධ සංඛ්‍යා දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් පුළුල් ඇගයීම් සිදු කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශ අංශය පිළිබඳව මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත නිරන්තරයෙන් සුදුසු ප්‍රතිපත්ති නිර්දේශ ලබා දෙන ලදී. මෙම ක්‍රියාවලියෙහි කොටසක් ලෙස, රුපියල මත වන පීඩනය හඳුනාගැනීම සහ විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අඩු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ගැනීම පිණිස විදේශ විනිමය අනුපාතිකයේ හැසිරීම පිළිබඳ අඛණ්ඩව විශ්ලේෂණය කරන ලදී.

මේ අතර, මුදල් නීති පනතෙහි විධිවිධානවලට අනුව, රජය විසින් විදේශ ණය ගැනීමේදී ඉන් මුදල් ප්‍රතිපත්තියට ඇතිවන බලපෑම ඇගයීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

විසින් තවදුරටත් සිදු කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ජා.මූ. අරමුදල සහ අමාත්‍යාංශවල අදාළ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් වි.ගැ.හි බිලියන 1.1 ක (දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5 ක) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන ප්‍රමාණාත්මක කාර්යසාධක නිර්ණායක, මූලික ඉලක්ක සහ ව්‍යුහාත්මක මිණුම් දඬු පිළිබඳව සාකච්ඡාවල ක්‍රියාකාරීව නියැළිණි. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ සහ විනිමය අනුපාතිකයෙහි වර්ධනයන්ට හේතු වූ සාධක සහ ඒවායෙහි ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තා රජය වෙත සපයනු ලැබූ අතර, විදේශීය අංශයෙහි පවතින අවදානම්වලට මුහුණ දීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යෝජනා කරන ලදී.

ජාත්‍යන්තරව පිළිගත් දත්ත වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුගත වීම සඳහා විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම සහ ප්‍රකාශනය වැඩිදියුණු කිරීම උදෙසා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. 2018 වර්ෂයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ (Standard International Trade Classification) 4 වන සංශෝධනයට අනුව සම්පාදිත භාණ්ඩ වෙළඳාම පිළිබඳ වූ සංඛ්‍යා දත්ත ප්‍රකාශනයට පත් කිරීම ආරම්භ කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන අත්පොතෙහි හයවෙනි සංස්කරණයට අනුව (BPM 6) කාර්තුමය පදනම මත වන ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත ද, මාසික පදනම මත වන ජාත්‍යන්තර සංචිත දත්ත සටහන ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙතද, වාර්ෂික පදනම මත සෘජු ආයෝජන දත්ත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය (CDIS) වෙත ද කාලීනව ඉදිරිපත් කරන ලදී. තවදුරටත්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාව සහ කාලීන බව සහතික කිරීම සඳහා සමීක්ෂණ කිහිපයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවලට පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක වන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය සහ නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ යනාදී කර්මාන්ත රැසක් ආවරණය කිරීම සඳහා වන සේවා වෙළඳාම පිළිබඳ වූ සමීක්ෂණ ඇතුළත් වේ. තවද, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සම්බන්ධයෙන් වාණිජ බැංකු සමඟ එක්ව සිදු කරන මාසික සමීක්ෂණය ද මෙම වසර තුළදී අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, බැංකු අංශය හරහා විදේශ රටවල් සමඟ සිදුවන සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුවන ගනුදෙනු අධීක්ෂණය කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය (ITRS) නම් වූ නව දත්ත එක්රැස් කිරීමේ පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය මූලික වැඩකටයුතු ආරම්භ කරන ලදී.

### 7.3 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම

2018 වසර තුළදී, විශේෂයෙන්ම මුදල් ප්‍රතිපත්ති, විනිමය අනුපාතික ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධව ඉදිරි කාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්තිමය උපදෙස් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය, රජය සහ පාර්ශ්වකරුවන් වෙත අඛණ්ඩව ලබා දෙන ලදී. මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තිය ප්‍රකාරව වසරේ පළමු මාස අටක කාලයට අදාළව ආර්ථිකයේ සිදු වූ වර්ධනයන් සහ 2019 වසර සඳහා වූ රජයේ අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිත කළ හැකි ප්‍රතිපත්තිමය යෝජනා ඉස්මතු කරමින් පිළියෙළ කරනු ලබන රහස්‍ය වාර්තාවක් වන "සැප්තැම්බර් 15 වාර්තාව" ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ආර්ථික සභාව වෙත තාක්ෂණික උපදෙස් මෙන්ම විවිධ සාර්ව ආර්ථික ගැටලු පිළිබඳ ස්වාධීන නිරීක්ෂණ ලබා දෙන ලදී.

2018 වසර තුළදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් අටක් සම්බන්ධීකරණය කරන ලදී. මුදල් ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකාවක ලෙස කටයුතු කිරීමට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය අංශ ස්ථායිතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව, භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සහ ශ්‍රී ලංකා බැඳුම්කර නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩලය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා වූ නියාමන කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, පුහුණු කටයුතු කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම ක්‍රියාත්මක කිරීමේ නියාමන කමිටුව, මානව සම්පත් සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැකසීමේ නියාමන කමිටුව සහ 2018 වසර සඳහා ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සඳහා ටෙන්ඩර් මණ්ඩලය සහ නියාමන කමිටුව වැනි අභ්‍යන්තර කමිටු ගණනාවකම සාමාජිකාවක ලෙස කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය මුදල් ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් වීමට අමතරව වෙනත් විවිධ කමිටුවල සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියාමන කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම ක්‍රියාත්මක කිරීමේ නියාමන කමිටුව, පුස්තකාල උපදේශන කමිටුව, පර්යේෂණ ප්‍රකාශන කමිටුව, ඉන්ට්‍රානෙට් පද්ධතිය නවීකරණය සඳහා වූ කමිටුව සහ රජය විසින් නිකුත් කරන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා ඒකාබද්ධ නියමු කළමනාකරුවන් පත් කර ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීමේ කමිටුව මේ අතර වේ.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා අපනයන

ණය රක්ෂණ සංස්ථාව සහ මුදල් අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටු ඇතුළු බාහිර ආයතනවල කමිටු සහ මණ්ඩල නියෝජනය කරමින් ප්‍රතිපත්තිමය වශයෙන් උපදෙස් ලබාදීමට අඛණ්ඩව කටයුතු කළහ. තවද, කෙරවලපිටියේ විදුලි බලාගාරයක් තැනීමේ ව්‍යාපෘතිය හා සම්බන්ධ තාක්ෂණික ඇගයුම් කමිටු, එලිෆන්ට්පාස් ලුණු ලේවායේ උතුරු කොටසෙහි ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති කමිටුව, පරන්තන් රසායනික සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම, ලංකා ඛනිජ වැලි සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම, ජාතික අපනයන උපායමාර්ග පිළිබඳ තාක්ෂණික කමිටුව, කුටුම්භ අයවැය ඒකක සහ අනෙකුත් ජාතික මට්ටමේ කමිටු වන ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කමිටුව සහ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව යනාදී කමිටු ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් වසර තුළදී නියෝජනය කරන ලදී.

## 7.4. ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මුදල් නීති පනතේ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට අනුව, අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2017 මහ බැංකු වාර්ෂික වාර්තාව නියමිත කාල වකවානුව තුළදී භාෂා ත්‍රිත්වයෙන්ම සම්පාදනය කර මුදල් අමාත්‍යවරයාට පිළිගන්වන ලදී. මීට අමතරව, 'මෑතකාලීන ආර්ථික ප්‍රවණතා: 2018 සුවිශේෂී සිදුවීම් සහ අපේක්ෂාවන්' සහ මාසික විවරණිකා ද ප්‍රකාශයට පත් කෙරුණි. තවද, මුදල් නීති පනතේ 116 (1) වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව 'සැප්තැම්බර් 15' වාර්තාව මුදල් අමාත්‍යවරයාට පිළිගන්වන ලදී.

2019 ජනවාරි 02 වන දින අධිපතිතුමා විසින් නිවේදනය කරන ලද '2019 වසර හා ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම' 12 වන වරට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලදී. පෙර දැක්මෙහි අරමුණ වනුයේ ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට සිය ඉදිරි සැලසුම් සහ උපක්‍රමික සැලසුම් සකස්කර ගැනීමට හා වැඩිදියුණු කිරීමට උපකාරී වන මහ බැංකුවේ ප්‍රතිපත්තිවල පුරෝකථනභාවය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමයි.

ඉහත කරුණුවලට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දෛනික, සතිපතා හා මාසික ආර්ථික දර්ශක සහ විවරණිකා මගින් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආර්ථික හා මූල්‍ය දත්ත මහ බැංකු වෙබ් අඩවියේ ඇති මාධ්‍ය අංශයේ සහ දත්ත පුස්තකාලයේ ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව නිතිපතා ප්‍රකාශයට පත් කරන මුදල් ප්‍රතිපත්ති විවරණයන්ට සහ විදේශීය අංශය පිළිබඳ පුවත්පත් නිවේදනයන්ට අමතරව විශේෂ සිදුවීම් සම්බන්ධව මාධ්‍ය ප්‍රකාශන ද නිකුත් කරන ලදී. විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයන්ට (SDDS) අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි සංඛ්‍යාන දත්ත බෙදා හරින ලදී.

## 7.5 ප්‍රතිපත්තිමය පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

කාලීන වැදගත්කමකින් යුත් විෂයන් පිළිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණ වැඩිදියුණු කිරීමේ අදහසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් වසර තුළදී පර්යේෂණ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පර්යේෂණ කටයුතු සම්බන්ධ කාර්යයන් සහ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් පිහිටුවනු ලැබූ 'පර්යේෂණ උපදේශක මණ්ඩලය' විසින් සිය කාර්යයන් 2018 වසරේදී ද අඛණ්ඩව සිදු කරනු ලැබීය. ඒ අනුව, බැංකු විදු පියසෙහි සහාය ඇතිව මහ බැංකුවේ නිලධාරීන්ගේ සහ බාහිර සහභාගිවන්නන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් 'ආර්ථික විද්‍යාව පිළිබඳ පර්යේෂණ' පාඨමාලාව සාර්ථකව පවත්වනු ලැබීය.

අඛණ්ඩව එකොළොස් වන වසරටත් සංවිධානය කරන ලද අන්තර්ජාතික පර්යේෂණ සමුළුව 2018 දෙසැම්බර් මසදී 'උද්ධමන ඉලක්කකරණය සහ මහ බැංකු ස්වාධීනත්වය, වගවීම සහ විනිවිදභාවය' යන තේමාව යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබිණි. සෛද්ධාන්තික සහ ප්‍රායෝගික පර්යේෂණ, විශේෂයෙන්ම සමකාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා සම්බන්ධ පර්යේෂණ ඉදිරිපත් කිරීමට, සාකච්ඡා කිරීමට සහ ඒ සම්බන්ධව පර්යේෂකයන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා මෙම සමුළුව තුළින් සුදුසු පසුබිමක් ලබා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂකයෙකු ද ඇතුළුව, චිලී, ජර්මනිය, ඉන්දියාව, මෝල්ටාව, තායිලන්තය, ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව යන රටවල් නියෝජනය කරමින් පර්යේෂකයන් අට දෙනෙකුගේ පර්යේෂණ පත්‍රිකා මෙහිදී ඉදිරිපත් කරනු ලැබිණි. සමුළුවේ ප්‍රධාන දේශනය ඉන්දියානු සංචිත බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයෙකු වන ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය චේතන් ඝතේ මහතා විසින් පවත්වනු ලැබූ අතර, ආරාධිත දේශනය 'On the Role of the Exchange Rate in an Inflation Targeting Strategy' යන මැයෙන් අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ විධායක අධ්‍යක්ෂ හාන්ස් ජෙන්බර්ග් මහතා විසින් පවත්වනු ලැබීය. හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා ආචාර්ය ඩී.එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය පිරිනැමීම ද මෙවර සමුළුවේ සිදු කරන ලදී.

තවද, මෙම වසරේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂණ සඟරාව, මාණ්ඩලික පත්‍රිකා, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ පර්යේෂණ පත්‍රිකා හතකින් යුතුව වෙළුම් දෙකකින් ප්‍රකාශයට පත් කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මාණ්ඩලික පත්‍රිකා වල පළවුණු "An open economy quarterly projection model for Sri Lanka" නම් වූ පර්යේෂණ පත්‍රිකාව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රධානත්වය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ජා.මු. අරමුදලේ පර්යේෂකයින්ගේ සමකතෘත්වය යටතේ

ජා.මු. අරමුදලේ පර්යේෂණ පත්‍රිකාවක් ලෙස ද ප්‍රකාශයට පත් කෙරිණි. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම වසරේ සිදු කරන ලද පර්යේෂණ අතර 2019 වසර මුලදී ප්‍රකාශයට පත්කළ අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් වූ 'Inflation Persistence: Evidence from CPI subcategories - The Sri Lankan Experience' නම් පරිච්ඡේදය ද විය. තවද, ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති අන්තර්ජාතික පර්යේෂණ සමුළුවලදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පර්යේෂණ පත්‍රිකා දෙකක් ඉදිරිපත් කරන ලදී. සිය ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ එක්ව සමුළු සංවිධානය කරමින් පර්යේෂණ සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය කාර්ය මණ්ඩලය සතු ප්‍රවීණත්වය බෙදා හරිමින් මහ බැංකුව තුළ හා ඉන් පිටත ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බැංකු විදු පියසෙහි සහ විශ්ව විද්‍යාල, පාසැල් වැනි අධ්‍යාපනික ආයතනවල සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපනික ආයතනවල ද සම්පත්දායකයින් ලෙස සේවය ලබා දෙන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බැංකු පරිශ්‍රය වෙත පැමිණෙන දේශීය සහ විදේශීය නියෝජිතයන්ට මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳව දේශන සිදු කරන ලදී. ඒ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදීන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය පිළිබඳ දැනුම්වත්කිරීමේ සැසි ද පවත්වන ලදී. තවද, මෙම වසර තුළදී බාහිර පාර්ශව විසින් සංවිධානය කරන ලද සමුළු හා සම්මන්ත්‍රණ කිහිපයක කමිටු සාමාජිකයින් ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් කටයුතු කරන ලදී. එසේම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදු ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට සහ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්ත අංශය මුහුණපාන ගැටලු හඳුනාගැනීමේ අරමුණින් සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවකට එක් විය. මෙම වසර තුළදී ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පශ්චාත් උපාධි ඇරඹීමට අපේක්ෂා කරන මහ බැංකු නිලධාරීන්ට පර්යේෂණ පත්‍රිකා සැකසීමට අවශ්‍ය උපදෙස් ලබාදීම අඛණ්ඩව කරගෙන යන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙක් විසින් උසස් පෙළ සිසුන්ගේ දැනුම වැඩි කිරීමේ අපේක්ෂාවෙන් සිංහල හා දෙමළ භාෂාවලින් විකාශය වූ 'තක්ෂිලාව' සහ 'Arivootru' වැඩසටහන්වලට සිය සම්පත්දායකත්වය ලබාදීම මෙම වසරේදී ද සිදු විය. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් පැවැත්වූ අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරඟය සංවිධානය කිරීමේදී මෙන්ම අභ්‍යන්තර සහ බාහිර විභාග පරීක්ෂකවරුන්, මෙහෙයවන්නන් සහ විචාරකයන් ලෙස ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දායකත්වය ලබා දුණි.

## 7.6 ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යෑම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ජා.මූ. අරමුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය, අග්නිදිග ආසියානු, නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA) වැනි ජාත්‍යන්තර බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන වෙනුවෙන් සම්බන්ධතා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කළ අතර, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි අනෙකුත් ප්‍රධාන බහුපාර්ශ්වීය සංවර්ධන කටයුතු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා රජයට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී. මේ අතර, 2018 වසරේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනවලට සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, 2018 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාසවලදී ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධව ජා.මූ. අරමුදල විසින් සිදු කළ සාමාජික මෙහෙයුම් වැඩසටහන්වල සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. තවද, ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායම් දෙකක් විසින් 2018 වසරේ ජුනි සහ අගෝස්තු මාසවලදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් නීති පනත සංශෝධනය කිරීමේ ව්‍යාපෘතියට සහයෝගය දක්වන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදලේ ඉලක්කගත පුහුණු කිරීමේ මෙහෙයුම් වැඩසටහන් තුනක් සම්බන්ධීකරණය සිදු කළ අතර ඉන් දෙකක් ශ්‍රී ලංකාව සඳහා සාර්ව ආර්ථික තත්ත්වය විනිශ්චය කිරීමේ මෙවලම් දියුණු කිරීම සඳහා වූ අතර ඉන් පළමුවැන්න 2018 වසරේ පෙබරවාරි මාසයේදී ද ඉන් අනතුරුව වඩාත් පුළුල් වූ පසු විපරම් මෙහෙයුම් වැඩසටහනක් 2018 වසරේ අගෝස්තු මාසයේදී ද පවත්වන ලදී. තෙවන ඉලක්කගත පුහුණු කිරීමේ මෙහෙයුම් වැඩසටහන 2018 වසරේ අප්‍රේල් මාසයේදී පවත්වන ලද අතර එහිදී ශ්‍රී ලංකාව සඳහා පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියෙහි කොටසක් වන කාර්තුමය පුරෝකථනය කිරීමේ ආකෘතිය දියුණු කිරීම සඳහා අවධානය යොමු විය.

මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සභාපතීත්වය හොබවමින් 54 වන අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ සමුළුව/ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය සහ 38 වන අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ රැස්වීම 2018 වසරේ නොවැම්බර් මස 29 වන දින සිට දෙසැම්බර් මස 2 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ සත්කාරකත්වය යටතේ පැවැත්වූ අතර එහි සංවිධාන කටයුතු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම සමුළුව සඳහා සාමාජික රටවල මහ බැංකු සහ මුදල් අධිකාරීන් 19 ක මහ බැංකු අධිපතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සහභාගි විය. මෙම සමුළුවේ

ප්‍රධාන දේශනය පැවැත්වීම සඳහා ජා.මූ. අරමුදලේ නියෝජ්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ තනතුර හොබවන මිට්සුහිරෝ ෆුරුසාවා මහතා සහභාගි විය. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සත්කාරකත්වය සපයමින් 2018 වසරේ මැයි මාසයේදී පවත්වන ලද ජා.මූ. අරමුදලේ දකුණු ආසියානු පුහුණු කිරීමේ සහ තාක්ෂණික සහය සැපයීමේ ආයතනයෙහි දෙවන නියාමන කමිටු රැස්වීම සංවිධානය කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ ප්‍රතිපාදන යටතේ සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) පිහිටුවා ඇත. පනතේ විධිවිධාන ප්‍රකාරව සියලුම පරිපාලන බලතල සහ කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදල් කළමනාකරණයට අදාළ බලතල, කාර්යයන් සහ වගකීම් පනතේ ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. සේ.අ.අ. පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමන් වෙත පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් යාන්ත්‍රණය ලෙස සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

### 8.1 සේ. අ. අ. දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සේ.අ.අ. පනතේ ප්‍රතිපාදන අනුව සාමාජික දායක මුදල් සහ අධිභාර රැස් කිරීම, පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම, සාමාජිකයන්ට සහ ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සහ පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේදී දරණු ලබන පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යන කාර්යයන් සේ. අ. අ. දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, සේ.අ.අ. දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සමඟද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. වසර 2018 දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් සංක්ෂිප්ත ලෙස පහත දැක්වේ.

**(අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්**

2018 වසරේ දායක මුදල් ලැබීම් රු. බිලියන 133.3 සිට 145.0 දක්වා ඉහළ ගිය අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 8.8 ක වර්ධනයකි. එසේම 2018 වසර තුළදී ප්‍රතිලාභ ලෙස අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත රු. බිලියන 108.0 ක් ගෙවන ලදී. එසේම සමස්ථ ප්‍රතිලාභ ගෙවීම් 2017 වසරට සාපේක්ෂව සියයට 8.1 කින් පහත වැටුණි (සංඛ්‍යා සටහන II-10). ඒ අනුව, 2018 වසරේදී ශුද්ධ දායකත්වය, 2017 වසරේ පැවති රු. බිලියන 15.8 හා සැසඳීමේදී රු. බිලියන 37.0 ක් දක්වා වර්ධනය විය.

**(ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම**

2018 වසර අවසානයේදී, අරමුදලේ මුළු වටිනාකම රු. බිලියන 2,289.4 ක් වූ අතර, එය 2017 වසර අවසානයේ වූ රු. බිලියන 2,066.3 හා සසඳන විට සියයට 10.8 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2017 වසරේ සාමාජික පොලිය ද ඇතුළු රුපියල් බිලියන 2,020.8 ක් ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම (සාමාජික ශේෂ) 2018 අවසන් වන විට රු. බිලියන 2,254.2 දක්වා සියයට 11.6 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-10)

**II-10 සංඛ්‍යා සටහන**

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2017 | 2018 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 2,066.3 | 2,289.4 | 10.8 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 2,020.8 | 2,254.2 | 11.6 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 18.0 | 18.6 | 3.3 |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.8 | 2.6 | (7.1) |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 15.3 | 16.0 | 4.6 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 133.3 | 145.0 | 8.8 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 117.5 | 108.0 | (8.1) |
| ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන) | 15.8 | 37.0 | 134.2 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 260,989 | 241,190 | (7.6) |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) අරමුදලේ ආයෝජනය කිරීම**

**(i) ආයෝජන කළඹ**

2018 දී, සේ.අ.අ. තම අරමුදල් විශේෂයෙන් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර සහ ආයතනික ණයකරවල තවදුරටත් ආයෝජනය කරන ලදී. 2018 වසර අවසානයේදී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) රුපියල් බිලියන 2,298.8 ලෙස වාර්තා වූ අතර, එය 2017 වසරේ පැවති රුපියල් බිලියන 1,992.4 ට සාපේක්ෂව සියයට 15.4 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-11). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින් සහ ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට සහ අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින්, අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය තම සාමාජිකයින් හට දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොටගෙන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

**II-11 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් | 1,818.6 | 91.3 | 2,119.2 | 92.2 |
| සමාගම් කොටස් | 84.3 | 4.2 | 74.9 | 3.3 |
| සාංගමික ණය උපකරණ | 41.5 | 2.1 | 44.8 | 1.9 |
| ස්ථාවර තැන්පතු | 48.0 | 2.4 | 33.6 | 1.5 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | - | - | 26.4 | 1.1 |
| **එකතුව** | **1,992.4** | **100.0** | **2,298.8** | **100.0** |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 වසර අවසානය වන විට අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 92.2 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 3.3 ක්ද සාංගමික ණය හා භාරකාර සහතිකපත්වල සියයට 1.9 ක්ද ස්ථාවර තැන්පතු වල සියයට 1.5 ක්ද සහ ඉතිරි සියයට 1.1 ප්‍රතිවිකුණුම් ගිවිසුම වල ආයෝජනය කර තිබුණි. 2018 වසර අවසානය වන විට රජයේ සුරැකුම් ආයෝජනයන්ගේ කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාතයන් සංඛ්‍යා සටහන II-12 හි දක්වා ඇත.

**II-12 සංඛ්‍යා සටහන**

**2018 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 124,096.4 | 5.8 | 9.90 |
| වසර 1 - 2 | 182,944.5 | 8.5 | 11.26 |
| වසර 3 - 4 | 269,016.6 | 12.5 | 10.50 |
| වසර 5 ට වැඩි | 1,571,118.8 | 73.2 | 11.37 |
| **එකතුව** | **2,147,176.2** | **100.00** | **11.16** |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) ආයෝජන ආදායම**

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2018 වසරේදී රුපියල් බිලියන 222.4 ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේදී සියයට 0.1 ක අඩු වීමක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-13). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය. 2018 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 229.4 ක් වූ අතර, එය 2017 වසරේ උපයන ලද රුපියල් බිලියන 219.6 හා සැසඳීමේදී සියයට 4.47 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් ලැබූ ලාභාංශ ලෙස රුපියල් මිලියන 3,887.6 ක් 2018 වසර තුළදී උපයන ලද අතර, එය 2017 වසරේදී ආදායම වූ රුපියල් මිලියන 2,993.6 සමග සැසඳීමේදී සියයට 29.9 ක වර්ධනයකි. තවද, 2018 දී ද්විතීයික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම නැවත ආරම්භ කරන ලදී. සමස්තයක් ලෙස, අරමුදලේ ඉපැයුම් අනුපාතිකය 2018 වසරේදී සියයට 10.4 ක් වූ අතර එය 2017 වසරේදී සියයට 11.8 කි.

**II-13 සංඛ්‍යා සටහන**

**ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) |
| පොලී සහ ක්‍රමක්ෂය ලාභ | 219,635.3 | 98.7 | 229,446.0 | 103.1 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු - රජයේ සුරැකුම්පත් * | 1,640.2 | 0.7 | - | - |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු - ව්‍යාපාර කොටස් | (163.4) | (0.1) | (10,901.3) | (4.9) |
| ප්‍රාග්ධන ලාභ - ව්‍යාපාර කොටස් | - | - | 7.2 | - |
| ලාභාංශ | 2,993.6 | 1.3 | 3,887.6 | 1.7 |
| මූල්‍ය වත්කම් හානිකරණය | (1,502.1) | (0.7) | 0.6 | - |
| **එකතුව** | **222,603.7** | **100.0** | **222,440.1** | **100.00** |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

*2018.01.01 දින සිට රජයේ සුරැකුම්පත්, මූල්‍ය උපකරණ සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව, ක්‍රමක්ෂය පිරිවැය පදනම (Amortised Cost Category) මත වර්ගීකරණය කර ඇත.

**(iii) වියදම්**

2018 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,505.3 ක් වූ අතර, එය 2017 වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 1,348.7 හා සසඳන විට සියයට 11.6 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 2018 වසරේදී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.68 ක් ලෙස සටහන් වූ අතර, එය 2017 වසරේදී සියයට 0.61 ක් විය (සංඛ්‍යා සටහන II-14). එසේම වසර ගණනාවක් පුරාම අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට අරමුදලට හැකිවිය.

**II-14 සංඛ්‍යා සටහන**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 | 2018 (අ) | |
| සේවක පිරිවැය | 847.3 | 967.3 | 14.2 |
| පරිපාලන වියදම් | 454.1 | 470.0 | 3.5 |
| වෙනත් වියදම් | 47.3 | 68.0 | 43.7 |
| **එකතුව** | **1,348.7** | **1,505.3** | **11.6** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.61** | **0.68** | |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

පසුගිය වසර 10 පුරා, සේ.අ.අරමුදලට, එහි සාමාජිකයින් වෙත ඉහළ පොලියක් අඛණ්ඩව ගෙවීමට හැකි විය (සංඛ්‍යා සටහන II-15). ඒ පිළිබඳ තොරතුරු 8 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

**II-15 සංඛ්‍යා සටහන**

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතය (%) | සඵල පොලී අනුපාතය (%)* |
|---|---|---|
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 | 10.50 | 10.60 |
| 2015 | 10.50 | 10.57 |
| 2016 | 10.50 | 10.51 |
| 2017 | 10.50 | 10.51 |
| 2018 (අ) | 9.50 | 9.54 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

*සඵල පොලී අනුපාතය = (සාමාජිකයන්ට ගෙවන ලද පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + වසර අවසානයේ පොලී ගෙවීම්වලට පෙර සාමාජික ශේෂය )/2]

### (ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම

#### (i) සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම

2018 වසරේදී, 2017 වසරේ පළමු හා දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන, සේ.අ.අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් වෙත, ඔවුන්ගේ සේවායෝජකයින් මගින් බෙදා හරින ලදී. ඊට අදාළ තොරතුරු (සංඛ්‍යා සටහන II-16) හි දක්වා ඇත.

**II-16 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන**

| කාලච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2017 පළමු අර්ධ වර්ෂය | 69,020 | 2,176,952 |
| 2017 දෙවන අර්ධ වර්ෂය | 76,308 | 2,711,049 |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

#### (ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් නිකුත් කිරීම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සමූපකාර ග්‍රාමීය බැංකුව යනාදී සහභාගිත්ව ණය දෙන ආයතන වලින් සාමාජිකයන්ට නිවාස ණයක් ලබාගැනීමේ අරමුණින් 1988 වසරේදී හඳුන්වා දුන් නිවාස ණය ක්‍රමය 2018 වසරේදී ද තවදුරටත් ක්‍රියාත්මක විය. නිවාස ණය ක්‍රමය යටතේ සේවක අර්ථසාධක අරමුදල මගින් 2018 වසර තුළදී රුපියල් මිලියන 4,974 ක් වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතික පත් 10,036 ක ප්‍රමාණයක් ණය ලබාදෙන ආයතන වෙත ලබා දෙන ලදී (II-17 සංඛ්‍යා සටහන). තවද, 2018 වසරේ දී 2017 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 2,759 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතන වලට ප්‍රේෂණය කරන ලදී.

**II-17 සංඛ්‍යා සටහන**

**නිවාස ණය පහසුකම**

| වසර | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | සහභාගීත්ව ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රු.මිලියන) |
|---|---|---|---|
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 (අ) | 10,036 | 4,974 | 2,759 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

#### (iii) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය සඳහා ප්‍රතිලාභ ලබන්නන්ගෙන් ඉහළ ඉල්ලුමක් පැවති අතර, ඒ යටතේ 130,000 ඉක්මවූ ප්‍රතිලාභීන් වෙත රුපියල් බිලියන 73.1 ක මුදලක් 2018 වසර අග වනවිට ගෙවන ලදී. එසේම 2018 වසර තුළදී, ප්‍රතිලාභීන් 28,377 ක් වෙත රුපියල් බිලියන 14.8 ක් නිදහස් කර ඇත.

#### (iv) සේ.අ.අ. ජංගම සේවාවන්

සේ.අ.අ. සාමාජිකයන් හට වඩාත් පහසු වන අයුරින් සේවා සැපයීම සහ ඔවුන්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාව තුළ ඇති සේ.අ.අ. සම්බන්ධ දැනුම වඩ වඩාත් දියුණු කිරීමේ අරමුණින් 2018 වසර තුළදී මෙම සේ.අ.අ. ජංගම සේවා පවත්වන ලදී.

කොළඹ පිහිටි සේ.අ.අ. ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන් සේ.අ.අ. සාමාජිකයෙකු හට ලබාගත හැකි සේවාවන් සියල්ලක්ම පාහේ තම ප්‍රදේශයේදී හෝ තම සේවා ස්ථානයේදී ලබාගැනීමේ පහසුකම මෙම ජංගම සේවා වැඩසටහන් මගින් සලසා ඇත. ප්‍රධාන වශයෙන් සාමාජික ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීම, සේ.අ.අ. සාමාජික තොරතුරු සංශෝධනය කිරීම, සේ.අ.අ. ගිණුම් සංශෝධනය සිදු කිරීම සහ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම යන පහසුකම් මෙන්ම කෙටි පණිවුඩ සහ අන්තර්ජාලය මගින් සේ.අ.අ. සාමාජික ගිණුම් තොරතුරු පිරික්සීමේ සේවාව ප්‍රවර්ධනය කිරීම, විද්‍යුත් දායක මුදල් සම්බන්ධ සේවාවන් පිළිබඳ සේව්‍ය ආයතන දැනුවත් කිරීම, සේ.අ.අ. සම්බන්ධ අනෙකුත් උපදෙස් ලබාදීම යන සේවාවන්ද මෙම ජංගම සේවා වැඩසටහන් තුළින් සේ.අ.අ. සාමාජිකයින් හට ලබා දෙන ලදී.

එලෙස 2018 වසර තුළදී සේ.අ.අ. ජංගම සේවාවන් 20ක් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 3ක් පවත්වන ලද අතර ඒවායින් කිහිපයක් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල යන ආයතන සහ සහයෝගයෙන් පවත්වන ලදී.

විවිධ රාජ්‍ය ආයතන/අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවිධානය කරන ලද ජංගම සේවා වැඩසටහන් සඳහා සහභාගි වන පුද්ගලයන්ට සේ.අ.අ. සම්බන්ධ සේවාවන් ලබාදීම සහ දැනුම්වත් කිරීම සඳහා එම ආයතන සහ සංවිධානවල ආරාධනයෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහභාගි වී ඇත.

එමෙන්ම විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වන ලද විශාල ලෙස මහජනතාව රැස් වූ වැඩසටහන් සහ ප්‍රදර්ශන සඳහා ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව තම සේවාවන් සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සහභාගි විය. 'ඉන්ෆොටෙල් 2018' ප්‍රදර්ශනයෙහි වසරේ හොඳම ඩිජිටල් විසඳුම් සපයන රාජ්‍ය ආයතනය වෙනුවෙන් පිරිනමන සම්මානය සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් හිමි කර ගන්නා ලදී.

තවද, ජංගම සේවාවට සම්බන්ධ සේවායෝජකයන්, සේවකයන් හා අනෙකුත් පාර්ශ්වයන් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් විද්‍යුත් ලිපි, පෝස්ටර්, අත් පත්‍රිකා, වීඩියෝපට සහ දේශන මගින් පවත්වන ලදී.

එමෙන්ම ජංගම සේවාව පිළිබඳව සහ එහි ඵලදායීතාව වැඩිදියුණු කර ගැනීමට සිදු කළ යුතු පෙර සූදානම් කටයුතු පිළිබඳව ජංගම සේවාවට සෘජුවම සම්බන්ධ වන පාර්ශ්වයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන්ද ජංගම සේවාවට පෙර පවත්වන ලදී.

**(v) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම**

කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් තුළ වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ සහ අදාළ සාමාජික දත්ත වාර්තා සැපයීමේ පහසුකම් සහිත විද්‍යුත් දත්ත වාර්තා රැස් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. මූලිකව, මෙම ක්‍රමය ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වූ අතර 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත හරහා මේ සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදනයන් ස්ථාපිත කරන ලදී. එකී ප්‍රතිපාදනයන් අනුව, සේවකයින් පනහකට වැඩි සේවායෝජකයින් සඳහා සිය සේවක අර්ථසාධක දායක මුදල් වාර්තා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සැපයීම අනිවාර්ය වේ. විද්‍යුත් දත්ත වාර්තා රැස් කිරීමේ ක්‍රමවේදය තුළ පරිවර්තනීය වෙනසක් සිදු කරමින් 2011 වසරේදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මාර්ගගත ගෙවීම් ක්‍රමය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් එක්රැස් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. එමගින් සේවායෝජකයින් මෙම ක්‍රමය සමඟ සම්බන්ධවීමේ වර්ධනීය වෙනසක් සිදු වූ අතර සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ද වඩාත් කාර්යක්ෂම විය. එමෙන්ම සමස්ථ ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රියාදාමයන් ද මේ සමඟ වඩාත් පහසු විය. 2016 වසරේදී, විද්‍යුත් දායක මුදල් රැස් කිරීමේ ක්‍රමවේදය එහි විශිෂ්ඨ තාක්ෂණික ජයග්‍රහණයක් සනිටුහන් කරමින් නියෝජිත වාණිජ බැංකු හරහා මාර්ගගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මේ අනුව, 2018 වසරේ දී සේ.අ.අ. සමඟ සම්බන්ධ වූ වාණිජ බැංකු දෙකත් ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු අටක් නියෝජිත බැංකු ලෙස දැනට සේ.අ.අ. ගෙවීම් කරනු ලබන සිය ගනුදෙනුකරුවන් වෙත පහසුකම් සලසනු ලබයි. ඒ අතරින්, වාණිජ බැංකු හතරක් මාර්ගගත දත්ත සත්‍යාපනයක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය භාවිතයෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සහ ඒ තුළින් සේවක අර්ථසාධක අරමුදලෙහි සියළුම පාර්ශ්වකරුවන්හට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. ඒ අනුව, ආසන්න වශයෙන් සක්‍රීය සාමාජිකත්වයෙන් 81% ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 7,900 සිට 8,540 දක්වා 2018 වසර තුළ දී වැඩිවූ අතර අදාළ මාසික දායක මුදල් ලැබීම සමස්ත දායක මුදලෙන් 88% ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි.

තවද, සේ.අ.අ. ගෙවීම සඳහා නව ගෙවුම් ක්‍රම හඳුන්වා දීමේ අරමුණින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා විද්‍යුත් දත්ත වාර්තා සැපයීමට හැකිවන සේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීමටත්, අදාළ ගෙවීම් ලංකා ක්ලියර් ආයතනයෙ හි විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ සම්බන්ධව ඇති ඕනෑම වාණිජ බැංකුවක් හරහා කිරීමටත් හැකිවන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

**(vi) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

සේ.අ.අ. විසින්, වඩාත් කාර්යක්ෂම සේවාවක්, සේවකයින් සහ සේවායෝජකයින් හට ලබා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා අත්වැල් බැඳ ගනිමින් පුද්ගලයින් නැවත ලියාපදිංචි කිරීම සඳහා, 2010 වසරේ ආරම්භ කළ විශේෂ ව්‍යාපෘතිය, 2018 වසර තුළදී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ජාතික හැඳුනුම්පත් තොරතුරු එක්රැස් කර, ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනාගැනීමේ අංකය (Unique Identification Number) ලෙස භාවිතා කිරමට හැකිවන ආකාරයට පහසුකම් සපයන අතර මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (Member Centric Database) සකස් කරන ලදී. මෙම වැඩසටහන සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව යන දෙඅංශයේම සාමාජික සාමාජිකාවන්ට සේවයක් සැපයීම සඳහා ඵලදායී ලෙස සාමාජිකයන්ගේ තොරතුරු වැඩිදියුණු කිරීම සඳහා උපකාරී වේ.

2018 වසර අවසාන වන විට ක්‍රියාකාරී සාමාජිකයින් මිලියන 1.91 කට ආසන්න සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමාන දායක මුදල් ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 81 ක් (ගිණුම් මිලියන 1.55) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ තොරතුරු තහවුරු කරමින් පවතී. තවද, නව සාමාජිකයන්ගේ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කිරීම සඳහා පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා සෑම මසකදීම පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රියාවලියක් ද පවත්වා ගෙන යනු ලැබේ. තවද, මෙම ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම විද්‍යුත් ක්‍රමයට සිදු කෙරේ.

**(vii) වෙනත් සේවා**

සේවක අර්ථසාධක අරමුදල සිය සාමාජිකයින්ට කාර්යක්ෂම සහ ඵලදායී ලෙස සේවා සැපයීම සඳහා කටයුතු කරයි. වර්තමානයේ වේගයෙන් වර්ධනය වන වටපිටාවක් තුළ සාමාජිකයන් විශිෂ්ට සේවා සැපයුමක් ඉල්ලා සිටිති. මේ අනුව, 2018 වසරේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය අභියෝගාත්මක වසරක් සනිටුහන් කර ඇත. 2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවාදායක පැමිණීම් 173,595 ක් වාර්තා වූ අතර, දුරකතන ඇමතුම් හරහා පුද්ගලයින් 82,454 දෙනෙකුද ඊමේල් හරහා සාමාජිකයින් 9,542 දෙනෙකුද විමසීම් කර ඇත. තවද, 2018 වසරේදී සාමාජිකයින්, සේවා යෝජකයින් හා අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත ලිපි 100,058 ක් ලැබී ඇත.

සාමාජික ගිණුම් සංශෝධනය කිරීම/නිවැරදි කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලිපි ලේඛන මගින් සහ සාමාජිකයන් පැමිණීම් හරහා ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙයි. වසර 2018 දී සේ.අ.අ. සාමාජික ගිණුම් වල සංශෝධන 60,532 ක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. සේ.අ.අ. සාමාජික ගිණුම්වල සංශෝධන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය. එය සේ.අ. අරමුදලේ සාමාජික ගිණුමක නම/ජාතික හැඳුනුම්පත් විස්තර නිවැරදි කිරීමක් හෝ සාමාජික ගිණුමකට බැර කර ඇති දායක මුදල් වල නිවැරදි කිරීමක් ලෙස දැක්විය හැකිය. 2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව මගින් නම/ජාතික හැඳුනුම්පත් සංශෝධන 57,602 ක් සහ ගිණුම් සංශෝධන 2,750 ක් සිදු කර ඇත. තවද, ඡායාස්ථගත පිළිබිඹු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමගම සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් සංශෝධන කිරීම සඳහා මහ බැංකුවේ ශාඛා කාර්යාල වෙත ද ඉඩ ප්‍රස්ථාව උදාවිය. ඒ අනුව, 2018 වර්ෂයේදී ශාඛා කාර්යාල හරහා සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් සංශෝධන 10,343 ක් සිදු කරන ලදී.

**(ඊ) අනෙකුත් කාර්යයන්**

තවද, සේ.අ.අ. විසින් එහි ආයෝජන උපායමාර්ග සහ රාමුව සමාලෝචනය සහ නැවත පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය ලෝක බැංකුවේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ සිදු කරමින් පවතී. තවදුරටත්, සේ.අ.අ. ට පුළුල් තොරතුරු තාක්ෂණික විසඳුම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලෝක බැංකුව විසින් ලබා දේ. මෙය පෙරදැරි කොටගෙන ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන හරහා ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය (BPR) මෙහෙයවන ලදී. ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයේ පළමු අදියර 2018 වසරේදී පවත්වන ලදී.

## 9. පහසුකම් කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමේ අරමුණින් 2018 වසරේ දී පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිය නඩත්තු සේවා පවත්වා ගෙන යාමට අමතරව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ උපකරණ වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ගොඩනැගිලි අභ්‍යන්තරය, පිරියත හා උපකරණයන් හි ප්‍රමුඛ අළුත්වැඩියාවක් සඳහා ආරම්භ

කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා වසර තුළදී වැඩි අවධානයක් යොමු කරන ලදී. ව්‍යුහාත්මක පරීක්ෂාවක් ද ඇතුළුව ගොඩනැගිල්ලේ තත්ත්වය තක්සේරු කිරීම සඳහා ව්‍යාපෘති උපදේශක ආයතනයේ ද සහාය ඇතිව පූර්ණ ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ උපස්ථ විදුලි ජනන පාලක පද්ධතිය සහ ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ පද්ධතිය අළුතින් සවි කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා දුරකථන ඇමතුම් පටිගත කිරීමේ පද්ධතියක් සහ නවීන තාක්ෂණය මත පදනම් වූ ආරක්ෂක කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කරන ලදී.

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන දෙපාර්තමේන්තු කිහිපයක මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබීය. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව තුළ කාර්යය පරිසරය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවහාර මුදල් වලින් නික්මෙන දූවිලි අංශු ඉවත් කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය අතිරේක ධාරිතාවයන් සපුරාලීම සඳහා නව මුදල් ගබඩා පහසුකම් ඉදිකිරීමට ද ව්‍යාපෘති ආරම්භ කරන ලදී. බැංකු අධ්‍යයන කේන්ද්‍රය සහ එයට අනුබද්ධ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රවණාගාරයේ පිවිසුමට ආවරණයක් ඉදිකිරීම, නව උපස්ථ විදුලි ජනන යන්ත්‍රයක්, පාඨමාලාවලට සහභාගීවන්නන් සඳහා නව ආපනශාලාවක් හා සවරින් ගොඩනැගිල්ලේ නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළු ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව පිහිටි ලොයිඩ් ගොඩනැගිල්ලේ වහලයේ සම්පූර්ණ අළුත්වැඩියාවක් ද සිදු කරන ලදී.

රාජකාරි කටයුතු සහ නිවාඩු අවශ්‍යතාවයන් සඳහා පිට පළාත්වලට ගමන් කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිවාඩු නිකේතන පහසුකම් පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. මෙම කාලය තුළ කිලිනොච්චියේ නව නිවාඩු නිකේතනයේ ගෘහ භාණ්ඩ සහ අභ්‍යන්තර අලංකරණ කටයුතු නිම කරන ලද අතර අනුරාධපුරයේ පිහිටි පැරණි නිවාඩු නිකේතනය වෙනුවට නව නිවාඩු නිකේතනයක් නිර්මාණය කිරීම හා ඉදිකිරීම සඳහා ව්‍යාපෘති උපදේශකයෙකු පත් කරන ලදී. මායිම් තාප්පය නැවත ඉදිකිරීම, වහලය අලුත්වැඩියා කිරීම සහ නව විදුලි ජනන යන්ත්‍රයක් ස්ථාපනය කිරීම ඇතුලුව වැඩිදියුණු කිරීම් කිහිපයක් නුවරඑළිය නිවාඩු නිකේතනය සඳහා සිදු කරන ලදී.

සිය පහසුකම් කළමණාකරන කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ දී පරිපාලන ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. සේවා නියුක්තිකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ පහසුව සඳහා පරිගණක ආශ්‍රිත නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලද අතර ප්‍රවාහන අවශ්‍යතා පහසුවෙන් ලබා ගැනීම සඳහා අන්තර්ජාලය පදනම් කරගත් කුලී රථ සේවා ඇනවුම් කිරීමේ පහසුකම් ද හඳුන්වා දෙන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් අනුව 2018 මැයි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවට අයත්ව තිබූ විදේශයන් හි පිහිටි දේපල වත්කම් දෙකක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අයිතිය සඳහා පවරා දීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය. නවීකරණ හා පුළුල් කිරීම්වලට අදාල විවිධ නව ව්‍යාපෘති සඳහා කටයුතු කරන අතරතුර පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි, උපකරණ සහ උද්‍යාන අලංකරණ කටයුතු පවත්වා ගෙන යාම සහ ප්‍රවාහන හා විදුලි සංදේශ සේවාවන් සැපයීම අත්‍යවශ්‍ය වගකීම් කොටසක් ලෙස ඉටු කරන ලදී.

## 10. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතියක් පවත්වාගෙන යෑම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 17ක් කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුලත් වේ.

### 10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2017 වසරේ දෙසැම්බර් මාසය හා 2018 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : කාර්තුමය මූල්‍ය ප්‍රගති / කාර්ය ඵල සහ තත්ත්වයන් 2018 වසරේ දී මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : 2002 වර්ෂයේ සිට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් (ජා.ගි.ප්‍ර.) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (ජා.මූ.වා.ප්‍ර.) අදාල කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2018 වර්ෂය තුළදීත් අඛණ්ඩ පදනමකින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2018 වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේදී ඉදිරිපත් කර ඇත.

(ඇ) **ජා.මූ.වා.ප්‍ර. 9 අනුකූලතාවය:** 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන ජා.මූ.වා.ප්‍ර. 9 ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි 2018 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

## 10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2019 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිගණකගත අය වැය සැකසුම් පද්ධතියක්" මඟින් පිළියෙළ කරන ලදී. මෙම වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2018 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2019 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2018 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## 10.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතිය

(අ) 2018 වසර තුල දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය මෙම පද්ධතිය හරහා ගෙවන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2018 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 4,603 ක් සිදු කරන ලද අතර, ඉන් 4,354 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 249 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) 2018 වසර තුල දී මහා භාණ්ඩාගාරයට සහ අදාල ව්‍යාපෘතීන් සඳහා රු. බිලියන 3,220.2 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 2,753 ක් සහ රු. බිලියන 2,409.2 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 597 ක් ආසන්න වශයෙන් සිදු කර ඇත. මීට අමතරව විවිධ ව්‍යාපෘති සඳහා විදේශ බැංකු 2 ක් සමඟ බැංකු එකඟතාවයන් 3ක් අත්සන් කරන ලදී.

## 10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථසාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමනාකරණය කිරීම සඳහා 2016 මාර්තු මස සිට මෙහෙයුම් ඇරඹූ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද වෙන්වූ ඒකකය මගින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8 ක් සහ වෙනත් අරමුදල් 4 ක්, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ව්‍යාපෘති අරමුදල් වලින් සමන්විත අරමුදල් 17 ක් කළමනාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තුව ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. අරමුදල් කළමනාකරණ පාලන පද්ධතිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය, මැද කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මගින් තීරණ ගැනීම සිදු කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2018 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකර වල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක 2017 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2018 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 112.84 දක්වා වර්ධනය විය.

**II-18 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්ය සාධනය - 2018 (රු. බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2018 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2017 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය කටයුතු | 55.16 | 52.22 |
| නිරාකරණ හා බලගැන්වීම් | 53.96 | 38.47 |
| ප්‍රාදේශීය සංවර්ධන | 3.64 | 3.12 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා | 0.08 | 0.07 |
| එකතුව | **112.84** | **93.88** |

## 10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුල මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මේ හා සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම් හා ඒවායේ ස්ථානගත කිරීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්,

ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2018 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 957 ක් සහ බැහැර කිරීම් 606 ක් සමගින් 2018 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2018 වසර තුළ දී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2018 වසර තුළ දී රු. බිලියන 1.9 ක වටිනාකමකින් යුත් 1,556 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

### 10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2018 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආසන්න වශයෙන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 229 ක්, මිලදී ගැනීම් හා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු 84 ක්, ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා වන එක් සමීක්ෂණ මණ්ඩලයක් සහ එක් වාහන බැහැර කිරීමේ කමිටුවක් නියෝජනය කර ඇත.

## 11. මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිය සේවාවන් දේශීයව මෙන්ම ජාත්‍යන්තරව දශකයකට වඩා වැඩි කාලපරිච්ඡේදයක් පුරා ලබා දී තිබේ. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට (FTRA) අනුව, 2006 වර්ෂයේ එය ආරම්භයේ සිට ස්වාධීන ව්‍යවස්ථාපිත අධිකාරියක් ලෙසින් රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමකයා ලෙස කටයුතු කරයි. මීට අමතරව, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සඳහා රටෙහි මූල්‍ය සහ මූල්‍ය නොවන ආයතන වලට පූර්ණ ආවරණයක් සපයන අතර, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සහ මූල්‍ය කාර්ය සාධක බලකායෙහි අධීක්ෂණයට ලක් වේ. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නීත්‍යානුකූල නොවන අනෙකුත් ක්‍රියාවන්ට අදාළ විය හැකි සම්බන්ධතාවන් අනාවරණය කර ගැනීම, සැක කටයුතු ගනුදෙනු පිළිබඳ විශ්ලේෂණයන්ට අදාළ විස්තර හා තොරතුරු ලබා දීම ඇතුළත් වේ. තවද, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ ද මූල්‍ය බුද්ධි ඒකකය සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

### 11.1 තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම පහසු කිරීම පිණිස විශේෂයෙන් හඳුන්වා දී ඇති ''ලංකාෆින්'' (LankaFIN) මාර්ගගත දත්ත පද්ධතිය හරහා මූල්‍ය ආයතන විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තා ඇතුළු මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය කොට තිබේ. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කරුවන්, මුදල් හෝ මූල්‍ය වටිනාකම හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන සහ රක්ෂණ සමාගම් විසින් රුපියල් මිලියනයක් හෝ ඊට සමාන වූ විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු (දේශීය සහ විදේශීය) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම නොකඩවා සිදු කරගෙන යන ලදී. මීට අමතරව, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වන වගන්තිය අනුව සැක කටයුතු ගනුදෙනු වාර්තාවන් ද මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. ඒ අනුව, 2018 වසර තුළදී රුපියල් මිලියන 11.9 කට වඩා වැඩි මුදල් ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් ද, සැක කටයුතු ගනුදෙනු 1.022 ක් ද වාර්තා කර ඇත. තවද, බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් ද එම ක්ෂේත්‍රය අධීක්ෂණය සහ නියාමනය කරනු ලබන විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා හරහා රුපියල් මිලියනයක් සහ ඊට වැඩි වන අගයකින් යුතු මුදල් ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය විසින් වැඩිදුර පරීක්ෂණ සඳහා 2018 වසර තුළ දී නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා 317 ක් යොමු කරන ලදී.

### 11.2. වාර්තාකරණ ආයතන නියාමනය කිරීම

මූල්‍ය බුද්ධි ඒකකය විසින් නියාමන රාමුව තවදුරටත් විධිමත් කිරීම සඳහා වාර්තාකරණ ආයතන වෙත රෙගුලාසි නිකුත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව, අවදානම මත පදනම්ව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සඳහා 2018 අංක 01 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති, 2018 ජනවාරි 10 දිනැති අංක 2053/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර වෙත නිකුත් කරන ලදී. තවද, වසර තුළදී මූල්‍ය බුද්ධි ඒකකය විසින් මාර්ගෝපදේශ හතක් මූල්‍ය ආයතන සහ නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර වෙත නිකුත් කරන ලද අතර, ඒවා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල්

සැපයීමේ අවදානම් කළමණාකරනය, කැසිනෝ සහ සූදු ගෙවල් සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා වන අනුකූලතාව, නිශ්චිත දේපළ අනුයෝජිතයන්, වටිනා ලෝහ වෙළඳුන් සහ මැණික් ගල් සහ අඩ මැණික් ගල් වෙළෙඳුන් සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන අනුකූලතාව, ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා ගැනීම, එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව සහ ඉරානය සඳහා වන) සම්බාධක සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම යන ක්ෂේත්‍රයන් මත පදනම් විය. ඒ හැරුනු විට, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරමින් එතැන් පරීක්ෂා සඳහා අවදානම මත පදනම් කරගත් පරීක්ෂණ සැලැස්මක් මත වූ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

## II.3. දේශීය සහ විදේශීය සහයෝගීතාව

ඔවුනොවුන් අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වසර තුළදී මූල්‍ය බුද්ධි ඒකකය අවබෝධතා ගිවිසුම් ගණනාවකට එළැඹි අතර, මූල්‍ය බුද්ධි ඒකකයේ නිළධාරීන්ගේ දැනුම වර්ධනයට සහ දැනුම හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාවන් මත ජාත්‍යන්තර සහයෝගීතා වැඩසටහන් ගණනාවක් නියෝජනය කර ඇත.

### (අ) අවබෝධතා ගිවිසුම්

2018 වර්ෂය තුළදී දේශීය වශයෙන්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුම් තුනක් අත්සන් කරන ලදී. ඒ අනුව, 2018 වර්ෂය අවසන් වන විටදී දේශීය නියෝජිත ආයතන සමග අත්සන් තබා ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 8 ක් වේ.

### (ආ) එග්මොන්ට් කණ්ඩායම (Egmont Group)

විමර්ශන පවත්වාගෙන යාමේ දී අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගැනීම පිණිස ගෝලීයව මූල්‍ය බුද්ධි ඒකක 155 කින් සමන්විතව පිහිටුවා ඇති එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබා ගන්නා ලද අතර, සාමාජික රටවල විමර්ශන කටයුතු සඳහා බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීමටද සහාය දෙන ලදී. 2018 වසර තුළදී මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවස්ථා 94ක දී විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමග තොරතුරු හුවමාරු කරගෙන ඇත. දැනට සිදුකරගෙන යන විමර්ශනවලට අදාළව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශීය මූල්‍ය බුද්ධි ඒකකවලින් සිදුකරන ලද තොරතුරු ඉල්ලීම් 24 ක් සඳහා ප්‍රතිචාර දක්වා ඇති අතර, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශීය මූල්‍ය බුද්ධි ඒකකයන් වෙතින් තොරතුරු ඉල්ලීම් 70 ක් සිදු කර ඇත. තවද, 2018 මාර්තු මාසයේ දී ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හි පැවැති මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ එග්මොන්ට් කණ්ඩායම් රැස්වීමට සහ 2018 සැප්තැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි පැවැති එග්මොන්ට් සැසිවාරය සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු සහභාගී වූහ.

### (ඇ) මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG)

2018 වසරේ ජූලි මාසයේ දී නේපාලයේ කත්මණ්ඩුහිදී පැවැති, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂකවරයා සම සභාපතිත්වය දරන ලද ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සැසිවාරය සහ තාක්ෂණික සහාය සඳහා වන සැසියට සහ 2018 දෙසැම්බර් මාසයේ දී රුසියාවේ දී පැවැති ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වර්ගීකරණය සහ ධාරිතාවය ගොඩනැංවීම සඳහා වූ වැඩමුළුවට මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු සහභාගී වූහ.

### (ඈ) බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC)

බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC) සංවිධානයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාරක සභාවේ 10 වන උපකණ්ඩායම් සැසිවාරය 2018 නොවැම්බර් මස 19-20 කාලපරිච්ඡේදයේ දී නේපාලයේ කත්මණ්ඩු හි පැවති අතර ඒ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු සහභාගී වූහ.

## II.4 ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුතුවලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් ඇති දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන, මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන, නාමොද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යපාර, කොටස් තැරැව්කාර ආයතන සහ රක්ෂණ සමාගම් නියෝජනය කරන නිලධාරීන් 3,258 කට දැනුම්වත් කිරීමේ වැඩසටහන්/පුහුණු වැඩමුළු 61 ක් වසර තුළදී පවත්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හතරවන සහ පස්වන තාක්ෂණික සහයෝගීතා මෙහෙයුම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥයන් විසින් පිළිවෙලින්, 2018 පෙබරවාරි 26 සිට මාර්තු 07 දක්වා සහ 2018 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 04 දක්වා පවත්වන ලදී. මෙම මෙහෙයුම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යභාරයන් යටතේ, අවදානම් පදනම් කරගත් අධීක්ෂණයන්, මූල්‍ය බුද්ධි ඒකකයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය අඛණ්ඩව ලබා දෙන ලදී. තවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට අදාළ නේවාසික උපදේශන නිලධාරියෙකු, මූල්‍ය බුද්ධි ඒකකයේ මෙහෙයුම් සහ එලදායිත්වය, මූල්‍ය අංශයේ අධීක්ෂණය හා මුදල් විශුද්ධීකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම යනාදියට අදාල උපාය මාර්ග සංවර්ධනය සහ සම්පත් කළමනාකරණය ආදී වශයෙන් වූ අංශ සම්බන්ධ තාක්ෂණික සහයෝගීතාවය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

### 11.5 ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායමේ ඇගයීම

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධීකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය, ඊට අදාළ ජාත්‍යන්තර සම්මුතීන්ට ඇති අනුකූලතාව ඇගයීමේ අරමුණින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේ දෙවන වටය 2014/2015 වර්ෂයන් තුළදී පවත්වන ලදී. 2015 ජූලි මාසයේ දී සම්මත කර ගන්නා ලද අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාවේ දී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ''කඩිනම් සහ පුළුල් පසු විපරම් ක්‍රියාවලිය'' යටතේ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග රාශියක් නිර්දේශ කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සඵලදායීතාව සම්බන්ධව ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සොයා බැලීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායමේ (ICRG) ඇගයීමට ශ්‍රී ලංකාව ලක්වන බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් 2016 ඔක්තෝබර් මස ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදී. සාකච්ඡා සහ ප්‍රගති සමාලෝචන වාර්තාවන් කිහිපයකට පසුව ජාත්‍යන්තර සහයෝගීතාව, අධීක්ෂණය, නෛතිකමය පුද්ගලයන් සහ සැකසුම් සහ සමූලඝාතන අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක (උතුරු කොරියාව සහ ඉරානයට අදාළ) ආදී වශයෙන් වන කරුණු 4 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අවශ්‍ය ප්‍රගතිය පෙන්වා නොමැති බවට මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 ඔක්තෝබර් මාසයේ දී ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හි දී පැවැති වාර්ෂික රැස්වීමේ දී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර, මෙය ''අළු ලේඛනයට'' ඇතුළත් කිරීම ලෙස හඳුන්වයි. මෙසේ ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව එම හඳුනාගත් ක්‍රමෝපාය දුර්වලතා මගහරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබාදෙන ලදී.

2017 නොවැම්බර් මස ලැයිස්තුගත වීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් මූල්‍ය කාර්ය සාධක බලකායේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී පියවර ගන්නා ලද අතර, ඒ සඳහා 2018 අංක 06 දරන භාර (සංශෝධන) පනත සහ 2018 අංක 24 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ (සංශෝධන) පනත නිකුත් කිරීම, උතුරු කොරියාව සහ ඉරානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ රෙගුලාසි/නියෝග/මාර්ගෝපදේශ නිකුත් කිරීම, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති නිකුත් කිරීම මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන ආවරණය නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් දක්වා පුළුල් කිරීම, අවදානම මත පදනම් වූ අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම, අනුගත නොවන මූල්‍ය ආයතන සහ නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා බලාත්මක පියවර ගැනීම සහ දැනුවත් කිරීමේ ක්‍රියාවලීන් ඇතුළත් වේ.

ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ආසියා ශාන්තිකර කලාපීය ඒකාබද්ධ කණ්ඩායම (AP/JG) හරහා මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ඇගයීමට ලක් කරන ලදී. ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සම්බන්ධව ප්‍රගති සමාලෝචන වාර්තා තුනක් සපයන ලද අතර, ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම සමග මුහුණට මුහුණලා කෙරෙන සාකච්ඡා පිළිවෙලින් 2018 ජනවාරි, මැයි සහ සැප්තැම්බර් යන කාලපරිච්ඡේදයන්හි දී පවත්වන ලදී. ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය, ආසියා ශාන්තිකර කලාපීය ඒකාබද්ධ කණ්ඩායම විසින් පිළිගෙන ඇත. එම නිසා, 2019 වසර මැද වන විට ශ්‍රී ලංකාව ''අළු ලැයිස්තුවෙන්'' ඉවත් වනු ඇතැයි අපේක්ෂිතය.

## 12. විදේශ විනිමය

ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 2 වන වගන්තිය ප්‍රකාරව 2017 නොවැම්බර් 20 වන දින සිට බලාත්මක වන පරිදි විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

පනත ප්‍රකාරව, විදේශ විනිමය වෙළෙඳාම් සිදු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන්ට, පරිසීමිත වෙළෙඳුන්ට සහ අමාත්‍යවරයා නිර්දේශ කරනු ලබන අනෙකුත් පුද්ගලයින්ට අවසර ලබාදීම, අවශ්‍ය කරනු ලබන අනුමැතීන් සහිතව විදේශ විනිමය මෙහෙයුම්වලට අදාළ රෙගුලාසි, නියම සහ විධාන නිකුත් කිරීමට සහාය ලබාදීම, එකී රෙගුලාසි, නියම සහ විධානවලට අදාළ අනුමත පුද්ගලයින් දක්වන අනුකූලතාව නිරීක්ෂණය කිරීම සහ පනතෙහි විධිවිධානවලට දක්වන අනුකූලතාවන් විමර්ශනය කිරීම විදේශ විනිමය දෙපාර්තමේන්තුවට පැවරී ඇති වගකීම් ඉටු කිරීමේදී සිදු කරනු ලබන කාර්යයන් වේ.

පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් කාර්යක්ෂමව හා සඵලදායීව සිදු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති හා පර්යේෂණ අංශය, ප්‍රාග්ධන ගනුදෙනු අංශය, සංඛ්‍යාන, නිරීක්ෂණ සහ විමර්ශන අංශය යන අංශ තුන යටතේ සංවිධානය වී ඇත. 2018 වසරේදී විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්හි සංක්ෂිප්තයක් පහත දැක්වේ.

### 12.1 විදේශ විනිමය පනත සහ 2017 වසරේදී නිකුත් කරන ලද රෙගුලාසි විධාන හා නියම සමාලෝචනය කිරීම, ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා සහාය ලබාදීම සහ නව රෙගුලාසි, විධාන හා නියම නිකුත් කිරීම.

(අ) විදේශ විනිමය පනත සහ 2017 වසරේදී නිකුත් කරන ලද රෙගුලාසි, විධාන හා නියම සමාලෝචනය කිරීම

අවලංගු කරන ලද විනිමය පාලන පනතෙහි හා විදේශ විනිමය පනතෙහි ඇති ප්‍රතිපාදනවල අඩුලුහුඬුකම් සමාලෝචනය කිරීම සහ හඳුනා ගැනීම විදේශ විනිමය

දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩවම සිදු කරන ලද අතර, ඒ හා සමගාමීව විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීම සඳහා එම ක්‍රියාවලි හා පටිපාටි තවදුරටත් සරල කිරීම ද සිදු කරන ලද අතර එමගින් රට තුළින් අනවශ්‍ය ලෙස විදේශ විනිමය ප්‍රවාහ ගලායෑම් හා ව්‍යවහාර මුදල් ජාවාරම් සඳහා මග පාදන ශ්‍රී ලංකාව තුළ සිදු කරන නීති විරෝධී විදේශ විනිමය ළඟ තබා ගැනීම්, මාරු කිරීම් හා හුවමාරු කිරීම් යනාදී නීති විරෝධී ක්‍රියාවන්වලට එරෙහිව විමර්ශන කටයුතු සිදු කිරීම් සහ දණ්ඩන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදේශ විනිමය පනතට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය එකී සංශෝධන සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත නිර්දේශ ලබාදීම ද සිදුවිණි.

2017 වසරේදී විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, නියම හා විධිවිධාන තවදුරටත් සරල කිරීම හා පැහැදිලි කිරීම අරමුණු කරගෙන අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් ඇතුළත් කිරීම සඳහා එකී රෙගුලාසි, නියම හා විධාන සමාලෝචනය කරන ලදී.

**(ආ) රජයේ ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම**

2018 වසරේ අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සහ අනේවාසික ආයෝජකයන් වෙත ඒ හා සම්බන්ධ ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට අවසර ලබා දුන් 2018 මාර්තු 19 දිනැති අංක 2063/12 දරන ගැසට් නිවේදනය නිකුත් කිරීම සඳහා සහාය ලබාදෙන ලදී. මෙම ගැසට් නිවේදනය මෙම වාර්තාවේ III කොටසේ ඇතුළත් කර ඇත.

**(ඇ) බලයලත් වෙළෙඳුන් වෙත විධාන නිකුත් කිරීම**

2018 වසර තුළදී බලයලත් වෙළෙඳුන් වෙත විදේශ විනිමය පනත යටතේ නිකුත් කළ විධාන 2 ක් මෙම වාර්තාවේ III කොටසේ අඩංගු වන අතර, ඒවායේ සාරාංශය පහත දැක්වේ.

(i) **2018 අංක 01 දරන විධානඃ** විනිමය අනුපාතිකයට බලපාන අහිතකර බලපෑම් අඩු කිරීමේ අරමුණෙන් ආනයන අධෛර්යමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගත් ක්‍රියාමාර්ග අතුරින් එක් ක්‍රියාමාර්ගයක් ලෙස, පෙර ගෙවීම් (මුදල් අත්තිකාරම් වශයෙන්) ක්‍රමය යටතේ යම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කොට කරනු ලබන ගෙවීම් සඳහා විදේශ විනිමය නැවත දන්වන තුරු නිදහස් නොකිරීමට බලයලත් වෙළෙඳුන් වෙත විධාන නිකුත් කරන ලදී.

(ii) **2018 අංක 02 දරන විධානඃ** අනේවාසික අතරමැදියන් විසින් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ගිණුමක් මාර්ගයෙන් සිදු කරන ආයෝජනවලට සම්බන්ධ විදේශීය ආයතනික ආයෝජකයන්ගේ ගනුදෙනු තවදුරටත් පහසු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත විධාන නිකුත් කරන ලදී.

## 12.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබාදීම

**(අ) විශේෂිත අරමුණු වෙනුවෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද විශේෂිත අවසර පිළිබඳ තොරතුරු පහත සංඛ්‍යා සටහන II-19 හි දක්වා ඇත.**

**II-19 සංඛ්‍යා සටහන**

**විදේශ විනිමය පනත යටතේ විදේශ විනිමය ගනුදෙනු සඳහා ලබාදුන් විශේෂිත අවසර**

| අරමුණ | බලපත්‍ර ගණන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය විසින් ස්වෛරීත්ව ඇපකර නිකුත් කිරීම සඳහා | 01 | 58.19 |
| ශ්‍රී ලංකා රජය විසින් විදේශයන්ගෙන් ණය ලබාගැනීම සඳහා | 08 | 1,272.64 |
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා | 06 | 44.17 |
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි ණය ගැනීම සඳහා | 03 | 2,001.69 |
| නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/සමාගම් ඇපකර | 05 | 41.45 |
| බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කොට පවත්වාගෙන යෑම සඳහා | 42 | අදාළ නොවේ |
| බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා | 283 | අදාළ නොවේ |

**(ආ) පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබාදීම (මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියුතු වන්නන්ට හැර)**

විදේශ විනිමය පනතේ 4 වැනි වගන්තිය යටතේ එම්.එම්.බී.එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව යන ආයතන සඳහා ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය වෙළෙඳාම් කටයුතු සිදු කිරීම සඳහා වර්ෂය තුළදී අවසර ලබා දෙන ලදී. ප්‍රවාසික සේවකයින් හට තම වේතන විදේශයන්හි සිටින යැපෙන්නන් හට (එක් පුද්ගලයෙකු සඳහා මාසිකව එ.ජ. ඩොලර් 500 ක උපරිමයකට යටත්ව) වෙස්ටර්න් යුනියන් මනි ට්‍රාන්ස්ෆර් සිස්ටම් හරහා ප්‍රතිමුඛ ප්‍රේෂණයන් සිදු කිරීම සඳහා එම්.එම්.බී.එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්ගලික) සමාගමට අවසර ලබා දෙන ලදී. දේශීය අපනයනකරුවන් වෙනුවෙන් බලයලත් වෙළෙඳුන් හට විදේශ ව්‍යවහාර මුදලින් පෙර/පසු නැව්ගත තොග සඳහා ඇපකර නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට අවසර ලබා දෙන ලදී.

**(ඇ) මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා පරිසීමිත වෙළෙඳුන් වෙත බලපත්‍ර නිකුත් කිරීම සහ එම මෙහෙයුම් කටයුතු අවසන් කිරීම**

(i) 2018 වසර තුළදී සීමිත සමාගම් (මුදල් මාරුකරන්නන්) 02 කට, සංචාරක හෝටල් 02 කට සහ එක් බලපත්‍රලාභී මූල්‍ය ආයතනයකට යනාදී වශයෙන් මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා නව බලපත්‍ර 05 ක් නිකුත් කරන ලදී.

(ii) තවද, දැනටමත් එම ව්‍යාපාරයේ යෙදෙන මුදල් මාරුකරන්නන් 03 දෙනෙකු හට නව ශාඛා 03 ක් විවෘත කිරීම සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

(iii) 2018 වසර තුළදී එක් මුදල් මාරු කිරීමේ ආයතනයක් මුළුමනින්ම තම මෙහෙයුම් කටයුතු අවසන් කරන ලද අතර තවත් ආයතන 02 ක් තම ශාඛා 02 ක මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී.

(iv) එක් එක් පරිසීමිත වෙළෙන්දා වෙත මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇති ආකාරය පිළිබඳ විස්තර පහත සංඛ්‍යා සටහන II-20 හි දක්වා ඇත.

**II-20 සංඛ්‍යා සටහන**

**මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා පරිසීමිත වෙළෙඳුන් වෙත නිකුත් කර ඇති බලපත්‍ර**

| ආයතන කාණ්ඩය | අවසරලත් ව්‍යාපාරික කටයුතු | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක්ම නියැලෙන සීමිත සමාගම් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීම | 58* |
| | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | 09 |
| සංචාරක හෝටල් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම | 05 |
| **එකතුව** | | **72** |

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 67 ක් ඇතුළුව සමාගම් 58 ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 67 න් 55 ක් වෙත විදේශ මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 12 වෙත විදේශ මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දී ඇත.

එපරිදි 2018 දෙසැම්බර් 31 දිනට, බලයලත් වෙළෙඳුන් 28 ක් සහ එම්.එම්.බී.එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ඇතුළුව පරිසීමිත වෙළෙඳුන් 74 ක් තම මෙහෙයුම් කටයුතුවල නිරත වූ අතර බලයලත් වෙළෙඳුන්ගේ සහ පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුවක් පිළිවෙළින් ඇමුණුම II-2 සහ II-3 හි අඩංගු වේ.

(ඈ) විගමනික අරමුදල් ප්‍රේෂණය

වර්ෂය තුළදී ශ්‍රී ලාංකික විගමනිකයන් හට විගමනික දීමනාව නිදහස් කිරීම සහ විජාතිකයන් හට උරුම වූ අරමුදල් ප්‍රේෂණය කිරීම අරමුණු කරගෙන ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 2,403 ක් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

## 12.3 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය හා සුපරීක්ෂණය/ විමර්ශනය

**(අ) එතැන් පරීක්ෂණ**

පරිසීමිත වෙළෙඳුන් විසින් ඔවුන් වෙත නිකුත් කර ඇති බලපත්‍රවල දැක්වෙන නියම සහ කොන්දේසිවලට අනුකූලතාව දැක්වීම පිළිබඳව නිශ්චය කර ගැනීම සඳහා එතැන් පරීක්ෂණ 28 ක් ක්‍රියාත්මක කරන ලදී.

**(ආ) විමර්ශන**

(i) විදේශ විනිමය රෙගුලාසිවලට අනුකූලතාව නොදැක්වීම් සම්බන්ධයෙන්, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ආරම්භ කරන ලද විමර්ශන 209 ක් 2018 වසර ආරම්භ වන විට ක්‍රියාත්මක වෙමින් පැවතුණි. විදේශ විනිමය පනතේ 30(2)(ආ) වගන්තිය අනුව, විනිමය පාලන පනත ප්‍රකාර විධිමත් විමර්ශන ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් විමර්ශන 52 ක් අවසන් කරන ලද අතර අදාළ පාර්ශ්වයන්ගෙන් දඩ මුදල් වශයෙන් අය කරන ලද රුපියල් මිලියන 2.56 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී.

(ii) විදේශ විනිමය පනතේ 30(2)(ආ) වගන්තිය ප්‍රකාරව අවසන් නොවූ ඉතිරි විමර්ශන 157, 2018 මැයි 19 දින වන විට අවලංගු විය. මෙම විමර්ශන වලින් බහුතරයක්ම පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටි උල්ලංඝනය කරමින් සුරැකුම්පත්/කොටස් නිකුත් කිරීම හා පැවරීම, නේවාසිකයන් විසින් අනේවාසිකයන් හට කරනු ලැබූ අනවසර ගෙවීම්, විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද විධාන/මෙහෙයුම් උපදෙස් සඳහා බලයලත් වෙළෙඳුන් අනුකූලතාව නොදැක්වීම, පරිසීමිත වෙළෙඳුන් වෙත නිකුත් කර ඇති බලපත්‍රවල සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම සහ අනවසරයෙන් විදේශ මුදල් තමා සන්තකයේ රඳවා තබා ගැනීම යනාදියට සම්බන්ධ වේ.

(iii) තවද, විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව 2018 වසරේදී විමර්ශන 3 ක් ක්‍රියාත්මක කරන ලද අතර එම විමර්ශන එම වසර තුළදීම අවසන් කරන ලදී.

**(ඇ) මීට අමතරව, විශේෂ සාක්ෂි/වාචික සාක්ෂි ලබාදීම මගින් නීති බලාත්මක කිරීමේ අධිකාරීන් හට නඩු හා අධිකරණ කටයුතුවලට සහාය දක්වන ලදී.**

## 12.4 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියස සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහයෝගයෙන් බලයලත් වෙළෙඳුන් වෙනුවෙන්, පවත්නා විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්/දේශන 5 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් පැවැත්වීමේ අරමුණු වූයේ බැංකු කාර්ය මණ්ඩල සතු, පවත්නා විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධ දැනුම ඉහළ නැංවීම මගින් එදිනෙදා විදේශ විනිමය මෙහෙයුම් සහ විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් බැංකු කාර්ය මණ්ඩලවලට ප්‍රවීණතාවක් ලබාදීම සහ කාර්යක්ෂම පාරිභෝගික සේවාවක් සමඟ ඔවුන්ට එම කාර්යයන්හි ඵලදායීව නිරතවීමට හැකියාව ලබාදීමයි.

(ආ) වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ආදායම් බදු ගෙවන්නන්ගේ සංගමය, පොලිස් සංචාරක කොට්ඨාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමය සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය සමඟ ඒකාබද්ධව අදාළ වෘත්තිකයන්/ආශ්‍රිතයන් සහ මහජනතාව විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ එම පනතට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් මෑතකාලීනව සිදු කළ ලිහිල් කිරීම් සම්බන්ධව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම්/සාකච්ඡා මණ්ඩල සහ සම්මන්ත්‍රණ 09 ක් පවත්වන ලදී.

(ඇ) විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ එම පනතට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් මෑතකාලීනව සිදු කළ ලිහිල් කිරීම් සම්බන්ධයෙන් බැංකුකරුවන්, විදේශ මුදල් මාරු කරන්නන් සහ ඒ සම්බන්ධයෙන් උනන්දුව දක්වන අනෙකුත් පාර්ශ්ව සතු දැනුම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ සම්මන්ත්‍රණ/වැඩමුළු 04 ක් පවත්වන ලදී.

(ඈ) විදේශ විනිමය සම්බන්ධ රෙගුලාසි පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විද්‍යුත් තැපැල, දුරකතන ඇමතුම් සහ දෙපාර්තමේන්තුවට පැමිණීම මගින් ඉදිරිපත් කෙරුණු විමසීම්වලට පිළිතුරු ලබාදීම විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කෙරුණි.

**ඇමුණුම II-2**

**2018.12.31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | |
| 1 | අමානා බැන්ක් පී.එල්.සී |
| 2 | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් |
| 3 | ලංකා බැංකුව |
| 4 | බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් |
| 5 | කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 6 | සිටි බැන්ක් එන්.ඒ. |
| 7 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී |
| 8 | ඩොයිෂ් බැන්ක් ඒ.ජී |
| 9 | ඩී. එෆ්. සී. සී. බැන්ක් ලිමිටඩ් |
| 10 | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 11 | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී |
| 12 | අයි. සී. අයි. සී. අයි. බැන්ක් ලිමිටඩ් |
| 13 | ඉන්දියන් බැන්ක් |
| 14 | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 15 | එම්. සී. බී. බැන්ක් ලිමිටඩ් |
| 16 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී |
| 17 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී |
| 18 | පැන් ඒෂියා බැන්කින් කොපරේෂන් පී.එල්.සී |
| 19 | මහජන බැංකුව |
| 20 | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 21 | සම්පත් බැන්ක් පී.එල්.සී |
| 22 | සෙලාන් බැන්ක් පී.එල්.සී |
| 23 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් |
| 24 | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 25 | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කොපරේෂන් ලිමිටඩ් |
| 26 | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | |
| 27 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 28 | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී |

**ඇමුණුම II-3**

**2018.12.31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| **විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන්** | |
| **බලයලත් මුදල් මාරුකරන්නන්** | |
| 1 | ඒ. ඕ. ලක්ෂ්මී ජුවෙල්ස් (පුද්.) සමාගම |
| 2 | ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 3 | ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 4 | අරුණ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 5 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 6 | බ්‍රෙෂියා ග්‍රාමීන් (පුද්.) සමාගම |
| 7 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 8 | කැපිටල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 9 | කාලෝ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 10 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 11 | දැදිගම ගෲප් (පුද්.) සමාගම |
| 12 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 13 | දයා ඕතරයිස්ඩ් මනි චේන්ජ්ර් (පුද්.) සමාගම |
| 14 | ඩෙල්ටා සරත් හෝල්ඩිංග්ස් (පුද්.) සමාගම |
| 15 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 16 | ජෝර්ජ් මයිකල් හෝල්ඩිංග්ස් (පුද්.) සමාගම |
| 17 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 18 | ගෝල්ඩන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 19 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 20 | ජයේස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් |
| 21 | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 22 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 23 | කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 24 | කුඩා මඩු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 25 | එම්. පී. මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 26 | මැජෙස්ටික් ජුවෙලරි (පුද්.) සමාගම |
| 27 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - යාපනය |
| 28 | මයුරි මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 29 | මිඩ්නා මිනි මාර්කට් (පුද්.) සමාගම |

30 මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

31 මොන්ට්කාලෝ එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

32 නර්මදා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම

33 නිව් නටාෂා (පුද්.) සමාගම

34 නිව් රීගල් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම

35 පර්ල් එක්සි (පුද්.) සමාගම

36 රෆීක්ස් ජෙම්ස් (පුද්.) සමාගම

37 රිම්හා ජුවෙලරි (පුද්.) සමාගම

38 රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම

39 රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01

40 රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06

41 රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - අලුත්ගම

42 රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - කොළඹ 01

43 සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම

44 ශාරන්ගා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

45 ශිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

46 එස්. එස්. ඩී. ඩී. මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

47 ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01

48 ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කෙළඹ 06

49 තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - කොළඹ 03

50 තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - මහනුවර

51 තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - ගාල්ල

52 යුනික් ෆොරෙක්ස් (පුද්.) සමාගම

53 වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

54 වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

55 විනිඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

**විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන්**

**බලයලත් මුදල් මාරු කරන්නන්**

56 අරුජිනා ජුවලරි (පුද්.) සමාගම

57 කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06

58 ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

59 සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

60 දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම

61 මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06

62 මෙට්රෝ ෆොරෙක්ස් (පුද්.) සමාගම

63 ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01

64 ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06

65 පුෂ්පා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

66 රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම

67 තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ

**බලපත්‍රලාභී මූල්‍ය සමාගම්**

68 ඒසියා ඇසෙට් ෆිනෑන්ස් පී.එල්.සී

69 බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී

70 සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී

71 ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්

72 එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් පී.එල්.සී

73 එල්. බී. ෆිනෑන්ස් පී.එල්.සී

74 සෙංකඩගල ෆිනෑන්ස් පී.එල්.සී

75 සිංහ පුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී

76 සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී

**විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන්**

**සංචාරක හෝටල්**

77 මැන්ඩරිනා කලම්බු

78 පර්ල් සිටි හොටෙල්

79 ෂැංග්‍රිලා හොටෙල් කලම්බු

80 ෂැංග්‍රිලාස් හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා

81 සීගිරිය ජංගල්ස්

**අනෙකුත් ආයතන**

82 එම්. එම්. බී. එල්. මනි ට්‍රාන්ස්ෆර් (පුද්.) සමාගම

83 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

# 13. මානව සම්පත්

2018 වසර තුළ දී, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා දායක විය හැකි ඉහළ ඵලදායීතාවයකින් යුත්, අභිප්‍රේරිත සහ තෘප්තිමත් සේවක පිරිසක් මහ බැංකුව තුළ බිහි කිරීම අරමුණු කොට ගෙන, නව මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වා දීම, කාර්යසාධන කළමනාකරණය, දෙපාර්තමේන්තු අතර සේවකයන් ස්ථාන මාරු කිරීම, අනුප්‍රාප්තික සැලසුම් සිදු කිරීම, පන්ති සහ ශ්‍රේණි උසස් වීම් ලබා දීම සහ යහපත් සේව්‍ය - සේවක සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය හිතකර පරිසරයක් ගොඩනැගීම සඳහා කාර්මික සාමය පවත්වාගෙන යැම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් ව්‍යුහය සහ 2018 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

## 13.1 මානව සම්පත් ව්‍යුහය

2018 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,421 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 686 කින් ද, කළමනාකරණ සහකාර පන්තියේ නිලධාරීන් 576 කින් ද, කාර්යාල සහායක පන්තියේ සේවකයින් 159 කින් ද සමන්විත විය. කාර්යමණ්ඩල සංයුතිය පසුගිය වසර හා සසඳා බැලීමේ දී මාණ්ඩලික පන්තියේ සහ කළමනාකරණ සහකාර පන්තියේ සුළු වෙනස් වීමක් දැකිය හැකි වුවද, කාර්යාල සහායක පන්තිය නොවෙනස්ව පැවතිණි. 2018 වසර අවසානය වන විට මහ බැංකුවේ සමස්ත සේවකයන්ගේ වයස්වල සාමාන්‍යය අවුරුදු 39 ක් විය. 2018 වසර අවසානය වන විට පන්ති අනුව, ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සහ වයස අනුව කාර්යමණ්ඩලයේ සංයුතිය රූප සටහන II-4 හි දක්වා ඇත.

**II-4 රූප සටහන**

**2018.12.31 දිනට කාර්යමණ්ඩල සංයුතිය**

(අ) සේවක සංයුතිය: පන්ති අනුව




(ආ) සේවක සංයුතිය: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව




(ඇ) සමස්ත සේවක සංයුතිය: වයස අනුව




(ඈ) මාණ්ඩලික පන්තියේ සේවක සංයුතිය: වයස අනුව




### 13.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

පහත සංඛ්‍යා සටහන II-21 හි දැක්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ඉහළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ නිපුණතාවලින් හෙබි, නානාවිධ දක්ෂතා ඇති කාර්යමණ්ඩලයකින් සමන්විත වේ.

### 13.3 මානව සම්පත් කළමනාකරණය

(අ) බඳවා ගැනීම්

2018 වසර තුළ දී, සාමාන්‍ය බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය යටතේ කළමනාකරණ අභ්‍යාසලාභීන් 30 දෙනෙකු, සහකාර ආරක්ෂක නිලධාරී (පුහුණු) 21 දෙනෙකු හා කණිෂ්ඨ පෞද්ගලික සහකාරවරියන් 12 දෙනෙකු බඳවා ගන්නා ලදී. තවද, බැංකුවට අවශ්‍ය සුවිශේෂී නිපුණතා සපුරා ගැනීම සඳහා පාර්ශ්වික බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය යටතේ ප්‍රධාන පුස්තකාලයාධිපතිවරයකු හා නීති නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා කටයුතු කරන ලදී. මීට අමතරව, වසර තුළ දී අභිරක්ෂක, නඩත්තු හා ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්/විදුලි/යාන්ත්‍රික), තාක්ෂණික නිලධාරි (සිවිල්/විදුලි/යාන්ත්‍රික) සහ තාක්ෂණ ශිල්පී (දුරකථන හා ශ්‍රව්‍ය දෘෂ්‍ය) යන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සිදු කරන ලදී.

(ආ) කාර්යසාධන කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය, සේවකයන්ගේ රාජකාරි ලැයිස්තු සකස් කිරීම හා

**II-21 සංඛ්‍යා සටහන**

**2018.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්වයන්**

| සේවක පන්ති | ආචාර්ය උපාධිධාරීන් | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්වයන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කාණ්ඩ / එකතුව | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්වයන් | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්වයන් | පශ්චාත් උපාධි සහ වෘත්තීය සාමාජිකත්වයන් | පශ්චාත් උපාධි | ප්‍රථම උපාධි | වෘත්තීය සාමාජිකත්වයන් |
| මාණ්ඩලික පන්තිය | 20 | 546 | 124 | 180 | 64 | 28 | 1 | 134 | 15 |
| කළමනාකරණ සහකාර පන්තිය | - | 148 | 9 | 23 | 11 | 12 | 10 | 52 | 31 |
| කාර්යාල සහායක පන්තිය | - | 7 | - | - | - | - | - | 7 | - |
| **එකතුව** | **20** | **701** | **133** | **203** | **75** | **40** | **11** | **193** | **46** |

සමාලෝචනය කිරීම, එක් එක් සේවකයන්ට අදාළ වන පරිදි ඉලක්ක අරමුණු පිහිටුවීම, කාර්යසාධන නිරීක්ෂණය සහ කාර්යසාධන ඇගයීම යන කොටස්වලින් සමන්විත වේ.

කාර්යසාධන ඇගයීමේ ක්‍රියාවලිය යටතේ, කාර්යසාධන ඇගයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා සහ තාක්ෂණික නිපුණතා පදනම්ව ළඟා කරගත් කාර්යසාධනය ප්‍රමාණනය කර ඒ සඳහා අගයන් ලබා දෙමින් සෑම සේවකයෙකුගේම කාර්යසාධන ඇගයීම සිදු කරනු ලැබීය. සේවක උසස්වීම් පටිපාටියේ ඇති එක් සංරචකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තවද, මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර, එම ක්‍රියාවලිය මගින් වසරේ මුල් භාගය තුළ දී සේවකයන්ගේ කාර්යසාධන මට්ටම අදාළ පාර්ශ්වයන් වෙත දැන ගැනීමට අවස්ථාව සැලසිණි.

**(ඈ) උසස් වීම්**

2018 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ උසස් වීම් පටිපාටියට අනුකූලව සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය තහවුරු කරමින් සේවක උසස් වීම් ලබා දුන් අතර, මේ යටතේ සේවකයන් 216 දෙනෙකුට අදාළ පන්ති හා ශ්‍රේණි උසස් වීම් ලබා දීම සඳහා කටයුතු සිදු කරනු ලැබීය. මේ අනුව සහකාර අධිපතිවරු දෙදෙනෙක් නියෝජ්‍ය අධිපතිවරුන් ලෙස උසස් වීම් ලැබූහ. තවද, මාණ්ඩලික පන්තියේ III (1) ශ්‍රේණියේ නිලධාරීන් 44 දෙනෙකුට නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස හා මාණ්ඩලික පන්තියේ III (2) ශ්‍රේණියේ නිලධාරීන් 10 දෙනෙකුට අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස උසස් වීම් ලැබිණි. මේ අතර, නිලධාරීන් 120 දෙනෙකු ශ්‍රේණි උසස් වීම් ලද අතර, නිලධාරීන් 38 දෙනෙකු කළමනාකරණ සහකාර පන්තියේ සිට මාණ්ඩලික පන්තිය දක්වා උසස් වීම් ලැබීය.

**(ඇ) දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම්**

බැංකුවේ විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ගැනීමට සියලු සේවකයන්ට අවස්ථාව සලසා දීමේ අරමුණින් යුක්තව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය යටතේ මාණ්ඩලික නිලධාරීන් 6 දෙනෙකු, කළමනාකරණ සහකාර නිලධාරීන් 9 දෙනෙකු සහ බැංකු කාර්යාල කාර්යය සහායකයින් 3 දෙනෙකු 2018 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ) කාර්මික සාමය**

පහසුකම් සලසාදෙන්නෙකු වශයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෘත්තීය සමිති සහ කළමනාකාරිත්වය අතර සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2018 වසර තුළ දී කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර සාකච්ඡා වාර 12 ක් පවත්වන ලද අතර, එමගින් සේවක වැටුප්, උසස්වීම්, පුහුණුවීම්, සුභසාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය සම්බන්ධයෙන් පැවති ඇතැම් ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබිණි.

### 13.4 දෙපාර්තමේන්තු වසා දැමීම සහ නව දෙපාර්තමේන්තු පිහිටුවීම

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වන වගන්තිය සහ අංක 21/2017 දරන 2017 ජුනි 16 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී එළැඹි තීරණය ප්‍රකාරව, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව පිහිටුවීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

### 13.5 2018 වසර තුළ අධිපතිතුමා සහභාගී වූ විදේශයන්හි පැවති රැස්වීම්

(i) මාර්තු 02 දින සිංගප්පූරුවේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) සහ සිංගප්පූරු - ශ්‍රී ලංකා ව්‍යාපාර සංගමය සමගින් කොළඹ කොටස් හුවමාරුව (CSE) විසින් සංවිධානය කරනු ලැබූ, “Invest Sri Lanka ආයෝජන සමුළුව” සඳහා සහභාගී වීම.

(ii) අප්‍රේල් 18 සිට 22 දින දක්වා වොෂින්ටන් හිදී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල්/ලෝක බැංකු 2018 වාර්ෂික වසන්ත සෘතු රැස්වීම සඳහා සහභාගී වීම.

(iii) ජූලි 15 සිට 18 දින දක්වා චීන මහජන සමූහාණ්ඩුවේ දී පැවති චීන සංවර්ධන බැංකුවේ (China Development Bank), ආසියානු යටිතල පහසුකම් සඳහා ආයෝජන බැංකුවේ (Asian Infrastructure Investment Bank), චීන මහජන බැංකුවේ (People's Bank of China) සහ චීන ජාත්‍යන්තර ප්‍රාග්ධන සමාගමේ (China International Capital Corporation) නිලධාරීන් සමග පැවති රැස්වීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරි මණ්ඩලයේ ප්‍රධානත්වය දැරීම.

(iv) සැප්තැම්බර් 9 සිට 13 දින දක්වා ඕමාන් රාජ්‍යයේ දී, කටාර්හි දී සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී ජ්‍යෙෂ්ඨ බැංකු නිලධාරීන් සමග පැවති රැස්වීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නිලධාරි මණ්ඩලයේ ප්‍රධානත්වය දැරීම.

(v) ඔක්තෝබර් 15 සිට 16 දින දක්වා පැරිසියේ දී පැවති මූල්‍ය කාර්ය සාධක බලකායේ (Financial Action Task Force) සැසි සහ වැඩ කණ්ඩායම් සඳහා සහභාගී වීම.

### 13.6 උසස් කිරීම්/ පත් කිරීම්

(i) මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ලෙස මුදා හැර සිටි සහකාර අධිපති, එස්.ආර්. ආටිගල මහතා 2018 ඔක්තෝබර් 31 දින සිට නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස පත් කරන ලදී.

(ii) සහකාර අධිපති, එච්.ඒ. කරුණාරත්න මහතා 2018 ඔක්තෝබර් 31 දින සිට නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස පත් කරන ලදී.

(iii) ක්ෂුද්‍ර මූල්‍ය අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩී.ඒ.ජී.කේ. විජේතුංග මහතා 2018 ජනවාරි 01 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(iv) පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්.කේ. රණසිංහ මහතා 2018 ජනවාරි 01 දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(v) ක්ෂුද්‍ර මූල්‍ය අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වී. බාස්කරන් මහතා 2018 ජනවාරි 01 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(vi) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඒ.එම්. ගුණතිලක මහතා 2018 ජනවාරි 17 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි ලෙස පත් කරන ලදී.

(vii) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්.එම්. ජයවර්ධන මහතා 2018 ජුනි 01 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(viii) සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි ඒ.ජී.යූ. තිලකරත්න මහතා 2018 ජුනි 01 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි ලෙස පත් කරන ලදී.

(ix) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි සී.පී.එස්. බණ්ඩාර මහතා 2018 ජුනි 01 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(x) මුදල් අමාත්‍යාංශය වෙත මුදා හැර සිටි අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර මහතා, 2018 ජුනි 01 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xi) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. දසනායක මහත්මිය 2018 ජූලි 19 දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේකම් ලෙස පත් කරන ලදී.

(xii) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ආර්.ඒ. පෙරේරා මහත්මිය 2018 ජූලි 19 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xiii) දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ සී.ඒ. අබේසිංහ මහතා 2018 අගෝස්තු 17 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xiv) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.ආර්.එම් අබේරත්න මහතා 2018 සැප්තැම්බර් 03 දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද, 2018 ඔක්තෝබර් 20 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී. ඉන් අනතුරුව 2018 නොවැම්බර් 23 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xv) අධිපති ලේකම් කාර්යාලයට අනුයුක්ත අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) ආචාර්ය එච්. අමරතුංග මහතා 2018 ඔක්තෝබර් 20 දින සිට ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xvi) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ බී.එල්.ජේ.එස්. බාලසූරිය මහතා 2018 ඔක්තෝබර් 20 දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xvii) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ඩබ්.ආර්.එම්.කේ. ප්‍රනාන්දු මහතා 2018 ඔක්තෝබර් 29 දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xviii) ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්.ඒ. දිල්රුක්ෂිණි මහත්මිය 2018 නොවැම්බර් 16 දින සිට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(xix) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්.ආර්. ජයරත්න මහතා එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස 2018 දෙසැම්බර් 01 දින සිට පත් කරන ලදී.

## 13.7 මුදා හරිනු ලැබ සිටි නිලධාරින්

(i) සහකාර අධිපති කේ.එම්.එම්. සිරිවර්ධන මහතා, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත

(ii) මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ එස්. රත්නායක මහත්මිය, පරිපාලන සහකාර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත

(iii) මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ එස්. අමිතා මෙනෙවිය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත කාර්යාලය වෙත

## 13.8 විශ්‍රාම ගැනීම්

(i) මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ඩී.කේ. විජේසූරිය මහතා 2018 ජනවාරි 01 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ii) ප්‍රධාන ගණකාධිකාරි එම්.අයි. සුහියාන් මහතා 2018 පෙබරවාරි 18 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(iii) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වී. බාස්කරන් මහතා 2018 මැයි 10 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(iv) කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ කේ.ජී.ආර්.කේ. ධීරසිංහ මෙනෙවිය 2018 සැප්තැම්බර් 01 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(v) ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක ලේකම් එච්.එම්. විමල් මහතා 2018 සැප්තැම්බර් 16 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(vi) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේකම් බී.ඩබ්. ජිනසේන මහතා, 2018 ඔක්තෝබර් 19 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(vii) නියෝජ්‍ය අධිපති සී.ජේ.පී. සිරිවර්ධන මහතා 2018 ඔක්තෝබර් 31 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(viii) දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පී.ඩබ්.ඩී.එන්.ආර්. රුද්‍රිගු මහතා 2018 නොවැම්බර් 17 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ix) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ආර්.ඩී.ඩබ්. පල්ලේගම මහතා 2018 දෙසැම්බර් 03 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(x) පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ කේ.ඩී.ආර්. පියතිලක මහතා 2018 දෙසැම්බර් 31 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 14. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී.

2018 වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ පහක් යටතේ සිය දායකත්වය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දෙන ලදී.

(අ) පිරිවැය-ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම;

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබාදීම;

(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම;

(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය.

**(අ) පිරිවැය-ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම**

බැංකුවේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය සහ ක්‍රමවත් කිරීම සඳහා මූල්‍ය දෙපාර්තමේන්තුව වෙනුවෙන් අයවැය තොරතුරු පද්ධතියක් (Budget Information Submission and Processing System) ස්ථාපනය කරන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙනුවෙන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ ඔස්සේ නිකුත් කිරීම සඳහා වෙබ් අඩවි තාක්ෂණය පදනම් කරගත් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි පද්ධතියක් නිර්මාණය කරන ලදී.

අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට තත්කාලීන මැදිහත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට විදේශ මුදල් සඳහා වූ මිල ගණන් ක්ෂණිකව ලබා ගැනීම සඳහා මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂණ (Central Integrated Market Monitoring) පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පවත්නා පොලී අනුපාත (SLIBOR, AWLR, AWDR) සම්පාදනය කිරීම ස්වයංක්‍රීය කිරීම සඳහා මෙම පද්ධතිය තුළ නව අතුරු මුහුණතක් නිර්මාණය කරන ලදී.

බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් භාවිතා කරන මධ්‍යම දත්ත පද්ධතිය (FinNet) නව නියාමන වාර්තා ඇතුළත් කොට වැඩිදියුණු කරන ලදී.

නව විදේශ විනිමය පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් ආමුඛ ආයෝජන ගිණුමෙහි අරමුදල් ගලා ඒම් සහ ගලා යාම් නිරීක්ෂණය සඳහා වූ මෙහෙයුම් පද්ධතිය වැඩිදියුණු කරන ලදී. තවද විදේශ විනිමය දෙපාර්තමේන්තුව භාවිතා කරන ForexNet පද්ධතියෙහි, විදේශ විනිමය අලෙවිය හා මිලදී ගැනීමේ නිරීක්ෂණ කටයුතු වැඩිදියුණු කරන ලදී.

මුදල් මණ්ඩල තීරණ හා පසුව සිදු කරන සමාලෝචන කළමනාකරණය කිරීමත් ඒ හා සම්බන්ධ කටයුතු වල තත්ත්වය නිරීක්ෂණය කිරීමත් පහසු කිරීම සඳහා කාර්ය අධීක්ෂණ පද්ධතිය (Task Tracker System) සංවර්ධනය කරන ලදී. තවද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සඳහා සකස් කල මාර්ගගත නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ පද්ධතිය (Holiday Homes Booking System) මගින් මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා පහසුවෙන් නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විනිවිදභාවය පවත්වාගෙන යමින් ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතිය වන ලංකාසෙට්ල් (LankaSettle) පද්ධතියේ පියවන සුරැකුම් පත් ගනුදෙනු පිළිබඳ ඊ-මේල් සහ කෙටි පණිවුඩ මගින් ආයෝජකයින් දැනුවත් කිරීම සඳහා, අවශ්‍ය පහසුකම් සපයන ලදී. මීට අමතරව, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනුවල මිල හා ඵලදා ග්‍රහණය කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය තුළ පහසුකම් සැපයීම මගින් මිල සෙවීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ගේ නාමලේඛනයෙහි ජාතික හැඳුනුම්පත් අංක මිලියනයක පමණ ප්‍රමාණයක් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් යාවත්කාලීන කරන ලදී.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම**

නව දියුණු තාක්ෂණය සමඟ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

සයිබර් ප්‍රහාරයන්ගෙන් හා අභ්‍යන්තර තර්ජන වලින් ආරක්ෂා වීම සඳහා ගිනි පවුරු (Firewalls) තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලයේ අභ්‍යන්තර සහ බාහිර සීමා තුළ අතිනවීන ගිනි පවුරු (Firewalls) ප්‍රතිස්ථාපනය කරන ලදී.

බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළු සම්බන්ධිත ආයතන විසින් උපාය මාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධති වෙත ප්‍රවේශ වීමට භාවිතා කරන CBSLNet අතථ්‍ය පෞද්ගලික ජාලය (Virtual Private Network -VPN), විදුලි සංදේශ සේවා සපයන්නන් දෙදෙනෙකු හරහා ද්විත්ව සම්බන්ධතාවයක් ඇති කරමින් වැඩිදියුණු කරන ලදී. තවද, මෙම VPN ජාලයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා සම්බන්ධිත අන්ත අතර ගුප්ත කේතනය (encryption) බලාත්මක කරන ලදී.

ඕනෑම විදුලි සංදේශ ජාලයක් හරහා කෙටි පණිවුඩ යැවීම හා ලබා ගැනීම සඳහා ඉඩ සලසන කෙටි පණිවුඩ සේවා ද්වාරයක් (SMS gateway) ස්ථාපනය කරන ලදී. එමගින් ලංකාසෙට්ල් (LankaSettle) පද්ධතියේ සුරැකුම් පත් ගනුදෙනු නිසා ප්‍රතිලාභ හිමියන්ගේ ගිණුම්වල සිදුවන හර කිරීම් හෝ බැර කිරීම් පිළිබඳව ඔවුන්ව කෙටි පණිවුඩ මගින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි. ඉදිරියේදී මෙම කෙටි පණිවුඩ සේවා ද්වාරය මගින් මෙවැනි සේවාවන් අවශ්‍ය විය හැකි වෙනත් ඕනෑම තොරතුරු පද්ධතියක් සඳහා ද ලබා ගත හැක.

**(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම**

ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන උපදේශනය සහ තාක්ෂණ දැනුම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සපයන ලදී. ඒ අනුව පසුගිය වසර තුල තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් ජාතික ව්‍යාපෘති කිහිපයක් සඳහා සිය තාක්ෂණ දැනුම සපයන ලදී.

මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතිය සම්බන්ධ ඊ-වෙළෙඳ වේදිකාව (e-Trading Platform) ස්ථාපිත කිරීම මූල්‍ය වෙළඳපොල යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා ගෙන එන වැදගත් ජාතික ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සේවය කරන ලදී.

ඊට අමතරව ජාතික ගෙවීම් කවුන්සිලය (NPC) විසින් පත් කරන ලද Fintech Developments පිළිබඳ කමිටුවට සහ Blockchain තාක්ෂණය පිළිබඳ කමිටුවට තොරතුරු තාක්ෂණ නිලධාරීන් දායක විය.

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ජංගම මුදල් සේවා සැපයුම්කරුවන් සඳහා සිදු කළ කාලීන පරීක්ෂණ සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සිය තාක්ෂණ දැනුම ලබා දුන් අතර, ඇතැම් මූල්‍ය ආයතනවල නියාමන කටයුතු ඉටු කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ද සහාය ලබා දුනි.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම**

තොරතුරු වල සුරක්ෂිතභාවය වැඩිදියුණු කොට බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති සයිබර් තර්ජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී. ඒ අනුව ආරක්ෂක පිළිවෙතක් ලෙස උපාය මාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධතිවල අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ අවදානම ඇගයීම් (vulnerability assessment) සිදු කරන ලද අතර, සයිබර් ප්‍රහාරයන්ට නිරාවරණය වීම අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ ක්‍රමවේද යොදන ලදී.

බැංකුවේ මූලික තොරතුරු ආරක්ෂක ප්‍රමිති ක්‍රියාපටිපාටි නිරූපනය කරන තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (Information Security Policy-ISP) සංශෝධනය කොට එහි හතර වන සංස්කරණය (ISP Version 4.0) ප්‍රකාශයට පත් කරන ලදී.

මානව සම්පත් ජාලය තුළ තිබිය හැකි දුර්වලතා හඳුනා ගැනීම සඳහා අවබෝධතා පරීක්ෂණ (Social Engineering Tests) සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් ඊමේල් පරිශීලකයින්ට ඔවුන් ඉලක්ක කරගත් ව්‍යාජ ඊමේල් පණිවුඩ යවා ඔවුන්ගේ දැනුවත්භාවය පරීක්ෂා කොට ඊමේල් සේවාව ආරක්ෂිතව භාවිතා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

2018 දෙසැම්බර් මස අවසානය වන විට අනිවාර්ය කරන ලද SWIFT පාරිභෝගික ආරක්ෂණ වැඩසටහන (Customer Security Programme) සඳහා අනුකූලතාවය ලබා ගැනීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය.

බැංකුවේ සියලු දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් (DLO) සඳහා සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණු සැසියක් පවත්වන ලදී.

**(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය**

බැංකුවේ සියලු සේවකයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඊ-මේල් හා අභ්‍යන්තර වෙබ් අඩවිය මගින් දැනුවත් කිරීම සහ අනතුරු අඟවීම් ප්‍රකාශයට පත් කරන ලදී. බැංකු කාර්යාල සහායකයින් සඳහා අන්තර්ජාලය හා ඊමේල් තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

තවද, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම පිණිස, එම නිලධාරීන්ට කෙටි කාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

# 15. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලයේ මෙහෙවර, කාර්ය වපසරිය, වගවීම, ස්වාධීනත්වය, වගකීම සහ අධිකාරී බලය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරයි. 2018 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 15.1 අභ්‍යන්තර විගණන සැලසුම

2019 වසර සඳහා සකසන ලද අභ්‍යන්තර විගණන සැලසුම මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව විසින් සමාලෝචනය කර මුදල් මණ්ඩලයෙන් අනුමත කර ඇත.

### 15.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

(අ) ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්

අභ්‍යන්තර විගණන සැලසුමට අනුව 2018 වසරේ දී, ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් සිදු කරන ලදී. සෑම විගණනයක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම සහ නිරාකරණයන්ට අදාළ කටයුතු කිරීම යන පියවර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී අනුගමනය කරන ලද විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිම කිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම්දීම, කෙටුම්පත් විගණන වාර්තා නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තා නිකුත් කිරීම යන පියවර හතරකින් යුක්ත වූ ක්‍රියාවලියෙහි විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම් දීමේ පියවර ඉවත් කිරීමෙන් පියවර තුනකින් යුතු ක්‍රියාවලියක් බවට මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ නිර්දේශයන් මත මුදල් මණ්ඩලයෙන් අනුමත කිරීමෙන් පසුගිය වසර තුළ දී වෙනස් කරන ලදී. තවද, ක්‍රියාවලි හිමිකරුවන් විසින් දැනුම් දී ඇති විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන් ද කාර්තු පදනමින් වසර තුළ දී සිදු කරන ලදී.

(ආ) ස්ථානීය විගණනයන් ක්‍රියාත්මක කිරීම

ස්ථානීය විගණනයන් 2018 වසරේ දී කරනු ලැබූ අතර එම විගණනයන්ගේ ප්‍රතිඵල ක්‍රියාවලි හිමිකරුවන්ට සහ අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත සන්නිවේදනය කරන ලදී.

(ඇ) විශේෂ පැවරුම්

මුදල් මණ්ඩලයේ උපදෙස් මත ව්‍යවහාරික විගණනයන්ට පහසුකම් සැලසීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් කරන ලද කොටස් සහ රාජ්‍ය සුරැකුම්පත්වල (2002 - 2016 අවසානය තෙක්) ආයෝජනයන්ට අදාළ ලිපිගොනු සහ ලේඛන පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් කරනු ලැබීය.

(ඈ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම, කරන ලද විගණනයන් පිළිබඳව අර්ධ වාර්ෂිකව විගණකාධිපතිට වාර්තා කරන ලදී.

### 15.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු පහසුකම් සැලසීම

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණන පහසුකම් සැපයීමේ මාර්ගෝපදේශ පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි උපාධි අපේක්ෂකයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳව පුහුණු කිරීම් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී අඛණ්ඩව සලසන ලදී.

### 15.4 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතීන්, අනුකූලතාවය, දුෂ්කෘත නිවේදන, වංචා, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම එමගින් සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සැලසීම ද වසර තුළ දී සිදු කරන ලදී.

# 16. ජාත්‍යන්තර මෙහෙයුම්

මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වගකීමකි. මේ යටතේ, විදේශ සංචිත කළමනාකරණය කිරීමේ කාර්යය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි කටයුතු අධීක්ෂණය තුළින් එහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමේ කාර්යය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

විදේශ සංචිතයන්හි සංයුතිය සහ එය පවත්වාගෙනයාම, ජාත්‍යන්තර වශයෙන් රුපියලෙහි ස්ථාවරභාවය ආරක්ෂා කරගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කාර්යයන්හි විෂය පථය සහ විදේශ සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම් වලට අදාළව මුදල් මණ්ඩලයට පැවරී ඇති බලතල සහ වගකීම් යනාදිය ආවරණය කරන විදේශ සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නෛතික රාමුව මුදල් නීති පනත මගින් දක්වා ඇත. මේ අනුව වත්කම් වර්ග, ප්‍රතිපාර්ශ්ව ආයතන, මූල්‍ය උපකරණ

සහ නිකුත්කරන්නන්ට අදාළව පවත්නා ප්‍රමිතීන් මුදල් නීති පනතේ 67 වගන්තිය මගින් දැක්වේ. ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ යන සංචිත කළමනාකරණ අරමුණු වැඩිදියුණු කිරීම සඳහා සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්හි විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට මුදල් මණ්ඩලය මගින් මගපෙන්වනු ලබයි.

## 16.1 විදේශ සංචිත කළමනාකරණය

මුදල් මණ්ඩලය මගින් සංශෝධිත සහ අනුමත කරන ලද, විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්ට (Foreign Reserve Management Guidelines - FRMG) අනුකූලව විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ (Foreign Reserves Management Committee - FRMC) අධීක්ෂණය යටතේ ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ යන අරමුණු සැලකිල්ලට ගෙන විදේශ සංචිත ආයෝජනය කරනු ලබයි. මෙම විදේශ සංචිත ප්‍රධාන මුදල් වර්ග කිහිපයකින් සංයුක්ත වන අතර ඒවා ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම්පත් (Fixed Income Securities) මුදල් වෙළෙඳපොළ උපකරණ (Money Market Investments) සහ රත්‍රං වල ආයෝජනය කර ඇත. ස්ථාවර ආදායම් සුරැකුම් ආයෝජනයන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතන සහ අධිජාතික (Supranational) ආයතන මගින් නිකුත් කළ සුරැකුම්පත් තුළ සිදුකර ඇත. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සංචිත කළමනාකරණ කාර්යය සඳහා වන ගනුදෙනු, ප්‍රතිපාර්ශ්ව ණය අවදානම් කළමනාකරණ පද්ධතියේ (Counterparty Credit Risk Management System - CCRMS) දක්වා ඇති ප්‍රමිතීන්ට අනුව විදේශ සංචිත කළමනාකරණ කමිටුව (FRMC) මඟින් අනුමත කරන ලද ප්‍රතිපාර්ශ්ව වන මහ බැංකු, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත වාණිජ බැංකු සහ ආයෝජන ආයතන (Investment Houses) සමග සිදුකරනු ලබයි. ඉහත කී සියළු ආයෝජනයන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාර්ශ්වයන්ගේ ශක්තිය හා ණය පියවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාර්ශවයන් සඳහා නිර්ණය කරන ලද ණය සීමාවන්ට යටත්ව සිදු කරනු ලබයි.

2016 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකුවේ 'සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහනට' (Reserve Advisory and Management Programme - RAMP) සම්බන්ධ වූ අතර, එම වැඩසටහන යටතේ විදේශ සංචිත සහ අනෙකුත් ආයෝජන කළඹ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා උපදේශක සේවා මෙන්ම පුහුණුවීම් ද සපයනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත සඳහා 'උපායමාර්ගික වත්කම් වෙන්කිරීම' (Strategic Asset Allocation - SAA) නමින් නව ආකෘතියක් නිර්මාණය කරන ලද අතර එය මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් ව්‍යුහය මත පදනම් විය. තව ද, මෙම ආකෘතිය නිර්මාණය කිරීමේ දී සංචිත කළමනාකරණයේ ප්‍රධාන අරමුණු වන ප්‍රාග්ධන සංරක්ෂණය, ද්‍රවශීල අවශ්‍යතා, ආදායම් උත්පාදනය සහ අවදානම දරාගැනීම යන කරුණු වෙත මූලික අවධානය යොමු කර ඇත. ඉහත කී නව ආකෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත, 2016 වසරේ සිට ආයෝජන කාල පරාසය, මුදල් සංයුතිය සහ වත්කම් සංයුතිය යනාදිය මත පදනම් වූ ආයෝජන කළඹ වලින් සමන්විත වන ප්‍රධාන කාණ්ඩ (tranches) තුනකට බෙදා වෙන් කර ඇත. ඒ එක් එක් කාණ්ඩ යටතේ වන සෑම ආයෝජන කළඹක් සඳහාම ජාත්‍යන්තරව පිළිගත් මිනුම් දණ්ඩක් (benchmark) නියම කරනු ලැබිණි. ඉහත කී නව ආකෘතිය යටතේ ආයෝජනය කරන ලද විදේශ සංචිත වල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම, අදාල මිනුම් දඬු වලට සාපේක්ෂව කරනු ලබන අතර එතුළින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් හා අනුමත ක්‍රමවේදයන්ට අනුගතව ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමක් අපේක්ෂා කරයි.

තව ද "සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන" (RAMP) යටතේ ලෝක බැංකු භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණය පිළිබඳ බාහිර කළමනාකරුවෙකු වශයෙන් පත්කරන ලද අතර, පූර්ව නියමයන්ට අනුව වසර තුනක කාලයකට ආයෝජනය කිරීම සඳහා විදේශ සංචිත වලින් ඇ.එ.ඩො මිලියන 200 ක් ඒ සඳහා වෙන්කර ඇත.

2018 වසර තුළ දී ලෝක බැංකුවේ "සංචිත උපදේශක හා කළමනාකරණ වැඩසටහනේ" (RAMP) මඟපෙන්වීම යටතේ, විදේශ සංචිත කළමනාකරණය හා සම්බන්ධ තාක්ෂණික වැඩමුළු දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවත්වන ලදී. මේ යටතේ විදේශ සංචිතයන්ට අදාළව අවදානම් අයවැයකරණය (Risk Budgeting), ආයෝජන කළඹ සහ අවදානම් කළමනාකරණය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශනය ඉලක්ක කරගනිමින් එම වැඩමුළු පැවැත්විණි.

## 16.2 කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම්

කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීම යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කෙරේ.

**(අ) කාර්යසාධන ඇගයීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සමස්ත ප්‍රතිලාභ ප්‍රවේශයක් අනුව එහි සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම් වල කාර්යසාධන ඇගයීම් කටයුතු දෛනික ව සිදුකරනු ලබන අතර, එය සංචිත මට්ටම් විශ්ලේෂණයක් ද සහිතව මාසික ව විදේශ සංචිත කළමනාකරණ කමිටුවටත්, කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙතටත් වාර්තා කරනු ලබයි. ස්ථාවර ආදායම් සුරැකුම්පත් වල හා මුදල් වෙළඳපොල ආයෝජනයන් හරහා ඉපැයෙන ප්‍රතිලාභ මුදල් මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයට අනුව එකිනෙකට අදාළ පිළිගත් මිනුම්දඬු වලට සාපේක්ෂව සහ අනුකූලව ඇගයීමට ලක්කරයි. අනුමත මාර්ගෝපදේශ තුල ආයෝජනය කිරීමෙන් සක්‍රීය සංචිත කළමනාකරණයෙහි ප්‍රතිලාභ අරමුණු සාධාරණ ප්‍රමාණයකට ලඟාකරගෙන ඇත් දැයි යන්න හඳුනාගැනීම සඳහා මෙම ප්‍රවේශය උපකාරී වේ. විදේශ සංචිත කළමනාකරණයෙන් උත්පාදනය වූ සමස්ත ප්‍රතිලාභ තවදුරටත් විදහා දැක්වීම සඳහා 2018 වසරේදී

කාර්යසාධන විශ්ලේෂණය හඳුන්වා දෙන ලදී. විවිධ අවදානම් ප්‍රභවයන් මගින් උත්පාදනය වූ ප්‍රතිලාභ ඇගයීම මගින් ආයෝජන කළඹ වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීමට මෙම ක්‍රියාවලිය උපකාරී වන අතර, එහි ප්‍රතිඵල, සංචිත කළමනාකරණ උපක්‍රම සැකසීම සඳහා භාවිතා කළ හැකි ඉතා වැදගත් යෙදවුම් වේ.

**(ආ) සංචිත කළමනාකරණ පද්ධතිය (TMS) පාලනය කිරීම**

සංචිත කළමනාකරණ පද්ධතියෙහි ප්‍රධාන පරිශීලකයා වන ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එහි සාමාන්‍ය පරිපාලන කටයුතු වල වගකීම දරන අතර, අනෙක් පරිශීලක දෙපාර්තමේන්තු, පරිගණක මෘදුකාංග සැපයුම්කරු හා දේශීය හවුල්කරු අතර විධිමත් සම්බන්ධීකරණය ද තහවුරු කරයි. තවද, සංචිත කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කරනු වස් අවශ්‍ය වන්නා වූ නිසි වැඩිදියුණු කිරීම් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳ මෙන්ම ස්විෆ්ට් (SWIFT), තත්කාලීන මුදල් පියවීමේ පද්ධතිය (RTGS) සහ පොදු ලෙජරය (GL) වැනි අභ්‍යන්තර පද්ධති ඇතුළුව බ්ලූම්බර්ග් (Bloomberg) සහ රොයිටර්ස් (Reuters) වැනි බාහිර පද්ධති සමඟ ද එහි පූර්ණ සහ අඛණ්ඩ සම්බන්ධතාව සහතික කිරීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ.

**(ඇ) මූල්‍යමය-නොවන අවදානම් නියාමනය**

සංචිත කළමනාකරණ කටයුතු වලට අදාල මූල්‍ය-නොවන අවදානම් පැතිකඩ හඳුනාගැනීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර, එම අවදානම් අවම කිරීමේ ක්‍රියාවලිය මූල්‍ය-නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත කාර්තුමය වශයෙන් යෝජනා කරයි.

**(ඈ) මූල්‍ය විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන්, ගනුදෙනු පාර්ශවයන්ගේ අනුකූලතාව පිළිබඳ වාර්ෂික සමාලෝචනය**

වර්ෂ 2018 දී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත කළමනාකරණයට සම්බන්ධිත නීති, රෙගුලාසි හා මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට අදාළව ජාත්‍යන්තරව පිළිගත් හොඳම පරිචයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා "ගනුදෙනුකරු හඳුනාගැනීම (KYC)/ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම අදාළ රීති (CDD)", වර්තමාන ගනුදෙනු පාර්ශව සඳහා ක්‍රියාත්මක කරන ලදී.

## 16.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය

පසුගිය වසර තුළ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, විනිමය අනුපාතයේ අධික උච්චාවචනයන් කළමනාකරණය කරන අතරම එහි ඉහළ නම්‍යශීලීත්වයකට ඉඩ සලස්වා, දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම උදෙසා අඛණ්ඩව කටයුතු කරන ලදී.

**(අ) දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මැදිහත් වීම්**

2018 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචනයන් අවම කිරීම පිණිස අවශ්‍ය පරිදි දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් විය. ඒ අනුව යමින්, 2018 ජූලි මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව, වෙළෙඳපොළ ගනුදෙනු විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කළ හැකි, විනිමය අනුපාතික විචලනයන් මත පදනම් වූ මිලගණන් කැඳවීම (Request for Quote) නැමති, වෙළෙඳපොළ මැදිහත් වීමේ රාමුවක් ක්‍රියාත්මක කරන ලදී. විනිමය අනුපාතයේ අධික උච්චාවචනයන් කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විකුණුම් සහ මිලදී ගැනීම් යන දෙඅංශයම සඳහා වෙළෙඳපොළ මැදිහත්වීම් සිදු කරන අවස්ථාවලදී බලපත්‍රලාභී වාණිජ බැංකු තරඟකාරී ද්විත්ව මිළ ගණන් ඉදිරිපත් කළ යුතු බැවින් මෙම නව යාන්ත්‍රණය වෙළෙඳපොළ පාරදෘශ්‍යභාවය පුළුල් කිරීමට සමත් විය.

**(ආ) නව අධීක්ෂණ පද්ධතිය**

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු දියුණුකිරීමේ ඉදිරි පියවරක් වශයෙන්, අන්තර් බැංකු ගනුදෙනු තත්කාලීනව වාර්තා කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නව 'ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළෙඳපොළ අධීක්ෂක' (CIMM) නමින් සංකලිත වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතියක් වසර මුලදී හඳුන්වා දෙන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු අතර විනිවිදභාවය හා තරඟකාරීත්වය පුළුල් කිරීම සඳහා මෙන්ම මෙම වාණිජ බැංකු සහ බලයලත් මුදල් තැරැව්කරුවන්හට වෙළෙඳපොළ වෙනස්වීම් පිළිබඳව වඩා හොඳ දැනුවත්භාවයකින් යුක්තව ගනුදෙනු කිරීමට ඉඩ සැලැස්වීම අරමුණු කොට ගෙන, අන්තර් බැංකු එතැන් වෙළෙඳපොළ තුළ සිදු වූ ආසන්නතම අත්පිට ගනුදෙනු පහක තොරතුරු මෙම අධීක්ෂණ පද්ධති මුහුණත මත තත්කාලීනව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී.

**(ඇ) තොරතුරු බෙදා හැරීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අනුරූප (Indicative) විනිමය අනුපාතිකය ඇතුළුව තවත් ලෝක මුදල් වර්ග පනස් හයක අනුරූප විනිමය අනුපාතිකයන් හා බලපත්‍රලාභී වාණිජ බැංකුවල, ප්‍රධාන මුදල් වර්ග නවයක විදුලි පණිවුඩ පැවරුම් සඳහා වූ මිලදී ගැනීමේ හා විකිණීමේ විනිමය අනුපාතිකයන්ගේ සාමාන්‍ය අගය දෛනික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව කරනු ලැබීය. මීට අමතරව, රාජ්‍ය ආයතන වලට සහ මහජනයා ඇතුළු විවිධ පාර්ශවයන් වෙත ඔවුන්ගේ ඉල්ලීම් මත විනිමය අනුපාත දත්ත සැපයීම මගින්ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිය තොරතුරු බෙදා හැරීමේ රාජකාරිය ඉටු කරන ලදී.

**(ඈ) ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය (NOP) සංශෝධනය කිරීම**

විදේශ විනිමය වෙළෙඳපොළ දියුණුවට සහාය දැක්වීමේ අදහසින්, බලපත්‍රලාභී බැංකු වල විදේශ විනිමය මෙහෙයුම් වලට අදාළ වන ශුද්ධ විවෘත විදේශ විනිමය සීමාවන්, 2018 මැයි සහ ඔක්තෝබර් මාස වලදී සංශෝධනය කරන ලදී.

**(ඉ) වෙළෙඳපොළ සහභාගිකරුවන් සමඟ සම්බන්ධ වීම**

විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු විධිමත් කිරීමේ අදහසින්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, වෙළෙඳපොළ අස්ථාවරත්වය සම්බන්ධයෙන් අදාළ වන කරුණු සාකච්ඡා කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු, බලයලත් මුදල් තැරැව්කරුවන්, ප්‍රධාන ආනයනකරුවන් සහ අපනයනකරුවන් සමඟ රැස්වීම් ගණනාවක් පැවැත්වූ අතර එම ගැටළු මඟහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දියත් කරන ලදී. තවද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා මෙන්ම තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා කාර්තුමය පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වල භාණ්ඩාගාර ප්‍රධානීන් සමඟ රැස්වීම් පැවැත්වීම අඛණ්ඩව කරගෙන යන ලදී. තවද, විදේශීය විනිමය වෙළෙඳපොළ කටයුතු සම්බන්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය කිරීම ආරම්භ කළ අතර ඔවුන් ගෝලීය විදේශ විනිමය ප්‍රමිතීන් පිළිපැදීම සහතික කරලීම සඳහා අවශ්‍ය පරිදි යම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**(ඊ) වෙළෙඳපොළ අපේක්ෂා පිළිබඳ නිරීක්ෂණ**

2018 වසර පුරාවටම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමේ මූලික වගකීම දරණ දෙපාර්තමේන්තුව ලෙස ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ බාහිර ආයතන විසින් ඉදිරිපත් කරන ලද විවිධ යෝජනා, රෙගුලාසි, සංශෝධන හා ප්‍රතිපත්තිමය කරුණු වලින් විදේශ විනිමය අනුපාතයේ විචලනයට සිදු විය හැකි බලපෑම පිළිබඳව සිය අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**(උ) ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 'විස්තීරණ ණය පහසුකම' (EFF) සමාලෝචනය සඳහා ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) දූත මණ්ඩල සහ දකුණු ආසියාවේ කලාපීය පුහුණු සහ තාක්ෂණික සහාය මධ්‍යස්ථානයේ (SARTTAC) දූත මණ්ඩල සමඟ සමීපව කටයුතු කිරීම සහ දත්ත වාර්තා කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන වගකීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිරතුරුව ඉටු කරන ලදී.

## 17. නීති සහ අනුකූලතා කටයුතු

නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණු ළඟා කර ගැනීමේ දී සියලුම නීතිමය සහ කාර්යපටිපාටික අංශයන් කෙරෙහි දක්වන අනුකූලතා මට්ටම වඩාත් ඉහළ නැංවීමේ අපේක්ෂාවෙනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන හා අධීක්ෂණ අධිකාරිය වැඩිදියුණු කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පරිපාලනය කරනු ලබන සියලුම පවත්නා නීති සංශෝධනයට ලක් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන සියලුම කාර්යය හා කර්තව්‍යයන්ට අදාළ වන්නාවූ අධිකාරිය, පාලනමය සහ වගවීමේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ අනුකූලතා කඩකිරීම් සිදු විය හැකි බවට හඳුනාගනු ලබන අවස්ථාවල දී කළමණාකාරිත්වයට වඩා උචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට හැකි වන පරිදි, ඵලදායි අනුකූලතා රාමුවක් නිර්මාණය කිරීම යන කාර්යයන් දැනට නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මේ සම්බන්ධයෙන් ගත්කල, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ පරිචයන් සමඟ සිය නෛතික හා නියාමන රාමුවෙහි සමකාලීන බව සාක්ෂාත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පුළුල් පරාසයක පවතින ක්‍රියාකාරකම් රැසක් සිදු කිරීමට නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රමෝපායික ප්‍රමුඛතාවන් ඉටුකරගැනීම සඳහා දායකවීමද නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂා කෙරෙන අතර, මහ බැංකුවේ සියලුම ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාශීලීව මැදිහත් වන අතරතුර, 2018 වර්ෂය තුළදී නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්විය හැක.

ගතවූ වසර තුළ, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ව්‍යවස්ථාවන් සඳහා නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙහි නිරතවන ලදී. එහිදී, නව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්තිමය රාමුවක් සඳහා පහසුකම් සැලසීම, මහ බැංකුවේ පාලන ප්‍රමිතීන් සහ සාර්ව විචක්ෂණ අධිකාරිය ඉහළ නැංවීම සඳහා 1949 අංක 58 දරන මුදල් නීති පනත සඳහා අවශ්‍ය සංශෝධන යෝජනා කරන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී වගවීමේ සහ විනිවිදභාවයේ අවශ්‍යතාවයන් ඉහළ නැංවීම සඳහා 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත සමාලෝචනය කිරීමට ද කටයුතු කරන ලදී. තව ද, මහ බැංකුවේ නියාමන හා අධීක්ෂණ රාමුව ඉහළ නැංවීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතට සංශෝධන යෝජනා කරන ලදී. රාජ්‍ය ණය සක්‍රීය ලෙස කළමනාකරණය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, නව නීතිමය රාමුවක් වශයෙන් 2018 අංක 08 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත හඳුන්වාදීම සඳහා ද නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිය දායකත්වය සපයන ලදී.

ස්ථාවර හා ශක්තිමත් මූල්‍ය පද්ධතියක් ඇතිකිරීම සහ මූල්‍ය ක්ෂේත්‍රය තුල සාර්ව විචක්ෂණ ආවේක්ෂණය ඉහළ නැංවීමට දායකත්වය සැපයීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ නියාමකයින්ට සිය ව්‍යවස්ථාපිත අරමුණු කරා ළඟා වනු පිණිස, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අංශයේ නියාමකයින් අතර තොරතුරු හුවමාරු කිරීමේ පනත කෙටුම්පත් කිරීම සඳහා කටයුතු කරන ලදී. එකී පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එකී පනත් කෙටුම්පත පැනවීමට පහසුකම් සැපයීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ ද සම්බන්ධ වී කටයුතු කරන ලදී. එසේම, බැංකු පනත යටතේ බලපත්‍රලාභී සියලුම බැංකු සඳහා කඩිනම් ක්‍රියාමාර්ග මගින් ණය අයකර ගැනීමේ ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකිවන පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනත සඳහා

ද සංශෝධන හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඉහත කී සියලුම ක්‍රියාමාර්ග තුළින් අවසන් වශයෙන් මූල්‍ය පද්ධතියේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම අපේක්ෂා කරන ලදී.

සිය අනුකූලතා අරමුණු කරා ළඟාවීම සම්බන්ධයෙන් ගත්කල, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට සිය නීතිමය, කීර්තිනාමය සහ අනුකූලතාවය සම්බන්ධයෙන් වන අවදානම් කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් විමධ්‍යගත කරන ලද අනුකූලතා රාමුවක් සහිත පරිපූර්ණ අනුකූලතා අත්පොතක් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් පෙර ඇඟවුම් ප්‍රතිපත්තියක් ද හඳුන්වා දෙන ලදී. පාලන ව්‍යුහය තුළ සැලකිය යුතු මට්ටමකින් පැවති පරතරය අවම කිරීම සඳහා පිළිවෙලින්, මුදල් මණ්ඩලයේ සාමාජිකයන් සඳහා සහ මහ බැංකුවේ සේවා නියුක්තිකයන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයන් ද්විත්වයක් හඳුන්වාදීමේ කටයුතු ද අවසන් කරන ලදී. තව ද, නීති සහ අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වෙමින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ පනවා ඇති නෛතික අවශ්‍යතාවයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව දක්වන අනුකූලතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ද කටයුතු කරන ලදී.

නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ එහි සේවා නියුක්තිකයින් පාර්ශවයන් වන නඩු කටයුතු, අදාළ අධිකාරීන් සමඟ සම්බන්ධ වෙමින් පවත්වාගෙන යාම සඳහා, වගකිවයුතු වූ අතර, 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන ලද මූල්‍ය ආයතන කිහිපයකට හා එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 වර්ෂය තුළදී අර්බුදයට ලක්වූ ඇතැම් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ආරම්භ කරන ලද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග වල දී, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව අධීක්ෂණ දෙපාර්තමේන්තු සමඟ සක්‍රීයව සම්බන්ධ වෙමින් කටයුතු කරන ලද අතර අවම මට්ටමේ නෛතික අවදානමක් සහිතව ඵලදායී ලෙසින් එකී නියාමන අවශ්‍යතාවයන් ඉටුකරගැනීම සඳහා අවශ්‍ය වන රෙගුලාසි, ගිවිසුම් සහ මෙහෙයුම් පටිපාටීන් වැනි නීතිමය මෙවලම් වැඩිදියුණු කිරීමට ද කටයුතු කරන ලදී.

තවදුරටත්, අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන් සමඟ ගනුදෙනු කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති සහ අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ගිවිසුම් පරීක්ෂා කිරීමෙහි නියැළුනු අතර එමගින් එකී සාධන පත්‍රයන් නීතිමය අවශ්‍යතාවයන් සමඟ අනුකූලවේද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කරන ලදී. එවැනි ගිවිසුම් තුළින් පැන නගින කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හි දී නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීති උපදෙස් සපයන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් මෙහෙයුම්වලට අදාළව ගත්කල, ඒවායේ පවතින නෛතික, අනුකූලතා සහ මෙහෙයුම් අවදානම් අවම කර ගැනීම සඳහා නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුවේ මතය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් සෑම විටම පාහේ විමසා තිබේ.

ඉහතින් සඳහන් කරන ලද කරුණු වලට අමතරව, 2018 වර්ෂය තුළ, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරකම්වලට අදාළ බහුවිධ විෂය කරුණු සම්බන්ධයෙන් මහ බැංකුව තුළ පිහිටුවන ලද විශේෂිත කමිටු රැසක් ද නියෝජනය කර ඇත.

2018 වර්ෂය තුළදී, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ එක් ආරක්ෂණ කාර්යංශයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු සහ ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ළඟා කර ගැනීම සඳහා සාර්ථකව දායක වී තිබේ.

## 18. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුව සතු ව්‍යවස්ථාපිත අරමුණු දෙකෙන් එකකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව අත්කර ගැනීම සඳහා ක්ෂුද්‍ර විචක්ෂණතා අධීක්ෂණය අඛණ්ඩව සිදු කරයි. එම ක්ෂුද්‍ර විචක්ෂණතා අධීක්ෂණය අනුපූරණය කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයේ උප-අංශ පිළිබඳව පුළුල් විශ්ලේෂණයක් සිදු කරයි. මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් පුළුල් සාර්ව ආර්ථික සාධක දේශීය මූල්‍ය පද්ධතිය හා එහි ස්ථාවරත්වය මත බලපාන අයුරු විශ්ලේෂණය කරයි. මූල්‍ය අංශයේ විචක්ෂණතාවය අධ්‍යයනය කරනු ලබන්නේ මූල්‍ය ආයතනවලින් ලබා ගන්නා දත්ත සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සමීක්ෂණ මගින් රැස් කර ගත් දත්ත භාවිතා කරමිනි. මෙවැනි අධ්‍යයනයන්ගේ සොයා ගැනීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට වැදගත් දායකත්වයක් දක්වයි. 2018 වසරේදී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**(අ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන**

මූල්‍ය අංශයේ පවත්නා පද්ධතිමය අවදානම් හඳුනාගැනීමත්, ඇති විය හැකි පද්ධතිමය අවදානම් හඳුනා ගැනීමටත් සහ මෙවැනි අවදානම් වලට මුහුණ දීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාව තක්සේරු කිරීමටත් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මෙම අධ්‍යයන මගින් ගෝලීය හා දේශීය සාර්ව ආර්ථික ප්‍රවණතාවන්, මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සහ මූල්‍ය ආයතනවල අවදානම් ආවරණය කොට ඇත. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උප-අංශ වල ස්ථාවරත්වය සහ අඛණ්ඩතාවය මත පදනම් වූ සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් සම්පාදනය කරන ලදී. මීට අමතරව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මගින් පිළිඹිබු කරන එක් එක් බැංකු හා බැංකු පද්ධතියේ ප්‍රාග්ධන

මට්ටම මත ණය අවදානම, පොළී අනුපාතික අවදානම සහ විදේශ විනිමය අවදානම මගින් ඇති කරන බලපෑම ගණනය කිරීමට ඉහළ සිට පහළට ගණනය කරන සාර්ව ආතති පරීක්ෂණ සිදු කරන ලදී. තවද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ආතති පරීක්ෂා කිරීමේ ආකෘතිය වැඩිදියුණු කරන ලදී. මෙම විශ්ලේෂණ වල සොයා ගැනීම් කාර්තුමය මාණ්ඩලික පත්‍රිකා හරහා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, 2018 වසර තුළදී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතාවයට අදාළ වන අනෙකුත් කාරණා වන ආනයනය කරන ලද රථ වාහන සඳහා ලබා දෙන උපරිම වටිනාකම මත ණය අනුපාතය, සාමාන්‍ය බර තැබූ ණය දීමේ අනුපාතිකය, ඉදිකිරීම් අංශය සඳහා බැංකු අංශයේ ඉහළ ණය මට්ටම, පරිභෝජන ණය සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ගැටළු යනාදිය හා සම්බන්ධ මාණ්ඩලික පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කරන ලදී.

### (ආ) සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම

**මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය** : සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී ආරම්භ කරන ලද මූල්‍ය පද්ධති අවදානම පිළිබඳ ද්වි-වාර්ෂික සමීක්ෂණය 2018 වසරේදී ද සිදු කරන ලදී. මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට වෙළෙඳපොළ ආකල්ප තුළින් ඇති විය හැකි අවදානම් හඳුනාගැනීම මෙම සමීක්ෂණයේ අරමුණ විය. ප්‍රතිපත්ති සම්පාදනය සහ නියාමන කටයුතු වලදී පාර්ශවකරුවන්ගේ විශ්වාසය මැන බැලීම සඳහා මෙම සමීක්ෂණවල සොයා ගැනීම් වැදගත් වේ. මෙම සොයාගැනීම් අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදකයන්ට මූල්‍ය පද්ධතිය තුළ පැන නගින අවදානම් සම්බන්ධව අනාගත දැක්මක් සපයන අතර, පුළුබතාවය ලබා දිය යුතු අවදානම් සමඟ ක්‍රියාකිරීමට උපකාරී වේ. පද්ධතිමය අවදානම සංකීර්ණ වන අතර, නිරවද්‍යතාවයකින් යුතුව එය මිනුම් කිරීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවට ඇති අභියෝගාත්මක කාර්යයකි. කෙසේ වුවද, පද්ධතිමය අවදානම සම්බන්ධ සමීක්ෂණයෙන් ලබා ගන්නා වෙළඳපොළ තොරතුරු හරහා මූල්‍ය පද්ධතියේ ශක්තිමත්භාවය පිළිබඳ දැනුමක් ලබා ගත හැකි අතර, එය දෙපාර්තමේන්තුවේ සාර්ව විචක්ෂණතා අධ්‍යයන ක්‍රියාවලිය සඳහා දායක වේ.

**ගෘහස්ත අංශයේ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය** : ශ්‍රී ලංකාවේ ගෘහස්ත අංශයේ ණයගැතිභාවය පිළිබඳව මූල්‍ය හා සාමාජීය අවධානය ඉහළ යෑම හේතුකොට ගෙන සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ගෘහස්ත අංශයේ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය ආරම්භ කරන ලදී. ගෘහ ඒකකවල ණය වාරික ගෙවීමේ හැකියාව සහ එමගින් මූල්‍ය ස්ථායීතාව මත ඇති කරන බලපෑම් ඇගයීම සඳහා ගෘහස්ත අංශයේ මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් සවිස්තරාත්මක දත්ත සමූහයක් පිහිටුවීම මෙම සමීක්ෂණයේ මූලික පරමාර්ථයයි. 2018 වසරේදී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ගෘහස්ත අංශයේ අවශ්‍ය තොරතුරු රැස් කර ගත් අතර, ණය ලබාගැනීම සඳහා ගෘහස්ත අංශය විධිමත් හා අවිධිමත් මූලාශ්‍ර මත යැපීමේ ප්‍රවණතාවය ඇගයීමට මෙම දත්ත යොදා ගනු ලැබේ.

**දත්ත රැස් කිරීම** : සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිය දත්ත ගබඩාව ශක්තිමත් කිරීමට විවිධ බාහිර පාර්ශව වෙතින් ක්ෂුද්‍ර මට්ටමේ සිට දත්ත එක්රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, සණස සම්මේලනය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඒකක බාර සංගමය වැනි බාහිර ආයතන වලින් නිතිපතා දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරයි. මීට අමතරව සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව තම විශ්ලේෂණ වැඩි දියුණු කර ගැනීම සඳහා ණය තොරතුරු කාර්යාංශය සහ ශ්‍රී ලංකා රේගුව වෙතින් පෙරට වඩා මූලික මට්ටමේ දත්ත රැස් කිරීම ආරම්භ කරන ලදී.

### (ඇ) මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශ කිරීම සහ මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ වෙනත් ප්‍රකාශන සඳහා දායකත්වය

**මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය (FSSR) 2018** : මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය 2018 දෙසැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වාර්තාවේ ප්‍රධාන අරමුණ වනුයේ, මූල්‍ය ආයතන, වෙළඳපොළ, සහ යටිතල පහසුකම් සම්බන්ධ අවධානම් විස්තීරණ වශයෙන් ගැඹුරෙන් තක්සේරු කිරීමයි. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රටෙහි මූල්‍ය පද්ධතිය ආශ්‍රිත උපනතීන් අවදානම්, අවස්ථා සහ නියාමනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ඇත. 2018 වසරේ මූල්‍ය පද්ධති ස්ථායිතා සමාලෝචනයෙහි, මූල්‍ය පද්ධතියට බලපෑ ජාත්‍යන්තර සහ දේශීය ප්‍රවණතා, මූල්‍ය අංශයේ සංවර්ධනය හා ස්ථායීතාවය සහ නව ප්‍රවණතාවයන් යන මාතෘකාවලින් යුත් ප්‍රධාන ශීර්ෂ 3 ක් අඩංගු විය.

**අනෙකුත් ප්‍රකාශන** : ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2018 වසරේ වාර්ෂික වාර්තාවේ සහ 2018 වසරේ මෑත කාලීන ප්‍රවණතා වාර්තාවේ අඩංගු වූ මූල්‍ය අංශයේ ප්‍රවණතා හා ස්ථායීතාව යන පරිච්ඡේදය සම්බන්ධීකරණය සහ සම්පාදනය කිරීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද මෙම දෙපාර්තමේන්තුව, මහ බැංකුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද සැප්තැම්බර් 15 වාර්තාවේ මූල්‍ය අංශයේ සංවර්ධනය පිළිබඳ පරිච්ඡේදයට දායක විය. මෙම වාර්තා මගින් එක් එක් ක්ෂේත්‍රය මගින් රටෙහි සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය මත ඇති විය හැකි බලපෑම තක්සේරු කරමින් එක් එක් ක්ෂේත්‍රයට අදාළ කාර්යසාධනය, අවදානම් සහ අවදානම කළමනාකරණය, සම්පත් සුලභතාවය සහ නියාමන උපනතීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන අතර, රටෙහි මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ සහ මූල්‍ය යටිතල පහසුකම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සපයනු ලබයි. මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කරමින් සහ මූල්‍ය පද්ධතියේ උප අංශයන් සම්බන්ධව විශ්ලේෂණ සපයමින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද දෙපාර්තමේන්තුව දායක විය.

**(ඇ) මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය**

**මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව (FSSC) :** සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව 2018 වසරේදී මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ ලේකම් කටයුතු සිදු කරන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව 2017 වසරේදී නැවත සංස්ථාපනය කරන ලද අතර, එහි පළමු රැස්වීම 2018 මැයි 17 දින පවත්වන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු 14 ක් සහ එම දෙපාර්තමේන්තු වලට සම්බන්ධ සහකාර අධිපතිවරුන් සහ නියෝජ්‍ය අධිපතිවරුන් නියෝජනය කරන අන්තර් දෙපාර්තමේන්තු සංසදයකි. මෙය මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම, අවදානම් අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය සඳහා වූ සංසදයකි. 2018 වසර තුළදී මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවේ රැස්වීම් තුනක් පවත්වන ලදී.

**මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව (FSSCC)** : මහ බැංකු අධිපතිතුමා විසින් පත් කරන ලද මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ කැපී පෙනෙන බාහිර ආයතනවල ප්‍රමුඛ පුද්ගලයන්ගෙන් සමන්විත වන අතර, වර්තමාන මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව සාමාජිකයින් 17 කින් සමන්විත වේ. මෙම කමිටුව මූල්‍ය ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අදහස් හා උපදෙස් ලබා දෙන අතර, වසර තුළදී රැස්වීම් හතරක් පැවැත්වීය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව වෙත ලේකම් සේවා සපයයි.

## 19. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62අ වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගිත්ව ආයතනවලට පද්ධති නීතිරීති නිකුත් කිරීම සඳහා බලය පවරා ඇති අතර, මෙම පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව 2002 දී ස්ථාපනය කරන ලදී. 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවට එම පනත යටතේ පැවරී ඇති ගෙවීම් නිෂ්කාශන සහ පියවීම් සහ මුදල් සේවා සැපයුම් කරුවන් නියාමනය, අධීක්ෂණය සහ නිරීක්ෂණය සහ අනෙකුත් වගකීම් ඉටු කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට පවරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම සහ රටතුළ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමන සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ප්‍රධාන කටයුතු වේ. 2018 වසර තුළ සිදුකරන ලද කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

### 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

(අ) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන අතර කාල සංවේදී සහ අන්තර් සමාජිකයින්ගේ මෙන්ම ගනුදෙනු කරුවන්ගේ විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම් සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර, එම පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා, අතිරේක අරමුදල් ඉල්ලා සිටින සහභාගිත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා දීම ද තවදුරටත් සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

(ආ) 2018 වසර අවසානයේ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 37 ක් විය. 2018 වසරේ දී බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් (Bank of China Limited) ලංකා සෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනයක් ලෙස බඳවා ගන්නා ලදී. වසර තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 100,473 ක වටිනාකමින් යුත් ගනුදෙනු 405,200 ක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද දෛනික සාමාන්‍යය ගනුදෙනු ප්‍රමාණය 1,688 ක් වූ අතර, එහි ගනුදෙනුවල සාමාන්‍යය වටිනාකම රුපියල් බිලියන 419 ක් විය. සහභාගිත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන ලද එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 55 ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි උපයෝගීතාව වසර තුළදී සියයට 99.90 වැනි ඉහළ තත්ත්වයකින් පවත්වාගෙන යන ලදී.

### 19.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

**(අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

2018 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

(i) 2018 වසරේ දී, විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළෙඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළෙඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් ගනුදෙනු 11,626 කට අදාළ පියවීම් සිදු කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 342.3 ක් විය.

(ii) ජාත්‍යන්තර ස්විෆ්ට් ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියෙහි සිදු කරන ලද වැඩිදියුණු කිරීම් වල

පෙර පරීක්ෂා කිරීම් කටයුතු සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව 2018 වසරේ දී ආයක විය.

(ආ) විවට වෙළෙඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

වෙළෙඳපොළ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ සිදු කළ විවට වෙළෙඳපොළ මෙහෙයුම් ආශ්‍රිත ගනුදෙනු පියවීම් සිදු කරන ලදී. ඒ අනුව, 2018 වසර තුළදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 1,125 ක් වටිනා ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 722 ක් ද, රුපියල් බිලියන 4,504 ක නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 3,049 ක් ද, රුපියල් බිලියන 3,057 ක නිත්‍ය ණය පහසුකම් 4,005 ක් ද, රුපියල් බිලියන 3,386 ක් වූ ප්‍රතිවිකුණුම් ගනුදෙනු 2,387 ක් ද, රුපියල් බිලියන 40 ක ස්ථිර පදනම මත මිලදී ගැනීම් ගනුදෙනු 83 ක්ද, රුපියල් බිලියන 64 ක ස්ථිර පදනම මත විකුණුම් ගනුදෙනු 38 ක් ද සිදු කිරීමට සහ පහසුකම් සැලසීමට ආයක විය.

## 19.3 ස්විෆ්ට් මූල්‍ය තොරතුරු සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් මූල්‍යමය සන්නිවේදන කටයුතු ආරක්ෂිත ලෙස සිදු කර ගැනීම සඳහා ස්විෆ්ට් වේදිකාව භාවිතා කිරීමත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පද්ධතිය භාවිතා කරන සියලුදෙනා වෙනුවෙන් එම පද්ධතිය කළමණාකරණය කිරීමත් තව දුරටත් සිදු කරන ලදී. ඒ සඳහා මෘදුකාංග, දෘඪාංග, ක්‍රියාදාමයන්, ක්‍රියාපටිපාටීන් සහ අවදානම් කළමනාකරණ පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් ප්‍රධාන මූලස්ථානය මගින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් එම පද්ධතිය පවත්වාගෙන යනු ලැබේ. මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ස්විෆ්ට් නෙට් පද්ධතිය සමඟ සම්බන්ධතාවය ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම හරහා පවත්වා ගනී.

2018 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම බැංකු හඳුනාගැනීමේ කේතය (Bank Identification Code) වන CBCELKLX සඳහා සම්බන්ධතා කළමනාකරණ අයැදුම (Relationship Manager Application Plus) පහසුකම ක්‍රියාත්මක කරන ලදී. මෙම පහසුකම මගින් එක් එක් පාර්ශ්වයන් විසින් යැවීමට හෝ ලබා ගැනීමට අපේක්ෂා කරන ස්විෆ්ට් පණිවුඩ කවරේද යන්න අර්ථ දැක්වීමේ හැකියාව ලබා දේ. තවද, මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් අවම කිරීම තුළින් අනෙකුත් පාර්ශ්වයන්ගේ සම්බන්ධතාවල පාලනයක් සහ අතිරේක තොරතුරු ලබා දීමක් ද සිදු වේ. 2018 වසරේ දී, ස්විෆ්ට් පද්ධතිය, නව සංස්කරණයක් (වෙළුම 7.2.50) සඳහා වැඩිදියුණු කරන ලදී. පද්ධතිය භාවිතා කරන්නන් හට වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවන් තවදුරටත් සැලසීම නව සංස්කරණය හඳුන්වා දීමේ අරමුණ වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව මෙම නව සංස්කරණය සාර්ථකව ස්ථාපනය කරන ලද අතර, ස්විෆ්ට් සේවාව විසින් හඳුන්වා දුන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ද වසර පුරාම ස්විෆ්ට් අංශයෙහි මනා ආරක්ෂිත මට්ටමක් පවත්වාගෙන යන ලදී.

## 19.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2018 වසරේ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළෙඳාම සහ වෙළෙඳාම ආශ්‍රිත ගනුදෙනු බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් පදනම මත පියවීම් සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව, රුපියල් බිලියන 585.0 ක වටිනාකමකින් යුතු ගනුදෙනු 6,467 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 490.5 ක් විය.

නිත්‍ය තාක්ෂණික කමිටුවෙහි ප්‍රාරම්භක රැස්වීම 2018 අප්‍රේල් මාසයේ දී කොළඹ දී පවත්වන ලද අතර, ආසියානු නිෂ්කාශන සංගමයේ මහ ලේකම් සහ සාමාජික රටවල මහ බැංකු සහ මූල්‍ය අධිකාරීන් හතක නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගි විය. ආසියානු නිෂ්කාශන සංගමයේ 47 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ නිත්‍ය තාක්ෂණික කමිටු රැස්වීම 2018 ජූනි මාසයේ දී නේපාලයේ කත්මණ්ඩු නගරයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිලධාරීන් මෙම රැස්වීම් සඳහා සහභාගි විය.

## 19.5 ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින්, ''ලංකාපේ'' (LankaPay) සන්නාමය යටතේ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි (CCAPS), උප යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. රටෙහි ජාතික ගෙවීම් යාන්ත්‍රණය ලෙස නම් කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය, උප යාන්ත්‍රණ 5 කින් සමන්විත වේ. එනම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණය (SAS), විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobS) වේ. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පහත දැක්වෙන අයුරින් සාරාංශගත කළ හැකි වේ.

(අ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු අදියර වූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, 2013 වසරේ ජූලි මස සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. 2018 වසර අවසානය වන විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජික සංඛ්‍යාව

ආයතන 28 දක්වා වැඩි විය. 2018 වසර තුළදී, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් පියවන ලද ගනුදෙනු සංඛ්‍යාව මිලියන 40 ක් වන අතර, එහි වටිනාකම රුපියල් බිලියන 344.6 කි.

(ආ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන අදියර වූ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය 2015 වසරේ අගෝස්තු මස 21 වන දින ආරම්භ කරන ලදී. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාලය පදනම් කර ගත් බැංකු කටයුතු, ජංගම දුරකථන පදනම් කර ගත් බැංකු කටයුතු, ස්වයං සේවා ගෙවීම් යන්ත්‍ර (Kiosks) සහ බැංකු කවුළු වෙතින් වැනි බහුවිධ ගෙවීම් මාධ්‍ය හරහා සිදු කරනු ලබන ගෙවීම් නිෂ්කාශනය සඳහා පොදු යටිතල පහසුකමක් සපයයි. 2018 වසරේ දී, මූල්‍ය ආයතන 5 ක් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සමඟ සම්බන්ධ වීමෙන් එහි සාමාජික සංඛ්‍යාව ආයතන 38 දක්වා වැඩි විය.

(ඇ) ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීන ගෙවීම් පහසුකම් සැලසීම සඳහා 2017 වසරේ ජූලි මස 20 වන දින සිට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 8ක් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ සම්බන්ධ වී ඇත. 2018 වසරේ දී, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනවලට මංගත ගෙවීම් පහසුකම් සැලසීම සඳහා ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව එම ආයතන සමග ඒකාබද්ධ කිරීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත අවසර ලබා දෙන ලදී.

(ඈ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කරන ගනුදෙනුවලට අදාළ අන්තර් බැංකු පියවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි නිෂ්කාශන චක්‍ර සංඛ්‍යාව 4 දක්වා වැඩි කරන ලදී. තවද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකයින්, අනෙකුත් සාමාජිකයින් වෙනුවෙන් දරන්නා වූ වගකීම්වල අවම සීමාවන් නිර්දේශ කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(ඉ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි හතරවන අදියර වන විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය විසින් දේශීය විකුණුම්පල යන්ත්‍ර හරහා සිදු වන ගනුදෙනු සඳහා නිෂ්කාශන පහසුකම් සලසයි. ඒ අනුව, විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සුමට මෙහෙයුම් කටයුතු සහතික කිරීම සඳහා විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර මෙහෙයුම් කටයුතු පිළිබඳ 2018 අංක 02 දරන පොදු විධිවිධානය නිකුත් කරන ලදී.

## 19.6 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අධීක්ෂණය

විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි නියාමන සහ අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, 2018 වසර තුළදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

(අ) ගෙවීම් වේදිකා සපයන්නන් (Payment Platform Providers) හරහා සිදු කරන ගෙවීම් කාඩ්පත් ගනුදෙනු අත්පත් කර ගැනීමේ කොන්දේසි පැනවීම සඳහා 2018 ජනවාරි මස දී සේවා සපයන්නන් මගින් ගෙවීම් කාඩ්පත් යොදා ගෙන සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කර ගැනීම පිළිබඳ විධිවිධානය නිකුත් කරන ලදී. වෙළෙඳුන් හට කාලීනව ගෙවීම් සහතික කිරීම මෙන්ම තුන්වන පාර්ශ්ව ගෙවීම් වේදිකා සපයන්නන් විද්‍යුත් වාණිජ ගනුදෙනු සඳහා සම්බන්ධ වීමේ අවදානම් අවම කිරීමේ අරමුණින් මෙම විධිවිධානය නිකුත් කරන ලදී.

(ආ) ගෙවීම් සේවා සැපයීම සඳහා මූල්‍ය ආයතන විසින් භාවිතා කරන ජංගම යෙදුම් මෘදුකාංග සඳහා අවම අනුකූලතා ප්‍රමිතීන් නියම කිරීම සඳහා 2018 ජනවාරි මස දී ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග සඳහා අවම අනුකූලතා ප්‍රමිති පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. ජංගම යෙදුම් මෘදුකාංග මගින් සිදුකරන ගනුදෙනු සුරක්ෂිත කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

(ඇ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු ලෙස හර කාඩ්පත් පමණක් නිකුත් කිරීමට අනුමැතිය දී ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකට සහ මූල්‍ය සමාගමකට ණය කාඩ්පත් නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. මෙයට අමතරව, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස බලපත් ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවකු ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

(ඈ) ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවල විශ්වාසනීයත්වය සහ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා බලපත්‍රලාභී ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සේවා සැපයුම්කරුවන් වෙත නිකුත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම පද්ධති පිළිබඳ එතැන් පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

(ඉ) හදිසි අවස්ථාවක දී, තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙටිල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 19.7 ජාතික ගෙවීම් කවුන්සිලය

ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශනාත්මක සහ නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය විසින් නව ගෙවීම් තාක්ෂණ ක්‍රමවේදයන් රටෙහි ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා හඳුන්වා දීමේ හැකියාව හැදෑරීමට මූල්‍ය තාක්ෂණ (FinTech) අංශය සහ බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය පිළිබඳ වර්ධනයන් අධ්‍යයනය කිරීම සඳහා කමිටු දෙකක් පත් කරන ලදී. මෙම කමිටු වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(අ) විවිධ ගෙවීම් ක්‍රමවේද සහ උපකරණ අතර අන්තර් ක්‍රියාකාරිත්ව සහතික කිරීම, ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ ආරක්ෂාව වර්ධනය කිරීම සඳහා 2018 ඔක්තෝබර් මාසයේදී ජාතික QR කේත ප්‍රමිතිය නිකුත් කරන ලදී.

(ආ) ප්‍රවාහන අංශයේ ටිකට්පත් නිකුත් කිරීම සහ ගාස්තු එක්රැස් කිරීම සඳහා ජාතික ප්‍රවාහන කාඩ්පතක් සහ යටිතල පහසුකම් රාමුවක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසන ලදී. මෙම ක්‍රියාන්විතය මගින් ප්‍රවාහන කර්මාන්තයේ ගෙවීම් ක්‍රමවේදය ප්‍රමිතිගත කිරීමක් සිදු වන අතරම කාසි හා නෝට්ටු අවම වශයෙන් භාවිතා වන සමාජයක් සඳහා වන ජාතික අරමුණ ඉටු කර ගැනීමට ද දායක වේ.

(ඇ) නියාමන අවශ්‍යතා උල්ලංඝනය නොවන ආකාරයෙන් තම නිෂ්පාදන සහ සේවාවන් පරීක්ෂා කිරීමට ආරක්ෂාකාරී සහ පාලිත පරිසරයක් නව නිපැයුම් හඳුන්වා දෙන්නන් හට සලසා දීම සඳහා මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශයක් ස්ථාපනය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී. ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වවලට, නියාමන පරීක්ෂණ අවකාශයේ විෂය පථය නිර්ණය කිරීම සඳහා තමන්ගේ දැනුම සහ අත්දැකීම් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඈ) මූල්‍ය අංශය තුළ බ්ලොක්චේන් තාක්ෂණය යොදා ගැනීම තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී. මෙම ක්‍රියාකාරී කමිටුව විසින් බ්ලොක්චේන් තාක්ෂණය උපයෝගී කර ගනිමින් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ පොදු ක්‍රමවේදයක් බැංකු ක්ෂේත්‍රයට හඳුන්වා දීමේ ශක්‍යතාවය ඇගයීම සිදු කරනු ලබයි.

### 19.8 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන ''කාර්තුමය විවරණිකාව'' (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාවය මත පදනම්ව, ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්ය මණ්ඩල දැනුම්වත් කිරීමේ අරමුණින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ජාතික QR කේතය ප්‍රවර්ධනය කිරීම සඳහා QR කේතය පදනම් කර ගත් ගෙවීම් පිළිබඳව ගනුදෙනුකරුවන් සහ වෙළෙඳුන් දැනුම්වත් කිරීම සඳහා දිනපතා පුවත්පත්වල දැන්වීමක් පළ කරන ලදී. අප්‍රකාශිත විද්‍යුත් මුදල් (Cryptocurrencies) භාවිතයෙහි ඇති අවදානම පිළිබඳව මහජනතාවට අනතුරු ඇඟවීම සඳහා 2018 අප්‍රේල් මාසයේ දී පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන හා දිගුකාලීන උපායමාර්ගික තීරණ ගැනීමේ සමස්ත ක්‍රියාවලියට පහසුකම් සැලසීමට බැඳී සිටියි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව වාර්ෂික ව උපායමාර්ගික කතිකාවත පැවැත්වීම, උපායමාර්ගික සැලසුම් හා දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් සමාලෝචනය කිරීම හා එම ප්‍රගතිය ආයතනික කළමනාකාරිත්ව කමිටුව හා මුදල් මණ්ඩලයට වාර්තා කිරීම සිදු කරයි.

### 20.1 2018-2020 සඳහා උපායමාර්ගික සැලසුම හා උපායමාර්ගික ප්‍රමුඛතා පිළියෙළ කිරීම

2018 ජනවාරි 02 වන දින නව වසර සඳහා වැඩ ආරම්භ කිරීමේ උත්සවයේ දී 2018-2020 උපායමාර්ගික සැලසුම දියත් කිරීම සිදු කෙරුණු අතර ඉන්පසු ව දෙපාර්තමේන්තුවල කාර්යමණ්ඩල සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා සහ ක්‍රියාමාර්ගික සැලසුම් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්විණි. 2018 සිට ඇරඹෙන වසර තුන සඳහා හඳුනාගත් උපායමාර්ගික ප්‍රමුඛතා හය පහත පරිදි වේ.

(i) ඵලදායි නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ රාමුවක් හඳුන්වා දීම

(ii) තිරසාර වර්ධනයට උරදෙන ගතික සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු මූල්‍ය ක්ෂේත්‍රයක් ප්‍රවර්ධනය කිරීම

(iii) ගෙවීම් සහ පියවීම් පද්ධතිවල යටිතල පහසුකම් නවීකරණය - අඩු මුදල් භාවිත සමාජයක් කරා මාර්ගය සෑදීම

(iv) ණය තිරසාරභාවය ඇති කිරීම සඳහා විචක්ෂණශීලී ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම

(v) පුළුල් මානව සම්පත් උපායමාර්ගයක් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම

(vi) ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අනුකූලතාව ශක්තිමත් කිරීම

එක් එක් ප්‍රමුඛතාව සඳහා කාර්ය සාධක බලකායන් (Task forces) විසින් අදාළ කාල පරාසය ද සහිත ව උපායමාර්ගික ක්‍රියාවන් හඳුනාගෙන ඇති අතර කාර්යසාධන දර්ශක අදාළ දෙපාර්තමේන්තු මගින් පිළියෙල කර ඇත. එක් එක් උපාය මාර්ගික ප්‍රමුඛතාව සඳහා ප්‍රධාන දෙපාර්තමේන්තුවක් (Lead Department) ඇති අතර එම දෙපාර්තමේන්තුව ප්‍රමුඛතා

සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන දෙපාර්තමේන්තු සමඟ එක්ව ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉතා මැනවින් අධීක්ෂණය කරන ලදී.

### 20.2 ප්‍රගතිය සමාලෝචනය හා කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම

වසර තුළ උපායමාර්ගික ප්‍රමුඛතා සහ ක්‍රියාමාර්ගික සැලසුම්වල ඇති වූ ප්‍රගතිය කාර්තුමය රැස්වීම්වල දී සමාලෝචනය කෙරුණි. මෙහි දී නව අංගයක් ලෙස කාර්යසාධන දර්ශක වර්ගීකරණය හඳුන්වා දුන් අතර ඒවා ''සම්පූර්ණයෙන් ම අවසන් කළ'', ''අර්ධ වශයෙන් අවසන් කළ'' සහ ''ආරම්භ නොකළ'' කාර්යසාධන දර්ශක යටතට ගැනේ. මෙමගින් කාර්යසාධන දර්ශක අදාළ කාල සීමාව තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ හේතු හඳුනා ගැනීමට මෙන්ම ඒ සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට ද ඉඩ ප්‍රස්ථා හිමි විය. මින් අනතුරු ව ප්‍රගතිය හා සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ආයතනික කළමනාකාරිත්ව කමිටුව හා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කෙරිණි. 2018 වර්ෂය අවසානයේ දී උපායමාර්ගික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාර්යසාධන මට්ටම පිළිවෙළින් සියයට 90.57 ක් හා සියයට 93.42 ක් වූ අතර ඒ හේතුවෙන් සමස්ත කාර්යසාධන මට්ටම සියයට 92.69 ක් විය.

### 20.3 උපායමාර්ගික කතිකාවත 2018

මහ බැංකුවේ උපායමාර්ගික දිශානතිය, මුල් වතාවට හඳුන්වා දුන් උපාය මාර්ගික ප්‍රමුඛතාවල 2018 වසරේ සමස්ත ප්‍රගතිය සහ දෙපාර්මේන්තුවල ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දහතුන්වන උපායමාර්ගික කතිකාවත මුදල් මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් 2018 ඔක්තෝබර් මස 20 සහ 21 දෙදින තුළ ශ්‍රී ලංකා මහ බැංකු සන්ථාගාරයේ දී පවත්වන ලදී. උපායමාර්ගික කතිකාවතට පෙර ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි-සැප්තැම්බර් කාලය සඳහා කාර්තුමය සමාලෝචන රැස්වීම් පැවැත් වූ අතර එහි ප්‍රගතිය උපායමාර්ගික කතිකාවතේ දී සාකච්ඡා කෙරුණි. 2019 සඳහා දෙපාර්මේන්තුවල ක්‍රියාකාරී සැලසුම් මෙහි දී ගැඹුරින් සාකච්ඡා කෙරුණු අතර උපායමාර්ගික කතිකාවතේ දී යෝජිත වැඩිදියුණු කිරීම් ද සහිත ව ක්‍රියාකාරී සැලසුම් සකස් කොට අවසන් කරන ලදී.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුදල් නීති පනතේ 113 වන වගන්තියට අනුව රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරයි. එම වගකීම ඉටු කිරීම සඳහා 1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත් සමඟ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය කළමනාකරණ සහ වගකීම් කළමනාකරණ උපායමාර්ග තීරණය කිරීමට දායක වෙමින්, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීමෙහි ලා කටයුතු කරයි.

### 21.1 විසර්ජන පනතට අනුව රජයේ දළ ණය ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම

(අ) 2018 වසරේදී, රජයේ දළ අරමුදල් අවශ්‍යතාවය මූල්‍යයනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අරමුදල් රැස්කිරීම සිදු කෙරිණි.

(ආ) ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදු කරනු ලැබූ මූල්‍යයන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

II-22 සංඛ්‍යා සටහන

**2017 සහ 2018 වසරේ ණය උපකරණ සහ වෙන්දේසි කාර්යසාධනය**

| උපකරණය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | නිකුත් කිරීම් (රු.බිලියන) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (රු.බිලියන) | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් | 1,624.3 | 52 | 1,653.3 | 51 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 548.8 | 16 | 763.02 | 11 |
| | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) | 2,231.4 | 4 | 1,492.05 | 6 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) | 1,500.00 | 1 | 2,500.00 | 1 |

(ඇ) 2018 වසරේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමස්ත ශුද්ධ විදේශ විනිමය ගලායෑම් එ.ජ.ඩොලර් මිලියන 990.7ක් වූ අතර, එය එම වසර තුළ භාණ්ඩාගාර බිල්පත්වලින් විදේශ විනිමය ගලා යෑම් එ.ජ. ඩොලර් මිලියන 96.4 කින් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් විදේශ විනිමය ගලා යෑම් එ.ජ.ඩොලර් මිලියන 893.6 කින් සමන්විත විය.

(ඈ) ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකයන්ගේ හැසිරීමට අනුගත වෙමින්, විශේෂයෙන්ම 2018 වසරේ අවසාන කාලපරිච්ඡේදය තුළ, ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකවල ද ඉහළ යාමක් දක්නට ලැබුණි. තවද, ඇමරිකා එක්සත් ජනපදය එහි පොලී අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන ආර්ථිකයන්ගෙන්, විදේශ ආයෝජකයන් සිය ආයෝජන ඉවත්කරගැනීම සහ විශේෂයෙන්ම වසරේ අවසාන කාලය තුළ දේශීයව මෙන්ම ගෝලීය වශයෙන් පැවති අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් යනාදී කරුණු ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතික ඉහළයාමට හේතු විය.

(ඉ) වෙළෙඳපොළ සහභාගිවන්නන් සමග පවත්නා නිරන්තර සබඳතාවයන්, පෙර ප්‍රකාශ කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි දින දර්ශනය ප්‍රකාශයට පත්කිරීම සහ වෙළෙඳපොළ පවත්නා සම්පත්වලට ගැළපෙන පරිදි නිකුතුන් සිදුකිරීම ආදී කරුණු නිසා නොපියවූ දේශීය ණය කළඹෙහි කල්පිරීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATM) 2017 වසරේදී වසර 5.78 ක සිට 2018 වසරේදී වසර 5.9 ක් දක්වා ඉහළ ගියේය.

### 21.2 රජයේ ණය සේවාකරණ

වසර තුළදී සිදුකරන ලද සමස්ත රාජ්‍ය ණය ගෙවීම් රුපියල් බිලියන 2,050.6 ක් වූ අතර, එය දේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,515.7 ක් හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 534.9 කින් සමන්විත විය.

### 21.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය භාවිතා කරනු ලැබේ. මෙම පද්ධතිය ඍජු අලෙවි සහභාගීකරුවන් විසින් ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වන අනෙකුත් ආයෝජකයින් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු අලෙවි සහභාගීකරුවන් 34 දෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 26 ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 8 ක්) සහ ඔවුන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු සහභාගීකරුවන් 3 දෙනෙකුගෙන් (කොළඹ කොටස් වෙළෙඳපොළ, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත වේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙක්‍යු පද්ධතියෙහි අඛණ්ඩව හා තත්කාලීනව මෙහෙයුම් සිදුවන බව සහතික කරමින් පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. 2018 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට සමස්ත නිර්ලේඛිත සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 5,103 ක් වූ අතර එය රුපියල් බිලියන 758.8 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වලින් සහ රුපියල් බිලියන 4,344.2 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත විය.

### 21.4 රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියෙහි රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරීත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම, රජයේ සුරැකුම්පත් සුරක්ෂිත කිරීමට උපකාරී විය. මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශයන් යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදුවිය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ විද්‍යුත් තැපැල මගින් විද්‍යුත් ප්‍රකාශනයන් 1,832 ක් සහ සාමාන්‍ය තැපැල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 16,026 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 42,681 ක් සහ ගෙවීම් ප්‍රකාශන 18,744 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී. තවද, මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2018 වසරේ දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 94,082ක් විය.

### 21.5 ක්‍රියා පිළිවෙත ප්‍රතිසංස්කරණය කිරීම

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය කිරීම සහ එහි කාර්යක්ෂමතාවය, සඵලතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා 2018 වසර තුළ පහත සඳහන් පද්ධති වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නංවන ලදී.

**(අ) සක්‍රීය වගකීම් කළමනාකරණ රාමුව නීති ගත කිරීම**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2018 වසරේ මාර්තු මාසයේදී සක්‍රීය වගකීම් කළමනාකරණ පනත (Active Liability Management Act-ALMA) අනුමත කරන ලද අතර, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී ණය වශයෙන් රුපියල් බිලියන 310 ක අරමුදල් රැස්කිරීම සඳහා වූ යෝජනාව ද සම්මත කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකා රජයට, ඉදිරි කාලය තුළදී මුහුණ දීමට සිදුව ඇති ප්‍රතිමූල්‍යන අවදානම (ණය ඒකරාශී වීම අවම කිරීමට) හා අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළු ණය කළඹෙහි කල් පිරීමේ කාලය දීර්ඝ කිරීම සහ/හෝ ආපසු ගෙවීම් ව්‍යුහය සුමට කිරීම සඳහා සක්‍රීය ලෙස මැදිහත් වීමට අවකාශය සලසයි. වගකීම් කළමනාකරණය ආධාරයෙන් ශ්‍රී ලංකා රජයට, ආයෝජන පදනම විවිධාංගීකරණය කිරීම, වෙළෙඳපොළ තත්ත්වයන් පදනම් කරගනිමින් ණය පිරිවැය පාලනය සඳහා ඉඩප්‍රස්ථා සැලසීම, වගකීම් කළඹෙහි කාලසීමාව දීර්ඝ කිරීම, ඉදිරි කාලය තුළ ප්‍රතිමූල්‍යකරණ අවදානම අඩුකිරීම සහ ඕනෑම නව නිකුතුන් සඳහා හිතැති මිල පරිසරයක් ඇති කිරීම ආදී දෑ සඳහා උපකාරී වේ. තවද, සක්‍රීය වගකීම් කළමනාකරණ පනත මගින්, ශ්‍රී ලංකා මහ බැංකුවට දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ, අපේක්ෂිත සංචිත ගොඩනැගීම, හුවමාරු කිරීම, ආපසු මිලදී ගැනීම, වෙන්දේසි ප්‍රතිවර්තනය ආදී වගකීම් කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකියාව ලබා දෙනු ඇත. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයේ උපදේශනය අනුව අනාගත ණය බැදීම් සඳහා වගකීම් කළමනාකරණ ක්‍රියාවලියක් ඇතිකිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ඇත.

(ආ) මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය ආයතනගත කිරීම

ඉතා වේගයෙන් වර්ධනය වන රාජ්‍ය ණය කළඹ සහ ඒ ආශ්‍රිත රාජ්‍ය වියදමෙහි පවතින ණය සේවාකරණ ගෙවීම් නිසා, මෑත කාලයෙහි ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය ප්‍රමුඛ ප්‍රතිපත්තිමය සාධකයක් බවට පත්ව ඇත. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය තුළින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළඹෙහි ප්‍රධාන අවදානම් ප්‍රාමාණීකරණය, ණය නිකුත් කිරීමේ යෝග්‍ය මූල්‍ය සංයුතිය සහ කල්පිරීමේ සංයුතිය සහ එය ළඟාකරගැනීම සඳහා උපායමාර්ගයක් තීරණය කිරීම, පිරිවැය සහ අවදානම් හුවමාරුකිරීම් මත පදනම් වූ වර්තමාන ණය නිකුතු විකල්පයන් මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අරමුණු හා ගැළපෙන පරිදි සිදුකිරීම සිදු වේ. ඊට අනුකූලව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක් සම්පාදනය කරනු ලබන අතර, එය 2019 වසරේ පළමු කාර්තුව වන විට සකස් කර ප්‍රකාශ කිරීමට අපේක්ෂා කෙරේ.

### 21.6 ඉදිරි දැක්ම

(අ) ලංකාසෙක්‍යු පද්ධතියෙහි සෑම සුරැකුම්පත් ගිණුමකම නිර්ලේඛිත සුරැකුම්පත්වල සිදුවන සෑම එක් එක් හර හා බැර සටහනක් සඳහාම කෙටි පණිවිඩ සේවාව මගින් සහ/හෝ විද්‍යුත් තැපැල මගින් එහි ගනුදෙනුකරුවන්ට තත්කාලීනව දැනුම් දීම 2019 වසරේ පළමු කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) දේශීය වෙළෙඳපොළෙහි රාජ්‍ය ණය ගැනීමේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, ප්‍රාථමික වෙළෙඳපොළ සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ නව පද්ධතියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් නිර්මාණය කිරීමේ හැකියාව සොයා බැලීමට හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ නව ප්‍රාථමික නිකුතු පද්ධතියේ වෙළෙඳපොළ පදනම් වූ නිකුත් කිරීම් සහ වෙළෙඳපොළ සහභාගීවන්නන් හට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අවශ්‍ය වන ලංසු ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා භාණ්ඩාගාර නිකුතු පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

(ඇ) වත්මන් නීති රාමුව ශක්තිමත් කිරීම සඳහා වූ පියවර

විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ තත්කාලීන වෙළෙඳපොළ වර්ධනයන් සමඟ සමගාමී වීම සඳහා ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (Registered Stocks and Securities Ordinance-RSSO) සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (Local Treasury Bills Ordinance-LTBO) වැඩිදියුණු කිරීම සඳහා සංශෝධන යෝජනා කර ඇත. එසේම, විදේශ වගකීම් සඳහා වූ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි, 1957 අංක 29 දරන විදේශ ණය පනතට සංශෝධන ගෙන ඒමටද යෝජනා කර ඇත.

### 21.7 ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් දූත මණ්ඩල සම්බන්ධීකරණය

2018 වසරේදී, ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ලබාගැනීම සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන වන ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස්, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් යන ආයතන සඳහා වාර්ෂික ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පහසුකම් සැලසීය.

## 22. ප්‍රාදේශීය සංවර්ධනය

රටේ මූල්‍ය අන්තර්ගත භාවය ප්‍රවර්ධනය කරමින්, සාර්ව සහභාගීත්වයක් සහිත තුලිත ආර්ථික වර්ධනයක් අඛණ්ඩව ඇති කරලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, විදේශ ආධාර සපයන නියෝජිත ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අරමුදල් සපයන ලද විවිධ ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම සාම්ප්‍රදායික ණය මෙහෙයුම් කටයුතුවලට අනුපූරකව පෙර වර්ෂයන්හිදී ආරම්භ කරන ලද නව උපාය මාර්ගයන් සහ මුලපිරීම් මෙන්ම ණය අතිරේකකරණ සේවාවන් 2018 වර්ෂයේදීත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩවම සිදු කරන ලදී.

විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශයන්හි ජීවත් වන අවදානම් සහිත කණ්ඩායම් ඉලක්කකර ගනිමින් තනි පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල මූල්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2018 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අඛණ්ඩව කටයුතු කරන ලදී. ශක්තිමත් මූල්‍ය පදනමක් සහ ඉහළ ස්වාධීනත්වයක් ඇති කරගනිමින් ව්‍යවසායකයන් ලෙස ඔවුන්ට මුහුණ දීමට සිදුවන අභියෝගයන්ට මුහුණ දීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සංවර්ධනය කර ගැනීමට සහ විභවතාවයෙන් යුතු ව්‍යවසායකයන්ගේ ධාරිතා සංවර්ධනය තවදුරටත් ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් මෙම මුලපිරීම් සිදු කරන ලදී. මෙම ප්‍රයත්නයේදී කෘෂි කාර්මික, සත්වපාලන, කර්මාන්ත සහ සේවා ඇතුළු ක්ෂේත්‍ර රැසක් ආවරණය වන පරිදි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්හට දැරියහැකි මූල්‍ය පහසුකම් හා ණය අතිරේකකරණ සේවාවන් සපයන ලදී. මීට අමතරව, සාමාන්‍ය මිනිසෙකු නැණවත් ආයෝජකයකු බවට පත්කරලීමේ අරමුණ ඇතිව, මූලික වශයෙන් විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරව සහ විධිමත් මූල්‍ය අංශය වෙත ප්‍රවේශවීමේ අඩු වරප්‍රසාදයන් සහිත පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් මූල්‍ය සාක්ෂරතාවය, දැනුම්වත්භාවය වර්ධනය කිරීම සහ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් මාලාවක් මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

ප්‍රතිපත්තිමය වශයෙන් බැලූ කල ඉතා වැදගත් ක්‍රියාමාර්ග කිහිපයක් ගනිමින් 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු වඩාත් සඵලදායීව

ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරී පියවරයන් ගණනාවක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩවම ගන්නා ලදී.

2017 වසරේදී මුල පුරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගයක් සැකසීමේ ක්‍රියාවලියෙහි සාධනීය වර්ධනයක් 2018 වසර තුළදී දැකියහැකි අතර එය 2019 වසරේදී අවසන්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම තුළින් රටතුළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු වන අතර ජාත්‍යන්තරය අත්දැකීම් ලබා ගැනීමට හා ජාත්‍යන්තරය සමඟ එක්ව කටයුතු කිරීමේ අවස්ථාවද සැලසෙනු ඇත. තවද, ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම 6 ක් හඳුන්වාදෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රම 6 හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශය සඳහා සහනදායි ණය ලබාදීමේ සම්ප්‍රදායෙහි සැලකිය යුතු හැරවුම් ලක්ෂයක් වන අතර මෙම යෝජනා ක්‍රම රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක හවුල්කාරීත්වයන්ගෙන් සමන්විත වේ. ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ සහයෝගය ඇතිව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රමයන්හි ණය සංරචකය ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 22.1 සහනදායි මූල්‍ය පහසුකම් සැපයීම

2018 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්මේන්තුව විසින් ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 11 ක් ක්‍රියාත්මක කරමින් මූල්‍ය කටයුතු ඉහළ නැංවීම සඳහා එහි ණය මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමවල තොරතුරු සංඛ්‍යා සටහන II-23 හි දැක්වේ. මූල්‍යමය කොන්දේසි අනුවල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සහනදායි ණය යෝජනා ක්‍රම මගින් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් 105,867 ක් විධිමත් මූල්‍ය පද්ධතියට ඇතුළත් කරගත හැකිවූ අතර ඒ සඳහා 2018 වර්ෂයේදී සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා රු. මිලියන 16,431.7 ක සහනදායී ණය මුදලක් ඔවුන් වෙත මුදා හරින ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මුළු ණය යෝජනා ක්‍රමවලින් සියයට 72.9 ක් සඳහා රජය විසින් අරමුදල් සපයන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලේ දායකත්වය පිළිවෙලින් සියයට 25.1 ක් සහ සියයට 2 ක් විය. මෙම අරමුදල්වලින් සියයට 71.5 ක් කෘෂිකාර්මික හා සත්ත්වපාලන අංශය වෙත යොමුවූ අතර සේවා අංශය හා කාර්මික අංශය වෙත පිළිවෙලින් සියයට 14.2 ක් සහ සියයට 14.3 ක් සපයන ලදී.

2018 වසරේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමවල තත්ත්වය පහත දැක්වේ.

## 22.2 රජයේ සහ සහභාගීත්ව මූල්‍ය ආයතනවල අරමුදල් වලින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රධාන මූලාශ්‍රය වෙමින් ශ්‍රී ලංකා රජය හා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් 2018 වර්ශයේදී මුළු ණය මුදාහැරීම්වලින් සියයට 72.9 ක් එනම් රු. මිලියන 11,986.7 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී. ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 7 ක් සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයකින් සමන්විත වූ මුළු ණය යෝජනා ක්‍රම 8 ක් හරහා මෙම අරමුදල් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් වෙත ලබාදෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රම අතරින් "සරුසාර" හෙවත් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් ලෙස මෙන්ම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ලෙසද ක්‍රියාත්මක වේ. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඔවුන්ගේ අරමුදල් යොදාගනිමින් ලබාදෙන ලද ණය සඳහා නවසපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ රජය විසින් පොලී සහනාධාර සපයන ලදී.

(i) 2018 වසරේදී, කෙටිකාලීන බෝග වර්ග 33 ක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කුඩා පරිමාණයේ ගොවීන් 78,215 ක් වෙත ලබාදෙන ලද රු. මිලියන 9,021.7 ක වටිනාකමකින් යුතු සහන ණය ප්‍රමාණයක් සඳහා රජය විසින් රු. මිලියන 245.6 ක් පොලී සහනාධාර ලෙස සපයන ලදී. කෘෂිකාර්මික අංශය වෙත ණය ලබා දීමට සහභාගීත්ව මූල්‍ය ආයතනවල ඇති කැපවීම පෙන්නුම් කරමින් 2017 වසර හා සැසඳීමේදී 2018 වසරේදී රු. මිලියන 7,845.2 සිට රු. මිලියන 9,021.7 ක ණය මුදල් ප්‍රමාණයක් නවසපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හරහා මුදාහැර ඇති අතර එය පෙර වසර හා සැසඳීමේදී. සියයට 15 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව, 2017 වර්ශයේදී රජය විසින් සපයන ලද රු. මිලියන 227.5 ක පොලී සහනාධාරය 2018 වර්ෂය හා සැසඳීමේ" සියයට 8.0 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

(ii) නවසපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබාදුන් ණය මුදල්වලින් ඉහලම ප්‍රතිශතය වූ සියයට 12.6 ක් අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර එහි වටිනාකම රු. මිලියන 1,137.9 ක් විය. එමෙන්ම නවසපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුළු මුදා හැරීම්වලින් රු. මිලියන 966.2 ක (සියයට 10.7) ණය මුදල් ප්‍රමාණයක් හා රු. මිලියන 948.3 ක (සියයට 10.5) ණය මුදල් ප්‍රමාණයක් පිළිවෙලින් පොළොන්නරුව දිස්ත්‍රික්කය හා අනුරාධපුර දිස්ත්‍රික්කය විසින් ලබාගෙන ඇත.

(iii) ආපදා වලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා රජයේ මැදිහත්වීමෙන් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස 2017 අගෝස්තු මාසයේ හඳුන්වාදෙන ලද "අත්වැල" ණය යෝජනා ක්‍රමය, 2018 වර්ෂයේ

ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කරන ලදී. රජය විසින් ලබා දෙන ලද රු. මිලියන 1,500 න් සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් ලබාදෙන ලද ණය 3,543 ක් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලෙස රු, මිලියන 1,499.7 ක් මුදා හරින ලදී. රජය විසින් හඳුනා ගත් ඕනෑම ආපදා තත්වයකින් හානියට පත් ඕනෑම ආර්ථික කටයුත්තක් නැවත නඟාසිටුවීම සඳහා වාර්ෂිකව සියයට 2 ක පොලී අනුපාතයක් යටතේ ඉලක්කගත ප්‍රතිලාභීන්ට සහනදායි මූල්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් "අත්වැල" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

(iv) නවසපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හා "අත්වැල" ණය යෝජනා ක්‍රමවලට අමතරව තවත් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 ක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 නම් "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය, දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (PAMP-RF), දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II - චක්‍රීය අරමුදල (PAMP II - RF) සහ ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II (SEPI-II) වේ. මීට අමතරව, තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනාක්‍රමය (WCLSTF) යටතේ ලබාදුන් ණය සඳහා ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පොලී සහනාධාර ලබා දෙනු ලබන අතර එම ණය යෝජනා ක්‍රමය 2017 වර්ෂයේ අවසන් කරන ලදී. මෙම ණය යෝජනාක්‍රම අතරින්, රජය විසින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රමයන්හි ණය මුදා හැරීම් වලින් සියයට 7.1 ක් එනම් රු. මිලියන 855.9 ක් මුදා හරින ලද්දේ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (PAMP-RF) සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II - චක්‍රීය අරමුදල (PAMP II-RF) යන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම දෙක මගිනි.

(v) තවද, රටේ දිළිඳුකම පිටුදැකීමට දායක වෙමින්, ව්‍යාපෘති කාලය තුළදී ප්‍රතිලාභීන් 94,893 ක් වෙත, රු. බිලියන 7 ක ණය මුදල් ප්‍රමාණයක් මුදාහරිමින් දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II - චක්‍රීය අරමුදල (PAMP II - RF) ණය යෝජනා ක්‍රමය සැලසුම් කල පරිදි 2018.07.15 දින සාර්ථකව නිම කරන ලදී.

(vi) පෙර තත්ත්වය තවදුරටත් රඳවා ගනිමින් රජය සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සැපයූ අරමුදල් වලින් රු. මිලියන 9,922.3 එනම් සියයට 82.8 ක බහුතර අරමුදල් ප්‍රමාණයක් කෘෂිකාර්මික හා සත්ත්වපාලන අංශය සඳහා සහනදායී ණය ලබා දීමට යොදවන ලදී. රජයේ අරමුදල් යොදාගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද, ණය යෝජනා ක්‍රම අතුරින් මූල්‍ය අංශයට ප්‍රවිශ්ඨ වීමේ අවශ්‍යතාවය ඇති සේවා අංශයේ ව්‍යාපාර ආයතන හා පුද්ගලයින් සඳහා 2018 වසරේදී රු. මිලියන 1366.6 ක ණය මුදල් ප්‍රමාණයක් එනම් සියයට 11.4 ක් ලබාදෙන ලදී. 2018 වසරේදී කාර්මික අංශයට නිකුත් කල ණය ප්‍රමාණය රු. මිලියන 697.7 ක් වූ අතර එය මුළු ණය මුදා හැරීම් වලින් සියයට 5.8 ක් පමණ වේ.

(vii) තවද, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) සමග මූල්‍ය ගිවිසුමකට 2018 වර්ෂයේදී එළඹුණ අතර, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි චක්‍රීය අරමුදල් ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 11.8 ක් වෙන් කිරීමට එකඟ විය. චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රම, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 3 කින් සමන්විත වන අතර ඒවානම්, චක්‍රීය අරමුදල් ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය, චක්‍රීය අරමුදල් කාලීන ණය යෝජනා ක්‍රමය හා චක්‍රීය අරමුදල් ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය වේ. මේ සඳහා රජය විසින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල යටතේ මූල්‍ය පහසුකම් සපයන ලද ණය යෝජනා ක්‍රමවල නැවත අයකර ගැනීම් භාවිතා කරනු ලබයි. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ආකෘතිය විස්තර කර ඇති 22.4 කොටසේ මේ පිළිබඳ වැඩි විස්තර ඉදිරිපත්කර ඇත. චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රම යටතේ කාන්තාවන්, තරුණ තරුණියන්, ගොවීන්, කුඩා ආයතන, තේ/රබර් කර්මාන්තශාලා, තේ/රබර් වගාවන් සහ ගොවිපොළ කළමණාකරුවන් ඇතුළු රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදන, හවුල්කාරිත්ව එකඟතාවයේ සිටින ගොවීන් හෝ ගොවි නිෂ්පාදක සංවිධාන සඳහා කාලීන, ප්‍රාග්ධන/කාරක ප්‍රාග්ධන සහ ආදායම් උත්පාදන ණය ලබාදෙනු ලබයි. 2018 වර්ෂයේ රජය විසින් අරමුදල් සපයන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි චක්‍රීය අරමුදල් ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 112.7 ක් සඳහා ණය 578 ක් ලියාපදිංචි කරන ලදී. 2018 වර්ෂයේ අවසන් මාස 07 තුළදී රු. මිලියන 106.4 ක වටිනාකමකින් යුත් ණය 527 ක් සඳහා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයා ඇත.

## 22.3 ශ්‍රී ලංකා මහබැංකුව හා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අරමුදල් සපයන ලද ණය යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම

2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම හරහා රු. මිලියන 4,123.0 ක් එනම් සියයට 25.1 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය" සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලද අතර "මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය" සඳහා පොලී සහනාධාර ලබාදෙන ලදී.

(i) ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලද ණය යෝජනා ක්‍රමවලින් සියයට 93.4 ක් එනම් රු. මිලියන 3,850.1 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරිමින් 2018 වසරේදී ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ණය යෝජනා ක්‍රමය ලෙස තවදුරටත්

තම ස්ථානය පවත්වාගෙන යාමට සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයට හැකි වූ අතර, එම යෝජනා ක්‍රමය හරහා 2018 වසරේදී ප්‍රතිලාභීන් 5,445 වෙත මූල්‍ය පහසුකම් ලබාදෙන ලදී.

(ii) තවදුරටත් "සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය" මගින් රු. මිලියන 3,800 ක් වූ 2018 වසරේ ප්‍රතිමූල්‍ය ඉලක්කය වෙත වසර අවසානයටත් පෙර සාර්ථකව ළඟා කරගැනීමට හැකි විය. ප්‍රතිමූල්‍ය පහසුකම්වලින් රු. මිලියන 465.0 ක් (සියයට 12.1) වූ බහුතරයක් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් අතරේ මුදා හරින ලදී. "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයේ ණය මුදාහැරීමේ භූගෝලීය ව්‍යාප්තිය සලකා බැලීමේදී කුරුණෑගල දිස්ත්‍රික්කය (රු. මිලියන 301.6 ක්) සියයට 7.8ක් හා මහනුවර දිස්ත්‍රික්කය (රු. මිලියන 294.9 ක්) සියයට 7.7 ක ණය මුදල් ප්‍රමාණයක් හිමිකර ගනිමින් පිළිවෙලින් දෙවන හා තුන් වන ස්ථාන හිමිකර ගෙන ඇත. "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයේ මුදා හැරීම්වලින් වැඩි ප්‍රමාණයක් එනම් රු. මිලියන 1,628.1 ක ණය මුදල් ප්‍රමාණයක් (සියයට 42.3) කාර්මික අංශය වෙත මුදාහරින ලද අතර රු. මිලියන 1,234.6 (සියයට 32.1) ක ණය මුදල් ප්‍රමාණයක් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශයෙහි ප්‍රතිලාභීන් වෙත මුදා හරින ලදී. ඉතිරි ප්‍රමාණය වූ රු. මිලියන 987.4 ක ණය මුදල් ප්‍රමාණයක් (සියයට 25.6) සේවා අංශය වෙත මුදා හරින ලදී.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනාධාර සපයන ලද මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි ඉලක්කය වූ රු. බිලියන 6 ක ණය මුදල් ප්‍රමාණයක් ලියාපදිංචි කිරීම සිදුකර අවසන් කරන ලද අතර 2018 වසරේ මුල්භාගයේදී, මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය හරහා රු. මිලියන 272.9 ක ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 287 ක් අතරේ මුදා හරින ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, සහභාගීත්ව මූල්‍ය ආයතන තම අරමුදල් යොදාගෙන ණය මුදල් නිකුත් කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ සඳහා පොලී සහනාධාර ලබාදෙනු ලබයි. කිරි වලින් ස්වයංපෝෂිත වීමේ ජාතික අරමුණ ළඟා කර ගැනීම සඳහා කිරි නිෂ්පාදනයට අදාල සියලුම අංශ හා කටයුතු ආවරණය වන පරිදි මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් නිකුත් කරනු ලබයි.

(iv) 2018 වසරේදී "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය හා මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය හරහා මුදා හරින ලද ණය මුදල්වලින් බහුතරයක් කාර්මික අංශය වෙත නිකුත් කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රම හරහා කාර්මික අංශය වෙත මුදා හරින ලද ණය ප්‍රමාණය රු. මිලියන 1,628.2 ක් වූ අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද අරමුදල් වලින් සියයට 39.5 ක් පමණ වේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමවල මුළු මුදා හැරීම්වලින් සියයට 36.6 ක් කෘෂි කාර්මික හා සත්ත්වපාලන අංශය වෙත මුදා හරින ලද අතර (රු. මිලියන 1,507.5 ක්) සියයට 23.9 ක් (රු. මිලියන 987.4) ක් සේවා අංශය වෙත මුදා හරින ලදී.

## 22.4 ප්‍රදානිත අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

2018 වසර පුරා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීමේ දිගුකාලීන අරමුදල් හවුල්කරුවකු වූ කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍ය සහ උපාය මාර්ගික සහය අඛණ්ඩවම සපයන ලදී.

(i) ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ (NADeP) ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) විසින් අරමුදල් සපයන ලද කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා වූ ප්‍රධාන ණය යෝජනා ක්‍රම අවසන් වීමත් සමඟ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) හඳුන්වාදෙන ලදී. ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන, තරුණදිරිය, පිටත වගාකරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ප්‍රාග්ධන හා කාලීන ණය යෝජනා ක්‍රම) සහ ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) යන ණය යෝජනා ක්‍රමවලින් ජාතික කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සමන්විත විය. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල සහ රජය විසින් අරමුදල් සපයනු ලබන අතරම ඒ සඳහා කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මීට පෙරද අරමුදල් සපයන ලද ව්‍යාපෘතියන්හි දැනට පවතින සහ අනාගත ණය ආපසු අයකර ගැනීම් මෙන්ම කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් අලුතින්ම සපයන ලද අරමුදල් යොදා ගනිමින් පිහිටුවන ඒකාබද්ධ ණය මුදලක් මගින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා අරමුදල් සපයනු ලබයි. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ (SAPP) ගිවිසුම් ප්‍රකාරව කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) මෙම වැඩසටහන සඳහා ඇ.ඩො. මිලියන 11.8 ක් ලබා දීමට එකඟතාවය පල කරන ලදී. කුඩා වැවිලි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන, වියළි කලාපීය ජීවනෝපාය සඳහා සහය වීමේ සහ හවුල් වීමේ චක්‍රීය ණය වැඩසටහන සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ණය ආපසු අයකර ගැනීම් යොදාගනිමින් මූල්‍ය ප්‍රතිපාදනයන් ලෙස ඇ.ඩො. මිලියන 18.5 ක් ලබා දීමට ශ්‍රී ලංකා රජය එකග වන ලදී.

(ii) මූල්‍යකරණ ගිවිසුමේ කරුණුවලට අනුව, චක්‍රීය අරමුදල් වැඩසටහන යටතේ කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලෙහි අරමුදල් බෙදාහැරීමේ නියෝජිත ආයතනය ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මූල්‍ය වෙළෙඳපොළ ප්‍රවේශය ඉහල නැංවීමට අදාල ක්‍රියාකාරකම් සඳහා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ වැඩසටහන් නියමු නියෝජිතායතනය ලෙස ජනාධිපති

ලේකම් කාර්යාලය කටයුතු කරන අතර වැඩසටහන් නියමු නියෝජිතායතනය ලෙස ක්‍රියා කරන ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් කළමණාකරන ඒකකය මඟින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබයි.

(iii) කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ මූලික අරමුණු වන්නේ දිළිඳුකම අඩු කිරීමට දායකත්වය ලබා දීම සහ ශ්‍රී ලාංකීය කුඩා පරිමාණ ජන කණ්ඩායම් වල තරගකාරීත්වය වැඩි දියුණු කිරීමයි. තවද වාණිජ මට්ටමින් නිෂ්පාදනය හා අලෙවිකරණයේ නියැලී සිටින කුඩා පරිමාණ ගෘහස්ථ නිෂ්පාදකයන් 57,500 කගේ ආදායම සහ පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ද මින් අපේක්ෂා කරයි. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම 6 කි.

- රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක, හවුල්කාරීත් (4P) ණය යෝජනාක්‍රම: ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය, කාලීන ණය යෝජනා ක්‍රමය, තුරුණු ණය යෝජනා ක්‍රමය (කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් අරමුදල් සපයයි).
- චක්‍රීය අරමුදල් (RF) ණය යෝජනාක්‍රම: චක්‍රීය අරමුදල් ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය, චක්‍රීය අරමුදල් කාලීන ණය යෝජනා ක්‍රමය, ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය (රජයේ ප්‍රතිපාර්ශවයන් මගින් අරමුදල් සපයයි).

(iv) 2018 වසරේ අප්‍රේල් මාසයේ හඳුන්වාදෙන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රම වල මෙහෙයුම් තවමත් මූලික අදියරේ පවතී. කුඩා කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි රාජ්‍ය, පෞද්ගලික නිෂ්පාදක, හවුල්කාරීත්ව ණය යෝජනා ක්‍රම යටතේ 2018 දෙසැම්බර් මස අවසාන වනවිට රු.මිලියන 437.9 ක් සඳහා ණය මුදල් 2,121 ක් ලියාපදිංචි කර ඇත. එහි මෙහෙයුම් කාලය වූ 2018 වර්ෂයේ අවසන් මාස 7 ඇතුළත ණය මුදල් 1,699 ක් සඳහා රු. මිලියන 322 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සපයා ඇත.

(v) ප්‍රතිපත්තිමය වශයෙන් ගත් කල, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි කාලීන ණය යෝජනා ක්‍රම යටතේ ණය මුදල් ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව සහ සහන කාලය ඉහළ නැංවීමට අදාළව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. කාලීන ගොවිතැන් කටයුතු වල නිරත වන ගොවීන් මුහුණපාන ප්‍රායෝගික ගැටලුවලට විසඳුමක් ලබාදීම එහි මූලික අරමුණ විය. එලෙස කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි කාලීන ණය යෝජනා ක්‍රමවල ණය එකවර ගෙවීමේදී සහන කාලය මාස 12 සිට 18 දක්වා ඉහළ දැමූ අතර මාස 30 ක උපරිම ආපසු ගෙවීමේ කාල සීමාවකට යටත්ව මාසික වාරික ක්‍රමය හඳුන්වා දෙන ලදී.

## 22.5 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ නව උපායමාර්ගික ක්‍රියාමාර්ග

### 22.5.1 මූල්‍ය අන්තර්ගත භාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සකස් කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයක් සැකසීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම් ක්‍රියාවලිය තවදුරටත් සඵලදායී හා කාර්යක්ෂමව ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයක් සැකසීම සඳහා මූල්‍යමය සහ තාක්ෂණික සහය ලබා ගැනීමට ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාවයේ සහය ලබා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මේ සඳහා 2018 ජනවාරි මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගීතා ගිවිසුමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්සන් කරන ලදී.

යෝජිත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය තුළින් රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළනැංවීම සඳහා පාර්ශවකරුවන්ට වගකීම් පවරමින් වඩාත් පුළුල් උපායමාර්ගික රාමුවක් සහ ක්‍රියාමාර්ගික සැලැස්මක් හඳුන්වා දීමට අපේක්ෂා කරයි. එවැනි උපාය මාර්ගික රාමුවක් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රමාණවත් ගුණාත්මකතාවයෙන් යුතු දැරිය හැකි මූල්‍ය සේවා ඇතුළත් වූ සාධාරණ හා පහසුවෙන් පිවිසිය හැකි මූල්‍ය පද්ධතියක් රටේ සෑම පුද්ගලයෙකුටම සහ ව්‍යාපාර ඒකකයකට ලබා දීමට අපේක්ෂා කරයි. තවද, 2019 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය, අනාගතයේ රටේ ආර්ථික තීරණ ගන්නා ශිෂ්‍යයන් ඇතුළු සියලු පාර්ශවකරුවන්ට මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවිය හැකි පරිදි සකස් කරන ලද ජාතික මට්ටමේ මූල්‍ය සාක්ෂරතා වැඩසටහනක් හා සම්බන්ධකර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සකස් කිරීම සඳහා අත්දැකීම් ලබා ගැනීමට සහ දැනුම හුවමාරු කිරීම සඳහා පිලිපීනයේ “Bangkosentralng Pilipinas” හි අධ්‍යයන චාරිකාවක නිරත වූ අතර එහිදී අධ්‍යාපනය තුළින් පාරිභෝගික බලගැන්වීම ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස යෝජනා කරන ලදී. තවද, 2018 වසරේදී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයක් සියළුම දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ 480 ක් ආවරණය වන පරිදි පවත්වන ලද අතර මෙම අරමුණ සඳහා කැපවූ සමීක්ෂණ ආයතනයක් මගින් එය සිදු කරන ලදී. මීට අමතරව, ලෝක බැංකු කණ්ඩායමේ උපදේශකයන් පිසක් 2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවට පැමිණ රටේ මූල්‍ය අන්තර්ගතභාවයට අදාල ප්‍රශ්න, ගැටළු හා දැක්ම ගැන සාකච්ඡා කිරීමට විවිධ පාර්ශවකරුවන් සමඟ රැස්වීම් සහ වැඩමුළු මාලාවක් පවත්වන ලදී. මෙම රැස්වීම් අවසානයේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයට අදාල ආකෘතියක් සකසන ලද අතර, පාර්ශවකරුවන්

විසින් එය පරීක්ෂා කරන ලදී. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයට අදාළ දෙවන උපදේශක වැඩමුළුව ලෝක බැංකු උපදේශකයන්ගේ සහභාගීත්වයෙන් 2019 වසරේ මුල් කාර්තුවේදී පැවැත්වීමට නියමිතය.

### 22.5.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන ණය යෝජනාක්‍රම වල මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය

2018 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම යටතේ ණය ලියාපදිංචිය හා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලදී. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති ආයතන ශක්තිමත් කිරීමේ සංරචකය යටතේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මඟින් මූල්‍ය පහසුකම් සපයන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රම මඟින් මෙම ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපේක්ෂිතය. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් (PMU) සහභාගීත්ව මූල්‍ය ආයතන සහ අනෙකුත් අදාල පාර්ශවකරුවන් සමඟ එකට එක්ව මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂිතය.

මෙම ස්වයංක්‍රීයකරණය කිරීම නිසා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රම පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකිවනු ඇත. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු වල කාර්යක්ෂමතාවය හා සඵලදායිත්වය ඉහල නංවමින් මේ හරහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ථ ණය කළඹේ මෙහෙයුම් ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කල හැක. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් සඵලදායි ලෙස සිදුකල හැකිවන පරිදි මෙම පද්ධතිය සියලු අංශ ඇතුළත් වූ කළමණාකරන තොරතුරු පද්ධතියක් ලෙසද කටයුතු කරනු ඇත.

මේ සම්බන්ධයෙන් කිහිපවතාවක්ම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පරිශීලක අවශ්‍යතා හා මෙහෙයුම් අවශ්‍යතා ගැන පර්ශවකරුවන් සමඟ රැස්වීම් සහ වැඩමුළු පවත්වන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය 2019 වසරේදී නිම කිරීමට අපේක්ෂා කරයි.

### 22.5.3 "එක් ගමකට එක් නිෂ්පාදනයක්" වැඩසටහන

ශ්‍රී ලංකාවේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් විභවතාවයක් ඇති ග්‍රාමීය ප්‍රදේශ තෝරාගෙන වාණිජ මට්ටමේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වූ "එක් ගමකට එක් නිෂ්පාදනයක්" සංකල්පය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූලික පියවර ගන්නා ලදී. මෙම වැඩසටහනේ පුළුල් පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය ලබා දීමයි.

දේශීය සම්පත්වලට වටිනාකමක් එකතු කරමින් ආදායම හා ධනය වැඩි කිරීමේ දැක්මක් සහිත ඒකාබද්ධ ප්‍රජා වැඩපිළිවෙලක් ලෙස "එක් ගමකට එක් නිෂ්පාදනයක්" වැඩසටහන පිහිටුවිය හැකිය. තවද, නවෝත්පාදන, පර්යේෂණය හා සංවර්ධනය, පවතින දේශීය සම්පත්වල එකතුකළ වටිනාකම ඉහළ නැංවීම හරහා ග්‍රාමීය ප්‍රදේශවල පවතින සම්පත් උපරිම ලෙස උපයෝගී කරගැනීම මෙයින් අපේක්ෂා කරන අතර එතුළින් මෙම නිෂ්පාදන විශේෂිත ගුණාත්මකභාවයකින් යුතු දේශීය, කලාපීය හා අන්තර්ජාතික වශයෙන් පිළිගත් නිෂ්පාදන බවට පත් කිරීමත් ඒ හරහා ආදායම් ඉහළ නැංවීම හා ජීවන තත්ත්වය නඟා සිටුවීම මගින් සමාජ සුභසාධනයට දායකවීමත් මෙයින් අපේක්ෂා කෙරේ.

## 22.6 මූල්‍ය සාක්ෂරතාවය හා ශක්‍යතා ගොඩනැංවීම

පුළුල් මූල්‍ය අන්තර්ගතභාවයක් කරා යන ගමනේදී ගතික අංශයන් ලෙස මූල්‍ය සාක්ෂරතාවය හා දැනුම්වත්භාවයෙහි ඇති වැදගත්කම හඳුනාගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2018 වසරේදී තම ඉලක්කය වූ වැඩසටහන 150 පැවැත්වීම අභිබවායමින් වැඩසටහන් 163 ක් පවත්වන ලදී. ප්‍රජා නායකයන් සහ සමාජ ක්‍රියාකාරකම් හි නිරතවී සිටින වෙනත් පාර්ශවකරුවන් සහ මූල්‍යමය වශයෙන් බැහැරවී සිටින සමාජයේ පහළම කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායී සංවර්ධන සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ආදිය පවත්වන ලදී.

මූල්‍ය සාක්ෂරතාවය නොමැති වීම නිසා ඇතිවන ගෘහස්ථ ණය ගැතිභාවය වැනි ගැටළු පිළිබඳ දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද, විධිමත් මූල්‍ය අංශය හා සම්බන්ධ වී කටයුතු කිරීමෙන් ඇතිවන ප්‍රතිලාභ පිළිබඳව මෙම වැඩසටහන්වලදී මතුකර පෙන්වා දෙන ලදී. බැංකුව හා කටයුතු කිරීමේදී ඇති කරගත යුතු හොඳ පුරුදු, මූල්‍ය විනය, නව මූල්‍ය උපකරණ සහ සේවා මූල්‍ය සාක්ෂරතාවයේ වර්තමාන තත්වය, ඉතුරුම්, ආයෝජන, ණයට ගැනීම්වලදී තීරණ ගතයුතු ආකාරය පිළිබඳව දැනුමක් ඉලක්කගත කණ්ඩායම්වලට මේ හරහා ලබා දෙන ලදී. මූල්‍ය අන්තර්භාවයෙන් බැහැරවීම හේතුකොටගෙන ඇතිවන ගැටළුකාරී තත්වයන් පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රටේ දියුණු සහ නොදියුණු ප්‍රදේශ විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පසුගිය කාලයේ ලද අත්දැකීම් උපයෝගී කරගනිමින් ප්‍රධාන වශයෙන් මූල්‍ය ගැටළුවලට ගෝචර වීමට ඉඩකඩ ඇති පිරිස් ඉලක්කගත කණ්ඩායම් ලෙස මෙහිදී තෝරාගන්නා ලදී.

**II - 23 සංඛ්‍යා සටහන**

**2018 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම**

(රුපියල් මිලියන)

| අරමුදල් ප්‍රභවය | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුණ | ප්‍රතිමූල්‍ය/ පොලී සහනාධාර | 2018 වසර සඳහා වෙන් කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය | 2018 වසරේදී සහභාගිත්ව මූල්‍ය ආයතනවලට මුදා හරින ලද අරමුදල් ප්‍රමාණය | මුදා හැරීමට ඇති ඉතිරි අරමුදල් ප්‍රමාණය | ණයලාභියා ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය (වසර අවසානයේදී) | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ අරමුදල් | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (PAMP - RF) | ආදායම උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධන හා විධිමත් බැංකු පද්ධතිය හා සම්බන්ධවීමට අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම තුලින් දිළිඳුකම පිටු දැක්ම | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 400.00 | රු.මිලියන 519.7 | ණය ආපසු අයකර ගැනීම චක්‍රීයව යොදා ගැනේ. | 12% | |
| | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල (PAMP - II RF) | | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 300.00 | රු.මිලියන 336.2 | අවසන් කරන ලදී. | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ලාභීන්ගෙන් 10% ක් අය කරනු ලබයි. | |
| | "ස්වශක්ති" ණය ව්‍යාපෘතිය | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින ව්‍යවසායක-යන් සහ එම අංශයට අලුතින් ඇතුළත් වූ ව්‍යවසායකයන් සඳහා රැකියා අවස්ථා ජනනය කිරීම. | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 3,500.00 විශේෂ වාර්ෂික වෙන් කිරීමක් නොමැත. | රු.මිලියන 375.4 | රු.මිලියන 930.5 | 5.5% | රු.මිලියන 47.3 ක් ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් යොදවන ලදී. |
| | ආපදාවලින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ "අත්වැල" ණය යෝජනා ක්‍රමය (READ) | ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ආපදාවකින් හානියට පත් ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම. | ප්‍රතිමූල්‍ය | ණය යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 2,000 කි. විශේෂ වාර්ෂික වෙන් කිරීමක් නොමැත. | රු.මිලියන 1499.7 | රජයෙන් අරමුදල් ලැබිය යුතුව ඇත. | 2% | |
| | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI) | තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය ලබා දීම. | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 127.4 | රු.මිලියන 127.4 | ශ්‍රී ලංකා රජය විසින් 2019 වසර සඳහා අරමුදල් වෙන් කරනු ඇත. | 7% | |
| | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය | වාණිජ අරමුණින් නිෂ්පාදනය හා අලෙවිකරණ පද්ධතියේ නියුතු කුඩා පරිමාණ නිෂ්පාදකයින් 57000 ක ගේ ආදායම් හා පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | ඇ.ඩො. මිලියන 18.5 ක් සියළුම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා විශේෂ වාර්ෂික වෙන් කිරීමක් නොමැත. | රු.මිලියන 106.4 | අදාල නොවේ. | 6.5% | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | වී සහ කෙටි කාලීන බෝග වගාවේ නිරත ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන් ගේ සමාජ හා ආර්ථික තත්වය නගා සිටුවීම | පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ | අරමුදල් සඳහා ඇති ඉල්ලුම මත පදනම් වේ. | රු.මිලියන 9,025.3 | අදාල නොවේ. | 7% | |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය (Subagya) | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ව්‍යසනයක බලපෑමකට ලක් වූ එවැනි ව්‍යාපෘති ඇරඹීමට හෝ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීම | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 3,800 | රු.මිලියන 3,850.1 | ණය ආපසු අයකර ගැනීම් චක්‍රියව යොදා ගැනේ. | 8% | |
| | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් ප්‍රවර්ධනය කිරීම මගින් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවලින් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීමට සහාය වීම | පොලී සහනාධාර | අරමුදල් සඳහා ඇති ඉල්ලුම මත පදනම් වේ. | රු.මිලියන 272.9 | අදාල නොවේ | 6% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ රජයේ පොලී සහනාධාර මගින් |
| ප්‍රදානිත අරමුදල් | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ දිළිඳුකම අඩු කිරීමට හා තරඟකාරීත්වයට දායක වීම සහ වාණිජ අරමුනින් නිෂ්පාදනයේ සහ අලෙවිකරණ පද්ධතියේ නියුතු කුඩා පරිමාණ නිෂ්පාදකයන් 57,500 කගේ ආදායම හා පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | ඇ.ඩො. මිලියන 11.8 ක් සියළුම කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රම සඳහා වෙන්කර ඇත. | රු.මිලියන 67.8 | අදාල නොවේ | 6.5% | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයන ලදී. |
| | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන කාලීන ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | | රු.මිලියන 254.2 | අදාල නොවේ | 6.5% | |

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තරයක් සංඛ්‍යා සටහන II-24 හි දැක්වේ.

**II-24 සංඛ්‍යා සටහන**

**2018 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය සාක්ෂරතාව | 110 |
| ශක්‍යතා ගොඩනැංවීම | 44 |
| මාධ්‍ය වැඩසටහන් | 09 |
| මුළු සංඛ්‍යාව | 163 |

# 23. ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය

මහ බැංකු කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා මුදල් නීති පනතේ 07 වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව 1981 සිට මාතර, අනුරාධපුර, මාතලේ, යාපනය, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 07 ක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. පසුව, මහජනතාවට වඩාත් සමීප හා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් හා කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලයේ සම්පත් වඩාත් ඵලදායි ලෙස යොදාගැනීමේ අරමුණින් 2017 වසරේ ජුනි මාසයේ දී යාපනය ප්‍රාදේශීය කාර්යාලය කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලය සමඟ ඒකාබද්ධ කරන ලදී. මෙයට අමතරව, මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසරේ දී ප්‍රාදේශීය කාර්යාල සේවා වපසරිය පුළුල් කරමින් එතෙක් කිසිදු ප්‍රාදේශීය කාර්යාලයක් මඟින් ආවරණය නොවූ රත්නපුර, කෑගල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක පිළිවෙළින් මාතර, මාතලේ හා නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල වලට අදාළ සේවා ප්‍රදේශ ලෙස නම් කරන ලදී. තව ද, එතෙක් කිසිදු ප්‍රාදේශීය කාර්යාලයක් විසින් ආවරණය නොවූ බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 03 ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආවරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව, 2018 වර්ෂයේ සිට ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මඟින් දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන ලෙස සේවා සැපයීම කරනු ලබයි.

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල විසින් තිරසාර හා තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා දායකත්වය සපයනු ලබන අතර ව්‍යවසායකයින් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ වෙළඳ පොළවල්, තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීමට කටයුතු කරනු ලබයි. තව ද, ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මහ බැංකු කාර්යයන් ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීම සඳහා ද වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

## 23.1 සංවර්ධන කාර්යයන්

2018 වසර තුළ දී විධිමත් හා අඩු පිරිවැය මූල්‍ය සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 148 ක් ව්‍යවසායකයින්, රාජ්‍ය සේවකයින්, පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් හා අනෙකුත් මහජනතාවගෙන් සමන්විත පුද්ගලයින් 12,781 ක් සඳහා පවත්වන ලදී. තව ද, සාර්ථක ලෙස ණය සම්බන්ධතාවයන් 1,953 ක් ස්ථාපිත කරමින් ප්‍රාදේශීය කාර්යාල අදාළ ප්‍රදේශයන්හි ණය බෙදාදීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලද අතර විවිධ හේතු නිසා ණය වාරික ගෙවීමට දුෂ්කරතා මතුවී ඇති ණයකරුවන් උදෙසා ණය උපදේශන සේවා ද සපයා ඇත.

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මඟින් ව්‍යවසාය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා හා දැනුම, කුසලතා සංවර්ධනය, තාක්ෂණික හුවමාරු වැඩසටහන්/ක්ෂේත්‍ර චාරිකා හා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් රැසක් පවත්වන ලදී. ඒ අනුව, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, බදුකරණය සහ අලෙවිකරණය වැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා හා දැනුම ඇතුළත් වැඩසටහන් 80 ක් ප්‍රතිලාභීන් 4,476 ක් සඳහා පවත්වන ලදී. තව ද, ව්‍යවසායකයින් 103 ක් සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන්/ක්ෂේත්‍ර චාරිකා 09 ක් ද, ව්‍යවසායකයින් 6,860 ක් සඳහා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් ඇතුළුව කුසලතා සංවර්ධන වැඩසටහන් 132 ක් ද පවත්වන ලදී. මෙම ව්‍යවසායකයින් මූලිකවම කෘෂිකර්මාන්තය, කිරිපට්ටි පාලනය, විසිතුරු මල් වගාව, බිම්මල් වගාව, ආහාර සැකසුම් කර්මාන්තය, පාවහන් නිෂ්පාදනය, බතික් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය හා සංචාරක කර්මාන්තය වැනි අංශවලට අදාළව තම ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන අය වේ. එමෙන්ම, ප්‍රාදේශීය කාර්යාල විසින් වෙළෙඳපොළ සම්බන්ධතා ඇති කිරීම, ගැණුම්කරු - විකුණුම්කරු සාකච්ඡා හා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම යනාදිය මඟින් ව්‍යවසායකයින්ගේ අලෙවි කටයුතු ප්‍රවර්ධනය කරගැනීම සඳහා සහය ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 05 ක් සංවිධානය කරන ලද අතර ඒ තුළින් ව්‍යවසායකයින් 373 කු හට ප්‍රතිලාභ ලැබිණි.

ප්‍රාදේශීය කාර්යාල මහජනතාවටම විවෘත වූ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ තුළින් සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ ගැටළු විසඳාගැනීම, පළුදු වූ මුදල් නෝට්ටු හුවමාරු කර ගැනීම, මුදල් කෞතුකාගාර ප්‍රදර්ශන නැරඹීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනයන් සහ සමරු කාසි මිල දී ගැනීම සහ ණය ගැනීම් වලට අදාළ විසඳුම් ලබාගැනීම වැනි සේවා තුළින් පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලැබීය. මෙයට සමගාමීව, විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වෙළඳ ප්‍රදර්ශන ද පවත්වන ලදී. ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය ජන සමාජය මුහුණපාන ණයගැතිභාවය පිළිබඳ අධ්‍යනය කළ අතර 2018 වසර තුළ දී නුවරඑළිය, ත්‍රිකුණාමලය, හා අනුරාධපුරය යන ප්‍රදේශවල අධිපතිතුමාගේ සංචාර සමඟ ග්‍රාමීය ණයගැතිභාවය පිළිබඳ සමාලෝචන වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඒ තුළින් පුද්ගලයින් 1,290 කට ප්‍රතිලාභ සැලසිණි. මෙම සෑම වැඩසටහනකටම සමගාමීව බැංකු හා මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වෙනම වැඩසටහන් ද පවත්වන ලදී.

### 23.2 ප්‍රාදේශීය මට්ටමේ මහ බැංකුව නියෝජනය කිරීම

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු වලට අදාළ විවිධ වැඩසටහන් ප්‍රාදේශීයව ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු ප්‍රාදේශීය වශයෙන් ලබාදීමට ක්‍රියාකාරී ලෙස දායක වුණි. ඒ අනුව, අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ ගැටළු 91,931 කට අවශ්‍ය විසඳුම් ලබාදීමට හැකි විය. තව ද, වසර පුරා මුදල් කෞතුකාගාර පවත්වාගෙන යාම, සමරු කාසි හා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීම, දීප ව්‍යාප්ත දත්ත එකතු කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ආදිය ඇතුළත් විවිධ සේවා රැසක් සපයන ලදී. මීට අමතරව, පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන, තහනම් මූල්‍ය යෝජනා ක්‍රම, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ විදේශ විනිමය රෙගුලාසි ආදිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සිසුන් හා ගුරුවරුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම ද සිදුකරන ලදී. ඒ අනුව, වර්ෂය තුළ දී පුද්ගලයින් 17,516 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 155 ක් පවත්වන ලදී. තව ද, ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල විසින් ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුව පිළිබඳ සමීක්ෂණ හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳව සමීක්ෂණ ප්‍රාදේශීය වශයෙන් පැවැත්වීමට ද ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය. මීට අමතරව, ප්‍රාදේශීය කළමණාකරුවන් හා ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රාදේශීය ලෙස පවත්වන ලද රැස්වීම්, සාකච්ඡා හා විශේෂ අවස්ථා වලට සහභාගී වන ලදී.

## 24. නිරාකරණ හා බලගැන්වීම්

මුදල් මණ්ඩලය විසින් 2017 ජුනි 16 වැනි දින පැවැති එහි අංක 21/2017 දරන රැස්වීමේදී තීරණය කරන ලදුව, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට අනුබද්ධව පැවති බලගැන්වීම් ඒකකය වැඩි දියුණු කරමින්, 2018.01.01 දින සිට බලාත්මක වන පරිදි නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එහිදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තිබූ තැන්පතු රක්ෂණ ඒකකය ද නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද අතර නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර තිබූ විශේෂ පොලිස් ඒකකයද නව දෙපාර්තමේන්තුවෙහි විෂය පථය යටතට පත් කෙරිණ.

නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වනුයේ අර්බුදයන්ට මුහුණ දෙන මූල්‍ය ආයතනයනවල ගැටලු නිරාකරණය කිරීම, මූල්‍ය ආයතනවල නිලධාරීන් විසින් බැංකු පනතේ සහ මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන සහ වෙනත් අදාළ රෙගුලාසි සහ විධානයන් උල්ලංඝනය කිරීම, තහනම් යෝජනා ක්‍රම සහ අනවසර මූල්‍ය ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම යනාදිය සම්බන්ධව විමර්ශන පැවැත්වීම, තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම යනාදියයි. මෙකී අරමුණු ඉටු කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුව තුළ නිරාකරණ කටයුතු අංශය, බලගැන්වීම් අංශය සහ තැන්පතු රක්ෂණ අංශය වශයෙන් අංශයන් තුනක් ස්ථාපිත කර තිබේ.

### 24.1 අර්බුදයන්ට මුහුණ දුන් මූල්‍ය ආයතන සම්බන්ධ නිරාකරණ කටයුතු

නියාමනය කෙරෙන මූල්‍ය ආයතනවල නිරාකරණ කටයුතු පිළිබඳ පුළුල් ප්‍රතිපත්ති පද්ධතියක් මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව මගින් සකස් කෙරෙමින් පවතී. නිරාකරණ බලාධිකාරය සහ එය සතු නිරාකරණ කටයුතු සම්බන්ධ බලතල සඳහන් කරනු ලැබ ඇති, පවත්නා නියාමන ක්‍රියාවලිය පසුබිම් කර ගනිමින් එකී නිරාකරණ ප්‍රතිපත්තිය සකස් කෙරෙනු ඇත. මේ වන විට, බලපත්‍රලාභී බැංකු, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකටත්, බැංකු නොවන මූල්‍ය ආයතන, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකටත් වශයෙන්, නිරාකරණ බලතල සියල්ලම පාහේ පැවරී ඇත්තේ අදාළ නියාමන අධිකාරීන් වෙතය.

### 24.2 බලගැන්වීම් කටයුතු

නීතිමය බලගැන්වීම් කාර්යයන් සිදු වනුයේ පවත්නා නෛතික විධිවිධානවලට අනුකූලව ස්ථාපිත කර ඇති අනුමත මෙහෙයුම් පටිපාටීන් ඇතුළු අභ්‍යන්තර සැලසුම් යටතේය. ඒ අනුව, අනවසර මුදල් ව්‍යාපාරවලට අදාළ විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ද, තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වගන්තියේ විධිවිධාන යටතේ අධිපතිතුමා විසින් ද, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, බලයලත් නිලධාරීන් වශයෙන් පත් කරනු ලැබේ.

ඒ අනුව, 2018 වර්ෂයේදී සැක සහිත පිරමීඩාකාරයේ තහනම් යෝජනා ක්‍රම හතරක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරන ලද අතර ඒ අතරින් විමර්ශන දෙකකට අදාළ වාර්තා සහ නිගමන, නඩු පැවරීමේ කටයුතු උදෙසා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව, පිළිවෙළින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් නිම කරන ලද විමර්ශන දෙකකට සම්බන්ධ වාර්තා ද ඉදිරි පියවර සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබේ.

අනවසර මුදල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය ආයතනයක් සම්බන්ධව සිදු කළ විමර්ශනයකින් පසු, එම ආයතනයට එරෙහිව නීතිමය පියවර ගනු ලැබීය. මුදල් මණ්ඩලයේ නියෝගයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් ද එම ආයතනයට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ද නියමිතය. එම ආයතනයේ එක් අධ්‍යක්ෂවරයෙකු අත් අඩංගුවට ගෙන ඇති අතර අධිකරණ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන සිදු කෙරේ.

නිවාරණ ක්‍රියාමාර්ගයක් වශයෙන් බලගැන්වීම් අංශය විසින් දිවයින පුරා නිරන්තරයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය දැනුම වර්ධනය කිරීමටත්, ඔවුන්ට තහනම් යෝජනා ක්‍රම සහ නීති විරෝධී තැන්පතු ලබා ගැනීම යනාදී වංචනික ක්‍රියා සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමත් එම වැඩසටහන් මගින් අරමුණු කෙරේ. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව 2018 වසරේදී රටේ විවිධ ප්‍රදේශවල පොලිස් නිලධාරීන්, ප්‍රජා නායකයන් සහ සාමාන්‍ය ජනතාව උදෙසා පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 43 කි.

**II-25 සංඛ්‍යා සටහන**

**දැනුවත් කිරීමේ වැඩසටහන්**

| ඉලක්කගත කණ්ඩායම | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසු සිසුවියන් | 08 | 1,053 |
| රජයේ නිලධාරීන් | 16 | 2,058 |
| සාමාන්‍ය ජනතාව | 15 | 1,984 |
| පොලිස් නිලධාරීන් | 01 | 150 |
| ගුවන් සහ නාවික හමුදා නිලධාරීන් | 03 | 233 |
| මුළු ගණන | 43 | 5,478 |

### 24.3 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම

2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන සංඛ්‍යාව 75 ක් වූ අතර එහි අරමුදල රුපියල් බිලියන 53 ක් (විගණනයට පෙර) විය. එදිනටම, අරමුදල විසින් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති මුදල සහ ද්‍රවශීලතා උපකාරක පහසුකම යටතේ එක් සාමාජික ආයතනයක් වෙත 2014 වසරේදී ලබා දුන් ණය මුදල පිළිවෙළින් රුපියල් බිලියන 49.8 ක් සහ 1.9 කි. යෝජනා ක්‍රමයට අදාළ විශේෂ මූල්‍ය තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

**II-26 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුදල් පිළිබඳ දත්ත**

| අයිතමය | අගය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | 2017.12.31 දිනට කණ්ඩායම | 2018.12.31* දිනට කණ්ඩායම |
| අරමුදලේ ප්‍රමාණය | 44,123 | 53,710 |
| මුළු ආදායම | 12,115 | 14,024 |
| මුළු වියදම | 2,249 | 3,240 |
| වාර්ෂික ලාභය (බදුවලට පෙර) | 9,866 | 10,784 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 39,646 | 49,843 |
| ණය සහ ලැබිය යුතු මුදල් | 6,129 | 1,902 |
| අලෙවියට තැබූ වත්කම් සංචිත | 2,392 | (1,528) |

* අපේක්ෂිත

(අ) ආසන්නතම මූල්‍ය වර්ෂය අවසානයේදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සියයට 14 ක් හෝ ඊට වැඩියෙන් පවත්වා ගන්නා බලපත්‍රලාභී බැංකු, සිය සුදුසුකම් ලත් මුළු තැන්පතුවලින් සියයට 0.1 ක වාරිකයක් ද, අනෙකුත් සියලු බැංකු සියයට 0.125 ක වාරිකයක් ද ගෙවිය යුතුවේ. බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වන වාර්ෂික වාරික අනුපාතය වනුයේ 0.15 කි. සාමාජික ආයතන වෙතින් 2018 වසරේදී ලැබුණු වාරික ගෙවීම් සහ දඩ මුදල්වල එකතුව රුපියල් බිලියන 8.8 කි.

(ආ) 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි එක් ආයතනයක එක් තැන්පතුකරුවෙකු සඳහා වන තැන්පතු රක්ෂණ ආවරණය රුපියල් 600,000 ක් වේ.

### 24.4 අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම

අර්බුදයන්ට මුහුණ දුන් සාමාජික ආයතන දෙකක් වන සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කරන ලද බලපත්‍ර, පිළිවෙළින් 2108.03.05 දින සහ 2018.07.25 දින සිට බලාත්මක වන පරිදි අවලංගු කිරීමට මුදල් මණ්ඩලය අනුමැතිය ලැබුණු අතර ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය සම්බන්ධ රෙගුලාසි යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම 2018.08.27 සිට ආරම්භ කරන ලදී. 2018.12.31 දින වන විට එලෙස ගෙවා තිබූ මුළු වන්දි මුදල් ප්‍රමාණය රුපියල් 601,539,494.66 ක් විය.

## 25. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති අරමුණු කරා ළඟා වීමේදී විවිධාකාර වූ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් රැසකට මුහුණ දෙනු ලබයි. මෙම අවදානම්වලින් ඇතිවිය හැකි බරපතල වූ හානිකර බලපෑම් පාලනය කරනු වස්, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ නිසි පරිදි සැලසුම් කළ අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒකාබද්ධ වූ ප්‍රවේශයක් මගින් අවදානම් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික වැදගත්කම සහ සම්ප්‍රදායික ඒකපාර්ශවීය අවදානම් දැක්මේ පවත්නා වූ දුර්වලතාවයන් අවධාරණය කර ගැනීමත් සමගම 2015 වසරේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට කටයුතු යෙදුණි. ඒ අනුව 2018-2020 වර්ෂයන් සඳහා මහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවයන් ලෙස අවදානම් කළමනාකරණය පිළිගනු ලැබූ අතර, මහ බැංකුව සඳහා ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් (Enterprise-wide Risk Management Framework) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් දැනට සිදු වෙමින් පවතී. මෙම රාමුවෙහි මූලික අරමුණ වන්නේ බැංකුවේ සියලුම ස්ථරයන් තුළ අවදානම පිළිබඳ දැනුම්වත් ව තීරණ ගැනීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමයි.

2018 ජූලි මාසයේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් යහපාලන රාමුව, අවදානම් යහපාලන හා අවදානම් කළමනාකරණ ව්‍යුහයන්ගෙන් සමන්විත වන අතර,

බැංකුව විසින් මුහුණ දෙන මූල්‍යමය හා මූල්‍යමය නොවන අවදානම් මෙමගින් ආවරණය වේ. අවදානම් යහපාලන ව්‍යුහය මුදල් මණ්ඩලයෙන් ද (Monetary Board), මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව (Board Risk Oversight Committee) සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව (Monetary Board Advisory Audit Committee) යන අනු කමිටු වලින්ද සමන්විත වේ. මුදල් මණ්ඩලය විසින් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකත්වය ද අවසාන වගකීම ද දරනු ලැබේ. තවද බැංකුවේ අවදානම් අභිරුචිය හා තිතික්ෂාව (Risk Appetite and Risk Tolerance) තීරණය කිරීමත්, අනුමත කිරීමත් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් වේ.

2018 වසරේ අගෝස්තු මස මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව ස්ථාපිත කරන ලද අතර, එය මුදල් මණ්ඩලයේ ස්වාධීන සාමාජිකයකු වන ක්‍රිෂාන්ත පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් ද, බාහිර විශේෂඥ දෙපලකගේ සාමාජිකත්වයෙන් ද (01.08.2018 සිට 05.10.2018 දක්වා හැටන් නැෂනල් බැන්ක් ඇෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂ රවී අබේසූරිය මහතා සහ 05.10.2018 සිට අද දක්වා බ්‍රැන්ඩික්ස් සමාගමේ සභාපති/බොස්ටන් උපදේශක සමූහයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ප්‍රියාන් ප්‍රනාන්දු මහතා) ක්‍රියාත්මක වේ. මෙම කාරක සභාවේ මූලික වගකීම වන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ හා අනුකූලතා කාර්යයන් අධීක්ෂණය කරනු ලැබීමත්, මේ සඳහා පුළුල් උපායමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත් ය. මීට අමතරව බැංකුව තුළ අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය කෙරෙහි විශේෂ අවදානමක් පවත්වාගෙන යාමටද මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහාය ලබා දේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය තෙවැදෑරුම් ආරක්ෂණ පිළිවෙතක් (Three Lines of Defence Model) අනුව සිදු කෙරේ. මෙහි ප්‍රථම පෙළ ආරක්ෂණ කටයුතු සඳහා වගකීම දරනු ලබන මෙහෙයුම් දෙපාර්තමේන්තු විසින් අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, පාලනය කිරීම, අවම කිරීම සහ බැංකුවේ අරමුණු සමග ගැලපෙන පරිදි අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

දෙවන පෙළ ආරක්ෂණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, නිසි යොමු කිරීම හා මග පෙන්වීම සඳහා කටයුතු සම්බන්ධීකරණය කිරීම තුළින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් සුමට කරනු ලබයි.

ඉදිරියේදීත් අඛණ්ඩව අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා ආයතනික සැලසුම් සැකසීම, අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම ආදී අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධිත අංගයන් වැඩිදියුණු කිරීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරනු ඇත.

තෙවන පෙළ ආරක්ෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියාකරන අභ්‍යන්තර විගණනය මගින් යහපාලනය, අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනයන් හි කාර්යක්ෂමතාවයද, ප්‍රථම හා දෙවන පෙළ ආරක්ෂණ ක්‍රමවේද මගින් අවදානම් කළමනාකරණය සම්බන්ධිත අරමුණු නිසිආකාරව සපුරාලන බවද තහවුරු කිරීමක් සිදු කරන අතර, තෙවැදෑරුම් ආරක්ෂණ ක්‍රමවේදය බැංකුවේ අවදානම් යහපාලන රාමුව තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

තෙවදෑරුම් ආරක්ෂක ක්‍රමවේදය යටතේ මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු වල මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීමට අමතරව, විදේශ සංචිත හා අභ්‍යන්තර අරමුදල මෙන්ම රජය සඳහා නියෝජිත සේවාවක් ලෙස ක්‍රියාත්මක වන සේවක අර්ථසාධක අරමුදල යන අරමුදල්වල මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම ද, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතුය. අභ්‍යන්තර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදලට අදාළ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් සහ ආයෝජන මාර්ගෝපදේශයන් ප්‍රතිශෝධනය කිරීම සහ අරමුදල් කළමනාකරණ අධීක්ෂණය සඳහා වන ආයෝජන අභිප්‍රේක්ෂණ කමිටු ස්ථාපිත කිරීමට කටයුතු කිරීමත් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. අරමුදල් කළමනාකරණ ක්‍රියාදාමයන්ට අදාළ වෙළඳපොළ අවදානම සහ ණය අවදානම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ස්වාධීනව නිරීක්ෂණය කර ඒවායින් ඇතිවන අවදානම් තත්ත්වයන් කළමනාකාරිත්වයට වාර්තා කරන ලදී. විදේශ සංචිත කළමනාකරණ කමිටුවෙහි මාසික රැස්වීම් වලදී වෙළඳපොල සහ ණය අවදානම් දර්ශකයන් මෙන්ම ආයෝජන උපායමාර්ග සහ ගෝලීය වෙළඳපොල තුළ සිදු වන වර්ධනයන් පිළිබඳ නිරීක්ෂණ ද අවදානම් කළමනාකරණ දෘෂ්ඨි කෝණයකින් ඉදිරිපත් කරන ලදී. ඒ හා සමානව, අභ්‍යන්තර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල යන අරමුදල් වලට අදාළ අවදානම් සහ අනුකූලතාවයන් සාකච්ඡා කිරීම සඳහා ආයෝජන අභිප්‍රේක්ෂණ කමිටුවල කාර්තුමය රැස්වීම් කැඳවන ලදී.

නව අවදානම් කළමනාකරණ රාමුව සමග අනුගත වෙමින්, මහ බැංකුව තුළ අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් පිළියෙල කිරීම ද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලියේ දී අවදානම් කළමනාකරණය සඳහා වූ පිළිගත් තත්ත්වයන් සහ මාර්ගෝපදේශ අනුගමනය කර, විවිධ පාර්ශවයන් සඳහා පැහැදිලි ලෙස අවදානම් හිමිකම සහ වගකීම පැවරීමට කටයුතු සිදු කරනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවට පොදුවේ බලපෑ හැකි මූල්‍ය නොවන අවදානම් හඳුනා ගැනීම සඳහා මූල්‍ය මණ්ඩලය ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්වය අතර සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයෙහි ප්‍රතිඵල ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා වන අවදානම් වර්ගීකරණයක් සැකසීමට උපයෝගී කරගන්නා අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට බලපෑ හැකි මූල්‍ය නොවන අවදානම් වල ප්‍රමුඛතාව හඳුනාගෙන මහ බැංකුවේ කළමනාකාරිත්වයේ වැඩි අවධානයක් එම හඳුනාගත් අවදානම් කෙරෙහි යොමු කිරීමට බලාපොරොත්තු වේ.

මහ බැංකුව තුළ අවදානම් කළමනාකරණය කිරීමේ සංස්කෘතියක් බිහිකිරීමේ වැදගත්කම හඳුනාගනිමින් අවදානම්

කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ බාහිර සම්පත් දායකයන්ගේ සහභාගිත්වයෙන් යුතුව අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

ලෝක බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂක අමදි ප්‍රොවොස්ට් මහතා සහ එහි කළමනාකාර රියාස් අහමඩ් මහතා 2018 ඔක්තෝබර් මස දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැමිණ ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් මහ බැංකුවේ නිලධාරීන් සමඟ බෙදාගත් අතර, මහ බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහය ලබා දීමේ දිගුකාලීන වැඩපිළිවෙළක් ගැන ද සාකච්ඡා කරන ලදී.

ඉදිරියේදී, ශ්‍රී ලංකා මහ බැංකුවට බලපෑමක් කළ හැකි ලෙස මතුවෙමින් පවතින අවදානම් මෙන්ම, මහ බැංකුවේ අවදානම් අභිරුචිය අභිබවා යන පරිදි, අත්පත් කර ගෙන ඇති අවදානම් ද නිසි ලෙස හඳුනාගෙන, කාලානුරූපී ව අවශ්‍ය පිළියම් යෙදීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පරිශ්‍රම දරනවා ඇත. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුවේ මෙහෙයුම් දෙපාර්තමේන්තු සමඟ එකතුවී එම දෙපාර්තමේන්තු වලට අදාළ අවදානම් ලේඛනයන් පියවරෙන් පියවර (Risk Registers) පිළියෙල කිරීමට කටයුතු කරමින් සිටී. මෙම අවදානම් ලේඛනයන් සමස්ත බැංකුවේම මෙහෙයුම් ආවරණය වන පරිදි සංගත හා සමරූපී ආකාරයේ අවදානම් මැනීමේ හැකියාවක් ලබා දේ. තවද, ඒ මගින් කළමනාකාරිත්වයට අවදානම් ඇගැයීම හා පිළියම් යෙදීම කාලානුරූපව සිදු කිරීමට හැකි වන පරිදි අවදානම් පිළිබඳ තොරතුරු ලබාදීම සිදු කරයි.

මහ බැංකුවට බලපෑම් සිදු විය හැකි ආකාරයේ අවදානම් සිද්ධීන් කළමනාකාරිත්වයට වාර්තා කිරීම තුළින් එවන් අවදානම් සිද්ධීන් වලට මුල් වන හේතු සඳහා සුදුසු පිළියම් යෙදීමට හැකි වන පරිදි සිද්ධි වාර්තා කිරීමේ පද්ධතියක් 2019 වසර තුළදී ක්‍රියාත්මක කිරීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සැලසුම් සකස් කරමින් සිටී. බැංකුවේ සෑම ස්ථරයකම සේවකයන්ට මෙම මාර්ගගත සිද්ධි වාර්තා කිරීමේ පද්ධතියට ප්‍රවේශ වීමේ හැකියාව ඇත. මෙය පාලන වටපිටාව ශක්තිමත් කිරීමට මෙන්ම මහ බැංකුවට සිදු වන ඍණාත්මක බලපෑම් වලට විරුද්ධ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සහතික කරන අතරම, අවදානම් විශ්ලේෂණයට සහ ඇගයීමට, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමට, ඇති විය හැකි උපනතීන් සහ අනතුරු හැකියාවන් හඳුනා ගැනීමට සහ අවදානම් අඩු කිරීමේ මිනුම් දියුණු කිරීමට පාදක වන මධ්‍යගත අනතුරු සිද්ධි ගබඩාවක් ගොඩනැගීමට ද උපකාරී වේ. මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳ සැලකීමේදී, අරමුදල් කළමනාකරණයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගනුදෙනු කරන ප්‍රතිපාර්ශවයන්, නිකුතුකරුවන් සහ භාරකරුවන් සඳහා අදාළ වන ණය අවදානම් කළමනාකරණ රාමුව දියුණු කිරීමේ අරමුණින් දැනට පවත්නා ණය අවදානම් ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශන නැවත සලකා බැලීමක් සිදු කිරීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අවධානය යොමු කරමින් සිටියි.

## 26. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එමගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැළසීම, සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු සිදු කිරීම, අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම සහ නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වේ.

**(අ) ප්‍රසම්පාදන කළමනාකරණය**

ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව 2018 වර්ෂය තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ටෙන්ඩර් පටිපාටිය මෙන්ම ටෙන්ඩර් නොවන ක්‍රමවේද යටතේ ද භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. මෙම වර්ෂය සඳහා පිළියෙළ කරන ලද ප්‍රසම්පාදන සැළැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යන ලදී. ඊට අමතරව බැංකුවේ අවශ්‍යතාව පරිදි හදිසි ප්‍රසම්පාදන කටයුතු ද කරගෙන යන ලදී.

**(ආ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

දෙදහස් දෙසීයකට අධික ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙනුවෙන් මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ ඊට අදාළ ලිපි ලේඛන කටයුතු ලේකම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම සහ ජීවන සහතික සයමාසිකව ලබා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීති රීතිවලට යටත්ව මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී.

**(ඇ) මහ බැංකු සේවා නියුක්තයන්ගේ විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැළසීම**

සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු, කෙටි කාලීන විදේශ පුහුණු සංචාර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ රාජකාරි විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ දී පහසුකම් සලසන ලදී. මේ සම්බන්ධයෙන් ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට, වෙනත් පුහුණු ආයතනවලට සහ රාජකාරිමය වශයෙන් විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලදී. මීට අමතරව, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට්පත් මිල දී ගැනීම සහ විදේශ සංචාර රක්ෂණය ලබා දීම මගින් ලේකම් දෙපාර්තමේන්තුව විදේශගත වන කාර්ය මණ්ඩලය සඳහා සහාය වන ලදී.

**(ඈ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම**

2018 වර්ෂය තුළ දී යල්පිනූ, අබලන් වූ, සේවාකරණය කළ නොහැකි, අලුත්වැඩියා කළ නොහැකි සහ අතිරික්ත කාර්යාලීය උපකරණ, ලී බඩු සහ වෙනත් ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කරන ලදී. බැංකුවේ එවැනි වත්කම් සමීක්ෂණය කිරීම සහ සමීක්ෂණ මණ්ඩලය මඟින් ලබා දුන් නිර්දේශ අනුව ඒවා බැහැර කිරීම, බැහැර කිරීම් කළමනාකරණ ක්‍රියාවලියට අයත් විය.

**(ඉ) නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් පරිපාලන කටයුතු සිදු කිරීම**

ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශේෂ නිවාඩු, හදිසි අනතුරු නිවාඩු, දීර්ඝ කරන ලද අසනීප නිවාඩු, රාජකාරී නිවාඩු සහ අඩ වැටුප් සහිත මාතෘ නිවාඩු සම්බන්ධයෙන් නිවාඩු රීති ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව බැංකුවේ වෘත්තීය සංගම් හා වෙනත් සමිති සංවිධානවලට සපයනු ලබන සේවාවලට අදාළ ලිපි ලේඛන කටයුතු ද සිදු කරන ලදී. එසේම ලේකම් විසින්, ප්‍රසිද්ධ නිවේදන, රැස්වීම් සහ සේවා නියුක්තයන් අතර පොදු විද්‍යුත් ලිපි සංසරණය කිරීම සඳහා අනුමැති ලබා දීම ද සිදු කරන ලදී.

**(ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම**

මහ බැංකු අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය සහ සන්ධාන සේවා අධිපති ලේකම් කාර්යාලය විසින් සපයන ලදී. ඒ අනුව, අධිපතිතුමාගේ නිල හමුවීම් හා රැස්වීම් සංවිධානය සහ දේශන හා ලිපි සඳහා කෙටුම්පත් සකස් කිරීම කාර්යාලයීය කටයුතුවලට අයත් විය. අධිපතිතුමාගේ දේශීය සහ විදේශීය නිල සංචාර සංවිධානය කිරීම, අධිපතිතුමාගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ මහ බැංකුවේ හා අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය පහසුකම් සැපයීම සන්ධාන කටයුතුවලට අයත් විය.

**(උ) වෙනත් කටයුතු**

ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපල් කාමර සේවාව මඟින් එන සහ යන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් සළසන ලදී. ලේකම් දෙපාර්තමේන්තුව සිය ලිපිද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය තුළින් එදිනෙදා අවශ්‍යතාවන්ට සෑහෙන තරම් ලිපිද්‍රව්‍ය තොග ගබඩා කර තබා ගත් අතර ඒවා කලට වේලාවට අනෙකුත් දෙපාර්තමේන්තුවලට නිකුත් කිරීම සිදු කරන ලදී. බැංකුව වෙනුවෙන් උත්සව සංවිධානය කිරීම ද ලේකම් දෙපාර්තමේන්තුවේ තවත් වැදගත් කාර්යභාරයක් විය.

# 27. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළ දී ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ට, එහි අමුත්තන්ට, දේපළවලට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලද අතර පහත සාරාංශගත කර ඇති පරිදි ක්‍රියා පද්ධති වැඩිදියුණු කිරීමේ හා සේවකයන් පුහුණු කිරීමේ කාර්යයන්හී ද නියැලුණි.

## 27.1 පද්ධති වැඩි දියුණු කිරීම

වර්ෂය තුළදී, මහ බැංකු මූලස්ථානයේ හා අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කර තිබූ සියලු ගිනි නිවීමේ උපකරණයන්හි ක්‍රියාකාරී යෝග්‍යතාව නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම, අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරන ලදී. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ හා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් රාජගිරියේ පිහිටි බැංකු විදු පියසෙහි 'සවරින්' අධ්‍යයන අංශය සඳහා වෙනම ප්‍රවේශ පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ආරම්භක පියවර ගන්නා ලදී. ගෙවීම් සහ පියවීම් හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු මගින් පවත්වන ලද සියලුම රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමේ පුහුණු කටයුතු සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහභාගිවීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## 27.2 පුහුණුවීම්

**(අ) ගිනි අනතුරු වැළැක්වීම, ගිනි නිවීම සහ ප්‍රථමාධාර වැඩසටහන්**

මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද ගිනි අනතුරු ආරක්ෂණ නිලධාරීන් සඳහා කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව, ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණ පිළිබඳව දින දෙකක පෘථුල වැඩසටහනක් 2018 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලදී. මීට අමතරව 2018, මාර්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයින් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි අනතුරු සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී.

**(ආ) කුසලතාවයන් හා දක්ෂතාවයන් ඔප්නැංවීම**

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවය වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ද පිළියෙළ කරන ලදී. මෙම අධ්‍යයන වැඩසටහන් ආරක්ෂක, තොරතුරු තාක්ෂණය සහ පාරිභෝගික සම්බන්ධතා ආදී ප්‍රධාන අංශ ආවරණය කරන ලදී.

**(ඇ) අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගය ඇතිව සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි තැබීමේ පුහුණුවක් වර්ෂයේ අවසාන කාර්තුවේ දී ලබා දෙන ලදී.

**(ඈ) 2018 දෙසැම්බර් මාසයේදී පුහුණු ආරක්ෂක නිලධාරීන් 21ක් බඳවා ගන්නා ලදී.**

# 28. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක) සුහසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රතිලාභීන් වෙත ලබා දීම මෙම වසර තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුහසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේව්‍ය දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් සහ ආපනශාලා පහසුකම් සැපයීම මෙම සේවාවන්වලට අයත් විය. 2018 වසර අවසාන වන විට සේවා නියුක්තයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,000 ක් පමණ විය.

2018 වසර තුළදී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් සහ කාර්යමණ්ඩල සුහසාධන ණය ක්‍රමයන් යටතේ වාහන ණය, පරිගණක ණය, වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 1,551 ක් ප්‍රදානය කරන ලදී. ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂමව සේවානියුක්තයන්ට ණය ලබා දීම අධීක්ෂණය කිරීමට හැකි විය.

මහ බැංකු ආපනශාලාව මගින් බැංකු කාර්ය මණ්ඩලයට උදේ ආහාරය සහ දවල් ආහාරය සාධාරණ මිලකට ලබාදීම මෙම වසර තුළදී ද සිදු කරන ලදී. තවද, 2018 වසර තුළදී ආපනශාලාවල තත්ත්වය සහ පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම ප්‍රතිලාභීන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීමට කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කටයුතු කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ප්‍රතිපූරණය කරන ලද මුළු වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට හතකින් ඉහළ ගොස් ඇත. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් බාහිර පාර්ශවයක් හරහා සපයනු ලබන වෛද්‍ය පහසුකම්, මහ බැංකු සේවා නියුක්තයන් වෙත කාර්යාල වේලාවන් තුළ දී සපයන ලදී. සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කිරීමට ද පියවර ගන්නා ලදී. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවානියුක්තයන් දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් සළකා බලන වර්ෂය තුළදී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී. ඒවානම්, "සිරස හා ගෙල අතර ලෙඩකට නොදෙමු අවසර", "ඔබ තුළ සිටින දක්ෂයා හඳුනාගන්න" සහ "රුකවරණය මැද වැඩිහිටි ළමා දිවි ඇයි මේ තරම් කෙටි" යන දේශනයන්ය.

# 29. සංඛ්‍යාන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2018 වසරේ දී ද අඛණ්ඩව දායක විය. මහ බැංකුව විසින් ක්‍රමිකව අනුගමනය කිරීමට නියමිත 'නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණය' නම් වූ නව මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ භූමිකාව තවදුරටත් පුළුල් විය. මෙම නව මුදල් ප්‍රතිපත්ති රාමුව කෙරෙහි නැඹුරු වීම පහසු කිරීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නව කාර්යයන් කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2018 වසර තුළ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරට (1) ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර මගින් දත්ත සහ තොරතුරු රැස් කිරීම (2) ව්‍යාපාර මත, දේපල මිල සහ වැටුප් යනාදියට අදාළ දර්ශක සම්පාදනය කිරීම (3) කෙටිකාලීන ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක පුරෝකථනය කිරීම (4) ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ පළාත් දළ දේශීය නිෂ්පාදිතය වැනි කලාපීය සංඛ්‍යාන සම්පාදනය කිරීම (5) දත්ත සංචිතය, ප්‍රකාශන, වාර්තා සහ පුවත්පත් නිවේදන මගින් නිතිපතා ප්‍රමාදයකින් තොරව තොරතුරු බෙදා හැරීම (6) ගෝලීය ශ්‍රේණිගත කිරීම් තුළ ශ්‍රී ලංකාවට හිමිවන ස්ථානය පිළිබඳ අවධානය යොමු කිරීම ඇතුළත් විය. තවද, දේශීය සහ ජාත්‍යන්තර ආයතනයන් විසින් සිදු කරන ලද මානව හැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපැයීමට ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

## 29.1 සමීක්ෂණ හා වෙනත් මූලාශ්‍ර මගින් දත්ත එකතු කිරීම

### (අ) ව්‍යාපාර මත පිළිබඳ සමීක්ෂණ

ආර්ථිකයේ ඉදිරි වර්ධනයන් පිළිබිඹු කරන මූලික සාධක ලෙස සැලකෙන, පවතින ආර්ථික තත්ත්වය සහ කෙටිකාලීන වෙළෙඳපොළ ප්‍රවණතා අධීක්ෂණය කිරීම සඳහා කාර්තුමය පදනම මත සිදුකරනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය (Business Outlook Survey - BOS) 2018 වසර තුළ දී ද අඛණ්ඩව සිදුකරන ලදී. ආර්ථිකයේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශයන් ආවරණය වන පරිදි තෝරා ගත් මහා පරිමාණ ව්‍යාපාර ඒකක මෙම සමීක්ෂණයේ ඉලක්ක ගත සංගහනය වේ.

දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පුරෝකථනය සඳහා පූර්ව දැනුම් දීමේ දර්ශක ලෙස භාවිතා කරන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (Purchasing Managers' Index - PMI) පිළිබඳ සමීක්ෂණය, නිෂ්පාදන, සේවා හා ඉදිකිරීම් කටයුතුවලට අදාළව මාසිකව සිදු කරන ලදී. තවද, රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා පර්යේෂකයන්, ආර්ථික විශ්ලේෂකයන්, ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂඥයන් සහ ව්‍යාපාර පිළිබඳ තීරණ ගන්නන් විසින් මෙම දර්ශක උපයෝගී කර ගනු ලබයි. නිෂ්පාදන සහ ඉදිකිරීම් කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පිළිබඳ සමීක්ෂණ සඳහා එම කර්මාන්තවල ගැනුම් කළමනාකරුවන් ද, සේවා කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය සඳහා එම ආයතනවලින් නම් කරන ලද ව්‍යාපාර කටයුතු පිළිබඳ මනා දැනුමක් සහිත නිලධාරීන් ද ඉලක්කගත සංගහනය ලෙස යොදා ගැනේ. ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් පවත්වා ගෙන යනු ලබන නිෂ්පාදන හා සේවා ආයතන 100 බැගින් වූ නියැදි ඉලක්ක කර ගනිමින් සෑම මසකම අවසාන සතිය තුළ දී මෙම නිෂ්පාදන හා සේවා අංශ සඳහා වන සමීක්ෂණ සිදු කරන ලදී. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (Construction Industry Development

Authority - CIDA) ලියාපදිංචි වී ඇති ආයතන අතුරින් තෝරාගනු ලැබූ ප්‍රධාන ඉදිකිරීම් ආයතන ආවරණය කරමින්, ඉදිකිරීම් අංශය සඳහා වූ සමීක්ෂණය මාසිකව සිදු කරන ලදී.

ණය වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය තත්ත්වය පිළිබඳ සමීක්ෂණ 2018 වසර තුළ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සැලකීමේ දී, බස්නාහිර පළාත තුළ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලින් ආවරණය වන පළාත් තුළ ක්‍රියාත්මකව පවතින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය මගින් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු ආවරණය කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපයෝගි කර ගැනීම සඳහා අර්ධ වාර්ෂික පදනමින් කළමනාකාරිත්වය වෙත වාර්තා කරන ලදී.

### (ආ) උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

2006 වසරේ දී හඳුන්වා දෙන ලද උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව මාසිකව සිදුකරනු ලබයි. වර්තමානයේ දී මෙම සමීක්ෂණයට, ආයතනික, ගෘහස්ථ සහ අධ්‍යයන යන ප්‍රධාන අංශ තුන යටතේ ප්‍රතිචාර දක්වන්නන් ඇතුළත් වේ. 2018 වසරේ අවසන් කාර්තුව තුළ, ගෘහස්ත අංශයේ නියෝජනය සහ තොරතුරු නිරවද්‍යතාව වර්ධනය කිරීම අරමුණු කොටගෙන දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළෙහි ගුරු සමීක්ෂකවරුන් ද ප්‍රතිචාර දක්වන්නන්ගේ කාණ්ඩයට ඇතුළත් කරගන්නා ලදී. මෙම ප්‍රතිචාර දක්වන්නන් විසින් පවත්නා කාලය තුළ සහ ඉදිරි මාස 12 ක කාලයක් දක්වා කාලය තුළ අපේක්ෂිත උද්ධමනය පිළිබඳ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. සමීක්ෂණයේ ප්‍රතිඵල, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපයෝගී කර ගැනීම සඳහා මාසිකව කළමනාකාරිත්වයට වාර්තා කරන ලදී.

### (ඇ) ශ්‍රම බලකායේ තොරතුරු සහ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය

සමස්ත ශ්‍රම වෙළෙඳපොළ දත්ත විශ්ලේෂණය සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ වෙනත් දත්ත සපයන්නන්ගෙන් ලබා ගත් තොරතුරු රටෙහි සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාව යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලදී. එසේම ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහාය වීම සඳහා ජාතික හා අන්තර්ජාතික ආයතන සමග සහයෝගීතාවයෙන් දත්ත හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි වර්ධනය නිර්ණය කිරීම සඳහා, සියලුම රාජ්‍ය ආයතන ආවරණය වන පරිදි රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව පෙර වසරවලදී අර්ධ වාර්ෂිකව පවත්වනු ලැබූ සමීක්ෂණය 2018 වසරේ සිට වාර්ෂිකව පවත්වන ලදී. මීට අමතරව, 2018 වසරේ සිට මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ දත්ත සපයනු ලබයි. මෙලෙස රැස්කර ගත් දත්ත විශ්ලේෂණය කර ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ප්‍රකාශන මගින් මහජනතාවගේ පරිශීලනය උදෙසා ඉදිරිපත් කරන ලදී.

### (ඈ) පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතු පිළිබඳ සමීක්ෂණය

දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමේ දී පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතුවල ප්‍රවණතාවන් ග්‍රහණය කර ගැනීමේ අරමුණින් නව දර්ශකයක් හඳුන්වාදීම උදෙසා සැලසුම් කරන ලද මෙම සමීක්ෂණය 2018 වසරේ දී ද කාර්තුමය වශයෙන් සිදු කරන ලදී. මෙහිදී, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලයේ ලියාපදිංචි වී ඇති රෝහල්වල නියැදියක් භාවිතා කරමින් මාසික දත්ත කාර්තුමය පදනම මත ලබා ගන්නා ලදී. පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන්හි ප්‍රවණතා ග්‍රහණය කර ගැනීම සඳහා බාහිර රෝගීන් ගණන හා නේවාසික රෝගීන් ගණන පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලදී. මෙම සමීක්ෂණය පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන්හි එකතු කළ අගයෙහි වර්ධනය පුරෝකථනය කිරීම සඳහා දර්ශකයක් ලෙස යොදා ගන්නා ලදී.

### (ඉ) සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳාම් කටයුතු පිළිබඳ සමීක්ෂණය

සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම්වල ප්‍රවණතාවන් ග්‍රහණය කර ගැනීමේ අරමුණින් 2017 වසරේ දී ආරම්භ කළ මෙම සමීක්ෂණය කාර්තුමය පදනමින් 2018 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් දර්ශක පදනම් කොටගෙන ද.දේ.නි. පුරෝකථනය කිරීමේ දී, මෙම සමීක්ෂණය මගින් එකතු කරන ලද දත්ත භාවිතයෙන් කාර්තුමය පදනම මත සම්පාදනය කරන ලද සුපිරි වෙළඳසැල් විකුණුම් පිරිවැය දර්ශකය ද යොදා ගන්නා ලදී. රටෙහි නව්‍ය සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම්වල ඉදිරි ප්‍රවණතාවන් හඳුනා ගනිමින් ආර්ථිකයේ පාරිභෝගික වියදම් රටා විශ්ලේෂණය කිරීම සඳහා සමීපස්ථ දර්ශකයක් ලෙස ද මෙම දර්ශකය යොදා ගන්නා ලදී.

### (ඊ) සහාධිපත්‍ය වෙළෙඳපොළ පිළිබඳ සමීක්ෂණය

සහාධිපත්‍ය දේපළවල තථ්‍ය විකුණුම් මිල, ඉල්ලුම, මිල වෙනස් වීම් සඳහා බලපාන හේතු, දැනට පවතින හා ඉදිරියේ දී ඉදිකිරීමට බලාපොරොත්තුවන නිවාස ඒකක ප්‍රමාණය, එක් එක් ව්‍යාපෘතිවල දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක ප්‍රමාණය, නිවාස ගැනුම්කරුවන්ගේ තොරතුරු සහ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ වෙළෙඳපොළ පිළිබඳ ඉදිරි දැක්ම යන ප්‍රාථමික දත්ත එක් රැස් කර ගැනීමේ අරමුණින් මෙම කාර්තුමය සමීක්ෂණය 2017 වසරේ දී ආරම්භ කරන ලදී. සමීක්ෂණයට අදාළ භූගෝලීය ආවරණය සමීක්ෂණය සඳහා සහභාගී වූවන් විසින් ව්‍යාපෘති ඉදිකෙරෙන ප්‍රදේශවලට පමණක් සීමා වේ. මෙමගින් එක්රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීම මගින් හඳුනාගන්නා ලද සහාධිපත්‍ය අංශයේ සිදුවන මිල ප්‍රවණතා සහ අනෙකුත් වෙළෙඳපොළ තොරතුරු, ප්‍රතිපත්ති සම්පාදනයේ දී උපයෝගී කර ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

**(උ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය පිළිබඳ සමීක්ෂණය**

ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සපයන්නන්ගේ සංගමයේ (SLASSCOM) සහයෝගය ඇතිව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (Information and Communication Technology - Business Process Management - ICT-BPM) අංශයේ ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා වෙන් වූ ව්‍යාපාර තත්ත්ව පිළිබඳ සමීක්ෂණයක් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2018 ජුනි මාසයේ දී හඳුන්වා දෙනු ලැබීය. ද.දේ.නි. පුරෝකථනය කිරීමේ ක්‍රියාවලියේ දී සමීපස්ථ දර්ශකයක් ලෙස යොදා ගත හැකි වීම, ද.දේ.නි. ඇස්තමේන්තු කිරීමේ දී සලකා බැලීම සඳහා මෙම තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සමග හුවමාරු කරගත හැකි වීම සහ ව්‍යාපාර පිළිබඳ තීරණ ගන්නන් හා ආර්ථික විශ්ලේෂකයන්හට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයේ ව්‍යාපාර තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි පරිදි දත්ත හුවමාරු කර ගත හැකි වීම මෙම සමීක්ෂණයේ ප්‍රතිලාභ වේ.

**(ඌ) අවශ්‍යතාව මත පවත්වන සමීක්ෂණ**

**උතුරු මැද පළාතේ කුටුම්භ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය**

කුටුම්භ අංශයේ වර්ධනය වන ණය ප්‍රවණතාවන් සහ එමගින් මූල්‍ය අංශයේ ව්‍යාපාර ස්ථායීතාව කෙරෙහි මෙන්ම අඩු ආදායම්ලාභී පවුල් ණයගැතිභාවයට පත් වීම නිසා ගෘහ ආර්ථිකය කෙරෙහි ඇති විය හැකි බරපතල ප්‍රතිවිපාක හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව සමග එක්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත තුළ කුටුම්භ අංශයේ ණයගැතිභාවය තවදුරටත් අධීක්ෂණය සඳහා සමීක්ෂණයක් දියත් කරන ලදී. උතුරු මැද පළාතට අයත් සියලුම ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන නිවාස ඒකක මෙම සමීක්ෂණයේ නියැදි රාමුව විය. දත්තවල විශ්වසනීයත්වය සුරක්ෂිත කරමින් නොනැඹුරු තොරතුරු එකතු කිරීම සහතික කරනු වස් ද්වි-අදියර ස්තෘත නියැදි (two-stage stratified sampling) ක්‍රමවේදයක් භාවිතා කරන ලදී. දත්ත සමීක්ෂකයින් ලෙස අදාළ ප්‍රදේශවල සංවර්ධන නිලධාරීන් සහභාගී කර ගනිමින් තෝරාගත් කුටුම්භ 1,500 ක් ආවරණය වන පරිදි ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් සම්මුඛ සාකච්ඡා මගින් සමීක්ෂණය සිදු කෙරිණි. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණය කරන ලද සමීක්ෂණ ප්‍රතිඵල කළමනාකාරීත්වය වෙත වාර්තා කරන ලදී.

**ගෝලීය ඩිජිටල්කරණය පිළිබඳ සමීක්ෂණය**

මියාමි ෆ්ලෝරිඩාහි අත්ලාන්තික ෆෙඩරල් සංචිත බැංකුව විසින් සංවිධානය කරනු ලැබූ මහ බැංකු ව්‍යාපාර සමීක්ෂණ හා සම්බන්ධතා වැඩසටහන් පිළිබඳ වාර්ෂික සම්මේලනයට සහභාගී වූ මහ බැංකු 16 ක් සමග එක්ව "ඩිජිටල්කරණය" පිළිබඳ ගෝලීය සමීක්ෂණයක් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී සිදු කරන ලදී. මෙම සමීක්ෂණය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු වූයේ ආයතන විසින් විවිධ ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගන්නා අයුරු හඳුනා ගැනීම සහ මිල ගණන් සහ සේවා නියුක්තිය කෙරෙහි ඩිජිටල් තාක්ෂණය මගින් ඇතිවේයැයි ඔවුන් අපේක්ෂා කරන බලපෑම පිළිබඳව තොරතුරු එක් රැස් කර ගැනීමයි. කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා යන අංශ ආවරණය වන පරිදි ආයතන තෝරා ගනිමින් ශ්‍රී ලංකාව සඳහා මෙම සමීක්ෂණය සිදුකරන ලදී.

**(i) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ**

1978 වසරේ දී ආරම්භ කරන ලද දත්ත පත්‍රිකා භාවිතයෙන් දත්ත එක්රැස් කළ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ නව්‍යකරණය කරමින් 2018 වසරේ ජනවාරි 01 දින සිට දත්ත එකතු කිරීමේ යෙදුමක් (App) සහිත ටැබ්ලට් පරිගණක හරහා තත්කාලීනව ඉලෙක්ට්‍රොනික දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට උපයෝගි කරගනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) පුරෝකථනය කිරීම සඳහා අවශ්‍යවන සිල්ලර මිල ගණන් සහ නිෂ්පාදිත මිල ගණන් නියමිත වේලාවට එක් රැස් කර ගැනීමයි. තවද මෙම නව පද්ධතිය හරහා කාලීන අවශ්‍යතා අනුව සමීක්ෂණ පැවැත්වීමට ද හැකියාව පවතී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින්, නව ඉලෙක්ට්‍රොනික දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ හඳුන්වා දීමේ දී ඊට අදාළ ගුරු සමීක්ෂකවරුන් සඳහා සම්මන්ත්‍රණ හතරක් 2018 වසරේ දෙවන භාගයේ දී පවත්වන ලදී.

නව ඉලෙක්ට්‍රොනික දත්ත රැස් කිරීමේ පද්ධතිය භාවිතයෙන් පාරිභෝගික භාණ්ඩවල සිල්ලර සහ නිෂ්පාදිත මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනයන්හි දළ අපේක්ෂිත නිෂ්පාදන මට්ටම් යන තොරතුරු සතිපතා, මාසිකව හා කාර්තුමය වශයෙන් රැස් කිරීම 2018 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙලෙස එක් රැස් කර ගන්නා ලද දත්ත, මිල හා වැටුප්වල ඍතුමය විචලන හා ප්‍රාදේශීය වෙනස්කම් විශ්ලේෂණය කිරීම; මිල දර්ශක, පළාත් දළ දේශීය නිෂ්පාදිතය හා ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කිරීම; මිල වෙනස්වීම් හා උද්ධමනය පුරෝකථනය කිරීම; ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් මිල මත ඇති කරන බලපෑම් ඇගයීම; ජාතික වියදම හා ආදායම ඇස්තමේන්තු කිරීම සහ මිල හා වැටුප් දත්ත පොදු ජනතාව වෙත බෙදා හැරීම සඳහා පුළුල් වශයෙන් යොදා ගනු ලබයි.

දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පද්ධතිය යටතේ, මුළු දිවයිනම ආවරණය වන පරිදි දත්ත එකතු කිරීම සඳහා රජයේ පාසල්වල ගුරුවරුන්ගේ සේවය ලබා ගැනේ. තවද, මෙම පද්ධතිය යටතේ පිටකොටුව වෙළෙඳපොළ, මරදගහමුල සහල් වෙළෙඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පෑලියගොඩ මාළු වෙළඳසැල් යන ස්ථානවලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස් කිරීම සඳහා ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන්ගේ සේවය ද ලබා ගැනේ. කළමනාකරණ තොරතුරු පද්ධතිය

ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් වෙළෙඳපොළවලින් ආහාර ද්‍රව්‍ය කිහිපයක තොග සහ සිල්ලර මිල ගණන් සෘජුවම රැස් කිරීම ද සිදු කරන ලද අතර මහජනතාවගේ දැන ගැනීම පිණිස එම තොරතුරු දිනපතා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

## 29.2 දර්ශක සම්පාදනය

### (අ) ව්‍යාපාර මත පිළිබඳ දර්ශක

ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ප්‍රතිඵල පදනම් කොට ගෙන, ව්‍යාපාර තත්ත්වය, ලාභාදායීත්වය, පුහුණු ශ්‍රම සුලබතාවය, විකුණුම්, ඉල්ලුම් සහ ධාරිතා උපයෝජනය යන ව්‍යාපාර මත පිළිබඳ වූ උප දර්ශක සකස් කරන ලදී. අදාළ සමීක්ෂණ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ප්‍රතිපත්ති සම්පාදනයේ දී සලකා බැලීම සඳහා අවශ්‍ය සවිස්තර වාර්තා කළමනාකාරීත්වය වෙත යොමු කරන ලදී. තවද, ප්‍රධාන දර්ශකවල සමස්ත ප්‍රතිඵල මහජනතාවගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සහ ගැනුම් තොග යන උපදර්ශක සහිතව නිෂ්පාදන කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයත්, නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත ප්‍රධාන කාර්යයන් සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂා යන උප දර්ශක සහිතව සේවා කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයත් මාසික ප්‍රවණතා නිරූපණය වන පරිදි ගණනය කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කරන ලදී. එමෙන්ම, මහජනතාවගේ දැන ගැනීම පිණිස පුවත්පත් නිවේදන මගින් ප්‍රසිද්ධ කරන ලදී.

### (ආ) දේපළ මිල දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1998 සිට 2008 දක්වා වාර්ෂිකව ද, 2009 සිට 2017 දක්වා අර්ධ වාර්ෂිකව ද, කොළඹ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක මධ්‍යස්ථාන 50 ක් ආවරණය කරමින් ඉඩම් මිල දර්ශකය (පාදක වර්ෂය 1998) සම්පාදනය කරන ලදී. මෑත කාලීනව නිශ්චල දේපළ ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය හේතුවෙන් ඉඩම්වල මිල ගණන් අධීක්ෂණය කිරීමේ වැදගත්කම වැඩිවීමත් සමග සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මධ්‍යස්ථාන 82 ක් ඇතුලත් වන පරිදි ඉඩම් මිල දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කරන ලද අතර, එහි පාදක වර්ෂය 2017 පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් හිස් ඉඩමක පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන වටිනාකම මෙම දර්ශක සැකසීමේ ක්‍රියාවලියේ දී උපයෝගී කර ගන්නා ලදී. ඉඩම් භාවිතය සම්බන්ධයෙන් පවතින විවිධත්වය සැලකිල්ලට ගෙන, සමජාතීත්වය පවත්වා ගැනීම සඳහා නේවාසික, වාණිජ සහ කාර්මික ඉඩම් සඳහා උප දර්ශක තුනක් වෙන් වෙන් වශයෙන් සම්පාදනය කරන ලද අතර එම උප දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් සමස්ත ඉඩම් මිල දර්ශකය ගණනය කරන ලදී.

දේපළ වෙළඳාම්වලට අදාළ වෙබ් අඩවිවල සඳහන් සහාධිපත්‍ය දේපළ විකුණුම් මිල පදනම් කරගෙන, මාසිකව සම්පාදනය කරනු ලබන සහාධිපත්‍ය දේපළ මිල දර්ශකය 2018 වර්ෂයේ දී ද අඛණ්ඩව සම්පාදනය කරන ලදී. මෙම ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ අරමුණින් ඊට අදාළ දත්ත එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත් භූගෝලීය ආවරණය පුළුල් කිරීමටත් නව ක්‍රියාමාර්ග කිහිපයක් 2017 වසරේ අග භාගයේ දී හඳුන්වා දෙන ලදී. මීට අමතරව, ප්‍රතිචාර දැක්වූවන් සතු ව්‍යාපෘති ආවරණය වන පරිදි කාර්තුමය වශයෙන් සිදු කරන ලද සහාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය මගින් ලබා ගන්නා ලද විකුණුම් මිල ගණන් පදනම් කර ගනිමින් 2018 වර්ෂයේ දී නව දර්ශකයක් ද ගණනය කරන ලදී.

### (ඇ) වැටුප් දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන මැනීම සඳහා වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබයි. මේ සඳහා රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශවල වැටුප් විචලන වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරනු ලැබේ. රාජ්‍ය අංශය සඳහා වන නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛන මත පදනම්ව ගණනය කරනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන පඩි පාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරනු ලබයි. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් විධිමත් පෞද්ගලික අංශය සඳහා 2017 වසරේ දී හඳුන්වා දෙන ලද නව දර්ශකය ගණනය කිරීම ඊට අදාල ක්‍රමවේදය වැඩිදියුණු කරමින් අඛණ්ඩව කරගෙන යන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ මගින් ලබා ගන්නා ලද දත්ත පදනම් කරගෙන සකසනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කරනු ලැබේ.

## 29.3 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් "ආකෘති" සහ "දර්ශක" යන ක්‍රමවේද පදනම් කර ගනිමින් කෙටිකාලීන පාරිභෝගික මිල උද්ධමනය සහ ආර්ථික වර්ධනය පුරෝකථනය කරනු ලබයි. මෙම පුරෝකථන කාර්යමණ්ඩලීය මට්ටමේ රැස්වීම්, පූර්ව-මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් ප්‍රතිපත්ති කමිටුව තුළ දී විශ්ලේෂණයට සහ සාකච්ඡාවට බඳුන් කර මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට යොදා ගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

කෙටිකාලීන උද්ධමනය පුරෝකථනය සඳහා මූලික වශයෙන්, මෑතකාලීන මිල ප්‍රවණතා, ආර්ථිකමිතික ක්‍රමවේද සහ වෙළෙඳපොළ ප්‍රවණතා හා සම්බන්ධ අපේක්ෂිත මිල විචලන පදනම් කර ගන්නා ලදී. උද්ධමන පුරෝකථන ආකෘති වැඩිදියුණු කිරීමේ අරමුණින් සැපයුම් සහ ඉල්ලුම් යන

දෙඅංශයෙන්ම උද්ධමනය මත බලපෑම් කරනු ලබන නව විචල්‍ය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් අධ්‍යයනය කරන ලදී. තවද, දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සමීක්ෂණ ප්‍රතිඵලවලින් පිළිබිඹු වන යෙදවුම් සහ නිමැවුම් මිල ප්‍රවණතා පදනම් කරගෙන, උද්ධමනය කෙරෙහි බලපාන විචල්‍යවල ඇති වී තිබෙන සහ ඇති වීමට නියමිත වෙනස්කම් සැලකිල්ලට ගනිමින් උද්ධමන පුරෝකථන නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබිණි. 2018 වර්ෂයේදී දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ තුළින් ලබා ගන්නා ලද දත්ත මත පදනම්ව ජා.පා.මි. දර්ශකයේ පුරෝකථන ක්‍රමවේදය වැඩිදියුණු කිරීම ද සිදු කරන ලදී. තවද, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ දත්ත (Early Warning System Data) භාවිතයෙන් ආකෘති මත පදනම් වූ උද්ධමන පුරෝකථන විනිශ්චයානුකූල ගැලපීම් සිදු කරමින් වැඩිදියුණු කරන ලදී.

ආර්ථිකයේ එක් එක් උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කොට දර්ශක හා ආකෘති පාදක කරගත් ක්‍රමවේද තුළින් ආර්ථික වර්ධනය කාර්තුමය වශයෙන් පුරෝකථනය කරන ලදී. දර්ශක පදනම් කර ගත් පුරෝකථන සඳහා ප්‍රමුඛ ආර්ථික දර්ශක, සමීක්ෂණ තුළින් ලබා ගත් තොරතුරු සහ ආර්ථිකයේ උප ක්‍රියාකාරකම්වලට අදාළ අනෙකුත් තොරතුරු ප්‍රවීණයන්ගේ විනිශ්චයන් සමග සංයුක්ත කරන ලදී.

තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය සඳහා කෙටිකාලීන උද්ධමන සහ ද.දේ.නි. පුරෝකථන, අදාළ විශ්ලේෂණ සහ අනෙකුත් තොරතුරු ලබා දීම ද සිදු කරන ලදී.

## 29.4 ප්‍රාදේශීය සංඛ්‍යාන ගණනය කිරීම

### (අ) ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය

සමස්ත රටෙහි සහ එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය 2017 වර්ෂය සඳහා ද සම්පාදනය කරන ලදී. මෙය සමස්ත රටෙහි සහ පළාත්වල ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබිඹු කරන සංයුක්ත දර්ශකයක් වේ. විචල්‍ය 43 ක් භාවිතයෙන් මනිනු ලබන, ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් මෙම දර්ශකය සමන්විත වේ.

### (ආ) පළාත් දළ දේශීය නිෂ්පාදිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කරන ලද ජාතික ගිණුම්, සුදුසු දර්ශක යොදා ගනිමින් පළාත් අනුව බෙදා වෙන් කර පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වටිනාකම 2017 වසර සඳහා ඇස්තමේන්තු කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙමගින් ජාතික දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් පළාත් මගින් ලබාදෙන දායකත්වය පිළිබිඹු කෙරේ. මෙම දත්ත, පළාත් අතර ආදායම් විෂමතා අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග හඳුන්වාදීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට පළාත් අධිකාරීන්ට මෙන්ම මධ්‍යම ආණ්ඩුවේ ජාතික සැලසුම්කරුවන්ට ද ප්‍රයෝජනවත් වේ.

## 29.5 සංඛ්‍යාන තොරතුරු බෙදා හැරීම

මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික යන මාධ්‍ය දෙකෙන්ම දත්ත සහ තොරතුරු බෙදා හැරීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම සංඛ්‍යාන ප්‍රකාශන ද්විත්වය වන "ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන 2018 - XL වෙළුම" අගෝස්තු මාසයේ දී ද, "ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික දත්ත 2018 - XLI වෙළුම" සැප්තැම්බර් මාසයේ දී ද භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී ද තෝරාගත් පාරිභෝගික අයිතමවල දෛනික මිල වාර්තා සහ සතිපතා හා මාස්පතා සකසනු ලබන ආර්ථික දර්ශක ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලද අතර, අභ්‍යන්තර දෙපාර්තමේන්තු නවයකින් සහ බාහිර ආයතන කිහිපයකින් එක්රැස් කර ගන්නා ලද මූර්ත, මුදල්, රාජ්‍ය මූල්‍ය, විදේශීය සහ මූල්‍ය යන අංශ ආවරණය කරනු ලබන කාලශ්‍රේණි දත්ත, ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත සංචිතයට (Data Library) ඇතුළත් කරන ලදී. තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු වාර්තාවේ සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා නැමැති ප්‍රකාශනයෙහි පරිච්ඡේද දෙකක් සම්පාදනය කිරීම සඳහා දායක වූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාව සඳහා දත්ත ලබා දීම ද සිදු කරන ලදී. මීට අමතරව, පුවත්පත් නිවේදන හරහා මහජනතාවට තොරතුරු බෙදා හැරීම හා වසර මුළුල්ලේම දැනුම බෙදා දීමේ විවිධ ක්‍රියාකාරකම්වල ද නිරත වන ලදී.

## 29.6 ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවට හිමිවන ස්ථානය පිළිබඳව අවධානය යොමු කිරීම

### (අ) "ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව" පිළිබඳ ශ්‍රේණිගත කිරීම (Ease of Doing Business Index Ranking)

"ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව" පිළිබඳ ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාවට හිමිවන ස්ථානය ඉහළ නැංවීමට අදාළ ප්‍රධාන වගකීම දැරීම වෙනුවෙන් පත් කරන ලද කාර්ය කමිටුව සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ සහාය ලබා දීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේ දී ද ප්‍රතිසංස්කරණ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සංවිධානය කරන ලද විවිධ රැස්වීම්වලට සහභාගී වීම, ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාවට හිමි ස්ථානය ඉහළ නංවා දියුණු කර ගැනීම හා සම්බන්ධ වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ මෙම ශ්‍රේණිගත කිරීම සඳහා සලකා බැලෙන විචල්‍ය පිළිබඳ තොරතුරු කාල පමාවකින් තොරව නියමිත පරිදි අදාළ බලධාරීන් වෙත ලබා දීම යනාදිය සිදු කරන ලදී. මීට අමතරව, ව්‍යාපාරික ප්‍රජාව, අනාගත ව්‍යවසායකයන්, විදේශ ආයෝජකයන් සහ ආයෝජන ප්‍රවර්ධන ආයතන සඳහා ප්‍රයෝජනවත්වන තොරතුරු ඇතුළත් "A Step-by-Step Guide to Doing Business in Sri Lanka" ප්‍රකාශනයෙහි යාවත්කාලීන කරන ලද මුද්‍රණය 2018 වර්ෂයේ දී නිකුත් කරන ලදී.

**(ආ) අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම්**

ගෝලීය දර්ශක වන ලෝක ව්‍යාප්ත පාලන දර්ශක (Worlwide Governance Indicators), ගෝලීය තරඟකාරීත්ව දර්ශකය (Global Competitiveness Index), ආර්ථික ස්වාධීනතා දර්ශකය (Index of Economic Freedom), මානව සංවර්ධන දර්ශකය (Human Development Index), ලෝක ආර්ථික ස්වාධීන දර්ශකය (Economic Freedom of the World Index) සහ දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index) අඛණ්ඩව අධීක්ෂණය කරමින් ඒවායේ ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ස්ථානය සහ ශ්‍රේණිගත කිරීම්වල වැඩිදියුණුවක් ඇති කර ගැනීම සඳහා යොදාගත හැකි උපායමාර්ග පිළිබඳ වාර්තා ඉහළ කළමනාකාරීත්වයට සහ අනෙකුත් ඉහළ අධිකාරීන් වෙත අවශ්‍ය අවස්ථාවන්හි දී දැනුම් දෙන ලදී. එසේම, ඉහත සඳහන් දර්ශක සම්පාදනය කරනු ලබන ආයතනවලට ශ්‍රී ලංකාව පිළිබඳ සාර්ව ආර්ථික තොරතුරු සහ දත්ත සතිපතා මෙන්ම මාසිකව සැපයීමට ද කටයුතු කරන ලදී.

## 30. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි දක්වා ඇති විධිවිධානයන් යටතේ පිළිවෙලින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මීට අමතරව, 1923 අංක 08 දරන භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතෙහි සහ 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතෙහි ඇති විධිවිධානයන් යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීමද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර වල නිරත වන ආයතන නියාමනය හා අධීක්ෂණය කිරීමේ අරමුණින් ඒ සඳහා 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙහිද නිරතව සිටියි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ හා අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම ඇතුළත් වන අතර නියාමන කාර්යයන් යටතට විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා නියාමන අනුමැතීන් ලබාදීම ඇතුළත් වේ. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අධිකරණ කාර්යයන් සඳහා පහසුකම් සැපයීම සහ මහජන පැමිණිලි සඳහා මැදිහත් වීම වැනි වෙනත් විවිධ කාර්යයන් වලද නිරතවේ.

2018 අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 43ක්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 5 ක් සහ ප්‍රාථමික අලෙවිකරුවන් 8 ක් දෙපාර්තමේන්තුවේ නියාමනය යටතේ පැවතිනි. මීට අමතරව, කල්බදු මූල්‍යකරණ පනත යටතේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 5 ද ඇතුළත්ව, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 65 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නාම ලේඛණය මෙම කොටස අවසානයේ දක්වා ඇත. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

### 30.1 විචක්ෂණ නියාමන නිකුත් කිරීම

2018 වර්ෂය තුළදී නිකුත් කරන ලද විධානයන් හා රෙගුලාසි මෙම වාර්තාවේ තුන්වැනි කොටසෙහි දැක්වේ. ප්‍රධාන විචක්ෂණ නියාමනයන්ගේ සාරාංශයක් පහතින් දැක්වේ.

(අ) ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම, ගනුදෙනුකරුවන් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හා මෙම අංශයේ ස්ථායිතාවය හා ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා අංශය කෙරෙහි ගනුදෙනුකරුවන්ගේ පවතින විශ්වාසය තහවුරු කිරීම අරමුණු කරගනිමින් මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවක් හඳුන්වා දෙන ලදී. මෙම විධානය තුළින් හෙළිදරව් කිරීම හා විනිවිදභාවය, මූල්‍ය දැනුම්වත් කිරීම, වගකීම් සහගත ව්‍යාපාරික හැසිරීම, පැමිණිලි හැසිරවීම හා සහන සැලසීම, අපක්ෂපාතී හා සාධාරණ සැලකීම් සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම යන අංශයන් සඳහා ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අවම ප්‍රමිතීන් අවධාරණය කර ඇත.

(ආ) බාහිරින් සේවා ලබා ගැනීම හරහා ඇතිවන අවදානම කළමනාකරණය කිරීමට අවශ්‍ය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයන් හඳුන්වා දෙමින් බාහිරින් සේවාවන් ලබා ගැනීමේ වැඩපිළිවෙලවල් ක්‍රමවත් කිරීම සහ මූලික ව්‍යාපාර කාර්යයන්/මෙහෙයුම් කටයුතු සහ ක්‍රියාකාරකම් සඳහා බාහිරින් සේවාවන් ලබා ගැනීමේ සීමාවන් පැනවීම සම්බන්ධයෙන් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිරින් සේවාවන් ලබා ගැනීමට අදාල නව විධානයක් හඳුන්වා දෙන ලදී.

(ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය දැඩි කරමින් අවදානම තක්සේරු කිරීමේ හැකියාවන් වර්ධනය දිරිමත් කිරීම අරමුණු කරගෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක රාමුවක් හඳුන්වා දෙන ලදී. බාසල් සම්මුතියෙහි සඳහන් මූලික ප්‍රවේශයන්ට අනුකූලව අවදානම් සංවේදීතාව වැඩි වශයෙන් ඉලක්ක කරගෙන ණය හා මෙහෙයුම් අවදානම් ආවරණය කරමින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පවත්වා ගැනීමට නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක රාමුවෙහි නියම කර ඇත. නව රාමුවට අනුව රුපියල් බිලියන 100 ට වඩා වැඩි වත්කම් සහිත සමාගම් විසින් ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පවත්වා ගත යුතුය.

(ඈ) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් නිශ්චල දේපළ තක්සේරු කිරීමේ ක්‍රමවේදය නියාමනය කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. මෙම නව අවශ්‍යතාව මගින් තක්සේරුකරුවන්ගේ සුදුසුකම්, තක්සේරු කිරීම සිදු කරනු ලබන වාර ගණන, අභ්‍යන්තර හෝ බාහිර තක්සේරු වාර්තා ලබාගැනීමේ සීමාවන් හා හෙළිදරව් කිරීම් පැහැදිලි කෙරේ.

(ඉ) සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලබන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයකින් ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගත යුතු අතර එම ශ්‍රේණිගත කිරීම 2018 ඔක්තෝබර් මස පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි හෙළිදරව් කළ යුතුය.

(ඊ) ණය ලබා දීමේදී අසාධාරණ පොලී අනුපාතයන් අය කිරීමෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අය කළ හැකි උපරිම පොලී අනුපාතය සම්බන්ධයෙන් නව විධානයක් නිකුත් කරන ලදී.

(උ) ආනයන හා එහි ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය මත ඇතිවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නව වටිනාකම් මත ණය අනුපාතය අනුගමනය කිරීමට නියම කරමින් පෙර පැවති වටිනාකම් මත ණය අනුපාතය සංශෝධනය කරන ලදී. මෙම විධානයට අනුව, දෙමුහුම් මෝටර් රථ, වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සඳහා වටිනාකම් මත ණය අනුපාතය සියයට 50 දක්වා අඩු කරන ලදී.

## 30.2 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම**

(i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා සැලසුම් කල පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 13ක වාර්ෂික ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කරන ලදී. අඩු කාර්යක්ෂමතාව, ආයතනික යහපාලනයේ ගැටලු, ණය අලාභ සඳහා ප්‍රමාණවත් නොවන වෙන්කිරීම්, අභ්‍යන්තර පාලනයේ දුර්වලතා, ඇතිවිය හැකි ණය අවදානම් සහ ව්‍යාපාර ආකෘතින් හරහා පැනනගින දිගුකාලීන ස්ථාවරත්වය සම්බන්ධ ගැටලු මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයාගැනීම් විය.

(ii) මෙම පරීක්ෂණ වලදී හඳුනාගත් ගැටලු සම්බන්ධව මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් සහ නිර්දේශයන්, අදාල බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල අවධානය සඳහා දැනුම් දුන් අතර, අදාළ සමාගම් විසින් එකඟ වූ කාල රාමුව තුල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා පසු විපරම් කිරීමද සිදු කරන ලදී.

**(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම**

(i) සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ඔවුන් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කරගෙන සහ විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ආදිය ඇතුලත් වෙනත් මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම මගින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. මෙම සමාලෝචනයන් මගින් පූර්ව අනතුරු කල්තියා හඳුනාගැනීමේ දර්ශකයන් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය හරහා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, ණය අලාභ වෙන්කිරීම්, ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය යන අංශයන්ගෙන් බලපත්‍රලාභී මුදල් සමාගම්වල සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ඇතිවිය හැකි අවදානම් හඳුනා ගනී.

(ii) වර්ෂය තුළදී අලුතින් නිකුත් කරන ලද අවම මූලික ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා යන විධාන හා සමගාමී වීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සම්බන්ධ නව දත්ත සම්ප්‍රේෂණ වාර්තාව හඳුන්වා දෙන ලදී. තවද, අංශයේ ණය ලබා දීම සම්බන්ධව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය හා සමගාමී වීම සඳහා පිළිවෙළින් විවිධ අංශ අනුව ණය ලබා දීමේ සහ තැන්පතු වගකීම් සම්බන්ධයෙන් නව වාර්තා දෙකක් හඳුන්වා දෙන ලදී.

(iii) අධීක්ෂණ කටයුතු වලදී හෙළිදරව් වූ ගැටලු වල ඇති ප්‍රමුඛතාවය සහ බරපතලභාවය පිළිබඳ ඇගයීම පදනම් කොටගෙන එම ගැටලු නියම කරන ලද කාල රාමුවක් තුල නිවැරදි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද, මෙම අංශයේ ඇතිවන නව වර්ධනයන් සම්බන්ධව ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කිරීම සඳහා අංශයේ කාර්යසාධනය මුදල් මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී.

(iv) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, සාංගමික ව්‍යවස්ථාවලීන් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන්

ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට, සමාගමේ ව්‍යාපාර නාමය වෙනස් කිරීමට, ලියාපදිංචි ලිපිනයන් වෙනස් කිරීමට, ව්‍යාපාර ස්ථාන වෙනස් කිරීමට, ව්‍යාපාර හිමිකම මාරු කිරීමට සහ නව ශාඛාවන් විවෘත කිරීමට නියාමන අනුමැතීන් ලබා දෙන ලදී. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ් සමාගම, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ වීමත් සමග එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ් සමාගම වෙත නිකුත් කර තිබූ කල්බදු මූල්‍යකරණ බලපත්‍රය අවලංගු කරන ලදී.

(v) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව ප්‍රධාන වශයෙන්ම ගනුදෙනුවලදී පාරිභෝගිකයන්ට සිදුවන අකටයුතුකම් සහ අදාළ සමාගම් සමග එළඹී ඇති ගනුදෙනු සඳහා සහන ඉල්ලීම් සම්බන්ධයෙන් මහජනතාවගෙන් ඉදිරිපත්වූ පැමිණිලි විශාල ප්‍රමාණයක් නිරාකරණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් විය.

**(ඇ) දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

2018 වර්ෂය තුල බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික ඉලක්කය වූයේ පසුගිය වසර කිහිපය පුරා දිගුකාලීන ද්‍රවශීලතා අර්බුදයන්ට ලක්වී ඇති බුන්වත් සමාගම්වල ගැටලු නිරාකරණය කිරීමයි. ඒ අනුව, මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(i) ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ලිමිටඩ් සමාගම විසින් සිදු කරන ලද ආයෝජනය සමග සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ් සමාගම යථා තත්ත්වයට පත් කර ඇති අතර වර්තමානයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක වෙමින් පවතී. එම සැලැස්මට අනුව, මූලික ප්‍රාග්ධන යෙදවීම්, ආයතන ඒකාබද්ධ කිරීම සහ තැන්පතු වලින් කොටසක් ආපසු ගෙවීම දැනටමත් සම්පූර්ණ කර ඇත.

(ii) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කර තිබූ බලපත්‍ර අවලංගු කළ අතර ඈවර කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

(iii) බලපත්‍රලාභී මුදල් සමාගම්වල යෝජිත නියාමන හා බලගැන්වීමේ රාමුව හා සමගාමීව 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 33 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල අනුව මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම් වල ප්‍රමුඛත්වය සම්බන්ධව රෙගුලාසියක් පිළියෙළ කරන ලදී. මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී මෙම රෙගුලාසිය අදාල වනු ඇත. අදාල අධිකාරීන්ගේ අනුමැතියෙන් අනතුරුව මෙම රෙගුලාසිය ගැසට් මගින් ප්‍රකාශයට පත් කෙරේ.

(iv) දුර්වල මූල්‍ය තත්ත්වයක් සහිත සමාගම් තුනක් මත තැන්පතු සහ ණය ගැනීම් මත සීමාවන් පැනවීම, ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීම, පාලිත සමාගම් හා ආයෝජන දේපල විකිණීම හරහා තැන්පතු වලින් කොටසක් ගෙවීම ආදී නියාමන ක්‍රියාමාර්ග ගන්නා අතරම එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් යෝජිත ආයෝජකයින් කිහිප දෙනෙකු සඳහා යථා තත්ත්ව පරීක්ෂණ සිදු කරගෙන යාමට පහසුකම් සැලසීම ද සිදු කරන ලදී. මීට අමතරව, මෙම සමාගම්වල වැරදිකාර පාර්ශවයන්ට ඔවුන්ගේ කටයුතු හේතුවෙන් අදාළ සමාගම්වලට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ඔවුන්ට විරුද්ධව විදේශ ගමන් බලපත්‍රය පරිරෝධනය කිරීම, පෞද්ගලික බැංකු ගිණුම් තහනම් කිරීම වැනි නියාමන ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට අනුකූලව මෙම සමාගම් වල ප්‍රතිව්‍යුහගත කිරීමේ / යථා තත්වයට පත් කිරීමේ සැලසුම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල, ඉහළ කළමනාකාරීත්වය සහ බාහිර විගණකවරුන් සමග නිරන්තරයෙන් රැස්වීම් පවත්වන ලදී.

## 30.3 ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම**

සියලුම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කළ අතර 2018 වර්ෂය තුළදී ප්‍රාථමික අලෙවිකරුවන් 4 දෙනෙකුගේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ අවසන් කරන ලදී. අධීක්ෂණ ක්‍රියාමාර්ගයක් ලෙස, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ ප්‍රාථමික අලෙවිකාර ඒකකයේ ව්‍යාපාර කටයුතු සඳහා කල අත්හිටුවීම තවත් මාස 6ක කාලයක් (පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනය 2019 ජනවාරි 05 දින සිට බලපැවැත්වෙන පරිදි සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ ප්‍රාථමික අලෙවිකාර ඒකකය 2018 අගෝස්තු 15 දින සිට බලපැවැත්වෙන පරිදි) සඳහා දීර්ඝ කරන ලදී.

2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකකයන්හි අධීක්ෂණ, පරීක්ෂණ හා සුපරීක්ෂණ සහ කාර්යසාධනය කාලාවර්තිතව අගයකිරීමේ කාර්යයන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරු කිරීමට මුදල් මණ්ඩලය අනුමැතිය ලබාදෙන ලදී. තවද, සියලුම ප්‍රාථමික අලෙවිකරුවන් වෙත (බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හා බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකක) රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ හා වෙළඳපොළ හැසිරීම දියුණු කිරීම සම්බන්ධයෙන් නියාමනයන් හා විධාන නිකුත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී වෙත තවදුරටත් අවසර ලබාදී ඇති අතර විචක්ෂණ අවශ්‍යතා සම්බන්ධව

**ඇමුණුම II-4**

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නියාමනය වන මූල්‍ය ආයතන (2018 වර්ෂය අවසානයට)

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඒ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් [අ]
6. එච්එන්බී ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්)
7. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
8. එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී)
9. එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
10. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
11. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
12. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
13. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් [අ]
18. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
19. ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී (පෙර කලම්බො ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී)
20. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී [අ]
21. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
22. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
23. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
24. ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී
25. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
26. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
27. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
28. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
29. යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
30. රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
31. ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්)
32. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
33. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
34. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී [අ]
35. සියපත ෆිනෑන්ස් පීඑල්සී
36. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
37. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී [අ]
38. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
39. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
40. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
41. සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්
42. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී
43. ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්)

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පීඑල්සී
2. එම්සීබී බැන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
7. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
8. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
9. ලංකා බැංකුව
10. සම්පත් බැන්ක් පීඑල්සී
11. සෙලාන් බැන්ක් පීඑල්සී
12. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
2. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
3. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
4. ශ්‍රී ලංකා සේවිංග්ස් බැන්ක් ලිමිටඩ්
5. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. එස්එම්බී ලීසිං පීඑල්සී
3. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
4. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ් [ආ]
5. යුනිසන්ස් කැපිටල් ලීසිං ලිමිටඩ්

**(ඈ) ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්**

### ප්‍රාථමික අලෙවිකරුවන්

1. ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්
2. එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
3. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී [ඇ]
4. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
6. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
7. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් [ඈ]
8. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී [ඉ]
9. මහජන බැංකුව
10. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
11. ලංකා බැංකුව
12. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්
13. සම්පත් බැන්ක් පීඑල්සී
14. සෙලාන් බැන්ක් පීඑල්සී
15. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී

(අ) මෙම සමාගම් මත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව තැන්පතු භාර ගැනීම් අත්හිටුවීම ද ඇතුළත්ව සීමා කිරීම් පනවා ඇත.
(ආ) 2019.03.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලියාපදිංචිය අහෝසි කර ඇත.
(ඇ) 2017.07.24 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙන්දේසිය සඳහා සහභාගි වීම වළක්වා ඇත.
(ඈ) 2019.01.05 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.
(ඉ) 2018.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.

ප්‍රාථමික අලෙවිකරුවන් වෙත විධානයන් හා මාර්ගෝපදේශ නිකුත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලය පවරා ඇත.

**(ආ) එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ දුර්වල මූල්‍ය භාවිතයෙහි ප්‍රතිඵලයක් ලෙස ඍණ ද්‍රවශීලතා තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් 2016 වර්ෂය තුළදී පද්ධතිමය ගැටලුවක් ඉස්මතු විය. සුරක්ෂිත ප්‍රතිමිලදී ගැනුම් හා ස්ථිර පදනමක් මතවූ ආයෝජන පියවන ලදී. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය මගින් නීතිමය කටයුතු ආරම්භ කළ අතර පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ ආයෝජන පියවීමේ සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටියි. තවද, අධිකරණය විසින් නියෝග කර ඇති පරිදි, එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී ආයතනයේ වෝහාරාත්මක විගණනයක් සිදු කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට පහසුකම් සලසනු ලැබේ.

### 30.4 මහජනයා දැනුම්වත්කිරීම් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් / විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශක්‍යතා වැඩි දියුණු කිරීම.

**(අ) ශක්‍යතා වැඩිදියුණු කිරීම**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දක්ෂතා/ නිපුණතා වැඩි දියුණු කිරීමේ අරමුණින්, වෝහාරාත්මක පරීක්ෂණ, බාසල් ප්‍රතිපත්ති, ආතති පරීක්ෂාව සහ ආයතනික යහපාලනය වැනි අංශයන් ඔස්සේ පැවති දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගී වන ලදී. තවද, සියලුම කාර්ය මණ්ඩලය සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතා හා සමගාමීව නව ගිණුම්කරණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණු වැඩමුළු පවත්වන ලදී. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියසෙහි සහ වෙනත් බාහිර ආයතනයන් හි පැවති පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

**(ආ) බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ වෙනත් සම්බන්ධිත පාර්ශවයන් සමග පැවති රැස්වීම්**

ආර්ථිකමය කරුණු සහ නියාමන වර්ධනයන් සම්බන්ධ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාවන් සැලසීමේ පරමාර්ථයෙන් මහ බැංකු අධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමග බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් 2 ක් පවත්වන ලදී. මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සහ ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ සමාගම්, බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයන් සමග අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

**(ඇ) මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නිරාකරණ හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව වැනි වෙනත් දෙපාර්තමේන්තු වෙතින් ලද ඉල්ලීම් අනුව අවශ්‍ය විට ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී.

### 30.5 අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නීතිමය කාර්යයන් සඳහා පහසුකම් සැපයීම

**(අ) ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය**

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරන ලද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදය අනුව, එම සමාගමේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට තැන්පතු ආපසු ගෙවීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

**(ආ) අනවසර මූල්‍ය ආයතන වලට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග**

ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනයන්හි තැන්පත්කරුවන් විසින් 2015 වසර තුළ ගොනු කරන ලද නඩු කටයුතු සඳහා දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සපයන ලදී. තවද, අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු සඳහා අධිකරණය නියම කළ පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාක්ෂි ලබා දීම සිදු කරන ලදී.

## 31. පුහුණු හා සංවර්ධන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි ලා එළැඹෙන අවශ්‍යතා සපුරාලීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව පහසුකම් සපයයි. ඒ සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, එම අවශ්‍යතාවන් සපුරාලීම සඳහා උපාය මාර්ග සකස් කිරීම, වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බැංකුවේ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ දේශීය / විදේශීය කෙටි කාලීන පුහුණු අවස්ථා සලසා දීම යන කාර්යයන් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. මෙයට අමතරව, කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ද එම දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

### 31.1 පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

2018 වසර තුළ දී ඕස්ට්‍රේලියාවේ සහ එක්සත් රාජධානියේ ඉහළ පෙළේ විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 8 දෙනෙකුට ද, විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා මාණ්ඩලික

ශ්‍රේණියේ නිලධාරීන් 8 දෙනෙකුට ද පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසා දෙන ලදී. අර්ධ කාලීන පදනමින් දේශීය විශ්වවිද්‍යාලයක විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි ආරම්භ කිරීමට තවත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 3 දෙනෙකුට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ දී අවස්ථාව සලසා දෙන ලදී. මේ අතර, සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ එක් අයෙකු සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කළ 14 දෙනෙකු ද වශයෙන් පශ්චාත් උපාධි සම්පූර්ණ කළ නිලධාරීන් 15 දෙනෙකු 2018 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරිය සඳහා නැවත වාර්තා කළ හ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2014 - 2018 කාලය තුළ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව හා එම කාලය තුළ සිය පශ්චාත් උපාධි අවසන් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව II-27 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### 31.2 කෙටි කාලීන පුහුණු අවස්ථා

වර්ෂ 2017 අග භාගයේ දී කරන ලද නිපුණතා සමීක්ෂණයෙහිදී හඳුනා ගන්නා ලද නිපුණතා අඩුපාඩු සම්පූර්ණ කිරීමේ අරමුණ ඇතිව පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත කෙටි කාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් 1,548 ක් සලසා දෙන ලදී.

#### 31.2.1 කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා

2018 වසර තුළ දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ඉහළ පෙළේ විදේශ පුහුණු ආයතන සහ විදේශ මහ බැංකු විසින් පවත්වන පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු, අධ්‍යයන වැඩසටහන් සහ රැස්වීම් සඳහා සහභාගී වීමට මහ බැංකු නිලධාරීන් හට පහසුකම් සපයන ලදී. 2018 වසර තුළ මහ බැංකු නිලධාරීන් පුහුණු කටයුතු සඳහා යොමු කරන ලද මහ බැංකු අතර ප්‍රංශ මහ බැංකුව, එංගලන්ත බැංකුව, ජර්මන් ෆෙඩරල් බැංකුව (Deutsche Bundesbank), ඉන්දියානු සංචිත බැංකුව, මැලේසියානු ජාතික බැංකුව, කොරියානු බැංකුව, ඇමෙරිකානු ෆෙඩරල් සංචිත බැංකුව, සිංගප්පූරු මූල්‍ය අධිකාරිය සහ පකිස්තානු රාජ්‍ය බැංකුව වේ. මීට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, දකුණු හා නැගෙනහිර ආසියානු රටවල මහ බැංකු පුහුණු මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS), ඉන්දියානු කාර්මික සහ ආර්ථික සහයෝගිතාව (ITEC), මැලේසියාවේ පුත්‍රා විශ්වවිද්‍යාලය, හොංකොංහි පිහිටි චීන විශ්ව විද්‍යාලය ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය ආයතන, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ පුහුණු ආයතන විසින් ලබා දුන් පුහුණු අවස්ථා සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

2018 වර්ෂය තුළ පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලද එවැනි කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා 408 කි.

**II-28 සංඛ්‍යා සටහන**

**කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2018**

| ක්ෂේත්‍රය | පුහුණු වැඩසටහන් ගණන | සහභාගි වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| ආර්ථික හා මිල ස්ථායීතාව | 67 | 101 |
| මූල්‍ය පද්ධති ස්ථායීතාව | 128 | 205 |
| නියෝජිත කාර්යයන් | 16 | 16 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 8 | 11 |
| ආයතනික සේවාවන් සහ වෙනත් | 39 | 75 |
| **එකතුව** | **258** | **408** |

තවද, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉන්දියාව, මැලේසියාව, හංගේරියාව, ඕස්ට්‍රියාව, සවුදි අරාබිය, පින්ලන්තය, පිලිපීනය, කොරියාව සහ ලෙබනනය යන රටවල පැවැති, විදේශීය අධ්‍යයන වැඩසටහන් 13 ක් සඳහා 2018 දී පහසුකම් සලසන ලදී. එසේම, විදේශීය වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස එක් වීමට මහ බැංකු නිලධාරීන් 2 දෙනෙකු හට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

පුහුණු හා සංවර්ධන කටයුතු පිළිබඳව වූ තීරණ ගැනීම සඳහා පුහුණු කමිටු රැස්වීම් 18 පැවැත්වීම සඳහා පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

මහ බැංකු නිලධාරීන් හට ඔවුන්ට අවශ්‍ය පුහුණු අවස්ථාවන් ලබා දෙන අතරතුර පුහුණු වැඩසටහන් හරහා ලබා ගත් දැනුම හා කුසලතාවන් මහ බැංකු මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට භාවිතා කරන බව සහතික කිරීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මේ සඳහා, පශ්චාත් පුහුණු අධීක්ෂණය සඳහා වන පුහුණු අනු කමිටු රැස්වීම් සඳහා පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. 2018 වසර තුළ දී පුහුණු අනු කමිටුවෙහි රැස්වීම් වාර 14 ක්

**II-27 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව (2014 - 2018)**

| සුදුසුකම් | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| ආචාර්ය උපාධිය | 5 | 2 | 3 | 5 | 5 | 2 | 3 | 3 | 8 | 1 |
| විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය | 24 | 11 | 19 | 21 | 24 | 11 | 19 | 18 | 8 | 14 |

පවත්වන ලදී. ඒ අනුව, 2019.02.28 වන විට එම අනු කමිටුව ලබා දුන් පැවරුම් 236 කින් 212 ක් කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් විසින් සම්පූර්ණ කර භාර දී ඇත (II-29 සංඛ්‍යා සටහන).

**II-29 සංඛ්‍යා සටහන**

**2019.02.28 වන විට කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගීවූවන් විසින් සම්පූර්ණ කරන ලද පැවරුම්.**

| වර්ගීකරණය | පැවරුම් ගණන |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 12 |
| පුවත්පත්/සඟරා ලිපි හා ඉදිරිපත් කිරීම් හරහා දැනුම හුවමාරු කර ගැනීම හා කාර්යමණ්ඩල දැනුම්වත් කිරීම් | 130 |
| පද්ධති හා ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම සඳහා වන යෝජනා | 30 |
| සංකල්ප පත්‍රිකා | 40 |
| එකතුව | 212 |

2018 වසර තුළ දී කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් හා සම්බන්ධව චක්‍රලේඛන 2 ක් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.

### 31.2.2 කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා

2018 වසර තුළ දී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, බැංකු විද්‍යා පියසෙහි සහ වෙනත් ඉහළ පෙළේ දේශීය පුහුණු ආයතනයන් හිදී පවත්වන ලද පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි කෙටි කාලීන පුහුණු අවස්ථා 1,140ක් බැංකුවේ කාර්ය මණ්ඩලය වෙත සලසා දෙන ලදී. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, ගිණුම්කරණය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, විගණනය, අරමුදල් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ලේකම් කටයුතු, මානව සම්පත් කළමනාකරණය, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය, මූල්‍ය වෙළෙඳ පොළ, විදේශ විනිමය, ව්‍යවහාර මුදල්, ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ වලට අයත් විය. 2018 වසර තුළ දී, බැංකු විද්‍යා පියස මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් 57 ක් සඳහා නිලධාරීන් 674 ක් සහභාගී වූ අතර අනෙකුත් පුහුණු ආයතන මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් 93 ක් සඳහා නිලධාරීන් 466 ක් සහභාගී විය.

මීට අමතරව, 2018 වසර තුළ දී, මහ බැංකු පරිපාලනය පිළිබඳව බැංකුවේ ඉහළ කළමනාකාරීත්වය සඳහා ද ආචාර ධර්ම පිළිබඳව මාණ්ඩලික නිලධාරීන් සඳහා ද වූ වැඩසටහන් 2 ක් බැංකු විද්‍යා පියස හා එක්ව පැවැත් වීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. තවද, සයිබර් ආරක්ෂාව පිළිබඳව වැඩමුළුවක් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ බැංකු විද්‍යා පියස හා එක්ව පැවැත් වීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. 2018 වසර තුළ දී, බැංකුවේ සියලුම නිලධාරීන් සඳහා මහ බැංකු ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව හා එක්ව පැවැත් වීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. 2018 දෙසැම්බර් මස දී, අලුතින් මහ බැංකු සේවයට බඳවා ගත් කළමනාකරණ අභ්‍යාසලාභීන්, නීති නිලධාරීන් හා පුහුණුවන ආරක්ෂක නිලධාරීන් හා උසස්වීම් ලද පරිවාසීය මාණ්ඩලික නිලධාරීන් හට නම්නීකරණ වැඩසටහන් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

## 31.3 දැනුම හුවමාරුව සහ අනෙකුත් කටයුතු

පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවලින් පසුව සේවයට වාර්තා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට සිය අධ්‍යයනයන් මහ බැංකු කාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා පහසුකම් සලසන ලදී. තවද, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආරාධිත දේශකයින් ගේ සහභාගිත්වයෙන් මෙන්ම ආචාර්ය උපාධි ලත් මහ බැංකු නිලධාරීන් ගේ සහභාගිත්වයෙන් ද ආර්ථික සංසද සංවිධානය කරන ලදී.

බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට මහ බැංකු නිලධාරීන් උනන්දු කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් වූ වරලත් මූල්‍ය විශ්ලේෂක සුදුසුකම ලබා ගැනීම සඳහා වන මහ බැංකු අනුග්‍රාහක වැඩසටහන පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව මෙම වසරේ ද ක්‍රියාත්මක කරනු ලැබී ය.